වර්ධනය
සඳහා අවකාශයක්



වාර්ෂික වාර්තාව 2019

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

පටුන

අප ගැන | **2**
දැක්ම | මෙහෙවර | ආයතනික වටිනාකම් | **3**
මූල්‍ය විශේෂතා | **4**
මූල්‍ය සමාලෝචනය | **6**

ආයතනික කළමනාකාරිත්වය

සභාපතිතුමාගේ සමාලෝචනය | **10**
සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ගේ සමාලෝචනය | **13**
අධ්‍යක්ෂ මණ්ඩලය | **16**
ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | **17**
ආයතනික පාලනය | **21**

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | **77**
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව | **79**
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව | **80**
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව | **82**

කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය | **86**
මානව සම්පත් කළමනාකරණය | **99**
ආයතනික සමාජ වගකීම | **102**
අපගේ නිෂ්පාදන සහ සේවාවන් | **103**

මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | **105**
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය | **110**
බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව | **112**
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | **114**
විගණකාධිපතිගේ වාර්තාව | **116**
ආදායම් ප්‍රකාශනය | **119**
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | **120**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | **121**
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | **122**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | **123**
ගිණුම්කරණ ප්‍රතිපත්ති | **124**
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | **137**
වටිනාකම් චකිතු කිරීමේ ප්‍රකාශනය | **169**
ආදායම් මූලාශ්‍ර සහ යෙදවීම | **170**
දස වසරක සංඛ්‍යාලේඛන සාරාංශය | **171**
සටහන් | **172**
ආයතනික තොරතුරු | **පසුකවරය ඇතුළු පිට**

Read this report online
http://smib.lk/
About SMIB - Annual Reports

වර්ධනය සඳහා අවකාශයක්

ජාතියේ ප්‍රමුඛ නිවාස බැංකුවක් ලෙස, ආර්ථිකය තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකිරීමට අපට ඇති ස්ථීර කාර්යසාධන මට්ටම් අත්කර ගැනීම සඳහා අභියෝගාත්මක ව්‍යාපාර වාතාවරණයක් තුළින් අපි සාර්ථකව පියමන්කර ඇත. අනාගතයේදී වඩා ඉහළ වේගයක් සහිතව ඉදිරියට ගමන් කිරීම සඳහා මෙය ස්ථීර අවකාශයක් සහ දියත් කිරීමේ මාවතක් නිර්මාණය කර ඇති බව අපි විශ්වාස කරමු.

අප ගැන



ලබාගතහැකි ආකෘති

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
වාර්ෂික වාර්තාව 2019

මුද්‍රිත පිටපත

සියලුම කොටස්හිමියන්ට CD තැපෑල් කරන ලදී

PDF ලෙස මාර්ගගතව ලබාගතහැක

අපගේ ඉතිහාසය

ජාතියේ පැරණිතම බැංකු වලින් එකක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1931 අංක 16 දරන ආඥා පනත මඟින් 1931 දෙසැම්බර් 6 දින ලංකා රාජ්‍ය උකස් බැංකුව (CSMB) ලෙස ආරම්භ කරන ලදී. ලංකා රාජ්‍ය උකස් බැංකුව සහ 1943 දී ස්ථාපිත කෘෂිකර්ම හා කර්මාන්ත ණය සංස්ථාව ඒකාබද්ධ කරමින් 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පිහිටුවන ලදී. බැංකුව එහි මෙහෙයුම 1979 ජනවාරි 1 දින ආරම්භ කර ඇත. බැංකුව බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස හඳුනාගනු ලැබූ අතර, 1998 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව 1998 අප්‍රේල් 27 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රය නිකුත් කරන ලදී.

එතැන් සිට, පූර්ව ව්‍යාපාරික මාර්ගවලින් අපගමනය වෙමින්, රටේ නිවාස අවශ්‍යතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, බැංකුව එහි වසර අසූවකට වැඩි කාලසීමාව තුළ, ජාතියේ නිවාස බැංකුව බවට පත්වීම දෙසට පරිනාමනය විය. බැංකුවේ කටයුතු පුළුල් කිරීමත් සමඟ, බැංකුව විවිධ වෙනත් නිෂ්පාදන ආරම්භ කිරීම මඟින් එහි සම්පත් පදනම ශක්තිමත් කරන ලදී. මේ අයුරින් 1991 දී, බැංකුව තැත්පතු භාර ගැනීම ආරම්භ කළේය. 2001 ඔක්තෝබර්, ඉතුරුම් ගිණුම් පොත් නිෂ්පාදනය හඳුන්වා දෙන ලදී. ප්‍රධාන ස්ථානවල නව ශාඛා විවෘත කිරීම මඟින් බැංකුව එහි ව්‍යාපාර ජාලය පුළුල් කරන ලදී. (වර්තමානයේ ශාඛා 24 ක් පවතී) ශාඛා තුළින් එහි සේවාවන් පුළුල් කරමින් සහ බැංකු ක්ෂේත්‍රය තුළ අභියෝග සහ තරඟකාරිත්වයට මුහුණ දෙමින්, "ජාතියේ නිවාස බැංකුව" ලෙස එහි තත්ත්වය පවත්වා ගැනීමට බැංකුවට හැකි වී ඇත.

දැක්ම

“පාරිභෝගික මූල්‍ය කටයුතුවල වෙළෙඳපොල පෙරගමන්කරුවෙකු වීම සමගින් සංවර්ධන බැංකුකරණයේ ජාතියේ අගනා කොටස්කරුවෙකු වීම”

මෙහෙවර

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ජාතියේ විශිෂ්ඨ නිවාස බැංකුව ලෙස ඉදිරියටත් පවත්වාගෙන යමින් සංවර්ධන බැංකුකරණයේ අගනා කොටස්කරුවෙකු වීම.

ගනුදෙනුකරු: විශිෂ්ඨ පාරිභෝගික සේවාව, නව්‍යකරණය, ගුණාත්මක බව හා අති නවීන තාක්ෂණය මගින් අපගේ සියළුම ගනුදෙනුකරුවන්හට ඔවුන්ගේ නිවාස හා සංවර්ධන මූල්‍ය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ආකර්ෂණීය මූල්‍ය විසඳුම් ලබා දෙමින් සේවය කිරීමට අපි ඇපකැපවී සිටිමු.

ව්‍යාපාර හවුල්කරුවන්: ඉහළ ආරක්ෂාවකින් හා නම්‍යතාවයකින් යුතුව ආයෝජන සඳහා විශිෂ්ඨ ප්‍රතිලාභ ප්‍රදානය කරන්නෙමු.

සේවකයා: කණ්ඩායම් හැඟීමෙන් සේවය කල හැකි යහපත් පරිසරයක් නිර්මාණය කරමින් අපගේ සේවකයින්ගේ කුසලතා උපරිම අයුරින් වර්ධනය කරගැනීම වෙනුවෙන් හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ද අපි අවස්ථා ලබා දෙන්නෙමු.

කොටස්හිමියන්: පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ ආරක්ෂා කරමින් ලාභදායිත්වයේ වර්ධනය මගින් කොටස්කරුවන්ගේ තත්ත්වය ඉහළ නැංවීමට අපි කැපවී සිටින්නෙමු.

තාක්ෂණය: වේගවත්බව, ගුණාත්මක බව හා පහසුව ඇතිකරලීම සඳහා ස්වයංක්‍රීයකරණ සහ තාක්ෂණික යෙදුම් මගින් අපගේ බාහිර ගනුදෙනුකරුවන් සඳහා අඟය චිකතුකළ සේවාවන් ලබා දීමට අපි බැඳී සිටිමු. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව හා සඵලතාවය වැඩිකරලීම සඳහා අපගේ අභ්‍යන්තර ගනුදෙනුකරුවන්ට වේගවත් හා නිවැරදි තොරතුරු ලබා දෙන්නෙමු.

සමාජය: ජාතික සංවර්ධනයේ කොටස්කරුවෙකු ලෙස අපගේ ප්‍රජාවගේ ජීවන රටාව නගා සිටුවීම සඳහා සේවය කිරීමට අපි පොරොන්දු වෙමු.

ආයතනික වටිනාකම්

අප පෙනී සිටින්නේ

ගෞරවය පුදකරමින් විශ්වාසනීයව කටයුතු කරමු

අප ඉටුකරන සියළුම කාර්යයන්වලදී වෘත්තීයවේදිත්වය හා විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කරමු

අප කරන කාර්යයන් ඉතා කැපවීමෙන් ඉටුකරමින් වගකීම ආරක්ෂා කරමු

අපි විවෘතභාවය ප්‍රදර්ශනය කරමින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට උත්සාහ කරමු

අපි නව්‍යකරණ අදහස් සහ සක්‍රීය විසඳුම් බලාපොරොත්තු වෙමු

ඉගෙනුම සඳහා බලවත් කැමැත්ත සහ බැංකුව සමඟ වර්ධනයවීම සඳහා මහත් ලැදියාව අපි සතු වෙමු

මූල්‍ය විශ්ලේෂතා

	2019	2018	වෙනස
	රු.මි.	රු.මි.	%
පොළී ආදායම	5,982	5,525	8.27
පොළී වියදම්	(3,951)	(3,578)	10.45
ශුද්ධ පොළී ආදායම	2,030	1,947	4.25
බදු පෙර ලාභය	500	480	4.15
බදු	(81)	(235)	(65.75)
බදු පසු ලාභය	419	244	71.42
ආයෝජනය සහ රජයේ පුරැකුම්පත්	1,164	1,149	1.28
ණය හා අත්තිකාරම්	35,893	34,225	4.87
මුළු වත්කම්	47,311	42,597	11.07
ගනුදෙනුකාර තැන්පතු	38,872	34,272	13.42
ණයගැනීම්	1,612	1,983	-18.71
පාර්ශ්වකරුවන්ගේ අරමුදල	5,659	5,187	9.09
අනුපාත විශ්ලේෂණ			
ලාභදායිතා විශ්ලේෂණ	%	%	
ශුද්ධ පොළී ආන්තිකය	4.52	4.60	(1.74)
ස්කන්ධය මත ඉපයීම්	7.73	4.82	60.37
වත්කම් මත ඉපයීම්	1.11	1.13	(1.77)
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය			
ස්කන්ධය/ මුළු වත්කම්	11.96	12.18	(1.78)
ස්කන්ධය ණය හා අත්කිකාරම්	15.77	15.16	4.03
පළමු පෙළ ප්‍රාග්ධනය	22.49	22.65	(0.71)
පළමු පෙළ හා මුළු ප්‍රාග්ධනය	23.22	23.20	0.09
ද්‍රවශීලතාව			
ද්‍රවශීල වත්කම් අනුපාතය	25.09	22.34	12.31
තැන්පතු /ණය හා අත්කිකාරම්	108.30	100.14	8.15
ණය ගැනීම් /ණය හා අත්කිකාරම්	4.49	5.79	(22.49)
ශ්‍රේණිගතකරණය			
වත්කම්වල තත්ත්වය			
අක්‍රීය ණය /ණය හා අත්කිකාරම්	21.21	21.76	(2.53)
මුළු වත්කම්වලට ණය හා අත්කිකාරම්	75.87	80.35	(5.58)

රු.බිලියන 8.61

නිවාස ණය බෙදාහැරීම



මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රාග්ධනය යනුවෙන් අපි සලකනු ලබන්නේ අවශ්‍යයෙන්ම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත ලබාගතහැකි මුදල් සංචිතයයි. මූල්‍යකරණය තුළින් රැස්කරන ප්‍රාග්ධනය, ස්කන්ධය, ණය, මෙහෙයුම් හා ආයෝජන මෙයට ඇතුළත්ය. මෙසේ උපදවන අරමුදල් අවම නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා අනුමත අවදානම් රුචිය තුළ තිරසාරාත්මක ප්‍රතිඵල නිර්මාණය කිරීමේ කටයුතු සහ ප්‍රාග්ධන විශේෂිත ව්‍යාපාර සඳහා යොදා ගනු ලබයි.

දළ විශ්ලේෂණය

2019 වසර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට සැබැවින්ම තීරණාත්මක වසරක් විය.

එයට හේතුව, රු.මි.815.90ක මෙහෙයුම් ලාභයක් (ඒ.අ.බදු, ණ.අ.බදු, ජා.ගො.බදු පෙර) සහ රු.මි. 419.07ක බදු පසු ලාභයක් අත්කර ගනිමින් කැපීපෙනෙන මූල්‍ය කාර්යසාධනයක් සහිතව බැංකුව වසර අවසන් කිරීමයි. 2018 වසර හා සැසැඳිමේදී මේ තුළින් පිළිවෙලින් 11.51% සහ 71.42% ක වැඩිවීම් පෙන්නුම් කරයි. බැංකුව මධ්‍යම ව්‍යාපාර භූමිය තුළ සමස්ත සංවර්ධනයක් පෙන්වා ඇත. යහපත් ව්‍යාපාර ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම, සන්නාමය ශක්තිමත් කරන ව්‍යාපාර සහ උවදුරු යුක්තිසහගතව පරිපාලනය කිරීම හේතු කොට ගෙන ව්‍යාපාර පරිමාවන් හී සැලකියයුතු සංවර්ධනයක් මෙම ජයග්‍රහනවලට මඟ පාදා ඇත.

පොළී පිරිවැය තුළ සිත්ගන්නා සුළු වර්ධනයේ බලපෑම සහ ශුද්ධ පොළී ආන්තිකය තුළ ඉන් ඇති වූ වෙනස ව්‍යාපාර පරිමාවන් හී විශාල වකතු කිරීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පොළී ආදායම 8.27% ක වෙනසක් සහිතව රු.මි. 5,981.51 දක්වා සහ වත්කම් පදනම රු.මි.47,311.43 දක්වා වැඩි විය. මෙය තවත් එක් විශාල ජයග්‍රහනයක් වන අතර, ඉන් එහි ණය කළඹ යහපත් කළමනාකරණය සහ වත්කම්වල විශිෂ්ඨ තත්ත්වය පෙන්නුම් කරයි.

ආදායම් ප්‍රකාශනය පිළිබඳ විශ්ලේෂණය

ආදායම් ප්‍රකාශනයේ සාරාංශය

	2019	2018	වෙනස
	රු.මි.	රු.මි.	
පොළී ආදායම	5,981.51	5,524.86	8.27%
මුළු මෙහෙයුම් ආදායම	2,173.65	2,080.67	4.47%
ඒ.අ.බදු ජා.ගො.බදු හා ණ.අ.බදු පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)	815.90	731.72	11.51%
බදු පෙර ලාභය/ (අලාභය)	499.65	479.73	4.15%
වසර සඳහා ලාභය/අලාභය)	419.07	244.47	71.42%

පොළී ආදායම

2018 වසරට සාපේක්ෂව, පොළී ආදායම 8.27%කින් වැඩි වී ඇත. පොළී ආදායම තුළ 2018 දී වැඩිවීම සඳහා ණය දීමෙන් ඉහළ ආදායම, අතිරික්ත ද්‍රවශීලතාව සහ බැංකු සමඟ ස්ථාපන ප්‍රධාන වශයෙන් හේතු විය. 2018 වසරට සාපේක්ෂව, ණය හා අත්තිකාරම් මත පොළී ආදායම රු.මිලියන 354.87කින් වර්ධනය වූ අතර ණය සහ අනෙකුත් උපකරණවලින් පොළී ආදායම රු.මිලියන 36.38කින් වැඩි විය. බැංකු සමඟ ස්ථාපන 2018 වසර හා සැසැඳිමේදී 9.79%ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කර ඇත.

ශුද්ධ පොළී ආදායම

2019 සඳහා ආදායම් ප්‍රකාශනය තුළ ශුද්ධ පොළී ආදායම රු. මිලියන 2,030.16 ක් වූ අතර එය 2018 වසරට වඩා 4.25%ක වර්ධනයකි. ඇප ගිවිසුම්, අනෙකුත් පොළී උපයන වත්කම් සහ බැංකු සමඟ ස්ථාපනවල වැඩි ඉහළ පොළී අනුපාතවල බලපෑම, ණය, අත්තිකාරම් සහ හිමි මූල්‍ය උපකරණවල වැඩිවීම් ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන පොළී ආදායම තුළ වැඩිවීම මින් පෙන්නුම් කරයි. එමෙන්ම බැංකුවට අයත් මූල්‍ය උපකරණ මත ඉපයීම් ද අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරන ලදී. පොළී ආදායම තුළ වැඩිවීම අනෙකුත් පොළී දරන වගකීම්, ඇප මූල්‍යකරණ මත වැඩි ඉහළ පොළී අනුපාතවල බලපෑම නිසා මෙන්ම මුළු සාමාන්‍ය දිගුකාලීන ණය සහ තැන්පතුවල වැඩිවීම් නිසා මූලික වශයෙන් ඉහළ පොළී වියදම මගින් අර්ධ වශයෙන් හිලව් කරන ලදී.

පොළී නොවන ආදායම

ගාස්තු හා කොමිස් ආදායම, මූල්‍ය ආයෝජනවලින් ශුද්ධ ලාභය /අලාභය, සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වලින් පොළී නොවන ආදායම සමන්විත වේ. ගාස්තු හා කොමිස් ආදායම පොළී නොවන ආදායමේ ප්‍රධාන සංරචකය වන අතර, එයට ණය දීමේදී අයකරන ගාස්තු ඇතුළත්ය. 2019 වසර තුළ, පසුගිය වසරට වඩා 5.46%කින් වර්ධනය වූ ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම 2019 දී පැවති රු. මිලියන 113.33ට සාපේක්ෂව 107.47ක් විය. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් 2019 දී රු.මිලියන 1.84 දක්වා ලඟාවිය. එමෙන්ම ලාභාංශ සහ විවිධ ආදායම ඇතුළත් අනෙකුත් මෙහෙයුම් ආදායම රු.මිලියන 28.32ක් විය.

මුළු මෙහෙයුම් ආදායම

වසර සඳහා ගාස්තු හා කොමිස් ආදායම තරමක් වෙනස් වී තිබුනද, ශුද්ධ පොළී ආදායම හා අනෙකුත් මෙහෙයුම් ආදායම තුළ වැඩිවීම් මුළු මෙහෙයුම් ආදායමේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2019 වසර අවසානයේදී, වාර්තාකළ මුළු මෙහෙයුම් ආදායම රු. මිලියන 2,173.65ක් වූ අතර, පසුගිය වසර හා සැසැඳිමේදී 4.47%ක සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම් කරයි.

මුළු මෙහෙයුම් ආදායම



වත්කම්වල තත්ත්වය හා හානිකරණ අයකිරීම්

ණය කළඹ තුළ වර්ධනය, වත්කම්වල තත්ත්වය තුළ වැඩි දියුණුවීම් සහ යොදාගත් සක්‍රීය අවදානම් කළමනාකරණ ප්‍රවේශයේ ප්‍රතිඵලයක් ලෙස, හානිකරණ වෙන්කිරීම් රු.මි. 131.53 දක්වා අඩුවී ඇත. අනපේක්ෂිත අලාභ සඳහා ස්වාරක්ෂකයක් ඇති කරමින් බැංකුවේ වෙන්කිරීම් ආවරණය මේ තුළින් වර්ධනය කරන ලදී. වත්කම් පදනමේ තත්ත්වය වැඩි කිරීම පිණිස, 2019 මූල්‍ය වසර තුළ බැංකුවේ කළමනාකරණය විසින් පහත සඳහන් යහපත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. ආදායම් මූලාශ්‍ර සහතික කිරීමේ ආදර්ශයක් ආරම්භ කිරීම.
2. ණය යෝජනා සඳහා පෙර බෙදාහැරීම් සහ නියාමන ඒකකයක් ස්ථාපිත කිරීම.
3. නවීන අවදානම් ශ්‍රේණිගතකරණ ආදර්ශයක් හඳුන්වාදීම.

ලාභදායිතාව

2019 මූල්‍ය වසර සඳහා බදු පෙර ලාභය රු.මි. 499.65 ක් වූ අතර, බදු පසු ලාභය රු.මි. 419.07කි. මින් 2018 වසරට සාපේක්ෂව 71.42%ක සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම් කරයි. ජාතිය ගොඩනැගීමේ බදු (NBT), එකතුකළ අගය මත බදු (VAT) සහ ණය ආපසු ගෙවීමේ බදු (DRL) අපගේ ලාභය කෙරෙහි අහිතකරව බලපානු ලැබුවත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකළ අනිවාර්ය ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත අපි පවත්වාගෙන ඇති බව පැවසීමට ලැබීම පිළිබඳ අපි ආඩම්බර වෙමු.

මූල්‍යමය වටිනාකම නිර්මාණය කිරීමේදී ස්කන්ධය මත ඉපයීම් (ROE) මූලික ක්‍රමෝපායික ආදායමකි. කළමනාකරණ ප්‍රවේශයේ ඵලදායිත්වය පිළිබඳ දර්ශකයක් ලෙස එය සේවය කරයි.

බැංකුව 7.73%ක අනෙන්‍යන්‍ය වශයෙන් ආකර්ශනීය ස්කන්ධය මත ඉපයීමක් පවත්වා ගන්නා අතර පෙර වසරට සාපේක්ෂව 60% ට වඩා එය වැඩි වී ඇත. එමෙන්ම, බැංකුවේ වත්කම් මත ඉපයීම් (ROA) අනුපාතය ද 2019 අවසානය වන විට 1.11%ක මට්ටමක් පෙන්නුම් කරන ලදී.

බදු පසු ශුද්ධ ලාභය



ජාතියට දායකත්වය

ජාතියේ පැරණිතම බැංකුව ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකළ අනිවාර්ය ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පවත්වාගනිමින්, බදු සහ අයබදුවලට අමතරව භාණ්ඩාගාරය වෙත විශේෂ ගාස්තු, ලාභාංශ ආකාරයෙන් ජාතියේ සංවර්ධනය කරා එහි දායකත්වය සහ ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය අඛණ්ඩව කරගෙන යයි.

කෙසේවෙතත්, 2019 දී ජාතිය ගොඩනැගීමේ බදු (NBT), එකතුකළ අගය මත බදු (VAT) සහ ණය ආපසු ගෙවීමේ බදු (DRL) සහ ආදායම් බදු තුළින් රජයට දායකත්වය ලෙස රු.මි. 427.98ක් ගෙවා ඇත.

	රු.මි.
එකතුකළ අගය මත බදු	186.99
ජාතිය ගොඩනැගීමේ බදු	24.91
ණය ආපසු ගෙවීමේ බදු	109.57
ආදායම් බදු	106.51
එකතුව	427.98

මූල්‍ය තත්ත්වය පිළිබඳ විශ්ලේෂණය

වත්කම්

මුළු වාර්තාගත වත්කම් පදනම රු. 47,311,436,771 ක් වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 11.07%ක ඉහළ යාමකි. මුළු වත්කම් පදනමට දායකවන අපගේ ඉලක්කගත වත්කම් වර්ධනය, ප්‍රධාන ව්‍යාපාර කටයුතු කෙරෙහි අවධානයේ ශක්තිමත්කම, පොළී උපයන ණය කළඹ සහ මූල්‍ය ආයෝජන අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය බැවින් අපි අපගේ ශේෂ පත්‍රයේ ශක්තිය පවත්වා ගෙන ඇත.

ණය සහ අත්තිකාරම්

ණය සහ අත්තිකාම් (ශුද්ධ) රු.මි.35,893 ක වාර්තාගත පදනමක් මත ඉහළ ගිය අතර, එය 2018 පසුගිය වසරට සාපේක්ෂව 4.87% ක වෙනසකි.

නිවාස ණය, පුද්ගලික ණය සහ ප්‍රතිමූල්‍ය ණය හා අනෙකුත් ණය වැනි පාරිභෝගික ණය මාර්ගවල වැඩිවීම මගින් මුළුමණින්ම මේ සඳහා දායක විය. ණය හා ලැබීම් කළඹ කෘෂිකර්මය, සංචාරක කර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ නිවාස මූල්‍ය යන අංශ කෙරෙහි අවධානය යොමුකරමින් විවිධ අංශ කිහිපයක් හරහා විවිධාංගීකරණය කරන ලදී.

මූල්‍ය සමාලෝචනය - ඉතිරි කොටස...

දළ ණය සහ අත්තිකාරම්

	2019	2018	වෙනස
	රු.	රු.	%
අතුරු නිෂ්පාදන			
උකස්	9,577,227,772	9,323,875,172	2.72%
සේ.අ.අ	8,282,816,696	8,707,071,343	-4.87%
මොටර් රථ	5,799,377	15,443,468	-62.45%
සේවක ණය	1,117,959,770	985,803,833	13.41%
පුද්ගලික ණය	16,648,653,558	14,821,377,959	12.33%
වෙනත්	1,096,396,335	1,076,948,869	1.81%
දළ ණය හා අත්තිකාරම්	36,728,853,508	34,930,520,644	5.15%

වගකීම්

2019 වසර තුළ, මුළු වගකීම් රු. 41,652,768,226 ලෙස වාර්තා වූ අතර 2018 දී එය රු.37,410,284,396 ක් විය. මෙය පසුගිය 2018 වසර හා සැසඳීමේදී 11.34%ක වැඩිවීමකි. නව සේවාදායකයින් දිනාගැනීම, දැනට සිටින ගනුදෙනුකරුවන්ගේ ශේෂ සහ ආයතනික තැන්පතු අප විසින් වර්ධනය කළ බැවින් 2018 වසරට සාපේක්ෂව 13.42%ක සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම් කරමින් රු.මි.38.872කින් වැඩි වූ ගනුදෙනුකාර තැන්පතු මෙයට දායක විය. ඒ අතරම අනෙකුත් වගකීම්වල අඩුවීමක් පෙන්නුම් කළ අතර ණය සුරැකුම්පත් රු.මි. 110.18ක් විය.

තැන්පතු කළඹ

සුදුසු වෙළෙඳපොල තුළ ඉහළ තරඟකාරිත්වය සහ උච්චාවචන ආර්ථිකය (පාස්කු ප්‍රහාර නිසා) සමඟ, ඉතුරුම් තැන්පතු, ස්ථාවර තැන්පතු සහ අනෙකුත් තැන්පතු (යෝජනා ක්‍රම) තුළ සුවිශේෂී සංඛ්‍යාවක් අත්කර ගැනීමට අපට හැකි වූ අතර, ඒ අනුව බැංකුවේ මුළු තැන්පතු පදනම පෙර වසරට සාපේක්ෂව 13.42%ක සැලකියයුතු වැඩිවීමක් සනිටුහන් කරමින් රු.මි. 38.872 දක්වා වැඩි විය. ගනුදෙනුකාර තැන්පතු රඳවාගැනීම සහ නව ගනුදෙනුකරුවන් අත්කරගැනීම වර්ධනය කරන ඵලදායී කළමනාකරණ ප්‍රතිපත්ති තුළින් ගනු ලැබූ විචක්ෂණ කළමනාකරණ ව්‍යවහාර මේ තුළින් පිළිබිඹු කරයි. මෙවැනි උපයාගත් තැන්පතු අරමුදල් මූලික වශයෙන්ම රජයේ සුරැකුම්පත්වල ආයෝජනයට වඩා ණය බෙදාහැරීම සඳහා යොදාගනු ලැබූ අතර, ඒ තුළින් සැලකියයුතු ලෙස තැන්පතුවලට රජයේ සුරැකුම්පත් අනුපාතය පහත හෙළන ලදී.

තැන්පතු පදනම



ද්‍රවශීලතා අනුපාතය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපත්‍රලාභී විශේෂ රජයේ බැංකුවක් (LSB) ලෙස, 20% ක අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතයක් පවත්නා ගැනීම අනිවාර්යය. 1988 අංක 30 දරන බැංකු පනතේ 86 වගන්තියට අනුකූලව ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් බැංකුව විසින් ගණනය කළ යුතුවන අතර, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය 2019 වසර අවසානය වන විට 25.09% මට්ටමේ පැවතින.

බාසල් III අනුකූලව, ද්‍රවශීලතා ආවරණ අනුපාතය මගින් අරමුණු කරන්නේ දින දර්ශනයේ දින 30ක ද්‍රවශීලතා පීඩන ක්‍රියාදාමය තුළ එහි ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් බාධාවක් නැති ඉහළ තත්ත්වයේ වත්කම් බැංකුවක් සතුවන බව සහතික කිරීමයි. ඉහළ තත්ත්වයේ ද්‍රවශීලතා වත්කම් වටිනාකමේ සුළු අඩුවීමක් හෝ යම් අලාභයක් නොමැතිව මුදල් බවට පරිවර්තනය කරගත හැකි මුදල් හෝ වත්කම්වලින් සමන්විත වන අතර, ඒ අනුව, 2019 වසර අවසානයේදී 121.05%ක් වූ බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 100% ක ව්‍යවස්ථාපිත අවමයට වඩා ඉහළ අගයක් ගනී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකළ නිර්වචන පරිදි ස්ථාවර අරමුදල් කරා පිවිසීමට බැංකුවට ශක්තිමත්ව සහයවන අතර, 100%ක අවම අවශ්‍යතාවයට අනුව ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 2019 දෙසැම්බර් 31 දිනට 137% ක් විය.

කළමනාකාරිත්වය

ආයතනික යහපාලනය සඳහා
අපගේ නායකත්වය සහ කැපවීම.



සභාපතිතුමාගේ සමාලෝචනය

මුළු වත්කම් වර්ධනය
11.07%.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ (SMIB) වාර්ෂික වාර්තාව සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමට ලැබීම මට සතුටකි. සලකා බලන වර්ෂය මෑත ඉතිහාසය තුළ වඩාත් අභියෝගාත්මක වසරක් වූ අතර, එය එසේවුවත්, රටේ අහිතකර ආර්ථික වාතාවරණය සහ මූල්‍ය වෙළෙඳපොල අඩු වර්ධනය තුළ බැංකු ක්ෂේත්‍රය සහ මෙම බැංකුව සඳහා ඉහළ පීඩන පරිසරය හමුවේවුවත්, යහපත් මූල්‍ය කාර්යසාධනයක් ලබාදීම තුළ බැංකුව සාර්ථක වී ඇත. කෙසේවෙතත්, මෙම වාසිඅවාසි හමුවේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලයේ දුර දක්නා නුවනැති නායකත්වය සහ බැංකුවේ මෙහෙයුම්වලට පාදක වූ ශක්තිමත් ක්‍රම සහ ක්‍රියාවලි හේතු කොට ගෙන සැලකියයුතු මූල්‍ය කාර්යසාධනයක් ලබා දී ඇත.

බැංකුවේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ පැවති බාහිර පීඩනයන් හමුවේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 71.42%ක වර්ධනයක් සලකුණු කරමින් පෙර වසර තුළ පැවති රු.මි. 244.47ට සාපේක්ෂව රු.මි. 419.07ක බදු පසු ලාභයක් වාර්තා කළේය. 2019 වසර සඳහා මෙහෙයුම් ලාභය රු.මි. 815.90 ක් වාර්තා කරමින් 11.51%කින් වැඩි වී ඇත. 11.07%ක වාර්ෂික වර්ධනයක් පිළිබිඹු කරමින් රු.මි. 47,311.43ක වත්කම් පදනමක් වාර්තා කිරීම සඳහා ණය කළඹ සහ ද්‍රවශීල වත්කම්වල තත්ත්වය නියාමනය සම්බන්ධ පෙර වසරේ එහි ක්‍රමෝපාය බැංකුව අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මානව ප්‍රාග්ධනය ලාභදායිතාව කරා ඉදිරියට ගමන් කළ අතර බැංකුවේ තිරසාර මෙහෙයුම් නගා සිටුවයි. ඒ අනුව බැංකුව, පුහුණුව, සංවර්ධනය සහ සේවකයාගේ සුභසාධනය තුළ අඛණ්ඩව ආයෝජනය කරන අතර, වඩා පුළුල් මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වීම දෙස බැලීම තුළින් සමාලෝචිත වසර තුළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ක්‍රියාත්මක කළ තරගය පිළිබඳ හැඟීමක් ලබා දෙනු ඇත.

සාර්ව- ආර්ථික පසුබැස්ම

2018 වසරේ පැවති 3.2%ක දළ දේශීය නිෂ්පාදිත වර්ධනයට සාපේක්ෂව 2.6%ක ඉතා දුර්වල වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 දී ශ්‍රී ලංකා ආර්ථිකය පහළ අගයකින් වර්ධනය විය. සමාලෝචිත මූල්‍ය වසර තුළ, විවිධ අභියෝග දක්නට ලද අතර, ඉන් ප්‍රධාන වන්නේ 2019 අප්‍රේල් විනාශකාරී පාස්කු ප්‍රහාරයයි. සමාලෝචිත වසරේ පළමු අර්ධය තුළ වර්ධනය මධ්‍යස්ථ වූ අතර වසරේ දෙවැනි අර්ධය ජනාධිපතිවරණය පවත්වන ලද අතර ඉන් පසුව, ස්ථාවරත්වයේ මූලිකාගංයක් නැවත ප්‍රකෘතිමත් කරන ලදී.

මේ සමඟ, සමස්ත අඩු ආර්ථික වර්ධනයට සමගාමීව 2019 වසරේ පළමු අර්ධය තුළ විරැකියා අනුපාතය තරමක් ඉහළ ගිය අතර, සාධාරණ පරාසයක් තුළ උද්ධමනය අඛණ්ඩව පැවතුනි. දුර්වල ආර්ථික වර්ධනය බැංකුවේ ණය දීම පමණක් නොව අයකිරීම් තුළ දී නතරවී බලා සිටීමේ ප්‍රවේශයකී ඇති කරමින් ව්‍යාපාරික විශ්වාසය සහ බැහැරකළ හැකි ආදායම තුළ පහත වැටීමකට හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුව වෙළෙඳපොල උච්ඡාවචනය අඩුකිරීම සඳහා වසර තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරන ලද අතර, දුර්වල ආර්ථික වර්ධනය, මුදල් ක්‍රමයේ සහ ණය ප්‍රසාරණයේ අඛණ්ඩ පහත වැටීම වැලැක්වීම සඳහා සහ ගෝලීය මූල්‍ය ප්‍රතිපත්ති පහසු කිරීම සඳහා අනුග්‍රාහක මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයක් යොදා ගනු ලැබිය.

ක්ෂේත්‍රයේ කාර්යසාධනය

අභියෝගාත්මක වෙළෙඳපොල තත්ත්වයන් යටතේ වුවත් මූල්‍ය ආයතන ඔරොත්තුදීම අඛණ්ඩව පෙන්නුම් කරන ලදී. වෙළෙඳපොල පීඩනයන්ට ප්‍රතිචාරාත්මකව, බැංකු ක්ෂේත්‍රයේ ණය වර්ධනය වේගයෙන් පහළ වැටුණ අතර අක්‍රිය ණය අත්තිකාරම් වැඩිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ධිත ණය අලාභ වෙන්කිරීමේ අයකිරීම්, වඩා ඉහළ මෙහෙයුම් වියදම් සහ බදු ඇති කරමින් බැංකු ක්ෂේත්‍රයේ ලාභදායිතාව පහත වැටුණි. වත්කම්වල තත්ත්වය පිරිහීම අක්‍රිය ණය වල (NPLs) වැඩිවීමක් පිළිබිඹු කරන ලද අතර, අහිතකර කාලගුණ තත්ත්වයන්, දේශපාලන



> **සමාලෝචිත වර්ෂය තුළ පැවති බාහිර පීඩනයන් හමුවේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 71.42%ක වර්ධනයක් සලකුණු කරමින් පෙර වසර තුළ පැවති රු.මි. 244.47ට සාපේක්ෂව රු.මි. 419.07ක බදු පසු ලාභයක් වාර්තා කළේය. 2019 වසර සඳහා මෙහෙයුම් ලාභය පෙර වසරට සාපේක්ෂව 11.51% ක වර්ධනයක් පෙන් වූ අතර එය රු.මි. 815.90 ක් ලෙස වාර්තා විය.**

අවිනිශ්චිතතාව සහ 2019 අප්‍රේල් පාස්කු ඉරිදා ප්‍රහාර හේතු කොට ගෙන ඇති වූ අහිතකර ව්‍යාපාර පරිසරය එයට හේතු විය

ඉහත සාධක නිසා ඇති වූ අභියෝගාත්මක ව්‍යාපාර පරිසරය අඩු ණය වර්ධනයක් ඇති කරමින් වඩා පහළ ණය සඳහා අඩු ණය වර්ධනයක් ඇති කරමින් ණය සඳහා වඩා පහල ඉල්ලුමකට හේතු වූ අතර වත්කම් වර්ධනය තුළ පහත වැටීමකට එය දායක විය. ණය තුළ වර්ධනය 2018 දී පැවති 19.6% සිට 2019 වසර තුළ 5.6% දක්වා සැලකියයුතු ලෙස අඩු විය. කෙසේවෙතත්, බැංකු ක්ෂේත්‍රය විසින් නියාමන අවම අවශ්‍යතාවන්ට වඩා ඉහළ
ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව පවත්වා ගනු ලැබීය. පහසු මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය ද්‍රවශීලතා මට්ටම් ශක්තිමත් කරමින් බැංකුවල වත්කම් කළඹ තුළ ඉපයීම ඉහළ නංවන ලදී.

තවද, ණය සහ අත්තිකාරම්වල යුතුකම් පැහැර හැරීමේ මට්ටම් 2018 වසරේ පැවති 3.4%ට සාපේක්ෂව 2019 අවසානයේදී 5% ක අඩීය ණය අනුපාතයක් වාර්තා කිරීම දක්වා ඉහළ ගිය බැවින්, සමාලෝචිත වසර තුළ ණය අවදානම ඉහළ අගයක පැවතුණි. බැංකු ක්ෂේත්‍රයේ බදු පසු ලාභය 2019 දී රු.බි. 111.7ක් වූ අතර එය පෙර වසර හා සැසඳීමේදී 11%කින් සංකෝචනය වීමකි. අභියෝගාත්මක සාර්ව ආර්ථිකය හමුවේවුවත්, බැංකු ක්ෂේත්‍රය නියාමන අවම අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් යහපත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත (CAR) මගින් සහයවෙමින් ශක්තිමත්ව රඳා පැවතිනි.

පරිනාමනය වන ක්‍රමෝපායන් සමඟ අවදානම් අවම කිරීම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව තිරසාර වර්ධනයට සහයවන අතර, ව්‍යවසාය තුළ අවදානම සුරක්ෂිත කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC) සහ ව්‍යාපාර අඛණ්ඩතා මෙහෙයුම් කමිටුව (BCP) ඒවායේ පාලනය ඉටුකිරීම කෙරෙහි ප්‍රමාණවත්ව අවධානය යොමු කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අවදානම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමක් කරමින්, අවදානම් ණය නැවත තක්සේරු කිරීමට සහ මුල් අනතුරු සංඥා හඳුනා ගැනීමට ණය සමාලෝචන යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත. ආදායම් මූලාශ්‍ර සහතික කිරීමේ ආදර්ශය (ISVM) බැංකුවේ ණය අවදානම අවම කිරීමට සංවර්ධනය කරන ලදී.

මෙහෙයුම් අවදානමේ පැවැත්ම ගනුදෙනුකරුවන් තක්සේරු කිරීමට සහ ඔවුන් මූලික ගනුදෙනුවට ඇතුළත් වන අවස්ථාවේදී පහළ, මධ්‍යම සහ ඉහළ අවදානම් වර්ගවලට වර්ගීකරණය කිරීම සඳහා ණය අනුකෘතියක් නිර්මාණය කිරීමට හේතු වී ඇත. අවදානම් අනුකෘතියේ 2 පිටපත ද බොහෝ ගනුදෙනුකරුවන්ගේ කඩිසර ක්‍රියාමාර්ග සමඟ හඳුන්වා දී ඇත. එමෙන්ම, අවදානම් පාලන ස්වයං-තක්සේරු කිරීමේ ප්‍රතිපත්තියක්ද සියලුම දෙපාර්තමේන්තු සඳහා සේවයේ යොදවන ලදී.

බැංකුව තුළ මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම පිණිස විස්තීර්ණ අවදානම් පාලන ස්වයං-තක්සේරු කිරීම් පැවැත්වීම දැඩි ණය පාලනයන් පෙන්වා දීම සඳහා බැංකුවේ බැඳීම ඉස්මතු කිරීම අත්‍යවශ්‍යය. අවදානම් කළමනාකරණ කණ්ඩායම කාර්තුමය වශයෙන් අලාභ සිදුවීම් වාර්තාකරණ මාර්ගෝපදේශ සමඟ මෙහෙයුම් අවදානම් සිදුවීම්/ අවස්ථා වාර්තා කිරීම සඳහා ආකෘතියක් සංවර්ධනය කිරීමට තවදුරටත් පියවර ගෙන ඇත.

ලාභදායිතාව සඳහා අභියෝග

අඩු වර්ධන අංශයක තරඟකාරිත්වය ක්ෂේත්‍රයට බලපාන ප්‍රධාන අභියෝගවලින් එකකි. තරඟකාරිත්වයේ වාසියක් ලබාගැනීමට සහ වඩා ඉහළ වෙළෙඳපොල කොටසක්, ව්‍යාපාර පරිමා සහ ලාභදායිතාවක් අත්කර ගැනීමට බැංකුවේ සේවා සහ නිෂ්පාදන ගැලපීම සඳහා බැංකුවට අඛණ්ඩව අභියෝගවලට මුහුණ සීමට සිදුවේ.

අමතර ප්‍රාග්ධනය සඳහා වැඩිවන අවශ්‍යතාව තවදුරටත් තරඟකාරිත්වය බලවත් කිරීමට පමණක් සේවය කරයි. වඩා ඉහළ බදු සහ ණයවල තත්ත්වය පිරිහීම බැංකුකරුවන්ගේ අනෙකුත් ගැටළු වෙති. ඉහත සාධක සයිබර් ආරක්ෂාව සහ නියාමන අනුකූලතාවයේ වැඩිවන පිරිවැය මගින් තවදුරටත් ඉහළ දමන අතර, විශේෂයෙන් මුදල් විශුද්ධිකරණ විරෝධී රෙගුලාසි බැංකුවල ලාභදායිතා අනුපාත කෙරෙහි සැලකියයුතු පීඩනයක් ඇති කරයි. වඩා ඉහළ අරමුදල් පිරිවැය ණය ප්‍රාග්ධනය රුස්කරන අවස්ථාවලදී බොහෝ බැංකු විසින් මුහුණ දෙන තවත් එක් බාධාවකි. මෙම අභියෝගාත්මක පරිසරය තුළ, වඩා කුඩා බැංකුවලට පීඩනයන් දරා ගැනීමට නොහැකිවන බැවින්, ප්‍රමාණය සහ පරිමාව සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි.

ආර්ථික අනාගත දැක්ම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අපි ක්ෂේත්‍රයේ දැඩි ආර්ථික තත්ත්වයන් හමුවේ ශක්තිමත් ශේෂ පත්‍රයකින් සහය වෙමින් සහ යහපත් මූල්‍ය කාර්යසාධනයක් ලබාදෙමින්, පහසුවෙන්ම ස්ථානගත වී ඇත. රජයට අයත් ආයතනයක් ලෙස, රට මෙහෙයවනු ලබන දිසාව තුළ අභිමානයක් අපි ගනිමු. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් මෙහෙයවන පවත්නා රජයේ අනාගත ආර්ථික ක්‍රමෝපායන් 2025 වන විට වාර්ෂික දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය 6.5% දක්වා සහ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇ.ඒ.ඩො. 69,500 දක්වා වැඩි කිරීමේ අපේක්ෂිත සැලසුම් සංක්ෂිප්ත කරනු ඇත. 5%ට පහළින් විරැකියා සහ උද්ධමනය තබාගැනීම වැනි අනෙකුත් ඉලක්ක මතු බලාපොරොත්තු සහිත වේ. ජාතිය සඳහා දැක්ම ප්‍රකාශනය තුළ ඇතුළත් තනි අංකයේ ණය පොළි අනුපාතයක් පෙර නිමිති දක්වයි. රජය ව්‍යාපාර සහයක ප්‍රතිපත්තිවලට දැනටමත් ප්‍රමුඛත්වය ලබා දෙන අතර, ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැංවීමට සම්පූර්ණ සහය ලබාගැනීමට ව්‍යාපාරවලට සූදානම් විය හැකිය.

ආරක්ෂිත අනාගතයක් සඳහා ක්‍රමෝපායන්

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් අත්කර ගැනීම කරා, 2022 දෙසැම්බර් 31 දිනට පෙර රු.බි.7.5ක අවම නියාමන ප්‍රාග්ධනය ඉටුකිරීමට සහ 10%ක ස්කන්ධය මත ඉපයීම සපුරාලීමට එක් එක් වසරේ 5%ක වැඩිවීම පවත්වා ගැනීමට අපි කටයුතු කරමින් සිටිමු. 2020 වන විට නව අරමුදල් අවශ්‍යතාවන්ගෙන් 1%ක් ආවරණය කිරීමට ණය පහසුකම් සහ ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රමවලින් අඩු පිරිවැය අරමුදල් ලබාගැනීම ප්‍රධාන උත්සාහයක් වන අතර, මෙය ඉන්පසුව එක් එක් වසර තුළ 2%කින් වැඩි කරනු ඇත. එමෙන්ම බැංකුව 2020 වනවිට ආදායමට පිරිවැය අනුපාතය 51% සිට 50% දක්වා සහ ඉන්පසුව සෑම වසරකම 3% බැගින් අඩුකිරීමට අපේක්ෂා කරයි. මේවා පැහැදිලිව කළහැකි ඉලක්ක වන අතර ඒවා අත්කරගැනීම සම්බන්ධව සම්පූර්ණ විශ්වාසය අප සතු වේ.

සභාපතිතුමාගේ සමාලෝචනය - ඉතිරි කොටස...

"රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් අත්කර ගැනීම කරා, 2022 දෙසැම්බර් 31 දිනට පෙර රු.බි.7.5ක අවම නියාමන ප්‍රාග්ධනය ඉටුකිරීමට සහ 10%ක ස්කන්ධය මත ඉපයීම සපුරාලීමට එක් එක් වසරේ 5%ක වැඩිවීම පවත්වා ගැනීමට අපි කටයුතු කරමින් සිටිමු."

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ශේෂ පත්‍රය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස, කෙටිකාලීන විශාල ප්‍රමාණයේ තැන්පතු මත කල්පිරීම් නොගැලපීම සහ සංකේන්ද්‍රණය අඩුකිරීමට දිගුකාලීන අරමුදල් අපි සොයමින් සිටිමු. බැංකුවේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් ද ශක්තිමත් කරනු ඇති අතර උසස් තාක්ෂණ අවස්ථා සහය කරගනිමු. සමස්ත ශාඛා ජාලය 2020 දී එහි සියලුම ශාඛා හරහා බැංකුවේ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාලය සේවයේ යෙදවීම සඳහා පළමු පියවර ලෙස 2020 දී නව බැංකුකරණ විසඳුම් සමඟ ඒකාබද්ධ කරනු ඇත. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2022 වන විට ගනුදෙනුකරුවන්ට අන්තර්ජාල බැංකුකරණ පහසුකම ලබාදීමේ එහි දැක්ම ඉටුකිරීම කරා කටයුතු කරමින් සිටී.

බැංකුව එහි ණය කළඹ තවදුරටත් විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, අපගේ පද්ධති සහ ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීම ක්ෂේත්‍රය තුළ මතුවන ප්‍රවණතා ගැලපීම සහ වර්ධනය සඳහා නිවැරදි අවස්ථාව නිර්මාණය කිරීම සඳහා බැංකුව සූදානම් කරමින් සිටී.

ස්තූතිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහයෝගය සහ උපදේශය සඳහා ස්තූතිය පුදකිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. බැංකුවේ සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ කාර්යය මණ්ඩලය අප බැංකුවේ පොදු දැක්ම ක්‍රියාත්මක කිරීමට වෙහෙස නොබලා කටයුතු කර ඇත. මූල්‍ය වසර තුළ ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ, ගරු අගමැති සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ, නියෝජ්‍ය අමාත්‍ය, සංවර්ධන බැංකු සහ ණය යෝජනා පිළිබඳ රාජ්‍ය ඇමති, මහ භාණ්ඩාගාරයේ ලේකම්, මහ බැංකුවේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති සහ අනෙකුත් නියාමන ආයතන ප්‍රධානීන් වෙත ඔවුන්ගේ මඟපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාව පළකිරීමට මම කැමැත්තෙමි.



ආචාර්ය උදය ශ්‍රී කාරියවසම්
සභාපති

සාමාන්‍යාධිකාරී/ ප්‍රධිනිගේ සමාලෝචනය

බදු ගෙවීමෙන් පසු ලාභ වර්ධන වේගය
71.42%.

2019 මූල්‍ය වසර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) සඳහා අභියෝගාත්මක වසරක් විය. විනාශකාරී පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර තුළින් සංචාරක, ඉදිකිරීම් සහ අනෙකුත් කර්මාන්තවලට බලපෑම් කරමින් ආර්ථිකය කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති විය. ප්‍රහාරයෙන් පසු ගැටළුකාරී ආරක්ෂක තත්ත්වය ව්‍යාපාර අනිශ්චිතතාව නිර්මාණය කළ අතර එය සමස්ත ආයෝජන අංශ සහ ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ලදී. කෙසේවෙතත්, 2019 අවසන් කාර්තුවේදී වෙනස්වීම් මගින් මෙරට ආර්ථික කටයුතු නංවාලන ප්‍රශස්ථභාවය ඇති කරන මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්තිවල හිතකර වෙනස්වීම් හඳුන්වා දෙන ලදී.

මෙම අභියෝගාත්මක ව්‍යාපාර වාතාවරණය පහත වැටීම තුළ, බාහිර තත්ත්වයන් හමුවේවුවත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශක්තිමත් කාර්යසාධනයන් පෙන්නුම් කර ඇත. ව්‍යාපාර බාහිර තත්ත්වයන්ගෙන් බැංකුව ආරක්ෂා කලහැකි ශක්තිමත් මූලධර්ම පදනමක් මත අප බැංකුව ගොඩ නැගී ඇති බව මින් සනාථ කරයි.

ශක්තිමත් මූල්‍ය කාර්යසාධනය

මෙහෙයුම් සංදර්භය තුළ වෙනස්වන ගතිකතා හමුවේ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2019 මූල්‍ය වසර තුළ ප්‍රසංශනීය කාර්යසාධන මට්ටම් පවත්වා ගනු ලැබීය. 2018 වසර තුළ රු.බිලියන 5.5 සිට රු.බිලියන 5.9 දක්වා 8.27%කින් එහි පොළී ආදායම වැඩි කරගැනීමේදී බැංකුව සාර්ථක විය. නිවාස ණය, පුද්ගලික ණය සහ අනෙකුත් ණය සඳහා ණය ඉල්ලුම මගින් ඉදිරියට ගිය වැඩි වූ ණයදීම මගින් පිළිබිඹුකළ වර්ධිත ව්‍යාපාර පරිමාවන් මගින් ඉපයීම්වල මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් දායක විය. මනාව විවිධාංගීකරණය කළ කළඹක් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්මය, සුළු හා මධ්‍ය පරිමාණ අංශය, ක්ෂුද්‍ර, නිවාස සහ සංචාරක වැනි විවිධ ක්ෂේත්‍ර තුළ එහි ණය මුසුව විවිධාංගීකරණය කිරීමට දැනුවත් ප්‍රවේශයක් බැංකුව විසින් යොදා ගනු ලැබීය.

බැංකුවේ ශුද්ධ බදු පසු ලාභය රු. මිලියන 419 දක්වා වැඩි වූ අතර, 2018 වසරට සාපේක්ෂව 71.42ක වර්ධනයක් ඉන් නියෝජනය කරයි. ණය කළඹ තුළ වර්ධනයෙන් උත්පාදිත වඩා ඉහළ ආදායම් මට්ටම් තුළින් මූලිකවම මෙය අත්කරගන්නා ලදී. බැංකුවලින් ස්ථාපන සමඟ අමතර ද්‍රවශීලතාව සඳහා වැඩිදුර ආයෝජන ක්‍රමෝපායන් ද ආදායම් මට්ටම් වැඩි කරන ලදී. ණය කළඹ සහ බැංකුවට අයත් මූල්‍ය උපකරණ වැනි අනෙකුත් පොළිය දරන වත්කම් වැඩිවීම හේතු කොට ගෙන පොළී ආදායම වැඩි වී ඇත. සමස්ත මට්ටමේදී, ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ ණය ආපසු ගෙවීමේ බදු ශුද්ධ බදු පෙර මෙහෙයුම් ලාභයට බලපාන ලදී.

ණය සහ අත්තිකාරම් ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කල අතර, 2019 අවසානයේදී එය රු. බිලියන 35.89ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ මුළු වත්කම් 2019 වසර තුළ රු. බිලියන 47.31 දක්වා වැඩි වූ අතර ඉන් 11.07%ක වැඩිවීමක් සනිටුහන් කරයි. ප්‍රධාන ව්‍යාපාර කටයුතුවලින් බැංකුවේ ආදායම් ප්‍රවාහය ඉහළ නැංවීමට සහය වූ බැංකුවේ ශක්තිමත් ව්‍යාපාර ප්‍රසාරණ ක්‍රමෝපායේ සාර්ථකත්වය මින් පිළිබිඹු කරයි. පොළිය දරන ණය කළඹ සහ මූල්‍ය ආයෝජනවල වැඩිවීම තුළින් උද්පාදිත ආදායම මුළු වත්කම් පදනම තුළ වැඩිවීම තුළ පිළිබිඹු කරයි.

ණය පොළී අනුපාතවල වැඩිවීම දිගුකාලීන ණය සහ තැන්පතුවලින් ප්‍රධාන වශයෙන් සමන්විත පොළිය දරන වගකීම් මත පොලී වියදම් ඉහළ දමන ලදී. පොළී ආන්තික මට්ටම් මත සෘජු බලපෑමක් තිබියහැකි මෙම සැලකියයුතු පොළී වියදම් වැඩිවීම වසර තුළ ව්‍යාපාර පරිමාවන් හි සැලකියයුතු වැඩිවීම මගින් හිලව්කර වැඩි ප්‍රමාණයකින් කළමනාකරණය කරයි. එබැවින්, ණයගැහීම්වල වැඩි වූ පිරිවැය හමුවේ වුවත් 4.52%ක පොළී ආන්තිකයක් පවත්වා ගැනීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට හැකිවී ඇත.

සමාලෝචනයට භාජනයවන වසර තුළ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතු පදනම සැලකියයුතු ලෙස වැඩි වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් එහි ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු කළඹ තුළ පිළිවෙලින් 7.01%ක සහ 14.15%ක වැඩිවීම දායක විය. මින් පෙන්නුම් කරන්නේ අප බැංකුව කෙරෙහි



"ණය සහ අත්තිකාරම් ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කල අතර 2019 අවසානයේදී එය රු. බිලියන 35.89ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ මුළු වත්කම් 2019 වසර තුළ රු. බිලියන 47.31 දක්වා වැඩි වූ අතර එය 11.07%ක වර්ධනයක් වාර්තා කළේය."

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරිනිගේ සමාලෝචනය - ඉතිරි කොටස...

ගනුදෙනුකරුවන් තබා ඇති විශ්වාසය හා පක්ෂපාතිත්වයයි. දැනට පවත්නා තැන්පතු සඳහා රඳවාගැනීමේ මට්ටම් සහතික කරමින් බැංකුව නව තැන්පතු සඳහා සේවාදායකයින් අත්කර ගැනීමේ ක්‍රමෝපායන් අඛණ්ඩව දියත් කරන ලදී. ආර්ථික කටයුතුවල සංවර්ධනයට සහයවන නව ණය බෙදාහැරීම් ඉදිරියට ගෙන යාමට මෙම අරමුදල් උපයෝගි කර ගැනීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදෙන ලදී.

වසර තුළ, ණය අනුමත කිරීමේ අදියරේ තීරණ ගැනීම ක්‍රමවත් කිරීමේ සහ ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිව ක්‍රියාවලි කිහිපයක් හඳුන්වා දෙන ලදී. ආදායම් මූලාශ්‍ර සහතික කිරීම, අවදානම් ශ්‍රේණිගතකරණ ආදර්ශය, පූර්ව බෙදාහැරීමේ සහ නියාමන කාර්යයන් වැනි මෙවැනි මූලිකාරම්භ කිහිපයක් ණය ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ අතර අක්‍රිය ණය අත්තිකාරම් (NPA) වර්ගය තුළට නව බෙදාහැරීම් විතැන්වීම අවම කිරීමට කාර්යක්ෂමව දායක වේ. අපගේ වර්ධනය ප්‍රතිඵල මගින් වන්දි ගෙවනු ලබන බව මින් සහතික කරයි. හඳුන්වාදුන් මෙවැනි ක්‍රියාමාර්ගවල ධනාත්මක බලපෑම අනාගත වසරවල දක්නට ලැබෙනු ඇතැයි අපිට විශ්වාසය.

මූල්‍ය ස්ථාවරත්වය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්කන්ධය මත ඉපයීම (ROE) 7.73%ක සතුටුදායක මට්ටමක පවත්වා ගනු ලැබීය. 100%ක නියමිත අනුපාතයට වඩා ඉහළ වනම් 137%ක අනුපාත මට්ටම පවත්වා ගනිමින් බැංකුවේ ශුද්ධ ස්ථාවර අරමුදල්කරණ අනුපාතයට බැංකුව අනුකූල වී වීය ඉක්මවා ඇත. වීමෙන්ම බැංකුව යහපත් ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගන්නා අතර බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2019 අවසානයේදී 121.05%ක් වූ අතර වීය 2018 අවසානය වන විට 83.91% මට්ටමේ පැවතුනි. ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතය 2019 වසර අවසානය වන විට ඉතා සතුටුදායක මට්ටමක වනම් 25.09% මට්ටමේ පවත්වා ගනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමකළ ව්‍යවස්ථාපිත මට්ටම්වලට වඩා ඉහළින් අපගේ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකා අනුපාත පවත්වාගෙන තිබීම සම්බන්ධයෙන් අපි සැබැවින්ම ආඩම්බර වෙමු.

ජාතියට දායකත්වය

පාස්කු ප්‍රකාරයෙන් පසු කාලය තුළ, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන මට්ටම් කෙරෙහි සැලකියයුතු ලෙස බලපෑම් විය. මෙම අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ, ජාතිය ගොඩනැගීමේ බදු, ණය ආපසු ගෙවීමේ බදු සහ අගය එකතුකළ බදු වැනි ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීම මගින් ජාතික ආර්ථිකයට බැංකුව දායක වී ඇත. වසර තුළ රජය වෙත බැංකුවේ සමස්ත දායකත්වයන් රු.මිලියන 397ක් විය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පරිනාමනය

වේගයෙන් වෙනස්වන ලෝකයේ ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කටයුතු කරන බැවින්, අපගේ පාර්ශ්වකරුවන්, ගනුදෙනුකරුවා, ප්‍රජාව සහ කොටස්හිමියන් වෙත වටිනාකම නිර්මාණය කිරීමට බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස අපි කැප වී සිටිමු.

වඩාත් ගනුදෙනුකාර කේන්ද්‍රීය ගතික බැංකුවක් ලෙස, අප පරිනාමනය වීම සහ අප ඉදිරියට යන බැවින්, මනාව නිශ්චිත ක්‍රමෝපායක් අපි ක්‍රියාවට නංවා ඇත. වඩාත් සහකම්පනයෙන් හා විශ්වාසවන්තවීම මගින් අනෙකුත් ඉහළ නංවන ලද සේවා මට්ටම් සමඟ භෞතික හා අස්පෘශ්‍ය අංශවලින් පෙළ ගැන්වීමෙන් සියලුම අංගයන් හී සේවා තත්ත්ව පරාමිති ශක්තිමත් කර උසස් කිරීමට ප්‍රමුඛතාව ක්‍රියාවට නංවා ඇත. තම බැංකුකරණ ගනුදෙනු සඳහා තොරතුරු තාක්ෂණ අවස්ථා සොයන සහ අගය කරන සහශ්‍රයේ ගනුදෙනුකාර පරම්පරාව වෙත යොදා ගැනීම සඳහා බැංකුවේ සේවාවන් නවීකරණය කිරීමට අපි කටයුතු කරමින් සිටිමු.

ඒ අනුව, අපගේ ගනුදෙනුකාර සේවා කොටස වැඩිකිරීමේ අවස්ථාව සකස් කරන සේවා මාන පහ හඳුන්වා දීමට අපි කල්පනා කරමින් සිටිමු. ජාතියේ ප්‍රමුඛ නිවාස බැංකුව ලෙස ඉදිරියට යාමේ හැකියාව මින් අප වෙත ලබා දේ. මෙම මාන පහ පහත පරිදි වේ:

විශ්වාසනීයත්වය

ප්‍රධාන ගනුදෙනුකාර සේවා පරාමිතියක් ලෙස අපි විශ්වාසනීයත්වය හඳුනා ගනිමු. සෑම අවස්ථාවකදීම විශ්වාස සහ අනුරූප වීම ප්‍රධාන සේවා සාධකයන් වන අතර, වියඅපගේ වටිනා ගනුදෙනුකරුවන් අතර විශ්වාසය සහ පක්ෂපාතිත්වය දිනා ගැනීමට හා ගොඩනගාගැනීමට සෘජුවම සහය වේ.

සහතකිකවීම

සහතික කිරීම දෙවැනි මානය වන අතර ඉන් සංවර්ධනය වීමට අපි බලාපොරොත්තු වන බව සහතික කරයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ජාතියේ නිවාස බැංකුව සහ සියලුම නිවාස අවශ්‍යතා සඳහා එකම ස්ථානයක් ලෙස ශ්‍රී ලාංකිකයින් විසින් විශ්වාස කරන බැංකුවක් ලෙස අපව හඳුනා ගනී. මෙම ප්‍රධාන සේවා පොදු සාධකය ලෙස සහතිකකිරීම සහ විශ්වාසය සංවර්ධනය කිරීම රටේ නිවාස මූල්‍ය අංශය තුළ අපගේ ප්‍රවීනත්වය සංවර්ධනය කර ගැනීමට අපව ශක්තිමත් කරනු ඇත.

ස්පෘශ්‍ය

අප බැංකුවේ ස්පෘශ්‍ය භෞතික අංගයට අපගේ සන්නාමය සංවර්ධනය කිරීම සහ අපගේ ගනුදෙනුකරුවන් සමඟ ශක්තිමත් සන්නාම ආකර්ෂණ සම්බන්ධයක් ස්ථාපිත කිරීම කෙරෙහි ඉතා ශක්තිමත් බලපෑමක් ඇත. මූල්‍ය ආයතන තමන් විසින් සැලකියයුතු ලෙස උසස් බවට පත්කර ඇති තරඟකාරී ව්‍යාපාර වාතාවරණයක් තුළ, අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතාවන්ට සමගාමී පරිසරයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව අපි හඳුනාගෙන ඇත.

සහකම්පනය

සහකම්පනය සහ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන්ට සවන්දීම සහ අවධානය යොමු කිරීම මගින් ගනුදෙනුකරුවන් සමඟ සහකම්පන සන්නිවේදනය ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමේදී පරම වැදගත්කමකි. වඩාත් සහකම්පනයෙන් කටයුතු කිරීම සඳහා අපගේ කාර්යය මණ්ඩලයේ ගනුදෙනුකාර සේවා දක්ෂතාව අප ගොඩ නැගිය යුතු බවට අපි හඳුනා ගනිමු.

ප්‍රතිචාරාත්මක බව

ප්‍රතිචාරාත්මකබව නම්‍යශීලීවීම සහ වේගවත් සේවා මට්ටම් ලබාදීම මගින් ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම මගින් නියෝජනය වේ.

අප බැංකුවේ කණ්ඩායම

බැංකුව සමඟ වසර 10කට වැඩි කාලයක් සේවය කළ 43%ක්වන අපගේ කාර්යය මණ්ඩලය සමඟ සේවකයින් 378කින් අප බැංකුවේ කණ්ඩායම සමන්විත වේ. අපගේ සේවකයින්ගෙන් 42%ක් අවුරුදු 5 - 9 ක කාලසීමාවක් බැංකුව සමඟ සිටින අතර, 15%ක් වසර 4 දක්වා සේවයේ නියුතු අය වේ.

අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේ වැදගත් අංගයක් ලෙස අපගේ සේවකයින් අපි හඳුනා ගනිමු. සමාජ-ආර්ථික වාතාවරණය තුළ මතුවන ප්‍රවනතාවන්ට සමගාමී වීම සඳහා අපගේ මානව සම්පත් ක්‍රමෝපාය අපි නැවත නිර්වචනය කළෙමු. බැංකුව සමඟ හවුල්වන සහශ්‍ර වාර්ෂිකවල වැඩිවන ප්‍රවනතාව සමඟ, බැංකුවේ මානව සම්පත් ක්‍රමෝපාය සහ ප්‍රතිපත්ති සහශ්‍රයේ ශ්‍රම බලකායේ අපේක්ෂාවන්ට සමගාමීවීම අවශ්‍යයෙන්ම කළ යුතුය. එබැවින්, සන්නිවේදනය සඳහා සමාජ මාධ්‍ය අවස්ථා භාවිතය සහ අපගේ මානව සම්පත් ක්‍රමෝපායට අනෙකුත් අංග හඳුන්වාදෙමින් මෙම නැගීවින ශ්‍රමබලකායට ඕනෑකම් පිරි මැසීමට අපි අපව ස්ථානගත කරමින් සිටිමු.

වසර තුළ, අපගේ කණ්ඩායමේ දක්ෂතා සහ තාක්ෂණික හැකියාවන් උසස් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමින් සේවකයෙකුගේ මුළු පුහුණු පැය ගණන පැය 1988 දක්වා වැඩි කරමින් සේවක සංවර්ධන කටයුතුවල සැලකියයුතු මුදලක් ආයෝජනය කරන ලදී. එමෙන්ම, බැංකුව තාක්ෂණික දැනුම් මට්ටම් ඉහල නැංවීම කෙරෙහි අවධානය යොමුකළ අතර, ඒ අනුව සේවකයින් 148ක් දැනුම හා නිපුනතා සංවර්ධන පුහුණුවල සහභාගි කිරීම සිදුකරන ලදී. ආයතනික සංස්කෘතිය ශක්තිමත් කිරීමට අපගේ සේවකයින්ගේ අභිප්‍රේරණය සහ ආකල්ප වර්ධනය කිරීම කෙරෙහි ද අපි අවධානය යොමු කළ අතර එය අදාළ අභිප්‍රේරණ පුහුණුවලට කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 95ක් සහභාගි කරමින් සිදුකරන අඛණ්ඩ වැඩසටහනකි.

අවදානම අවම කිරම

ණය සහ ද්‍රවශීලතා අවදානම් බැංකුව මුහුණ දෙන ප්‍රධාන අවදානම් වෙති. බැංකුවේ අවදානම් නිරාවරණය අවමකර පාලනය කිරීම පිණිස, බැංකුව විසින් මූල්‍ය, ණය, මෙහෙයුම්, අනුකූලතාව සහ නෛතික වාර්තාකරණ ක්‍රම, අභ්‍යන්තර පාලනය, කළමනාකරණ සමාලෝචන ක්‍රියාවලි සහ වෙනත් යාන්ත්‍රණ ඇතුළත් කරමින් අවදානම් සඳහා පාලන රාමුවක් හඳුන්වාදෙන ලදී. වසර තුළ, ආදායම් මූලාශ්‍ර සහතික කිරීමේ ආදර්ශයක් හඳුන්වා දෙමින් අපගේ ණය ක්‍රියාවලි අපි ශක්තිමත් කළෙමු. ණය යෝජනා සඳහා පූර්ව බෙදාහැරීම සහ නියාමන චීකකය ස්ථාපිත කිරීම ද ණයවල තත්ත්වය පවත්වාගන්නා බව සහතික කරයි. ණයවල තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරමින් හා හානිකරණ වෙන්කිරීම් වඩා අඩුකරමින් නවීන ණය ශ්‍රේණිගතකරණ ආදර්ශයක් ද හඳුන්වා දෙන ලදී. මෙවැනි ප්‍රධාන අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් අවදානම් ප්‍රතිලාභ ගතිකතා සහිත කළඹ වර්ධනය තුලනය කරමින් එහි ගමන්මඟ ඉදිරියට යාමට බැංකුවට සහය වනු ඇති බව අපි විශ්වාස කරමු.

අනාගත දැක්ම සහ තාක්ෂණය තුළ ආයෝජනය

බැංකුව තරඟකාරී වාසියේ මූලාශ්‍රයක් ලෙස තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ වීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. ප්‍රධාන බැංකුකරණ පද්ධති 2021 වසර තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පද්ධතිය ශාඛා අතර සම්බන්ධතාව සහතික කර, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATM) ජාලය සහ අන්තර්ජාල බැංකුකරණ පහසුකම් ඇති කරන අතර ඉදිරි වසර දෙක තුළ අදියර අනුව ක්‍රියාත්මක කරනු ඇත. අපගේ ක්‍රියාවලි ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රියකරණය කිරීම තුළින් අපගේ ගනුදෙනුකරුවන්ට පහසු සහ කඩිනම් සේවා මට්ටම් සලසාදෙන කාර්යක්ෂම අවස්ථාවක් නිර්මාණය කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

පිළිගැනීම

සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන ලද අඛණ්ඩ මඟපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත මාගේ අගය කිරීම පිරිනැමීමට මම කැමැත්තෙමි. තවද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකරණය සහ කණ්ඩායම වෙත ඔවුන්ගේ කැපවීම සහ බැඳීම වෙනුවෙන් ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකා මහ බැංකුව, රේඛීය අමාත්‍යංශය සහ අප බැංකුවේ අනෙකුත් වටිනා හවුල්කරුවන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහය සහ මඟපෙන්වීම වෙනුවෙන් මගේ කෘතඥතාව පළකර සිටිමි. එමෙන්ම, වසර ගණනාවක් පුරා තම නිවාස මූල්‍ය අවශ්‍යතා සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කෙරෙහි තම විශ්වාසය තබන ලද අපගේ පක්ෂපාතී ගනුදෙනුකරුවන් වෙත මගේ කෘතඥතාව පළකර සිටිමි.



ඩබ්ලිව්.එම්. දයාසිංහ
සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි

අධ්‍යක්ෂ මණ්ඩලය

1.නිරෝෂන පෙරේරා මහතා
සභාපති

නීතිඥයෙක් වන නිරෝෂන පෙරේරා මහතා 2018 ජූලි 26 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සභාපති ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 3 දක්වා සේවය කරන ලදී.

ඔහු 1993 දී ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු සභාපති, ජනාධිපති නීතිඥ ආනන්ද විජේසේකර මහතා යටතේ ඔහුගේ නීතිඥ වෘත්තිය ආරම්භ කර ඇත. පුරා වසර 26ක් තුළ බුද්ධිමය දේපල, අල්ලස් සහ දූෂණය, ණය අයකිරීම, අපහාසකිරීම, අපරාධ සහ කම්කරුවන්ට අදාළ කරුණුවලදී මහේස්ත්‍රාත් උසාවි සහ දිස්ත්‍රික් උසාවි තුළ ප්‍රධාන වශයෙන් පෙනී සිටිමින් පුළුල් වශයෙන් සංචාරය කළේය.

ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ වඩාත් කීර්තිමත් නියෝජිතයෙක් වන අතර වසර පහක කලාසීමාවක් සඳහා කොළඹ නීති සමාජයේ කමිටු සාමාජිකයෙක් ද විය.

නිරෝෂන පෙරේරා මහතා කර්මාන්ත තාක්ෂණ ආයතනයේ සභාපති වූ අතර 2018 සිට 2018 දක්වා මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ද විය. තවද, 2018 සිට 2019 දක්වා ශ්‍රී ලංකා විදේශ රැකියා ආයතනයේ අධ්‍යක්ෂවරයෙක් ද විය.

2. කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය
අධ්‍යක්ෂ

මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය 2018 ජූලි 02 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරියක් ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 3 දක්වා සේවය කරන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ආර්ථිකයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ඇය සතුවන අතර ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (විශේෂ) පිළිබඳ උපාධිය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 1987 දී පවත්වන ලද වරලත් ආවසරික විභාගයේදී සුදුසුකම් ලබමින්, 1990 සිට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය තුළ ගණකාධිකාරිවරියක් ලෙස වසර 29කට වැඩි කාලයක් ඇය සේවය කර ඇති අතර රාජ්‍ය මූල්‍ය කළමනාකරණ විගණනය, ගිණුම්කරණය සහ රාජ්‍ය ප්‍රසම්පාදනය වැනි රාජ්‍ය අංශය තුළ විවිධ අංශයන්හි පළපුරුද්ද ලබාගෙන ඇත.

3. බර්නාඩ් වසන්ත මහතා
අධ්‍යක්ෂ

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ලේකම්, බර්නාඩ් වසන්ත මහතා 2019 මාර්තු 11 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 3 දක්වා සේවය කරන ලදී.

ඔහු 1990 සිට මේ දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) වසර 28කට වැඩි කාලයක් සේවය කර ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී (ආර්ථික කටයුතු) උපාධිය ලබාගෙන ඇති අතර, කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය (සමාජ විද්‍යාව) ලබාගෙන ඇත.

4. සෙනාත් එම් ද සොයිසා මහතා
අධ්‍යක්ෂ

සෙනාත් එම් ද සොයිසා මහතා 2019 ජනවාරි 30 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 3 දක්වා සේවය කරන ලදී.

ඔහු ඇරිසෝනාවේ පිනික්ස් හී ජත්‍යන්තර කළමනාකරණය (Thunderbird) පිළිබඳ ඇමෙරිකන් උපාධි පාසලෙන් ජාත්‍යන්තර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇති අතර ඔහු වර්තමානයේ ටෘෂන් රාජ්‍ය විශ්ව විද්‍යාලය ලෙස හඳුන්වන ගිණිකොන මිරෝර් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය (මූල්‍ය) පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරියෙකි.

සෙනාත් එම් ද සොයිසා මහතාට අමෙරිකා එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ ආයෝජන/ආයතනික බැංකුකරණය සහ මූල්‍ය කල්බදු අංශය තුළ වසර 20කට වැඩි වෘත්තීය පළපුරුද්ද ඇති අතර මින් බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 10කට වැඩි කාලයක් ඇතුළත්ය.

ඔහු 1997 සිට 2007 දක්වා කාලසීමාව තුළ සෙලාන් මර්චන්ට් බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂ තනතුරු දරා ඇත. එමෙන්ම, ඔහු 2000 සිට 2007 දක්වා සෙලාන් මර්චන්ට් ලීසින් පී.එල්.සී හී අධ්‍යක්ෂ/ සාමාන්‍යාධිකාරී තනතුරු දරා ඇත.

5. දිල්හාන් ජයසිංහ මහතා
අධ්‍යක්ෂ

දිල්හාන් ජයසිංහ මහතා 2019 පෙබරවාරි 01 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 3 දක්වා සේවය කරන ලදී.

ඔහු චික්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙක් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. ඔහු 2011 සිට ද රවීව් පබ්ලිකේෂන්, එස්වින් ජයසිංහ ඩියුට් ප්‍රී සහ බෝගමුව ඩි.සී.මිල්ස් හී අධ්‍යක්ෂවරයෙකි.

6. විදුර මංචනායක මහතා
අධ්‍යක්ෂ

නීතිඥයෙක් වන විදුර මංචනායක 2019 මාර්තු 11 දින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 3 දක්වා සේවය කරන ලදී.

ඔහු 1992 වසරේදී ඔහුගේ නීතිඥ වෘත්තිය ආරම්භ කළ අතර නීතිඥ වෘත්තිය තුළ වසර 28කට වැඩි පළපුරුද්ද ඔහු සතුය. 1992 සිට 1994 දක්වා ඔහු නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටි අතර, 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කර ඇත.

ආයතනික සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණය

1. ඩබ්ලිව්.එම්.දයාසිංහ මහතා
සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි

බැංකුවේ වර්තමාන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වන, ඩබ්ලිව්.එම් දයාසිංහ මහතාට විගණනය, මූල්‍ය, ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය සහ සමස්ථ ශාඛා කළමනාකරණ කටයුතු පිළිබඳ ක්ෂේත්‍රවල පුළුල් පළපුරුද්ද ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙක් වන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වේ. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධිය ලබාගෙන ඇත. ඔහු භාණ්ඩාගාර ආයෝජනය සහ අවදානම් කළමනාකරණය සහ තොරතුරු පද්ධති ආරක්ෂාව පාලනය සහ විගණනය පිළිබඳ ඩිප්ලෝමාව (DISSCA) සාර්ථකව සම්පූර්ණ කර ඇත.

ඩබ්ලිව්.එම් දයාසිංහ මහතා 2003 මාර්තු 11 දින බැංකුව හා එක් වූ අතර අභ්‍යන්තර විගණක, ප්‍රධාන කළමනාකරු - මූල්‍ය, භාණ්ඩාගාරය සහ ශාඛා මෙහෙයුම් සහ සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය වැනි ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු කිහිපයක් දරා ඇත.

ඔහු 1984 දී ගණකාධිකාරීවරයෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. විතැන් සිට, වරලත් ගණකාධිකාරී ආයතන, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ ග්‍රේලයින් සමාගම් සමූහය වැනි බොහෝ පිළිගත් ආයතනවලට වෘත්තීය සේවා ලබා දී ඇත. ඔහු වසර 15කට වැඩි කාලයක් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරමින් සිටී.

2. ඒ.ඩී.එන්. ධර්මරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය)

ඒ.ඩී.එන්. ධර්මරත්න මහතා බැංකුකරණ හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන අතර, වතු කළමනාකරණය සහ තක්සේරු කිරීම පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව, ව්‍යාපාර සංඛ්‍යාලේඛණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, වාණිජ පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ඔහු සතු වේ. ඔහු රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ (චිංගලන්තය) සාමාජිකයෙක්, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක්, වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ (APB) සාමාජික සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ (MAAT) සාමාජිකයන් ද වේ.

ඔහු 1983 දී සහකාර ක්ෂේත්‍ර නිලධාරියෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. එතැන් සිට, එක්සත් ජාතීන් සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත.

ඒ.ඩී.එන්. ධර්මරත්න මහතා තක්සේරුකරණ පරීක්ෂකවරයෙක් ලෙස 1986 නොවැම්බර් 04 දින බැංකුව හා එක්විය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඔහුගේ වෘත්තිය තුළ, තක්සේරු පරීක්ෂක, ජ්‍යේෂ්ඨ තක්සේරු පරීක්ෂක සහ සහකාර තක්සේරු නිලධාරී/ සහකාර සාමාන්‍යාධිකාරී - (තක්සේරු කිරීම), නියෝජ්‍ය කළමනාකරු (තක්සේරු කිරීම), කළමනාකරු (තක්සේරු කිරීම), ප්‍රධාන කළමනාකරු (තක්සේරු කිරීම), සහ සහකාර සාමාන්‍යාධිකාරී (තක්සේරු කිරීම) වැනි තනතුරු දරා ඇත. 2019 ඔක්තෝබර් 15 දින ඔහු විශ්‍රාම ගනු ලැබූ අතර ඔහු විශ්‍රාම යන අවස්ථාවේදී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) තනතුර දරන ලදී.

3. ඩී.එම්.ජේ. වික්‍රමසේකර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(ණය- සේ.අ.අ./වතු/සු.හා.ම. හා ක්ෂුද්‍ර)

ටී.එම්.ජේ. වික්‍රමසේකර මහතා ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ වාණිජවේදී (විශේෂ) උපාධිය ලබාගෙන ඇති අතර ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වෘත්තීය 11 කොටස විභාගය සුදුසුකම් ලබා ඇත. ඔහු 1983 දී විගණන සහයකයෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය.

ටී.එම්.ජේ. වික්‍රමසේකර මහතා කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස 1986 අගෝස්තු 01 දින බැංකුව හා එක් වූ අතර, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඔහුගේ වෘත්තිය තුළ, ඔහු ණය නිලධාරී (11 ශ්‍රේණිය), ජ්‍යේෂ්ඨ ණය නිලධාරී/ප්‍රධාන කළමනාකරු (ණය) සහ සහකාර සාමාන්‍යාධිකාරී - ණය පාරිපාලනය, සේ.අ.අ. - ණය, විශේෂ අයකිරීම්, සහ ණය අංශය යන තනතුරු දරා ඇත

4. කේ.එල්.එන්.ඒ. පෙරේරා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

කේ.එල්.එන්.ඒ.පෙරේරා මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය හා ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිධාරියෙකි. වාණිජවේදී (විශේෂ) උපාධිය, ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව, බැංකුකරණ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ඔහු සතුවන අතර, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (FCA) සහය සාමාජිකයෙක්ද වේ. ඔහු 1995 දී විගණක පරීක්ෂක (II) ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය.

කේ.එල්.එන්.ඒ.පෙරේරා මහතා අභ්‍යන්තර විගණක ලෙස 2010 සැප්තැම්බර් 02 දින බැංකුව සමඟ එක්විය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඔහුගේ වෘත්තිය තුළ, ඔහු ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර දරා ඇති අතර, වර්තමානයේ සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර දරමින් සිටී.

ආයතනික සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණය - ඉතිරි කොටස...

5. එන්.පී.කේ. ලොකුගේ මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)

එන්.පී.කේ ලොකුගේ මහත්මිය 1995 ඔක්තෝබර් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ එක්විය. ඇයට නීති වෘත්තිය තුළ වසර 32කට වැඩි පළපුරුද්ද සහ බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 24කට වැඩි පළපුරුද්ද ඇත. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඇයගේ වෘත්තිය තුළ, සහකාර සාමාන්‍යාධිකාරී (නීති) තනතුර තුළ ප්‍රධාන ප්‍රවාහයට අමතරව වගකීම්සහගත තනතුරු ඇය දරා ඇත.

ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගත අතර, නීති උපාධිය උසුලයි. ඇය නීතිඥවරියක් වන අතර අය 1988 දී නීතිඥ සංගමයට සම්බන්ධ විය. ඇය සමාගම් ලේකම්වරියක් මෙන්ම දිවුරුම් කොමසරිස්වරියක් ද වේ. එමෙන්ම, එයට අමතරව, ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනයේ බැංකුකරණ අධ්‍යයන ඇය සාර්ථකව සම්පූර්ණ කර ඇත.

සහකාර සාමාන්‍යාධිකාරී (නීති) තනතුර තුළ ප්‍රධාන ප්‍රවාහයට අමතරව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුර ද ඇය දැනට දරමින් සිටී.

ඇයගේ බැංකු වෘත්තිය තුළ, විවිධ රටවල්වල පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහභාගි වෙමින් ආසියානු රටවල නීති පද්ධති සම්බන්ධයෙන් විවිධ ජාත්‍යන්තර නිරාවරණ ඇය අනුගමනය කර ඇත.

ඇයගේ පළපුරුද්ද තුළින් බැංකුකරණ නීතිය, ආයතනික නීතිය, වාණිජ නීතිය සහ කම්කරු නීතිය යන ක්ෂේත්‍ර ආවරණය කරයි.

6. බී.එම්.ඩී.පී.බී.බස්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

බී.එම්.ඩී.පී.බී. බස්නායක මහතා කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය, කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ උපාධිය සතු වන අතර ඔහු බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ (BCS) සහතිකලත් සාමාජිකයෙකි. ඔහු 1997 දී පරිගණක පුහුණු වැඩසටහන්කරුවෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ එක්වීමට පෙර, 2002 සිට 2007 දක්වා ඔහු කොමර්ෂල් බැංකුවේ සේවය කර තිබුණි.

බී.එම්.ඩී.පී.බී. බස්නායක මහතා සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) ලෙස 2017 ඔක්තෝබර් 17 දින බැංකුව හා එක්විය.

7. කේ.කේ.කේ.එස්. කුමාර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්)

කේ.කේ.කේ.එස් කුමාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙක් මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාධාරියෙක්ද සහ බැංකුකරණ සහ මූල්‍ය පිළිබඳ උසස් සහතිකපත්‍රලාභියෙක් ද වේ. ඔහු 2001 දී කළමනාකරණ අභ්‍යාසලාභී/ සහකාර කළමනාකරුවෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. ඔහු ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුවේ 2001 සිට 2019 දක්වා සේවය කර ඇත.

කේ.කේ.කේ.එස් කුමාර මහතා සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) ලෙස 2020 මැයි 22 දින බැංකුව හා එක් විය.

8. ඒ.එස්.කේ අමරසිංහ මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා සැපයුම් කළමනාකරන)

ඒ.එස්.කේ. අමරසිංහ මහත්මිය ඕස්ට්‍රේලියානු ව්‍යාපාර ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ මනෝ විද්‍යා ඩිප්ලෝමාව ලබාගෙන ඇති අතර, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම (PQHRM) ඇය සතුය. ඇය ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනයේ (CIPM –SL) සභය සාමාජිකයෙකි. ඇය 1999 දී අධිකාරිලත් නිලධාරියෙක් ලෙස ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලකායෙන් ඇයගේ වෘත්තිය ආරම්භ කළාය. ඇය ඩබ්ලිව්පීඒ වර්ල්ඩ් ක්ලාස් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ජෝර්ජ් සෝර්සින්ග් සර්විසස් යුකේ ලිමිටඩ් හී සේවය කර ඇත.

ඒ.එස්.කේ. අමරසිංහ මහත්මිය සහාකර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා සැපයුම්) ලෙස 2019 ඔක්තෝබර් 14 දින බැංකුව හා එක් විය.

9. එල්.ඩබ්ලිව්. සමරවික්‍රම මහතා
වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී (ණය)

එල්.ඩබ්ලිව්. සමරවික්‍රම මහතා විශ්ව විද්‍යාලයේ වතු කළමනාකරණය හා තක්සේරු කිරීම (විශේෂ) පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරියෙක් මෙන්ම බැංකුකරණ සහ මූල්‍ය පිළිබඳ උසස් සහතික පත්‍රලාභියෙක්ද වේ. ඔහු ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සභය සාමාජිකයෙක් ද වේ. ඔහු 1993 දී ක්ෂේත්‍ර විමර්ෂකයෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. එතැන් සිට, ජාතිය ගොඩ නැගීමේ පර්යේෂණ ආයතනය සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත.

එල්.ඩබ්.ලිව්. සමරවික්‍රම මහතා තක්සේරු පරීක්ෂකයෙක් ලෙස 1996 පෙබරවාරි 16 දින බැංකුව හා එක් විය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඔහුගේ වෘත්තීය තුළ ජ්‍යේෂ්ඨ තක්සේරු නිලධාරී, සහකාර කළමනාකරු (ණය), ශාඛා කළමනාකරු, ප්‍රධාන කළමනාකරු (ණය) වැනි තනතුරු ඔහු දරා ඇත. ප්‍රධාන කළමනාකරු (ණය) තනතුර දරමින්, වර්තමානයේ ඔහු සහතාර සාමාන්‍යාධිකාරී (ණය) ලෙස කටයුතු කරමින් සිටී.

10. අයි.කේ.ගාමිනී මහතා
ප්‍රධාන කළමනාකරු (ණය)

අයි.කේ. ගාමිණී මහතා ශාස්ත්‍රවේදී ගෞරව උපාධිධාරියෙක් වන අතර, බැංකුකරණ හා මූල්‍ය පිළිබඳ සහතිකපත්‍රලාභියෙක් ද වේ. ඔහු 1992 දී සහකාර විධායක නිලධාරියෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. එතැන් සිට, ඔහු ප්ලෑන් ඉන්ටර්නැෂනල්- ශ්‍රී ලංකා, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ආසියානු සංවර්ධන බැංකුවේ නාගරික සංවර්ධනය හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ සේවය කර ඇත.

අයි.කේ ගාමිනී මහතා 1999 මාර්තු 15 දින ණය නිලධාරී (11 ශ්‍රේණිය)/ නියෝජ්‍ය කළමනාකරු (ණය) ලෙස බැංකුව සමඟ එක්විය. දැනට ඔහු ප්‍රධාන කළමනාකරු (ණය) තනතුර දරමින් සිටී.

11. ඩී.එම්.ආර්. දිසානායක මහතා
ප්‍රධාන කළමනාකරු (සේ.අ.අ/වතු/සු. හා සහ ක්ෂුද්‍ර)

ඩී.එම්.ආර්. දිසානායක මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන අතර,බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙක් ද වේ. එමෙන්ම වතු කළමනාකරණය හා තක්සේරු කිරීම පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිධාරියෙක් ද වන ඔහුට සිවිල් ඉංජිනේරු පිළිබඳ ස්ටැෆර්ඩ් ඩිප්ලෝමාව, පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ ඩිප්ලෝමාව, බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ (ACBF) උසස් සහතිකය, ජනමාධ්‍ය පිළිබඳ ඩිප්ලෝමාව සහ බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව ඇත. ඔහු ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ (AIV) සහය සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (AIB) සහය සාමාජිකයෙක්ද වේ. ඔහු 1994 දී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තුළ ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය.

ඩී.එම්.ආර්.දිසානායක මහතා තක්සේරු පරීක්ෂකයෙක් ලෙස 1996 පෙබරවාරි 16 දින බැංකුව සමඟ එකතු විය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඔහුගේ වෘත්තීය තුළ ඔහු සහකාර කළමනාකරු (ණය), ශාඛා කළමනාකරු, ප්‍රධාන කළමනාකරු (ණය), ප්‍රධාන කළමනාකරු (ශාඛා මෙහෙයුම්), වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මනා සංවිධාන) වැනි තනතුරු දරා ඇත. ඔහු වර්තමානයේ ප්‍රධාන කළමනාකරු (සේ.අ.අ./වතු/සුළු හා මධ්‍ය පරිමාන/ක්ෂුද්‍ර) තනතුර දරමින් සිටී.

12. එස්. වික්‍රමසිංහ මහතා
ප්‍රධාන කළමනාකරු (ණය)

එස් වික්‍රමසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වතු කළමනාකරණය හා තක්සේරුකිරීම (විශේෂ) විද්‍යාවේදී උපාධිධාරියෙක් වන අතර, ඔහු ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ (AIV) සහය සමාජිකයෙක් ද වේ. ඔහු 1993 දී ක්ෂේත්‍ර විමර්ෂකයෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය.

එස් වික්‍රමසිහං මහතා 1996 පෙබරවාරි 16 දින තක්සේරු පරීක්ෂකයෙක් ලෙස බැංකුව සමඟ එකතු විය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඔහුගේ වෘත්තීය තුළ ජ්‍යේෂ්ඨ තක්සේරු පරීක්ෂක, සහකාර කළමනාකරු (ණය), ශාඛා කළමනාකරු, වැඩබලන ප්‍රධාන කළමනාකරු (ශාඛා මෙහෙයුම්), ප්‍රධාන කළමනාකරු (ප්‍රාදේශිය ශාඛාව -රත්නපුර) වැනි තනතුරුවල සේවය කර ඇති ඔහු වර්තමානයේ ප්‍රධාන කළමනාකරු (ණය) තනතුර දරමින් සිටී.

13. ඩබ්ලිව්.කේ.පෙරේරා මහත්මිය
ප්‍රධාන කළමනාකරු (නීති)

ඩබ්ලිව්. කේ. පෙරේරා මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිධාරිණියක් වේ. ඇය නීතිඥවරියක් මෙන්ම සමාගම් ලේකම්වරියකි.

ඩබ්ලිව්. කේ. පෙරේරා මහත්මිය නීති නිලධාරී (11 ශ්‍රේණිය)/නියෝජ්‍ය කළමනාකරු (නීති) ලෙස 2000 මාර්තු 15 දින බැංකුව හා එකතු විය. වර්තමානයේ ඇය ප්‍රධාන කළමනාකරු (නීති) තනතුර දරමින් සිටී.

14. ඩී.බී.පී.විල්ලාරච්චි මහතා
අභ්‍යන්තර විගණක

ඩී.බී.පී. විල්ලාරච්චි මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන අතර, ව්‍යාපාර හා මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ICASL), වාණිජවේදී විශේෂ උපාධිය ඔහු සතු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙක් (CBA) වන ඔහු අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (IIA) සාමාජිකයෙක් මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වේ.

ඔහු 1995 දී ජ්‍යේෂ්ඨ විගණක ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. එතැන් සිට ඔහු හුළුගල්ල සමරසිංහ සහ සමාගම, ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුව, ටී ට්‍රෙන්ඩ් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්, කෘෂිකර්ම, වාර්මාර්ග සහ මහවැලි සංවර්ධන අමාත්‍යංශය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ ආයතනය (SLIATE) සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවය කර ඇත.

ඩී.බී.පී. විල්ලාරච්චි මහතා 2015 ජනවාරි 01 දින අභ්‍යන්තර විගණකවරයෙක් ලෙස බැංකුව සමඟ එකතු විය.

15. ඩබ්ලිව්.පී.එස්.එස්.කේ. අබේවික්‍රම මහත්මිය
ප්‍රධාන කළමනාකරු (අනුකූලතා)

ඩබ්ලිව්.පී.එස්.එස්.කේ. අබේවික්‍රම මහත්මිය නීතිඥවරියකි. ඇය 1988 දී ඇයගේ වෘත්තිය ආරම්භ කළාය. එතැන් සිට, සමරරත්න ඇසෝසියේට්ස් (නීති ආයතනය), ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (HDFC), සෙලාන් මර්චන්ට් බැංකුව තුළ සේවය කර ඇත.

ඩබ්ලිව්.පී.එස්.එස්.කේ. අබේවික්‍රම මහත්මිය නීති නිලධාරී (11 ශ්‍රේණිය)/ නියෝජ්‍ය කළමනාකරු (නීති) ලෙස 2000 මාර්තු 27 දින බැංකුව සමඟ එකතු විය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඇයගේ වෘත්තීය තුළ ඇය කළමනාකරු (නීති) සහ ප්‍රධාන කළමනාකරු (නීති) තනතුරු දරා ඇත. වර්තමානයේ ඇය ප්‍රධාන කළමනාකරු (අනුකූලතාව) තනතුර දරමින් සිටී.

16. ආර්.එම්.යූ.ඩී. බණ්ඩාර මහතා
ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා සැපයුම් කළමනාකරන)

ආර්.එම්.යූ.ඩී. බණ්ඩාර මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙක්ද වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය (විශේෂ) පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරියෙක් මෙන්ම මානව සම්පත් කළමනාකරණය (NIBM) පිළිබඳ ජාතික ඩිප්ලෝමාධාරියෙක් ද වේ. ඔහු ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ වරලත් ආයතනයේ (CIPM) සහය සාමාජිකයෙකි.

ඔහු 196 දී සහාකර කළමනාකරුවෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. එතැන් සිට, ඔහු සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ඇප) සමාගම, සමාජ ආරක්ෂණ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ සේවය කර ඇත.

ආර්.එම්.යූ.ඩී. බණ්ඩාර මහතා ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා සැපයුම්) ලෙස 2018 නොවැම්බර් 12 දින බැංකුව සමඟ එකතු විය.

ආයතනික සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණය - ඉතිරි කොටස...

17. එස්.ඒ.කේ.ඒ.කේ. සූරියආරච්චි මහතා

ප්‍රධාන කළමනාකරු (අවදානම් කළමනාකරණ)

එස්.ඒ.කේ,ඒ.කේ. සූරියආරච්චි මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන අතර ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සහ ACCA – චක්සත් රාජධානියේ වෘත්තීමය අදියර ඔහු සතු වේ.

ඔහු ඔහුගේ වෘත්තිය උපාධි අභ්‍යාසලාභියෙක් ලෙස ආරම්භ කළේය. එතැන් සිට, කොළඹ ඉන්දීය රාජ්‍ය බැංකුව, සෙලාන් බැංකුව, ආර් ආර් ඩොනෙලි (ඇමරිකා චක්සත් ජනපදය පදනම් ෆෝචූන් ආයතන 500) සහ ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුවේ සේවය කර ඇත.

එස්.ඒ.කේ,ඒ.කේ. සූරියආරච්චි මහතා 2018 නොවැම්බර් 12 දින ප්‍රධාන කළමනාකරු (අවදානම් කළමනාකරණ) ලෙස බැංකුව සමඟ එකතු විය.

ආයතනික පාලනය

ආයතනික පාලනය තුළින් විධායක කළමනාකරණයේ කාර්යසාධනය සහ ක්‍රමෝපායික තීරණ සහ පාර්ශ්වකරුවන් වෙත ඔවුන්ගේ වගවීම් සම්බන්ධයෙන් අධීක්ෂණය සහ පාලනය පිළිබඳ වැදගත් මූලධර්ම ඉස්මතුකර දක්වයි.

බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව එහි අනාගත සංවර්ධනය සහ ආයතනික කාර්යසාධනය සඳහා පදනමක් ලබාදෙන ආයතනික යහපාලනයේ වැදගත්කම පිළිබඳ සාධකයට එහි උපරිම ප්‍රතිෂ්ඨාව ලබා දේ.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ඉහළම තීරණ ගැනීමේ බලධාරියාවන අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍යමය යහපත්බව සඳහා සමස්ත වගකීම ඇති අතර, තැන්පත්කරුවන්, ණයහිමියන්, සේවකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් සපුරාලන බව සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ බැංකුකරණය, මූල්‍යකරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය, අලෙවිකරණය යනාදිය තුළ ප්‍රායෝගික පළපුරුද්ද සහිත වෘත්තිකයින්ගේ සක්‍රිය සංයෝගයක් ඇත. ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් ස්වාධීන, අපක්ෂපාතී සහ සෘජු තීරණ ගැනීමට අවශ්‍ය දක්ෂතා සහ පළපුරුද්ද ඔවුන් සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ක්‍රමෝපායික අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය ලබාදීම, ව්‍යාපාර පිළිබඳ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ කොටස් හිමියන්ට ඔවුන්ගේ කළමනාකාරිත්වය පිළිබඳ වාර්තා කිරීම සම්බන්ධ කටයුතු පිළිබඳ එහි පාලන වගකීම් අඛණ්ඩව ශක්තිමත් කරයි.

බැංකුවේ පාලන මූලධර්ම සහ ව්‍යුහය ඵලදායී තීරණ ගැනීම ශක්තිමත් කරන අතර, ඉන් වඩා ඉහල විනිවිදභාවය දිරිගන්වමින් ව්‍යාපාරයේ සෑම අංගයක් තුළම වගවීම ඇතුළත් කරයි. බැංකුව විචක්ෂණශීලීව සහ රටේ සහ පාලන අධිකාරීවල නීති සහ රෙගුලාසි සහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති පිළිබඳ රාමුව තුළ පාලනය කෙරෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

බැංකුවේ තත්ත්වය සහ අනාගත කටයුතු සභාපතිතුමාගේ සමාලෝචනය/පණිවිඩය සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.ගේ සමාලෝචනය තුළ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

කෙසේවෙතත්, සාදාචාර ආකාරයකින් බැංකුවේ ව්‍යාපාරය වර්ධනය කිරීම අත්‍යවශ්‍යයෙන් කළයුතු බැවින්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වගවීම, අවංකකම, සාධාරණත්වය, ආචාරවිධි සහ සදාචර, නෛතික/නියාමන අනුකූලතාව, විනිවිදභාවය හා අනාවරණය සහ විශිෂ්ඨ කාර්යක්ෂමතා වැනි පදනම් තත්ත්වයන් සහ උපලක්ෂණ සහිත මූලික පදනම මත කටයුතු කිරීම ඉතා වැදගත් ය.

වගවීම

ආයතනයක සාර්ථකත්වය සඳහා මුදුන්ගල වගවීම පිළිබඳ සංස්කෘතියක් සංවර්ධනය කිරීම බැවින්, බැංකුව එහි කාර්යයන් සඳහා වගකීම භාරගැනීමේ සංස්කෘතියක් සංවර්ධනය කර ඇත යන සාධකය බැංකුව මනාව අවබෝධ කරගෙන ඇත.

වගවීම පිළිබඳ සංකල්පය යහපාලනයේ මුරගලක් වන බව අවබෝධ කරගනිමින්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුවේ නිර්දේශ මත බැංකුවේ වාර්ෂික සහ අතුරු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අනුමත කරන අතර, මූල්‍ය ප්‍රකාශන මත තොරතුරු විනිවිද සහ නිසි ආකාරයෙන් බැංකුවේ පාර්ශ්වකරුවන්ට සහ පොදු මහජනතාවට වාර්තා කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන අතර, බැංකුව පුවත්පත්වල කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරයි. මේ මඟින් බැංකුව එහි වගවීම මුදාහැරීමේදී එහි ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිවල විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය වැඩි කරයි.

බැංකුවේ ව්‍යාපාරයට අදාළ කරුණු සම්බන්ධයෙන් සියලුම නියාමන බලධාරීන් විසින් පනවනු ලබන අවශ්‍යතාවන්ට බැංකුව අනුකූල වී ඇත.

සාධාරණත්වය

ජාතියේ නිවාස බැංකුව බවට පත්වෙමින්, බැංකුව එහි උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ට නිවැරදි සහ සාධාරණ ආකාරයකින් සලකනු ලබයි. බැංකුව යහපත් තීරණ ගන්නා අතර, එම තීරණ ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්හිමියන්, සැපයුම්කරුවන් සහ අවසාන වශයෙන් ප්‍රජාව වැනි යම් අයෙකුට පීඩාවත් නොමැතිව ව්‍යාපාර අවශ්‍යතාවන්ට සේවය කරන තීරණ වේ.

ආයතනික පාලනය - ඉතිරි කොටස...

එම තීරණ ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස්හිමියන්, සැපයුම්කරුවන් සහ අවසාන වශයෙන් ප්‍රජාව වැනි යම් අයෙකුට පීඩාවත් නොමැතිව ව්‍යාපාර අවශ්‍යතාවන්ට සේවය කරන තීරණ වේ.

බැංකුව සියලුම ගනුදෙනුකරුවන් සඳහා වටිනා දෑ සිදුකරයි. ණය පහසුකම් ලබාදීමේදී, බැංකුව මාසිකව ගෙවීමේ හැකියාව වන එහි ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කරයි. බැංකුව අවසාන උපාය ලෙස පමණක් පැහැරහැරි ගනුදෙනුකරුවන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා අතර, අනපේක්ෂිත දුෂ්කරතාවන්ට ඔවුන් මුහුණපාන අවස්ථාවක සෑමවිටම ගනුදෙනුකරු සමඟ සිටීම මගින් ඉතා තරගකාරී බැංකුකරණ කර්මාන්තයක් ලෙස ජාතියේ නිවාස බැංකුව වෙමින් බැංකුවේ දැක්ම සහ මෙහෙවර නගා සිටුවයි.

විනිවිදභාවය සහ අනාවරණය

ප්‍රාග්ධනය වෙන්කිරීම, ආයතනික ගනුදෙනු සහ මූල්‍ය කාර්යසාධන නියාමනය සම්බන්ධයෙන් කොටස්හිමියන්ට, පාර්ශ්වකරුවන්ට සහ අනාගත ආයෝජකයින්ට දැනුවත් තීරණ ගැනීම සඳහා ඔවුන්ට පදනම් ලබාදෙන බැවින්, විනිවිදභාවය සහ අනාවරණය ශක්තිමත් ආයතනික පාලන රාමුවක අත්‍යවශ්‍ය අංග වෙති. මූල්‍ය අර්බුදයට හේතුවන ප්‍රධාන දෝෂය මූලිකව ඇති වන්නේ මූල්‍ය අනාවරණයේ අඩුපාඩුව සහ ප්‍රමාණවත් නොවන පාලන ව්‍යවහාරය මගින් බවට පොදුවේ විකඟ වී ඇත.

ආයතනික පාලනය සඳහා විනිවිදභාවය මූලික පියවරක් වන අතර, කළමනාකරණය අවිධිමත් හෝ නීති විරෝධී හැසිරීම් තුළ නොයෙදෙන බව සහතික කිරීමට ඒවායේ හැසිරීම සියුම්ව පරීක්ෂා කළ හැකි සහ කරනු ලබන බැවිනි. විනිවිදභාවය අත්කර ගැනීම පිණිස, බැංකුව නිවැරදි ගිණුම්කරණ ක්‍රම යොදාගැනීම, සමාගමේ තොරතුරු සම්පූර්ණයෙන් හා කඩිනමින් අනාවරණය කිරීම සහ අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාලන කොටස්හිමියන් යනාදියගේ බැඳියා පිළිගැටුම් අනාවරණය කිරීම කළයුතු බව බැංකුව තරයේ විශ්වාස කරයි. ඒ අනුව, බැංකුව එහි වාර්ෂික වාර්තාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව, මූලික කාර්යසාධන දර්ශක, ව්‍යාපාර සංකේන්ද්‍රණ, ආයතනික පාලන ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන අනාවරණය තුළින් එහි කටයුතුවල විනිවිදභාවය අනාවරණය කරන බව බැංකුව සහතික කරයි.

එමෙන්ම, බාසල් 111 රෙගුලාසි සහ පැහැදිලිව සහ පහසුවෙන් අවබෝධකරගත හැකි ශ්‍රී.ලං.මු.වා. (SLFRS) ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරන කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා බැංකුව ප්‍රසිද්ධියට පත් කරයි. බැංකුවේ කටයුතුවල පොදු බැඳියාව සුරක්ෂිත කරන බව මේ මගින් සහතික කරයි.

අවශ්‍ය රහස්‍යතාව කඩනොකර බැංකුවේ අවදානම් නිරාවරණ සහ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් සම්බන්ධ ප්‍රධාන කරුණු පිළිබඳ එහි අනාවරණ බැංකුව විසින් කළ යුතුය යන්න පිළිගැනීම මගින්, විධිමත් වාර්තා අතර ඇතිවන සියලුම වැදගත් සංවර්ධනයන් අනවශ්‍ය ප්‍රමාදය නොමැතිව නීතිය මගින් අවශ්‍යකරන පරිදි අදාළ බලධාරීන්ට සහ පාර්ශ්වකරුවන්ට අනාවරණය කරනු ලැබේ.

2019 වසර කාලසීමාවේදී, බැංකුව තුළ වාර්තා වූ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කිසිවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ එහි සංශෝධනවල දක්වා ඇති පරිදි රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රාජ්‍ය ව්‍යවසාය සහ මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබ ඇති අතර, විවිධ ක්ෂේත්‍රවල දැනුම සහිත සුදුසු සහ යෝග්‍ය ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් නව දෙනෙකුගෙන් සමන්විත වේ. එකී සාමාජිකයින් නවදෙනාගෙන් අධ්‍යක්ෂවරු තිදෙනෙක් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ, නිවාස විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ සහ පශුසම්පත් විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ නියෝජිතයින් විය යුතුය. එයට හේතුව මූල්‍ය සහ අනෙකුත් සහය ලබාදීම මගින් කෘෂිකර්මය, කර්මාන්ත සහ නිවාස සංවර්ධනය තුළ පොදු ජනතාවට සහයවීම බැංකුවේ අරමුණ වීමයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ දායකවීමේ මඟපෙන්වීම්වල ප්‍රමාණවත් බල තුලනයක් සහ අඛණ්ඩතාවයක් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සංයුතිය මගින් සහතික කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළ මට්ටමේ ක්‍රමෝපායික තීරණ ගැනීම අධීක්ෂණය කරමින් බැංකුවේ සමස්ථ වගකීම් සහ වගවීම භාරගන්නා අතර සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි වෙත ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ බලය පවරා ඇති අතර ඔහු මූලිකත්වය ගන්නා සහ ඔහු විසින් නායකත්වය සහ උපදෙස් ලබාදෙන ආයතනික කළමනාකරණ කණ්ඩායම තුළින් විධායක බලය ක්‍රියාවට නංවයි. බැංකුවට ඵලදායී නායකත්ව ව්‍යුහයක් ඇති අතර ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයට කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීමට ඉඩලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ විනිශ්චය, පළපුරුද්ද සහ ප්‍රවීනත්වය මත විශ්වාසය තබමින්, බැංකුවේ ක්‍රමෝපායික ප්‍රමුඛතාවන්ට සමගාමීව සම්පත්වල ඵලදායී භාවිතය, ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සහ සක්‍රීය අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් සහතික කිරීම සඳහා ආයතනික කාර්ය මණ්ඩලය වෙත මනා අධ්‍යක්ෂ මණ්ඩලයක් ලෙස සහ මඟපෙන්වීමේ මූලාශ්‍රයක් ලෙස සේවය කරයි.

සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ ශක්තිමත් බැඳීම සහ දූර දර්ශී මඟපෙන්වීම අනුව, බැංකුව ඉදිරියට පාලනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය මාසයකට වරක් අවම වශයෙන් මුණ ගැසෙන අතර, 2019 වසර තුළ, රැස්වීම් 14ක් පවත්වා ඇත.

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරීට ආරාධනය කෙරේ. පැමිණීම අවශ්‍යනම් පමණක් ක්‍රමෝපායික අරමුණු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය, සමාජ හා පාරිසරික කාර්යසාධනය, මෙහෙයුම් පරිසරයෙන් ඇතිකළ වෙනස්වීම් සහ අභියෝග, නිර්දේශිත ප්‍රතිපත්ති රාමු සහ විධායක පාලන ව්‍යුහ පිළිබඳ ප්‍රගතිය ඇතුළු කරුණු සම්බන්ධයෙන් විස්තර කිරීම සඳහා වෙනත් යම් විධායක නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල කාමරය වෙත කැඳවනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපාර අවස්ථාවන් සහ බැංකුව නිරාවරණය වන ප්‍රධාන අවදානම් සැලකිල්ලට ගනිමින් ආයතනික සැලැස්ම, කාර්ය සැලැස්ම සකස් කිරීම බැංකුවේ මෙහෙවර, දැක්ම, ව්‍යාපාර පරමාර්ථ සහ ක්‍රමෝපාය කලින්කල සමාලෝචන කර, තක්සේරු කර අනුමත කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමට පෙර සුදුසු බවට සලකා බලන බැවින් ක්‍රමෝපායික

සැලැස්මට එවැනි සංශෝධන යෝජනා කරයි. කළමනාකාරිත්වය අනුමතකළ පරිදි ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය:

අධ්‍යක්ෂගේ නම	පත්වීමේ දිනය	විශ්‍රාම ගිය හෝ අධ්‍යක්ෂධූරය නතර වූ දිනය	අධ්‍යක්ෂගේ වර්ගීකරණය
නිරෝෂන පෙරේරා මහතා (සභාපති	2018.07.12 2019.02.01 දින නැවත පත්කරන ලදී	30.11.2018 03.12.2019	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය	2018.07.02 2019.02.21 දින නැවත පත්කරන ලදී 2019.05.14 දින නැවත පත්කරන ලදී	30.11.2018 04.04.2019 03.12.2019	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (මහ භාණ්ඩාගාර නියෝජිත)
බර්නාඩ් වසන්ත මහතා	11.03.2019	03.12.2019	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (නිවාස අමාත්‍යාංශයේ නියෝජිත)
සෙනාත් ද සොයිසා මහතා	30.01.2019	03.12.2019	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
දිල්හාන් ජයසිංහ මහතා	01.02.2019	03.12.2019	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
විදුර මංචනාහක මහතා	11.03.2019	03.12.2019	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2019 වසර තුළ රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව තුළ දැක්වේ.

සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.ගේ කාර්යයන්

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී යනු බැංකුවේ ඉහළම ශ්‍රේණියේ පුද්ගලයාය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී පත්කරයි. බැංකුවේ කළමනාකාරිත්ව සහ මෙහෙයුම් කටයුතු සාමාන්‍යාධිකාරී වෙත පවරා ඇති අතර ඔහු ආයතනික කළමනාකරණ කණ්ඩායම මෙන්ම බැංකුවේ කළමනාකරණ කමිටු මෙහෙයවයි.

සාමාන්‍යාධිකාරී බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකරණය තුළ ප්‍රධාන කාර්යභාර විධායක ලෙස කටයුතු කරයි. ඉහළ මට්ටමේ කළමනාකාරිත්ව තීරණ ගැනීම සඳහා බැංකුවේ සියලුම සාර්ථකත්වය වෙනුවෙන් ඔහු වගකීමට බැඳී සිටී. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ කාර්යසාධනය සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකරන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමට බැඳී සිටී. බැංකුවේ සමස්ථ සාර්ථකත්වයට අමතරව, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සංවර්ධනය මෙහෙයවීම සහ කොටස්හිමි වටිනාකම වැඩි කිරීම අපේක්ෂා කරමින් දිගුකාලීන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම සඳහා ද වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනත් ආකාරයක උපදෙස් ලබාදී ඇත්නම් මිස සාමාන්‍යාධිකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමටකම පැමිණ සහභාගිවන නමුත් එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඔහුට නොමැත.

මෙය ඉතා වගකීම්සහගත තනතුරක් වන බැවින් සහ බැංකු ක්ෂේත්‍රයේ විවිධ අංශ සහ මට්ටම්වල වසර ගණනාවක පළපුරුද්ද අවශ්‍ය වන බැවින්, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීට බැංකුව තුළ සෑම මට්ටමකම සිදුවන මෙහෙයුම් පිළිබඳව ගැඹුරු දැනුමක් ඇත. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රධානී වීම තුළ, බැංකුවේ කළමනාකරණයේ සියලුම අංශ පාලනය සඳහා ඔහු වෙත පැවරී ඇති රාජකාරී ඔහු දැඩිව පිළිපැදිය යුතුය.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ බලය සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව වෙනස් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුකමිටු හතරක් (4) පිහිටුවා ඇති අතර ඒවා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සාමාන්‍යයෙන් එකිනෙකාගෙන් ස්වාධීනව කටයුතු කරන අතර, සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීමේදී ඒවා වෙත ප්‍රමාණවත් බලය, සම්පත් සහ පැවරුණු වගකීම් ලබා දේ.

මෙම අනුකමිටු පහත පරිදි වේත

- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
- අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)
- අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)
- අධ්‍යක්ෂ මණ්ඩල වැකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC).

මෙම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂයපථයන් අනුකමිටු වාර්තාව තුළ විස්තර කර ඇති අතර, මෙම වාර්ෂික වාර්තාව තුළ සඳහන් කර ඇත. මෙම කමිටු විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් මෙහෙයවන අතර, අදාළ ක්ෂේත්‍රය තුළ ප්‍රවීනත්වය සහ ප්‍රවීනතාව ඔවුන් සතුය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, විගණන ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව සම්බන්ධයෙන් පාලනය ලබා දේ. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අනාගත බලපෑම අවබෝධ කර ගැනීම සඳහා වැදගත් ගිණුම්කරණ හා වාර්තාකරණ ගැටළු සහ මෑතකාලීන වෘත්තීමය හා නියාමන ප්‍රකාශනයන් සමාලෝචනය ඉන් අපේක්ෂා

ආයතනික පාලනය - ඉතිරි කොටස...

කරයි. වාර්තා සම්පූර්ණ සහ නිවැරදිද යන්න තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් අභ්‍යන්තර අතුරු මූල්‍ය තොරතුරු සංවර්ධනය කරන ආකාරය පිළිබඳ අවබෝධයක් අවශ්‍යය.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඉලක්ක සහ අරමුණු සකස් කරන අතර, කලින්කල සකස්කළ ඉලක්ක හා අරමුණු අනුව ඒවායේ කාර්යසාධනය ඇගයීමට ලක්කර, පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ අනෙකුත් කාර්යසාධනය පදනම් දිරිදීමනා ගෙවීම් සමාලෝචනය සඳහා පදනම තීරණය කරයි. බැංකුව වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන ක්‍රමෝපායන් සංවර්ධනය සහ සමාලෝචනය සහ සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටළු පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හා මෙහෙයුම් කමිටු සමඟ උපදේශක භූමිකාවක් පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත පැවරී ඇති බලතල අතර මූලික වගකීම් වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරාගැනීම/පත්කිරීමේ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකාබැලිය යුතු යෝග්‍යතාව සඳහා අවශ්‍යකරන සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික උපලක්ෂණ වැනි නිර්ණායක තීරණය කිරීම සඳහා වගකීමට බැඳී සිටී. ඒ අනුව, මෙම කමිටුව බැංකුවේ ආයතනික පාලනයේ කොටසක් ලෙස කටයුතු කරයි. මෙම කමිටුව එයට අදාළ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමට ලක්කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩල අපේක්ෂකයින්ට අවශ්‍ය දක්ෂතා සහ ගතිලක්ෂණ පරීක්ෂා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් බැංකුවට ඇති ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් තක්සේරු කරයි. මෙම කමිටුව විශේෂ අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ එවැනි අවදානම් කමිටුව විසින් නියමකළ පරිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ කළමනාකරණය කර ගැනීම සඳහා ණය කමිටුව සහ වත්කම් - වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කරනු ලබයි. යම් අවදානම් බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම් වී කමිටුව විසින් තිරණය කරන මට්ටම්වලින් එපිට පවතින අවස්ථාවලදි එවැනි විශේෂ අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග මෙම කමිටුව විසින් ගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණතාව සහ අවංකකම පිළිබඳ සමාලෝචනය කර තීරණ ගැනීමට සහ මූල්‍ය තොරතුරු සහ වේවායේ අවංකකම, ක්ෂේත්‍රයේ ප්‍රධාන අවදානම් අංග සහ බැංකුවේ සුදුසු අවදානම් සාධක සහ ආයතනික පාලනය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. ආයතනික පාලන ව්‍යවහාර පරිදි මෙහෙයුම් මට්ටම දක්වා බලය බෙදීම නොමැතිව එහි අධීක්ෂණය යටතේ මෙහෙයුම්වල තීරණාත්මක ක්ෂේත්‍ර අධ්‍යක්ෂ මණ්ඩලය රඳවාගෙන ඇත.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ යහපත් අවදානම් කළමනාකරණය විසින් වඩා අඩු සාපේක්ෂ අවදානම් සහ පාර්ශ්වයන් අතර වඩා අඩු බැඳියා පිළිගැටුම් තුළ බැංකුව ක්‍රියාත්මක වන බව සඳහන් කරයි. යහපත් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ මෙවැනි වාසි බැංකුවේ කාර්යසාධනය වර්ධනය කිරීමට හේතු වී ඇත.

කළමනාකරණ කමිටු

බාසල් මාර්ගෝපදේශවලට අනුගත වෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය විදිනෙදා කළමනාකරණයට සහභාගි නොවිය යුතු වුවත් කළමනාකරණය විනිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත යුතුය. බැංකුවේ කටයුතු කළමනාකරණය

කිරීමේදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමන්විත යම් විශේෂිත කමිටුවලට ව්‍යාපාර මෙහෙයුම් පවරා ඇත. මෙවැනි කමිටු අධ්‍යක්ෂ මණ්ඩලයට එහි පාලන කාර්යයන්හිදී සහයවීම සඳහා ස්ථාපිත කරනු ලැබ ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ආරක්ෂිත සහ යහපත් ආකාරයෙන් බැංකුවේ විදිනෙදා කටයුතු කරගෙන යනු ලබන බවට මඟපෙන්වීම සහ පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇති කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම කමිටු විසින් වාර්තා ඉදිරිපත් කළ යුතුය.

මෙම සංදර්භය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට අමතරව පහත සඳහන් කළමනාකරණ කමිටු පත්කර ඇත.

- විධායක ණය කමිටුව (ECC)
- වත්කම්/වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)
- අලෙවිකරණ කමිටුව (MC)
- නිෂ්පාදන සංවර්ධන කමිටුව (PDC)
- අයකිරීම් කමිටුව (RC)
- විධායක වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC)

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශය සහ පාලනය යටතේ, ජ්‍යේෂ්ඨ කළමනාකරණය විසින් ව්‍යාපාර ක්‍රමෝපාය, අවදානම් රුචිය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිපත්තිවලට අනුරූප වන ආකාරයකින් බැංකුවේ කටයුතු සිදුකර පාලනය කළ යුතු අතර, ඒ අනුව ඉහත සඳහන් කළමනාකරණ කමිටුවල සාමාජිකයින්ට ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ව්‍යාපාරය සහ සේවකයින් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පළපුරුද්ද. දක්ෂතා සහ අවංකකම තිබිය යුතු අතර, ඔවුන්ගේ දක්ෂතා පවත්වාගැනීමට සහ වැඩි කර ගැනීමට මෙන්ම ඔවුන් වගකීමට බැඳී සිටින ක්ෂේත්‍රවලට අදාළ සංවර්ධනයන් පිළිබඳ යාවත්කර තබාගැනීම සඳහා විධිමත් පුහුණුව වෙත ප්‍රවේශය ඔවුන්ට ලබා දේ. ශාඛා කළමනාකරුවන් ජ්‍යේෂ්ඨ කළමනාකරණය සමඟ මාසයකට එක්වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම්වල සහභාගි වෙති.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல / My No. BAF/G/SMIB/CG/2019/3

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 30 September 2020

සභාපති,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සපුරාලීම සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සිද්ධි වාචක සෙවීම් පිලිබඳ විගණකාධිපතිගේ වාර්තාව - 2019 දෙසැම්බර් 31

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීමේ අවශ්‍යතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙලකර ඉදිරිපත්කර ඇති පාලන වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුම 1 ට සම්බන්ධකර ඇති ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැංවීම මා විසින් සිදුකරනු ලැබ ඇත. විකඟ වූ ක්‍රියාමාර්ග සඳහා අදාලවන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති 4400 (SLSPS 4400) හි දක්වා ඇති මූලධර්මවලට අනුකූලව මෙම කටයුතු සිදුකර ඇත. ආයතනික පාලන විධිවිධානයන්ට අනුකූලවීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඔබට සහයවීම පිණිස පමණක් මෙම ක්‍රියාපටිපාටි ඉටුකර ඇත.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාවේ 1 ඇමුණුමෙහි මා විසින් දක්වා ඇත.

ඉහත ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන බැඳීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් අර්ථවත් නොවන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ආයතනික පාලන විධිවිධාන සඳහා අනුකූලවීම සම්බන්ධයෙන් යම් සහතික කිරීමක් මම ප්‍රකාශ නොකරමි.

ඉහත ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන බැඳීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලව පාලන වාර්තාව පිළිබඳ මා විසින් අතිරේක ක්‍රියාපටිපාටි ඉටුකර හෝ විගණනයක් හෝ සමාලෝචනයක් සිදුකර තිබිනි නම්, ඔබට වාර්තාකළ යුතුව තිබූ අනෙකුත් කරුණු මාගේ අවධානයට ලක්විය යුතුව තිබිනි.

මාගේ වාර්තාව මෙම වාර්තාවේ පලමුවන පරිච්ඡේදයේ විස්තරකර ඇති කාර්යයන් සඳහා සහ ඔබගේ දැනගැනීම පිණිස පමණක් වන අතර, එය වෙනත් අරමුණු සඳහා හෝ වෙනත් කිසිම පාර්ශවයක් සඳහා ලබාදීම පිණිස නොවේ.

මෙම වාර්තාව ඉහත දක්වා ඇති අයිතමයන් සම්බන්ධයෙන් පමණක් වන අතර, සමස්ථයක් ලෙස ගත්විට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කිසියම් මූල්‍ය ප්‍රකාශයක් සම්බන්ධයෙන් විස්තර දැක්වීමක් නොවේ.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ආයතනික පාලනය - ඉතිරි කොටස...

බැංකුවේ අනුකූලතා නිලධාරීන් සඳහා ප්‍රශ්නාවලියග

සටහන : ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගයේ 3 වගන්තියට අනුකූලව පහත සඳහක් අංකකිරීම භාවිතා කෙරේ. 1 සහ 2 කොටස් මෙම ලියවිල්ල සඳහා අදාළ නොවේ.

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**					
3(1)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ආරක්ෂාව සහ අඛණ්ඩතාව ශක්තිමත් කර ඇති බව සහතික කිරීමට ගත යුතු ක්‍රියාපටිපාටි	අනුකූලවිය				
	අ බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරීක්ෂා කිරීම	අනුකූලවිය			2019 - 2023 කාල පරිච්ඡේදය සඳහා වන ආයතනික සැලැස්ම සහ 2019 සඳහා කාර්යය සැලස්ම 2019.04.30 දින පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 19/04/28 යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.	**අනුකූලවිය** 2019 - 2023 කාල පරිච්ඡේදය සඳහා වන ආයතනික සැලැස්ම සහ 2019 සඳහා කාර්යය සැලස්ම සහ 2019.04.30 දින පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 19/04/28 පරීක්ෂා කරන ලදී.
	බැංකුව විසින් බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් බැංකුව තුළ සන්නිවේදනය කර තිබේද යන්න පරීක්ෂා කිරීම	අනුකූලවිය			2019 වසර තුළ ජ්‍යේෂ්ඨ කළමනාකරණ රැස්වීම් සහ ශාඛා කළමනාකරුවන්ගේ රැස්වීම්වලදී එක් එක් අංශයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් මගින් ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් සන්නිවේදනය කර ඇත	**අනුකූලවිය** 2019/08/23 දින පැවති ශාඛා කළමනාකරුවන්ගේ රැස්වීම් වාර්තාව පරීක්ෂා කරන ලදී.
	ආ බැංකුවේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරීක්ෂා කිරීම	අනුකූලවිය			සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය (ආයතනික දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ) ආයතනික සැලැස්මේ ඇතුලත් වේ. එය 2019.04.30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත වී ඇත.	**අනුකූලවිය** 2019/04/30 දින පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 19/04/28 හි ආයතනික සැලැස්ම සඳහා අනුමැතිය පරීක්ෂා කරන ලදී.
	සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි හා යාන්ත්‍රණ ඇතුළත් සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය සහ එය ලේඛණගත කිරීම පරීක්ෂා කිරීම	අනුකූලවිය			සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි හා යාන්ත්‍රණ ඇතුළත් සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය බැංකුව විසින් ලේඛණගත කර ඇත.	**අනුකූලවිය** ආයතනික සැලැස්ම පිළිබඳ 34 සිට 37 දක්වා පිටු බලන්න

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය තුළ අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක අඩංගු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			2019-2023 දක්වා මැනිය හැකි ඉලක්ක ආයතනික සැලැස්ම තුළ ඇතුළත් වී ඇත.	**අනුකූලවිය** ආයතනික සැලැස්ම පිළිබඳ 36 සිට 54 දක්වා පිටු බලන්න
	ඇ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගත් අවදානම් කලමනාකරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන්හි විචක්ෂණශීලි බව මෙන්ම ඒවා නිසි පරිදි ක්‍රියාවට නංවා ඇත් දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව කලින් කලට හඳුනාගත් අවදානම් පිළිබඳව අවධානය යොමුකරයි. එමනිසා අවදානම් කලමනාකරණය සඳහා සුදුසු පද්ධතියක් තිබේදැයි තහවුරු කරගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුවේ විෂය ක්ෂේත්‍රය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ රාමුව සහ ස්වයං තක්සේරු ක්‍රියාවලිය, පීඩන පරීක්ෂණ ප්‍රතිපත්තිය සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ පද්ධතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. කාර්තුමය පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කරන මූලික කාර්යසාධන දර්ශක හා පීඩන පරීක්ෂණ ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කරයි.	**අනුකූලවිය** 2019.11.13 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව රැස්වීම් සහ එම කමිටුවේ විෂය ක්ෂේත්‍රය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 18.09.132.04.07 මත අනුමත කිරීම බලන්න

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඈ තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් හා ණය ගැනුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමග සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමතකර ක්‍රියාත්මක කරන්නේ දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			බැංකුව සහ ගනදෙනුකරුවන් අතර ඵලදායී සන්නිවේදන ක්‍රියාවලියක් සඳහා ගනුදෙනුකාර ප්‍රඥප්තිය (පිටපතක් අමුණා ඇත) ප්‍රයෝජනයට ගනු ලබයි. එමෙන්ම, බැංකුවේ අයිතිය 100% රජය සතුවන අතර සියලුම අධ්‍යක්ෂවරු මුදල් අමාත්‍යාංශය විසින් පත්කරනු ලබයි. එම නිසා රජය, කොටස්කරුවන්, තැන්පත්කරුවන්, ණය හිමියන්, හා ණය ගැනුම්කරුවන් සහ බැංකුව අතර ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලබයි. කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පුවත්පත්වල ප්‍රසිද්ධ කරනු ලබයි. සන්නිවේදන ප්‍රතිපත්තිය 2015 දෙසැම්බර් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. :අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 15/11/08 තුළ වාර්තා අංක 15.11.155.01). 2020 දී පත්කළ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කරුණ නැවත සලකාබලා අවශ්‍ය වෙනස්වීම් සිදුකරනු ඇත.	**අනුකූලවිය** බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය පරීක්ෂා කරන ලදී. 2015 දෙසැම්බර් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය අනුමත කරන ලදී (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 15/11/08 තුළ වාර්තා අංක 15.11.155.01).

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඉ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා කලමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත් බව හා විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම;	අනුකූලවිය			අභ්‍යන්තර පාලනය සහ කලමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය හා විශ්වාසනීයත්වය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල වීකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව වාර්තා පිලිබඳ සමාලෝචනයක් සිදුකරයි. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක . 19.12.171.01- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක .19/12/23- 2019.08.27 දින පැවති BIRMC රැස්වීමේ අවදානම් තක්සේරු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 19.14.213.01- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක No.19/14/26 - 2019.10.21 දින පැවති BIRMC රැස්වීමේ අවදානම් තක්සේරු වාර්තාව ප්‍රධාන බැංකුකරණ පද්ධති ප්‍රසම්පාදනය දැනට ආරම්භ කර ඇත. මේ මගින් අනාගතයේ බොහෝ ගැටළු ආමන්ත්‍රණය කරනු ඇත.	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 19.12.171.01- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක.19/12/23 නිරීක්ෂණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක.19.14.213.01- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක.19/14/26

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඊ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති පරිදි (i) ප්‍රතිපත්ති කෙරෙහි දැඩිව වගකියන (ii) සෘජු ක්‍රියාකාරකම් හා (iii) ව්‍යාපාරික කටයුතු මෙහෙයුම් හා අවදානම් කලමනාකරණය වැනි තනතුරුවලට අදාළ ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන පත්කර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 හි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් හඳුනාගෙන පත්කර ඇත. 2015/12/11 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15.11.149.26 (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා No.15/10/57) නිරීක්ෂණය කරන ලදී. තවදුරටත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ සහකාර සාමාන්‍යාධිකාරීන් වැනි ජේෂ්ඨ කලමනාකරණ නිලධාරීන් බඳවාගැනීමට පියවර ගෙන ඇත.	**අනුකූලවිය** 2015/12/11 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15.11.149.26 (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 15/10/57) නිරීක්ෂණය කරන ලදී.
	උ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට අනුව ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් මගින් බැංකුවේ කටයුතුවල සුදුසු පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතාකර ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් මගින් බැංකුවේ කටයුතුවල සුදුසු පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතාකර ඇත. සභාපති විධිමත් කළමනාකරණ රැස්වීම් පවත්වයි.	**අනුකූලවිය** සභාපතිගේ පැමිණීම සහතික කිරීමට 2019.02.27 දින පැවති කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව නිරීක්ෂණය කරන ලදී.
	ඌ ප්‍රධාන කලමනාකරණ නිලධාරීන් හා අධ්‍යක්ෂවරුන්හට ඔවුන්ගේ ප්‍රධාන වගකීම් හා අධිකාරිත්වයේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා අධිකාරිත්වය 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ පරිශේදු අංක 07 යටතේ නිර්වචනය කර ඇත. එක් එක් අධ්‍යක්ෂවරු අනු කමිටුවක් හෝ කිහිපයක් සඳහා පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරු අනු කමිටු සඳහා වෙන්කර ඇති අතර, සෑම කමිටු ප්‍රඥප්තියකම වගකීම් පිළිබඳ නිර්වචනයන් සිදුකර ඇත. ප්‍රධාන කලමනාකරණ නිලධාරියාගේ බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ලැයිස්තුගත කර ඇත.	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුවේ විෂය ක්ෂේත්‍රය සහ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ ප්‍රඥප්ති පරීක්ෂා කරන ලදී.

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඊ (i) අධ්‍යක්ෂවරු හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තේරීම, නම් කිරීම හා පත්කිරීම, (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ (iii) දුර්වලතාවයන් හඳුනාගැනීම සහ අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකිරීම පිලිබඳ කරුණු ඇතුලත්වන අධ්‍යක්ෂවරුන්ගේ පාලන පරිචයන්හි ඇති සඵලතාවය කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩලය තේරීම නම්කිරීම හා පත්කිරීම 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විහි පාලන පරිචයක් පිලිබඳව වාර්ෂික ඇගයීමක් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ස්වයං ඇගයීම් පත්‍රිකාවල තහවුරු කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම විගණනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිත්වය ප්‍රශ්නාවලියක් තුළින් තක්සේරු කෙරේ.	**අනුකූලවිය** ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් යවන ලද ආවරණය ලිපිය හා විහි ලද මුද්‍රාව නිරීක්ෂණය කරන ලදී.
	ඌ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත්කිරීම සඳහා අනුප්‍රාප්තික සැලස්මක් ඇති බව පරීක්ෂාකිරීම	අනුකූලවිය			2017 වසර සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලස්මක් පවතී. 2017/04/28 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක 17.04.52.04 (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක17.04.21) අධ්‍යක්ෂ මණ්ඩලය සේවක සංඛ්‍යාව, බඳවාගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය සමාලෝචනය සඳහා පියවර ගෙන ඇත. තවද, බැංකුව වෙත අනාගත නායකයින් පුනුණු කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මත කරමින් සිටී.	**අනුකූලවිය** 2017 වසර සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලස්ම පරීක්ෂා කරන ලදී. 2017/04/28 දින පැවැත්වූ රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විය අනුමත කරන ලදී. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක.17.04.21) සේවක සංඛ්‍යාව, බඳවාගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය සමාලෝචනය පරීක්ෂා කරන ලදී.

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඔ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහළ කලමනාකරණ නිලධාරීන් සමග ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමේ සන්නිවේදන ක්‍රම ඇති කිරීමේ සහ ආයතනික අරමුණුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා නියමිත පරිදි රැස්වීම් වාර පැවැත්වීමට නියම කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකටම සහභාගී වන ලෙස සාමාන්‍යාධිකාරීවරයාට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරාධනා කර, එමඟින් මනා සන්නිවේදනයක් පවත්වාගෙන යෑමත් ආයතනික අරමුණුවල ප්‍රගතිය අධීක්ෂණය කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත. තවද, කලමනාකරණය, ආයතනික අරමුණු ලඟා කර ගැනීම සඳහා කටයුතු කරන බව තහවුරු කිරීම වෙනුවෙන් සෑම මසකම කලමනාකරණ කමිටු රැස්වීම් හා ජ්‍යෙෂ්ඨ කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනුම් දී ඇත.	**අනුකූලවිය** 2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පරීක්ෂා කිරීම සහ සාමාන්‍යාධිකාරීගේ පැමිණීම සහකිත කරන ලදී.
	ඕ නියාමන පරිසරය අවබෝධකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාමාර්ග සමඟ ක්‍රියාවලි ගෙන තිබේද යන්න සහ බැංකුව නියාමකයින් සමග සම්බන්ධතාවයක් පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම.	අනුකූලවිය			පැහැදිලි කාලානුරූප සන්නිවේදනයක් හා නියාමකයින්ගේ අරමුණු සමඟ අන්‍යෝන්‍ය අවබෝධය පදනම්ව නියාමකයින් සමඟ ක්‍රමික සම්බන්ධතාවයක් පවත්වාගෙනයාම සඳහා අනුකූලතා නිලධාරියෙකු පත්කර ඇත. අනුකූලතා අංශය නිරතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව වෙත වාර්තා කරන අතර අදාළ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රගතිය සමාලෝචනය කරයි. විගණන කමිටුවේ විෂය ක්ෂේත්‍රය අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මේ සම්බන්ධයෙන් බැංකුවට සහාය දක්වයි.	**අනුකූලවිය** නිරතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව වෙත අනුකූලතා අංශය විසින් යවනලද වාර්තා පරීක්ෂා කරන ලදී.

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ක බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීමට මෙන්ම ඔවුන් අධික්ෂණ තත්ත්වයේ තබා ගැනීම සඳහා ක්‍රියා පිලිවෙතක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බව පරීක්ෂා කිරීම.			අදාළ නැත	1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ දක්වා ඇති අවශ්‍යතා අනුව බාහිර විගණකවරයකු පත්කර ඇත. එම විධිවිධාන අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වෙයි. සභාපති විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය සමඟ රැස්වීමක් ඉල්ලා ඇත.	**අදාළ නැත** 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ දක්වා ඇති අවශ්‍යතා අනුව බාහිර විගණකවරයකු පත්කර ඇත.
3(1)(ii)	සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා (ප්‍ර.වි.නි.) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇති බව පරීක්ෂා කිරීම. සභාපතිවරයාගේ සහ (ප්‍ර.වි.නි.)ගේ කාර්යභාරය සහ වගකීම් මෙම නියෝගයන්හී 3 (5) නියෝගයට අනුකූලව ඇත්දැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව, සභාපතිවරයා අදාළ රේඛිය අමාත්‍යංශය විසින් පත්කරනු ලැබ ඇත. සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිවරයා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත. ඉහත සඳහන් නියෝගවලට අනුව සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යයන් හා වගකීම් පරීක්ෂාකර තහවුරුකර ඇත.	**අනුකූලවිය** 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ අංක 14 (1) පරිච්ඡේදය බලන්න
3(1)(iii)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා තිබේද යන්න හා මසකට වරක් වතාවක් බැගින් වසරකට අවම වශයෙන් දොළොස් වතාවක් රැස්වීම් පවත්වා තිබේදැයි පරීක්ෂා කිරීම.	අනුකූලවිය			2019 වසර තුළ නව අධ්‍යක්ෂ මණ්ඩලය ආසන්න වශයෙන් මාසයක කාලපරාශයක් තුළ 14 වතාවක් රැස්වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා හා පැමිණීමේ ලේඛන පවතී. 2020 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දින දර්ශනය සකස් කරනු ලබයි.	**අනුකූලවිය** පැමිණීමේ ලේඛන පරීක්ෂා කරන ලද අතර 2019 දී. අධ්‍යක්ෂ මණ්ඩලය 14 වතාවක් රැස්වී ඇත.

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(1)(iv)	විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට කරුණු හා යෝජනා ඇතුලත් කිරීමට සියළුම අධ්‍යක්ෂවරුන්ට හැකිවන පරිදි සැකසූ වැඩ පිලිවෙලක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇති බව පරීක්ෂා කිරීම සහ මෙහිදී වීම කරුණු හා යෝජනා ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ බැංකුවේ අවදානම් කළමනාකරණයට අදාළ වීම	අනුකූලවිය			න්‍යාය පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ අධීක්ෂණය යටතේ පිලියෙල කරනු ලබන අතර එය සාමාන්‍යාධිකාරීවරයා/ ප්‍රධාන විධායක නිලධාරී විසින් පරීක්ෂාකරනු ලබයි. අධ්‍යයනය කිරීමට හා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි රැස්වීම් පැවත්වීමේ නිවේදනය හා න්‍යාය පත්‍රය සියළුම අධ්‍යක්ෂවරුන් වෙත රැස්වීම් පැවැත්වීමට අවම වශයෙන් දින 07 ට පෙර ලැබීමට සලස්වයි. ඒ අනුව බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනයට හා අවදානම් කලමනාකරණය කිරීමට සම්බන්ධ කරුණු හා යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරනු ලබයි	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් යවනලද තැපෑල සහ න්‍යාය පත්‍රයේ පිටපත පරීක්ෂා කරන ලද අතර එය රැස්වීමට දින 07කට පෙර බව පරීක්ෂා කරන ලදී.
3(1)(v)	සියලුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම්වලට සහභාගීවීම සඳහා අවස්ථාව ලබා දීම පිණිස අවම වශයෙන් දින 07 ට පෙර දැනුම් දීම සිදුකරන බව පරීක්ෂා කර ඇත. ඉන් සියලු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහාත් දැනුම් දීම සිදුකර ඇත.	අනුකූලවිය			අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පවසන පරිදි ඔහු විසින් අත්සන් තබා අනුමත කර පිලියෙල කරන ලද න්‍යාය පත්‍රය රැස්වීම් පැවැත්වීමට දින 07 ට ප්‍රථම සෑම අධ්‍යක්ෂවරයකු වෙතම තැපැල් මගින් හෝ රැගෙන ගොස් බාර දීම සිදුකරයි.	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් යවන ලද තැපැල්වල පිටපත පරීක්ෂා කරන ලදී
3(1)(vi)	මාස 12 ක් ඇතුළත පැවැත්වූ රැස්වීම් වාර වලින් 2/3 කට සහභාගී නොවූ හා නොකඩවා රැස්වීම් වාර 03 ක් සඳහා සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන ඇති බව පරීක්ෂා කරන ලදී. අධ්‍යක්ෂවරයෙකු වෙනුවට නම් කරන ලද විකල්ප අධ්‍යක්ෂවරයෙකු රැස්වීම් වලට සහභාගි කරවීම රැස්වීම් වලට සහභාගී වුවාසේ පිළිගනු ඇත.	අනුකූලවිය			අවශ්‍ය පරිදි අධ්‍යක්ෂවරු රැස්වීම් වලට සහභාගී වී ඇති නිසා එවැනි පියවර ගැනීමක් අවශ්‍ය නොවීය. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ලේඛනය හා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේඛනය පවතී.	**අනුකූලවිය** 2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පැමිණීම පරීක්ෂා කරන ලදී

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(1)(vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම් ලේකම් කෙනෙකු පත්කර ඇති බව පරීක්ෂා කරන ලද අතර, එම අයගේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩල හා කොටස් කරුවන්ගේ රැස්වීම්වල ලේකම්ගේ කාර්යභාරය ඉටු කිරීමත් අඥාපනතේ හා අනෙකුත් නීතිරීතින්හි දක්වා ඇති කටයුතු ඉටු කිරීමත්ය.	අනුකූලවිය			2007 අංක 07 දරණ සමාගම් පනත හා 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස්කරුවන්ගේ රැස්වීම් වලදී ලේකම්ගේ කාර්යභාරය ඉටුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වගකිවයුතු අතර ආඥා පනත්වල සහ අනිකුත් නීතිරීතින් හි අර්ථ දක්වා ඇති වෙනත් කාර්යයන් ඉටුකිරීම ද සිදුකල යුතුය.	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නීතිඥයෙක් වන අතර ඔහු 2007 අංක 07 දරණ සමාගම් පනත හා 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියට අනුකූලව වේ. නීතිඥ සහතිකය නිරීක්ෂණය කළෙමු.
3(1)(viii)	සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට ඇති ක්‍රියාවලිය පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සියළුම අධ්‍යක්ෂවරුන්හට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් අවශ්‍ය පරිදි ලබා ගැනීමට පිවිසීම ඇත.	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ ප්‍රකාශයන්ට අනුව සියළුම අධ්‍යක්ෂවරුන්හට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් අවශ්‍ය පරිදි ලබා ගැනීමට හැකියාව ඇත
3(1)(ix)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තබා ගැනීම සමාගම් ලේකම් විසින් සිදු කරන අතර, සියලුම අධ්‍යක්ෂවරුන්ට එවැනි වාර්තා පිරික්සීමට ක්‍රියාවලියක් තිබේද යන්න පරීක්ෂා කරන ලදී.	අනුකූලවිය			සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිලිවෙලින් ගොනු කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ භාරයේ තබාගනී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිලිබඳ ඕනෑම තොරතුරක් ඕනෑම අවස්ථාවක ලබාගැනීමට ඕනෑම අධ්‍යක්ෂවරයකුට අවස්ථාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා නිරීක්ෂණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සඳහා වෙනම අංශයක් පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනටමත් තීරණයක් ගෙන ඇත.	**අනුකූලවිය** සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිලිවෙලින් ගොනු කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ භාරයේ තබාගන්නා බව නිරීක්ෂණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ ප්‍රකාශයන්ට අනුව සියළුම අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ තොරතුරු කරා පිවිසීම ඇත

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(1)(x)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත සඳහන් කරුණු අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම: (අ) අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලදී අධ්‍යක්ෂ මණ්ඩලය භාවිතා කල දත්ත හා තොරතුරු සාරංශයක් (ආ)අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කල කරුණු (ඇ)කරුණු හෙලිදරව් කර ගැනීමේ සාකච්ඡා සහ මතබේදයට තුඩු දුන් කරුණු, අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි සැලකිල්ලකින් හා විචක්ෂණශීලීව ඔවුන්ගේ රාජකාරී ඉටු කරමින් සිටියේද යන වග නිරූපණය කරයි. (ඈ)අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති හා අදාළ නීති හා රෙගුලාසි පිළිපැදීම පිළිබඳ අනුකූලතාවය දක්වන කරුණු (ඉ)බැංකුව මුහුණදෙන අවදානම් අවබෝධ කර ගැනීම හා යොදාගත් අවදානම් කලමනාකරණ ක්‍රියාමාර්ගවල දළ විශ්ලේෂණයක් සහ (ඊ)තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූලවිය			ඉහත සඳහන් සියලු කරුණුවලට අදාළව ප්‍රමාණවත් විස්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල අඩංගුවී ඇති බව තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්ථා පරීක්ෂාකරන ලදී. පොදුවේ, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවන් හි පහත සඳහන් දෑ අඩංගු වේ. i) පෙර රැස්වීම්වල ස්ථිර කරන ලද වාර්තා ii) පෙර රැස්වීම්වල වාර්තාවලින් මතු වූ කරුණු iii) පෙර රැස්වීම් වාර්තාවලින් කල් තැබූ කරුණු iv) අයකර ගැනීම් පිලිබඳ කරුණු v) මූල්‍ය කරුණු vi) අලෙවිකරණ සහ ප්‍රකාශනය කරන ලද කරුණු vii) පරිපාලන සහ පුද්ගල කරුණු viii)ණය කරුණු ix) අවදානම් කරුණු x) නෛතික කරුණු සහ xi) වෙනත් කරුණු.	**අනුකූලවිය** 2019 වසර සඳහා 14 වැනි රැස්වීමේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පරීක්ෂාකරන ලද අතර එම වාර්තා ප්‍රමාණවත් විස්තර සමඟ වාර්තාකර ඇති බව සහතික කරන ලදී.

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(1)(xi)	සාධාරණ ඉල්ලීමකින් පසුව සුදුසු අවස්ථාවන්හි දී ස්වාධීන වෘත්තිය උපදෙස් බැංකුවේ වියදමින් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ට හැකිවීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟවූ ක්‍රියා පිලිවෙත් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			තීරණ ගැනීමේ දී හා රාජකාරී කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය වූ විටක ස්වාධීන වෘත්තීය උපදෙස් බැංකුවේ වියදමින් අධ්‍යක්ෂවරුන්ට ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. සාමාන්‍යයෙන් මේ සඳහා රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරයි.	**අනුකූලවිය** බදු උපදේශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදුන් 2019.08.09 දින පැවති 10 වැනි රැස්වීමේ වාර්තාව නිරීක්ෂණය කරනලදී.
3(1)(xii)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ බැඳියා පිලිගැටුම් නොමැතිවීම හෝ පැවතීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාපාටි පැවතීම, ඒ පිළිබඳ වාර්තා කිරීම හා ඒවා නිරවුල් කිරීම සහ එවැනි තත්ත්වයන් වලක්වාලීමට සුදුසු ක්‍රියාමාර්ග පැවතීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය			සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.(අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35) 2016.06.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 28 වගන්තියට අනුව, කිසිදු ණය මුදල් කිසිදු අධ්‍යක්ෂවරයෙක්ට ලබා දී නොමැත.	**අනුකූලවිය** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 2016.08.16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/08/35 & අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා අංක 16.08.95.02 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 28 වගන්තියට අනුව, කිසිදු ණය මුදල් කිසිදු අධ්‍යක්ෂවරයෙක්ට ලබා දී නොමැත. කිසිදු ණය මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දී නොමැති බව සඳහන් කරමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සහතිකයක් ලබාගෙන ඇත.
	අධ්‍යක්ෂවරයකු ඔහු/ඇය හෝ ඔහුගේ /ඇයගේ ඥාති සම්බන්ධතාවයක් ඇති අයෙකු හෝ අධ්‍යක්ෂවරයාගේ සැලකිය යුතු උනන්දුවක් ඇති කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටීම පරීක්ෂා කිරීම.	අනුකූලවිය			එවැනි කිසිදු අවස්ථාවක් 2019 වසර තුළ සිදු නොවීය.	**අනුකූලවිය**

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ වන කරුණක් සඳහා ගණපූරණය සම්බන්ධයෙන් ඔහු/ඇය ගණන් ගෙන ඇති බව පරීක්ෂා කිරීම.			අදාළ නැත	චිවැනි කරුණක් 2019 වසර තුළ පැන නැගී නොමැති බැවින් මෙම කොටස අදාල නොවේ.	**අදාළ නැත**
3(1)(xiii)	නියෝග හඳුනාගැනීම සහ බැංකුවේ පාලනය සම්පූර්ණයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අධිකාරිත්වයේ පවතින බව තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආවේනික වූ විධිමත් සැලැස්මක් ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, බැංකුවේ විධිවිධානයන් හා පාලනය එහි බලය යටතේ දැඩිව පවතින බව හඳුනාගැනීම තිරණය කිරීම සඳහා වෙන්වූ කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය පවත්වා ගනී. 16.10.122.02 වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/10/40 නිරීක්ෂණය කරන ලදී.	**අනුකූලවිය** 2016 ඔක්තෝබර් 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක.16.10.40 සහ වාර්තා අංක. 16.10.122.02 නිරීක්ෂණය කරන ලදී.
3(1)(xiv)	බැංකුවට සිය වගකීම් ඉටුකල නොහැකි හෝ නොහැකිවීමේ තත්ත්වයට පත්විය හැකි බව හෝ බුන්වත් තත්ත්වයට පත්වීමට ආසන්න බව හෝ තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ ගෙවීම් අත්හිටුවීමට ආසන්න බව අධ්‍යක්ෂ මණ්ඩලයට හැඟි යන්නේ නම් බැංකුවේ තත්ත්වය පිළිබඳව යම්කිසි තීරණයක් හෝ පියවරක් ගැනීමට ප්‍රථම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වහාම දැනුම් දීම සිදුකල යුතු බව පරීක්ෂා කිරීම.			අදාළ නැත	චිවැනි අවස්ථා සිදු වී නොමැත.	**අදාළ නැත**
3(1)(xv)	මුදල් මණ්ඩලයේ අවශ්‍යතාවය පරිදි බැංකුවේ ප්‍රාග්ධන මට්ටම පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇති බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව (පළමුපෙළ) 21% සහ මුළු ප්‍රාග්ධන අනුපාතය (දෙවන පෙළ) 21.7% ක් වන අතර, 2019.12.31 දිනට රු.බි.5 ක අවම නියාමන ප්‍රාග්ධනය සමඟ බැංකුව අනුකූල වී ඇත.	**අනුකූලවිය** ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තොරතුරු ජාලය (Fin Net) පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 21% (Tier 1) සහ 21.7% (Tier 11) කි.

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(1)(xvi)	මෙම නියෝගයන්ගේ 3 නියෝගයට අනුකූලව සකස් කරන බැංකුවේ වාර්ෂික වාර්තාව, වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශයට පත් කරන බව බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			වාර්ෂික වාර්තාව තුළ මෙම නියෝගයන්ගේ 3 නියෝගයට අනුකූලව සකස් කරන වාර්ෂික ආයතනික පාලන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශයට පත් කර ඇත.	**අනුකූලවිය** බැංකුවේ 2018 වාර්ෂික වාර්තාව පරිදි ප්‍රකාශයට පත්කරන ලද ආයතනික පාලන වාර්තාවක් ඇත.
3(1)(xvii)	සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම වාර්ෂිකව ස්වයං තක්සේරුවක් සිදුකල යුතු බවට වැඩ පිලිවෙලක් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මකකර ඇති අතර එවැනි තක්සේරු පිළිබඳව වාර්තා පවතවාගෙන යෑම සිදු කිරීම කලයුතු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං තක්සේරු/ඇගයීම් ක්‍රියාවලිය 2019 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත	**අනුකූලවිය** අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයීම් පත්‍රිකා ලබාගෙන ඇත.
3(2)	**අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**					
3(2)(i)	අධ්‍යක්ෂ මණ්ඩලයේ 07 දෙනෙකුට නොඅඩු සහ 13 දෙනෙකුට නොවැඩි අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් අඩංගු විය යුතු බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 07 වන වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් පත්කරන සුදුසු හා යෝග්‍ය අධ්‍යක්ෂවරු නව දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.	**අනුකූල නොවිය** 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු 06 දෙනෙකුගෙන් සමන්විත විය
	අ ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුර හොබවන අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරයකුගේ මුළු සේවා කාලය අවුරුදු 9 නොඉක්මවන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			අධ්‍යක්ෂවරයකු ලෙස කිසිම අධ්‍යක්ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැත.	**අනුකූලවිය** කිසිම අධ්‍යක්ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැති බව නිරීක්ෂණය කරන ලදී.
	ආ කිසියම් අධ්‍යක්ෂවරයකු අවුරුදු 9 ට වඩා කාලයක් සේවයේ යෙදෙනවිට සංක්‍රාන්තික ප්‍රතිපාදන අනුගමනය කර ඇත්දැයි පරීක්ෂා කිරීම.			අදාළ නැත	අධ්‍යක්ෂවරයකු ලෙස කිසිම අධ්‍යක්ෂවරයෙකු වසර 09 ට වැඩි සේවා කාලයක් ගතකර නොමැත.	**අදාළ නැත** 2019 වාර්ෂික වාර්තාව තුළ ප්‍රකාශිත අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය බලන්න

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
3(2)(iii)	ප්‍රධාන විධායක නිලධාරියා ද ඇතුළුව විධායක අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වැඩි නොවන බව පරීක්ෂා කිරීම.	අනුකූලවිය			1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධානවලට අනුව රේඛීය මුදල් අමාත්‍යංශය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර ඔවුන් සියල්ලන්ම විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.	**අනුකූලවිය** 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය සහ 1984 අංක 28 දරන සංශෝධිත රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධානවලට අනුව රේඛීය මුදල් අමාත්‍යංශය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර ඔවුන් සියල්ලන්ම විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.
3(2)(iv)	අධ්‍යක්ෂ මණ්ඩලයට අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂ මණ්ඩල සංඛ්‍යාවෙන් තුනෙන් එකකට සමාන ගණනින් වැඩි අගයට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් සිටිය යුතු බව පරීක්ෂා කිරීම. විධායක නොවන අධ්‍යක්ෂවරු ස්වාධීන ලෙස සැලකිය හැකි නම් ඔහු හෝ ඇය:	අනුකූලවිය			සියලුම අධ්‍යක්ෂවරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, ඔවුන් සියල්ලන්ම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.	**අනුකූලවිය** 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය අනුව, සියලුම අධ්‍යක්ෂවරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, ඔවුන් සියල්ලන්ම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වේ.
	අ බැංකුවේ සෘජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයෙන් 1% ට වැඩි ප්‍රමාණයක් දැරීමත			අදාළ නැත	බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවන බැවින් එවැනි අවස්ථාවක් උදා නොවේ.	**අදාළ නැත**
	ආ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක් ඇතුලත ඔහු/ඇය මෙහි විධිවිධාන අංක 3(7) යටතේ විස්තර වන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවා යන ප්‍රමාණයක බැංකුව සමග කිසියම් ව්‍යාපාරික ගනුදෙනුවක් සිදුකර ඇති විට			අදාළ නැත	2017 මුල්‍ය ප්‍රකාශනවලට සටහන් 27 ට අනුව, එවැනි ගනුදෙනු සිදුවී නොමැත.	**අදාළ නැත**
	ඇ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක් තුළදී බැංකුව විසින් එහි සේවයේ යොදවා ඇති විට			අදාළ නැත	බැංකුව මගින් සේවයේ යොදවා ඇති එවැනි කිසිම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු නොමැත.	**අදාළ නැත** ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් යවන ලද ආවරණ ලිපිය හා එහි ලද මුද්‍රාව නිරීක්ෂණය කරන ලදි.

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවීය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඈ බැංකුවේ හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ප්‍රධාන විධායක නිලධාරි, ඉහල කලමනාකරණයේ නිලධාරියෙකු සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු සමග සමීප සම්බන්ධතාවයක් පවත්වා තිබීම (සමීප සම්බන්ධතාවය යනු කලත්‍රයාගේ හෝ මූල්‍යමය ලෙස යැපෙන දරුවෙක් මේ සඳහා අදහස් කෙරේ)			අදාළ නැත	බැංකු පනතේ 42 වගන්තියට අනුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් සිදුකළ ප්‍රකාශයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇති ස්වයං ප්‍රකාශනයට අනුව සමීප සම්බන්ධතාවයක් පැවැත්වූ එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු නොමැත.	**අදාළ නැත** ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් යවන ලද ආවරණ ලිපිය හා එහි ලද මුද්‍රාව නිරීක්ෂණය කරන ලදි.
	ඉ බැංකුවේ විශේෂිත පාර්ශ්වකරුවෙකු නියෝජනය කරන විට			අදාළ නැත	බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවේ.	**අදාළ නැත** බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතුවේ.
	ඊ සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක අධ්‍යක්ෂවරයකු සේවකයකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වන විට					
	I. මෙම නියෝගවල 3(7) නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ප්‍රමාණයක් ඉක්මවා යන යම්කිසි ගනුදෙනුවක් බැංකුව සමග පැවතීම හෝ			අදාළ නැත	2019න් අවසන් වූ වසර සඳහා කිසිම අධ්‍යක්ෂවරයෙකු බැංකුව සමග සෘජුවම හෝ වක්‍රව කිසියම් කොන්ත්‍රාත්තුවක් පිළිබඳව උනන්දුවක් දක්වා නොමැත	**අදාළ නැත**
	II. මේ සම්බන්ධයෙන් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සේවයේ යොදවා හෝ අධ්‍යක්ෂවරුන් හෝ සැලකිය යුතු කොටස්කරුවන් හෝ			අදාළ නැත	මේ සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් ඇති වී නොමැත	**අදාළ නැත**
	III. i මෙම නියෝගවල 3(7) නියෝගයේ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ප්‍රමාණයක් ඉක්මවා යන ගනුදෙනුවක් බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් බැංකුව සමග ඇති බව			අදාළ නැත	මේ සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් ඇති වී නොමැත	**අදාළ නැත**

ආයතනික පාලනය - ඉතිරි කොටස...

	නියෝගය	අනුකූලවිය	අනුකූල නොවිය	අදාළ නැත	අදාළ නැත යොමුව	විගණන නිරීක්ෂණ
	ඌ විචක්ෂණ අවශ්‍යතා, නීති, රෙගුලාසි හා අභ්‍යන්තර පාලනය සමග අනුකූලවීම සම්බන්ධ විස්තර සහ යම් වැදගත් අනුකූල නොවීම් නිවැරදි කිරීමට ගත් පියවර පිළිබඳව විස්තර ඇතුළත් වාර්තාවක්	අනුකූලවිය			වාර්ෂික වාර්තාව තුළ විචක්ෂණ අවශ්‍යතා, නීති, රෙගුලාසි හා අභ්‍යන්තර පාලනය සමග අනුකූලවීම සම්බන්ධ විස්තර සහ යම් වැදගත් අනුකූළ නොවීම් නිවැරදි කිරීමට ගත් පියවර පිළිබඳව විස්තර ඇතුළත් වෙනම වාර්තාවක් නොමැත. කෙසේවෙතත්, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවට අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම පිළිබඳ ප්‍රකාශය ඇතුළත් කර ඇත.	**අනුකූලවිය**
	එ බැංකුවේ අවදානම් කලමනාකරණයේ ඇති අඩුපාඩු පිළිබඳව නියාමන හා අධීක්ෂණ කරුණු අඩංගු ප්‍රකාශයක් හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ලබා දී ඇති මෙම උපදෙස්වලට අනුකූලවීම, මූල්‍ය මණ්ඩලය විසින් එසේ කරන ලෙස නියෝග කර ඇති අවස්ථාවක මහජනතාවට එවන් ගැටළු විසඳීමට බැංකුව ගත් ක්‍රියාමාර්ග ද සමග දැනුවත් කිරීම.	අනුකූලවිය			2019 වසර තුළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අනුකූල නොවීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් කිසිදු වාර්තාවක් ලබා දී නොමැත.	**අනුකූලවිය** අනුකූලතා නිලධාරීට අනුව, 2019 වසර තුළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අනුකූල නොවීම සම්බන්ධයෙන් කරුණු දක්වමින් කිසිදු වාර්තාවක් ලබා දී නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තා

පාලනය සඳහා අපගේ බැඳීම ශක්තිමත් කිරීම.



අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

සභාපති වරයාගේ සමස්ථ නිරීක්ෂණය 2019

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ මහ බැංකු පනත් නියෝගය යටතේ 3 (6) (11) හි දක්වා ඇති කරුණු, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත විගණන ප්‍රඥප්තිය සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට අනුකූලව කමිටුවේ කටයුතු පවත්වාගෙන යයි.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) අරමුණ වන්නේ එහි ආයතනික පාලන ව්‍යවහාරවල විනිවිදභාවය තහවුරු කිරීම වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, බැංකුවේ මූල්‍ය පරිපාලනය සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ ස්වාධීන වාස්තවික සමාලෝචනයක් සහතික කිරීමට සහ මහ බැංකුව විසින් දෙනලද මඟපෙන්වීම්වලට අනුකූලවීමට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත විෂය ක්ෂේත්‍රය අනුගමනය කරමින් අභ්‍යන්තර හා බාහිර සාධක මගින් හැඩගැසෙමින් එහි න්‍යාය පත්‍රය සමඟ තවත් වසරක් ප්‍රත්‍යක්ෂ කර ඇත.

කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර, 2019 වසර තුළ රැස්වීම් ගණන හා පැමිණීම පහත දැක්වේ. සාමාන්‍යාධිකාරී සහභාගී වන්නේ ආරාධනයෙනි.

පැමිණීම

	සාමාජිකයා	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ දරන තනතුර	කමිටු සාමාජිකයා		2019 වසර තුලදී පැමිණි රැස්වීම් වාර ගණන
			සිට	දක්වා	
1	කේ.ඩී.ආර්. ඔල්ගා මිය	සභාපති (වි.නො.අ)	2018 සැප්තැම්බර්	2019 නොවැම්බර්	05
2	විදුර මංචනායක මහතා	සභාපති (වි.නො.අ)	2019 මැයි	2019 නොවැම්බර්	04
3	දිල්හාන් ජයසිංහ මහතා	සභාපති (වි.නො.අ)	2019 මැයි	2019 නොවැම්බර්	02
4	සෙනාත් ද සොයිසා මහතා	විකල්ප සාමාජික (වි.නො.අ)	2019 මැයි	2019 නොවැම්බර්	01

මෙම කමිටුවේ සියලුම සාමාජිකයන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ වරු වන අතර ඔවුන් මූල්‍ය කළමනාකරනයේ නිපුනත්වයක් ලබා ඇති නීති, ගිණුම්, විගණන සහ මූල්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා ඇති පිරිසක් වේ. සාමාජිකයින්ගේ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අභ්‍යන්තර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන ප්‍රඥප්තිය

අභ්‍යන්තර විගණනයට සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණනයට එහි කාර්යයන් කාර්යක්ෂමව හා ස්වාධීනව කරගෙන යාමට සහයවීම පිණිස විගණන ප්‍රඥප්ති භාවිතා කරනු ලබයි. විගණන කමිටුවේ විෂයපථය, කාර්යයන්, වගකීම්, බලතල, වාර්තාකරණ ක්‍රියාපටිපාටිය, ස්වාධීනත්වය සහ විෂයමූලකත්වය මෙම ප්‍රඥප්තියේ ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති විෂය ක්ෂේත්‍රයට අනුකූලව කමිටුව කටයුතු කර ඇත. ප්‍රඥප්තිය ප්‍රකාරව, එහි පාලන වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවිමේදිද කමිටුවේ විෂයපථය පහත දැක්වේ:

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අවංකභාවය

(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයේ ඵලදායිත්වය,

(ඇ) බැංකුවේ බාහිර විගණන කාර්යයේ කාර්යසාධනය, සහ

(ඈ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය

වාර්තාකරණය

කමිටුව රැස්වීම්වල වාර්තා සමඟ එහි කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාවතක් ලබා දේ. කමිටුවේ විෂය ක්ෂේත්‍රය සියලුම වැදගත් අංශ තුළ සකස් කර ඇති බව කමිටුවේ මතය වේ.

කමිටුවේ කාර්යය හා වගකීම

බැංකුවේ මූල්‍ය, පරිපාලන හා මෙහෙයුම් කටයුතු කරගෙන යෑම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අරමුණ වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂය පථයට පහත සඳහන් කරුණු ඇතුලත් වේ.

- බැංකුවේ මූල්‍ය වාර්තාකරනය ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS) හා අනුකූලවේ ද යන්න නිරීක්ෂණය කිරීම.
- මෙහෙයුම් හා මූල්‍ය පාලන පද්ධතියේ ගුණාත්මක බව සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණනයේ විෂයපථය හා කාර්ය සාධනය ඇගයීම නිරීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම.
- බැංකුව මුහුණදෙන අවදානම් වැලක්වීමට/අවම කිරීමට අභ්‍යන්තර ක්‍රියාමාර්ග හා පාලන පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව - ඉතිරි කොටස...

- සියළුම නියාමන අවශ්‍යතාවයන් සමග අනුකූලවීම නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම.
- විගණන විෂයපථය හා වාර්තා පිලිබඳව බාහිර විගණකවරුන් සමග සහයෝග යෙන් ක්‍රියා කිරීම.
- ව්‍යාපාරයේ විගණන කටයුතු හා මූල්‍ය තත්ත්වය පිලිබඳව සැලකිය යුතු බලපෑමක් ඇති කරන සියළුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධයකින් සිටින බව කමිටුව තහවුරු කරයි.

රැස්වීම්

2019 වර්ෂය තුළ දී කමිටුව රැස්වීම් වාර පහක් (05) පවත්වා ඇත. ආරාධනය අනුව මෙම කමිටුවේ රැස්වීම් සඳහා විගණකාධිපතිගේ නියෝජිතයෙක් ලෙස රජයේ විගණන අධිකාරී සහභාගි විය. රැස්වීම්වලදී සාකච්ඡා කල කරුණු පිළිබඳ කෙටි විස්තරයක් පහත සඳහන් වේ.

2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු

කමිටුව පහත සඳහන් කාර්යයන් හී සහභාගි විය :

01. විගණන කමිටුව විසින් 2019 වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්තුමය වශයෙන් අවදානම් පදනම් අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමතකර සමාලෝචනය කරන ලදී.

02. 2018 වසර සඳහා විගණකාධිපතිගේ විමසුම්වල පිළිතුරුවල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

03. ශාඛාවන් හි අයවැය ඉලක්ක ලබා ඇති ප්‍රගතිය තුන් මසකට වරක් කමිටුව සමාලෝචනය කළ අතර මතු බලාපොරොත්තු ඉලක්ක ලබා ඇති ප්‍රගතිය, ශාඛා මගින් පවත්වාගෙන යන වාර්තා හා ලේඛණ පිලිබඳව ද කමිටුව විශේෂ අවධානයක් යොමු කරන ලදී.

04 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සහ 2019 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ කාර්තුවල බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කර ඇත.

05. සියළුම නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සිදුවන බව තහවුරු කිරීම සඳහා කමිටුව විසින් ත්‍රෛයිමාසික සමාලෝචනයක් සිදුකර ඇත.

06. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය පිළිබඳ ත්‍රෛයිමාසික සමාලෝචනයක් සිදුකර ඇත

07. අභ්‍යන්තර විගණන අංශයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය සමාලෝචනය සිදුකර ඇත

08. අභ්‍යන්තර විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් විගණන කමිටුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සමාලෝචනය සිදුකර ඇත

09. කමිටුව විසින් සිදුකරන ලද නිර්දේශයන්ට ප්‍රතිචාර දක්වමින් අභ්‍යන්තර විගණන අංශය විසින් සකස් කරන ලද අභ්‍යන්තර විගණන අත්පොතක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත තර තිබේ.

10 බැංකුවේ මූල්‍ය, පරිපාලන සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තා සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් නිරීක්ෂණය කර සමාලෝචනය කර ඇත. කමිටුව අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනයේ ඵලදායි බව සමාලෝචනය කර ඇත. අභ්‍යන්තර විගණන පැවරුම්වල ප්‍රමාණවත්බව හා ඒවා අනුමත කරන ලද විගණන වැඩසටහනට අනුව ඉටුකිරීම පිළිබඳව ද නිරීක්ෂණය කරයි.

බාහිර විගණන වාර්තා

ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වේ. කමිටු රැස්වීම් තුළ බාහිර විගණකගේ සොයාගැනීම් සාකච්ඡා කිරීමට බාහිර විගණකට ආරාධනය කරන ලදි විගණනයේ අරමුණ සඳහා බාහිර විගණකට අවශ්‍යවන සියලුම තොරතුරු සහ ලියවිලි ලබාදීම කමිටුව සහතික කර ඇත.

අවසන් විගණන වාර්තාවේ එලිදරව් කර ඇති බාහිර විගණනයේ දී සැලකිල්ලට බඳුන් වූ කරුණු සමාලෝචනය කර ඇති අතර, බාහිර විගණකවරුන්ගේ සැලකිල්ලට යොමු වූ කරුණු සඳහා අවධානය යොමුකර වීමට කළමනාකාරිත්වය ගත් නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ගවල ප්‍රමාණවත් බව ද සමාලෝචනය කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය

අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අත්පොතේ අර්ථ දක්වා ඇති අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූලව බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සඳහා අදාළ, තොරතුරු තාක්ෂණ හා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායි බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් කමිටුව සමාලෝචනය කර ඇත.



කේ.ඩී.ආර්. ඔල්ගා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණක කමිටුව/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විකල්ප අධ්‍යක්ෂවරයෙක් ඇතුළුව අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ. කමිටුව මෙහෙයවන පුද්ගලයින් අතර, සියලුම අධ්‍යක්ෂවරු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුවන බව දැකිය හැකිය. කමිටුව වෙත පත්කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන අතර වසර තුනක කාලසීමාවක් සඳහා වලංගු වේ.

2019 වසර අවසානයේදී අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සාමාජිකයින් පහත දැක්වේ.

කේ.ඩී.ආර්. ඔල්ගා මිය - සභාපති

විදුර මංචනායක මහතා - සාමාජික

දිල්හාන් ජයසිංහ මහතා - සාමාජික

සෙනාත් ද සොයිසා මහතා - විකල්ප සාමාජික

රැස්වීම්

මෙම කමිටුව වසරකට අවම වශයෙන් දෙවරක් හමුවිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවලදී රැස්වීම් කැඳවිය හැකිය. ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙක් වන අතර, ඔවුන් දෙදෙනා පුද්ගලිකව රැස්වීම තුළ සහභාගිවන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු විය යුතුය. සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි., සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා සැපයුම්), සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) කමිටුවේ සභාපතිගේ උපදේශය මත ආරාධිතයින් ලෙස රැස්වීම්වලට සහභාගි වෙති.

කමිටු රැස්වීම්වල කටයුතු අධ්‍යක්ෂවරුන්ගේ දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිරතුරුව වාර්තා කෙරේ. බැංකුව සම්බන්ධයෙන්, එක් කමිටු රැස්වීමක් 2019 වසර පවත්වන ලදී.

රැස්වීම්වලදී කමිටු සාමාජිකයින්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ දරන තනතුර	සහභාගිවිය යුතු රැස්වීම් ගණන	සහභාගි වූ රැස්වීම් ගණන
කේ.ඩී.ආර්. ඔල්ගා මිය	සභාපතිනිය	01	01
විදුර මංචනායක මහතා	සාමාජික	01	01
දිල්හාන් ජයසිංහ මහතා	සාමාජික	01	-
සෙනාත් ද සොයිසා මහතා	විකල්ප සාමාජික	01	01

ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

කාර්යභාරය, වගකීම් සහ රාජකාරි

ආයතනයේ ආයතනික පාලනයේ කොටසක් ලෙස කටයුතු කරන කමිටුවක් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය නැවත තෝරාපත් කර ගැනීම, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් කිරීම සහ බැංකු පනත යටතේ සිදුකළ 3 (3) නියෝගයේ ලබාදෙන නිර්ණායක තුළ විශේෂයෙන් දක්වා ඇති පරිදි තනතුරු දැරීම සඳහා යෝග්‍යතාව සහ සුදුසුකම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍ර.වි.නි, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඇගයීම සහ ප්‍රවීනි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලියයුතු යෝග්‍යතාවයට අවශ්‍ය නිර්ණායක සකස් කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කර නිර්දේශ කිරීම (නිර්දේශ නොකිරීම) සිදු කරයි.

කමිටුවට පවරන කාර්යයන් ඉටු කිරීම මගින්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත කටයුතු හා සම්බන්ධ වේ.

- ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරාගැනීම/පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම
- අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ සුදුසුකම මෙන්ම ඔවුන්ගේ කටයුතු ඇගයීමට ලක් කිරීම
- ප්‍ර.වි.නි. සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යෝග්‍යතාව සහ සුදුසුකම ඇගයීමට ලක් කිරීම.

එයට අමතරව, කමිටුව කලින් කල අපේක්ෂකයින් බඳවා ගැනීම සහ නම් කිරීම සඳහා යහපත් ක්‍රියාවලියක් සකස් කිරීමට එක්ව කටයුතු කරමින් බැංකුව වෙත අමතර/නව ප්‍රවීනතා අවශ්‍යතාවන් සලකා බලා නිර්දේශ කරනු ලැබේ.

කේ.ඩී.ආර්. ඔල්ගා
කමිටුවේ සභාපතිනිය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

2019 වසර තුළ කමිටුවේ සංයුතිය හා ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) විකල්ප අධ්‍යක්ෂවරයෙක් ඇතුළුව අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. කමිටුවේ ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකි.

2019 වසර අවසානයේදී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයින් පහත දැක්වේ.

2019 වසර තුළ සාමාජිකයින්

බර්ණාඩ් වසන්ත මහතා - සභාපති

විදුර මංචනායක මහතා - සාමාජික

සෙනාත් ද සොයිසා මහතා - සාමාජික

දිල්හාන් ජයසිංහ මහතා - විකල්ප සාමාජික

කමිටුවේ විෂයපථය

කමිටුව මානව සම්පත් ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා සැලසුම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේදී මඟපෙන්වා උපදෙස් ලබාදෙන අතර, මානව සම්පත් ආශ්‍රිත ගැටළු විසඳමින් අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කරයි.

මෙම කමිටුව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ඉලක්ක සහ පරමාර්ථ නියම කරන අතර, වරින්වර නියමකළ ඉලක්ක සහ පරමාර්ථ අනුව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කරමින් පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ දිරිදීමනා මත පදනම් කාර්යසාධනය පිළිබඳ අනෙකුත් ගෙවීම් තීරණය කරයි.

කමිටුවේ ප්‍රධාන රාජකාරි

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ රාජකාරිවලට පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවේ මානව සම්පත් හා කාර්ය මණ්ඩල ගැටළුවලට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ නියාමනය, ඇගයීම සහ ගැනීම සිදුකිරීම.
- සුදුසු පරිදි සියලුම මානව සම්පත් ගැටළු සම්බන්ධයෙන් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු හා මෙහෙයුම් කමිටු සමඟ උපකාරී කාර්යභාරයක් පවත්වා ගැනීම.
- කාර්ය මණ්ඩලයේ ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නිර්දේශ මත උපදෙස් නිකුත් කිරීම.
- සේවය දිගුකිරීම, වැටුප්, අතීතකාල ගෙවීම් වැනි ගෙවීම් කරුණු සහ වැඩකරන පැය ගණන, පැමිණීම සහ නිවාඩු වැනි සේවා කොන්දේසි සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- වර්තමාන වෙළෙඳපොල ප්‍රවනතා වෙත යොමු වෙමින් සේවක ප්‍රතිලාභ සැලසුම් පාලනය කරන රාමුව කලින්කල තක්සේරු කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- පාරිතෝෂික, විශ්‍රාම දීමනා, විශ්‍රාම වැටුප්, සේවක ප්‍රතිලාභය සඳහා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඇතුළුව ජීවිත රක්ෂණය වැනි ගෙවීම් සඳහා අරමුදල් ස්ථාපිත කිරීමට අවශ්‍ය විය හැකි යම් මුදල් වියදම් සඳහා රාමු සමාලෝචනය කර නිර්දේශ කිරීම.
- සෞඛ්‍ය හා ආරක්ෂාවට අදාළ ගැටළු පිළිබඳ මානව සම්පත් හා සැපයුම් ප්‍රධානීගේ කාලීන වාර්තා ලැබීමෙන් පසු වෘත්තීය හා පාරිසරික සෞඛ්‍ය සහ සෞඛ්‍ය නීති, අදාළ රෙගුලාසි, ප්‍රමිති හා චර්යා සංග්‍රහය සමඟ බැංකුවේ අනුකූලතාවය සහතික කිරීමේ ප්‍රතිපත්ති හා ක්‍රියාවලිවල පොදු පාලනය ලබාදීම.
- සාමූහික ගිවිසුම් සහ ආශ්‍රිත කරුණු පිළිබඳ සාකච්ඡාව සඳහා යෝජනා ක්‍රම සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- ආයතනික ව්‍යුහය සහ මානව සම්පත් අවශ්‍යතාව සමාලෝචනය කිරීම සහ පැහැදිලිව බෙදා ඇති වගකීම ස්ථාපිත කිරීමට ප්‍රධාන කාර්යයන් හා ක්‍රියාවලි නැවත අර්ථ දැක්වීම
- නව තනතුරු ඇතිකිරීම, පවත්නා තනතුරු යටපත් කිරීම තනතුරු වෙනස් කිරීම යනාදීය සඳහා සේවක සංඛ්‍යාව සමාලෝචනය ඇතුළත් කර සමස්ත කාර්ය මණ්ඩල මට්ටම් වෙනස් කිරීම පිණිස බඳවාගැනීමේ සැලසුම් සමාලෝචනය කර නිර්දේශ කිරීම.
- සමස්ත කාර්ය මණ්ඩල කාර්යසාධනය සමාලෝචනය සහ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධන මට්ටම සහ කාර්යසාධන බාධා (ඇත්නම්) අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- සමාලෝචිත කාලසීමාව තුළ අනුප්‍රාප්තික සැලසුම්කිරීමේ ක්‍රියාවලිය තුළින් ලබාදෙන ලද අවස්ථා සමාලෝචනය කර බැංකුවේ තීරණාත්මක රැකියා සඳහා අනාගත ප්‍රධාන පිරිස වන අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- බැංකුවේ ව්‍යාපාර ක්‍රමෝපායට සමගාමීව කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියා සංවර්ධන වැඩසටහන් ඇතුළුව මානව සම්පත් සහ ආයතනික සංවර්ධන ක්‍රමෝපායන් සංවර්ධනය කිරීමඟ
- බැංකුවේ ව්‍යාපාර ආදර්ශය ක්‍රියාත්මක කිරීමට මානව සම්පත් අවශ්‍යතා සහ අවශ්‍ය දක්ෂතාවන් තක්සේරු කිරීම සහ නව දක්ෂයින් බඳවා ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ වාර්තා කිරීම.
- පීඩාවට පත් කාර්ය මණ්ඩල සාමාජිකයෙක් සාධාරණ සහ යුක්තිසහගත විසඳුම් සඳහා

ඔහුගේ/ඇයගේ ගැටළු කමිටුව වෙත ඉදිරිපත් කරන්නේනම් සේවකයා සඳහා අභියාචන මණ්ඩලයක් ලෙස සේවය කිරීම.

- මානව සම්පත් කළමනාකරණ ව්‍යවහාර සහ බැංකුවේ අනාගත මානව සම්පත්වල වර්ධනය තක්සේරු කිරීම සඳහා කලින්කල සමාලෝචන හා සමීක්ෂණ පැවැත්වීම.

- මානව සම්පත් හා පාරිශ්‍රමික විෂයය යටතේ කලින් කල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශ පරිදි කටයුතු කරගෙන යාම සහ නියාමන අවශ්‍යතා ඉටුකරන බව සහතික කිරීම

කමිටුවේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව අවම වශයෙන් කාර්තුමය ලෙස මුණගැසෙන අතර, අවශ්‍ය අවස්ථාවලදී රැස්වීම් කැඳවනු ලැබිය හැකිය. 2019 වසර තුළ මෙම කමිටුවේ රැස්වීම් 03ක් පවත්වන ලදි.

කමිටුවේ රැස්වීම්වලදී කමිටු සාමාජිකයින්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ දරන තනතුර	සහභාගිවිය යුතු රැස්වීම් ගණන	සහභාගි වූ රැස්වීම් ගණන
බර්ණාඩ් වසන්ත මහතා	සභාපති	2	0
විදුර මංචනායක මහතා	සාමාජික	2	2
සෙනාත් ද සොයිසා මහතා	සාමාජික	2	1
දිල්හාන් ජයසිංහ මහතා	විකල්ප සාමාජික	2	1

සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නිට අදාළ කරුණු සාකච්ඡා කිරීමේදී හැර සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි රැස්වීම්වලට සහභාගි වේ. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මනා සංවිධාන) සහ කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ගේ පැමිණීම කමිටුව විසින් අවශ්‍යයයි කල්පනා කරන අවස්ථාවල ඔවුන්ට සහභාගිවන මෙන් ආරාධනය කෙරේ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

බර්ණාඩ් වසන්ත මහතා
කමිටුවේ සභාපති

විදුර මංචනායක මහතා
කමිටුවේ සාමාජික

සෙනාත් ද සොයිසා මහතා
කමිටුවේ සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය - 2019

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විකල්ප සාමාජිකයෙක් ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන්, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධානී, අවදානම් කළමනාකරණ ප්‍රධානී, සහ කමිටුවේ ලේකම්ගෙන් සමන්විත විය. 2019 වසර තුළ මෙම කමිටුවේ රැස්වීම් 4ක් පවත්වන ලදී.

මෙම කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

සෙනාත් ද සොයිසා මහතා - විධායක නොවන අධ්‍යක්ෂ - කමිටුවේ සභාපති

බර්ණාඩ් වසන්ත මහතා - විධායක නොවන අධ්‍යක්ෂ

දිල්හාන් ජයසිංහ මහතා - විධායක නොවන අධ්‍යක්ෂ

විදුර මංචනායක මහතා - විධායක නොවන අධ්‍යක්ෂ (විකල්ප සාමාජික)

ඩබ්ලිව්.එම්. දයාසිංහ මහතා - සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී

එස්.ඒ.කේ.ඒ.කේ. සූරියආරච්චි මහතා - ප්‍රධාන කළමනාකරු - අවදානම් කළමනාකරණ අංශය

නිෂානි ලෝකුගේ මහතත්මිය - සහකාර සාමාන්‍යාධිකාරී - නීති / කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කළ 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ 3(6) (v) වගන්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය 2012.03.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එය කලින් කලට සමාලෝචනය කරයි. අනුමත කරගත් ප්‍රඥප්තිය තුළින් එහි බලතල, ව්‍යුහය සහ වගකීම් පිළිබඳ අර්ථ දක්වයි.

ප්‍රඥප්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධාන වගකීම් පහත සඳහන් පරිදි වේ.

1. බැංකුවේ අවදානම් රුචිය සමාලෝචනය කිරීම.

2. බැංකුවේ ප්‍රධාන අවදානම් ප්‍රතිපත්ති සමාලෝචනය සහ අනුමත කිරීම හා විශේෂිත සීමාවන් සඳහා බැංකුවේ අනුගතවීම පිළිබඳ වාර්තා ලබා ගැනීම.

3. බැංකුව මුහුණ දෙන ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් ඇතුළුව විවිධ අවදානම් සහ එක් එක් වර්ගවලට නිරාවරණයවීම, මෙම අවදානම් වර්ග තුළ සැලකියයුතු සංකේන්ද්‍රණ, අවදානම් නිරාවරණය මැනීම සඳහා යොදාගත් ක්‍රම සහ මෙම අවදානම් නිරාවරණයේ පිලිගතහැකි හා සුදුසු මට්ටම් පිළිබඳ කළමනාකරණයේ අදහස් පිළිබඳ වාර්තා ලබාගැනීමත් ඒවා සමාලෝචනය කිරීමත් සමගින් කළමනාකරණයට යම් පිටුවහලක් ලබාදීම.

4. කළමනාකරණය විසින් අවදානම් නිරාවරණ පාලනය කිරීමට භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව සහ අවදානම් මැනීමේ ක්‍රමවේද සහ පීඩන පරීක්ෂා ප්‍රවේශය සමාලෝචනය කිරීම

5. මෙයටම සීමා නොවූවද, බැංකුව වෙත ඇති ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් සහ ක්‍රමෝපායික/ කීර්තිනාම අවදානම් ඇතුළු සියලුම අවදානම් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් සමාලෝචනය කිරීම.

6. බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම් වී, ස්ථාපිතව පවරනලද බලතලවලට අනුකූලව අවදානම් තීරණ ගන්නා බව සහ කමිටුව විසින් නියමකළ අවදානම් ඉවසුම් සීමාව ඉක්මවන, අවදානම් අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීම.

7. අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණාත්මතාව සහ තෝරාගත් අවදානම් නිලධාරීන්ගේ සුදුසුකම් සහ පසුබිම ඇගයීමට ලක් කිරීම.

8. අවදානම් කළමනාකරණ කාර්යයේ ස්වාධීනත්වය සහ බලතල සමාලෝචනය කිරීම.

9. බැංකුවේ අවදානම් ප්‍රාග්ධන රාමුව (ණය, වෙළඳපොල, ද්‍රවශීලතා හා මෙහෙයුම් අවදානම්) වැදගත් නිමැවුම් හා උපකල්පන ඇතුළුව සමාලෝචනය කිරීම

10. අවදානම් නිරාවරණය කළමනාකරණ සඳහා කළමනාකරණය භාවිතා කරන වැදගත් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රම ඇතුළුව බැංකුවේ ශේෂ පත්‍රය. ශේෂ පත්‍ර ව්‍යුහය, ප්‍රාග්ධනය, අරමුදල්, පොළි අනුපාත සහ ද්‍රවශීලතා කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම.

11. බැංකුවේ ද්‍රවශීලතාව, තැන්පතු රැස්කිරීම සහ අරමුදල් කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.

12. බැංකුවේ නියාමන ප්‍රාග්ධන මට්ටම සහ ප්‍රාග්ධන ව්‍යූහය සම්බන්ධයෙන් කළමනාකරණයේ වාර්තා සමාලෝචනය කිරීම.

13. බැංකුවේ ප්‍රාග්ධන අරමුණු ඇතුළුව එහි ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ රාමුව සමාලෝචනය කිරීම.

14. අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ කාර්යයට අදාළ කරුණු සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ප්‍රධානී, අනුකූලතා නිලධාරී, අභ්‍යන්තර විගණක, මූල්‍ය ප්‍රධානී, භාණ්ඩාගාරික, කළමනාකරණයේ අනෙක් අය, ස්වාධීන විගණකවරුන්, නියාමකයින් සහ සුදුසු පරිදි බාහිර ප්‍රවීනයින්ගෙන් තොරතුරු ලබාගැනීම

15. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අයකරගැනීමේ කමිටුව, විධායක ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි විශේෂිත අවදානම් හෝ අවදානමේ සමහර අංශ සමඟ කටයුතු කරන සියලුම කළමනාකරණ කමිටුවල විෂය ක්ෂේත්‍රය සමාලෝචනය කිරීම.

16. ඉහත සඳහන් අදාළ කමිටු විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවල ඵලදායිත්වය පරීක්ෂා කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් ආරම්භ කළ ක්‍රියාමාර්ග නියාමනය.

17. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියමකළ ප්‍රාමාණාත්මක හා ගුණාත්මක පරාමිති තුළ අවදානම් හඳුනාගැනීම, මැනීම, වැලැක්වීම, අවම කිරීම, මාරු කිරීම හෝ පාලනය කිරීම සඳහා එහි විධි නියෝගය සහ ප්‍රමාණවත් යාන්ත්‍රණය පිළිබඳ මනා අවබෝධයක් ඇති බව සහතික කිරීමට ඉහත කමිටුවල වාර්ෂික වැඩ සැලැස්ම, අදාළ ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ වැඩරාමු සමාලෝචනය කිරීම

18. විශේෂිත අවදානම් සමඟ සෘජුව හෝ වක්‍රව කටයුතු කරන කළමනාකරණ කමිටු සමඟ අබණ්ඩ සාකච්ඡා පවත්වා ගැනීම සහ ඒ තුළින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එහි කාර්යය ඉටු කිරීමේදී හෝ එහි තීරණ ක්‍රියාත්මක කිරීම තුළ යම් අවහිරතා, බාධා, අධෛර්යමත් කිරීම හෝ වැලැක්වීම පිළිබඳ BIRMC දැනුවත් කෙරේ.

19. අපේක්ෂිත අවදානම් කළමනාකරණ පරමාර්ථවලට සේවය කිරීමේදී අවදානම් දර්ශකවල ප්‍රමාණාත්මතාව තීරණය කිරීම පිළිබඳ දැක්මක් සහිතව යම් දෙන ලද කාලයක් තුළ විශේෂිත අවදානම්වල මට්ටම නියාමනය කිරීමට එවැනි දර්ශක සමාලෝචනය කිරීම.

20. එක් එක් අවදානම් දර්ශක අනුව මාසිකව ගණනය කරන ලද සැබෑ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ යම් අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමාවන් ඉක්මවන අවස්ථාවක එම විශේෂිත අවදානම්වල බලපෑම අවම කිරීමට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ගතයුතුය.

21. විවිධ වර්ගයේ අවදානම් අනුව කළමනාකරණය විසින් නියමකළ පරාමිති සහ සීමා සමාලෝචනය කර අනුමත කිරීම සහ ඒවා අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ අපේක්ෂිත ප්‍රතිපත්ති මට්ටම්වල පවතින්නේද යන්න සහතික කිරීම

22. විශේෂ අවදානම් හඳුනාගැනීමට/ අභ්‍යන්තර පාලන උපදෙස්වලට අනුකූලවීමට අපොහොසත් වීම සඳහා වගකීමට බැඳී සිටින නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සහ කමිටුව විසින් නිර්දේශ කරන පරිදි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාපටිපාටි ගැනීම.

23. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළ නීති සහ රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යයේ ඵලදායිත්වය සමාලෝචනය කිරීම

24. වාර්ෂිකව ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා පිලියම් සැලැස්ම සමාලෝචනය කිරීම

25. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කිරීම

26. බැංකුවේ ප්‍රධාන වියදම් වැඩසටහනට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දීම අවශ්‍ය ප්‍රාග්ධන දායකත්වයන් සමාලෝචනය කර අනුමත කිරීම

27. වැදගත් පීඩන අවස්ථාවක් සම්බන්ධයෙන්. ව්‍යාපාරය පිළිබඳ අර්බුදයක් වියහැකි බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම සහ කළමනාකරණය විසින් සිදුකළයුතු අයකරගැනීමේ විකල්ප සමාලෝචනය කිරීම

28. විගණන කමිටුවේ උපදේශකත්වයෙන්, අවම වශයෙන් වාර්ෂිකව කළමනාකරණය සමඟ සමාලෝචනය කර සාකච්ඡා කිරීම

29. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා ඇති පරිදි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ප්‍රඥප්තියට අදාළ වෙනත් කටයුතු ඉටු කිරීම

ප්‍රඥප්තියට අනුව, මෙම කමිටුවේ අනෙකුත් වගකීම් පහත පරිදි වේ.

1. කමිටුව විසින් විගණන කමිටුවට එහි ව්‍යවස්ථාපිත. නියාමන සහ අනෙකුත් වගකීම් කරගෙන යාමට ඉඩදීම සඳහා අවශ්‍ය සහ සුදුසු පරිදි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සහ සන්නිවේදනය සහ තොරතුරු හුවමාරුව.

2. කමිටුව විසින් කමිටුවේ විෂයපථය තුළ ඇති කරුණු සම්බන්ධයෙන් නියාමන පරීක්ෂණ වාර්තා සහ ඒ සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරවල පිටපත් ලබාගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව - ඉතිරි කොටස...

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වන අතර, කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගි වූ රැස්වීම් ගණන/ (සහභාගිවිය යුතු රැස්වීම් ගණන)
සෙනාත් ද සොයිසා මහතා (කමිටුවේ සභාපති)	4/4
බර්ණාඩ් වසන්ත මහතා	0/4
දිල්හාන් ජයසිංහ මහතා	2/4
විදුර මංචනායක මහතා - (කමිටුවේ විකල්ප සාමාජික)	2/4

වසර තුළ, අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීමේදි ව්‍යාපාර මෙහෙයුම් සිදුකරමින් හා අවදානම් කළමනාකරණය කරමින් ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සමීපව කටයුතු කර ඇත.

වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වලදී යෝජනා කල හා සාකච්ඡාවට ලක්කල කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ලබා ගැනීම චිකඟතා හා විශේෂිත මඟ පෙන්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකල නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා අවශ්‍ය විස්තර ද සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම පිණිස ඔවුන් වෙත ඉදිරිපත් කර ඇත.



සෙනාත් ද සොයිසා මහතා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසි වර්ධන හැකියාවන් අත්කර ගැනීමට නැඟීවන ව්‍යාපාර අවස්ථාවන් මත ප්‍රාග්ධනණියකරණය කිරීම සඳහා මනාව ස්ථානගත වී ඇත.



ඒකාබද්ධ අවදානම් කළමනාකරණය

අවදානම් සංස්කෘතිය හා දැක්ම

නිෂ්පාදන, සේවා, ගනුදෙනු තුළ සහ සමස්ත බැංකුව තුළ අවදානම් පාලනය කරමින් බැංකුවේ තිරසාර වර්ධන ක්‍රමෝපායට සහ එහි සෞභාග්‍ය කරා ගමන් මඟට සහයවීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් අවශ්‍ය බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දැඩිව විශ්වාස කරයි.

වේගයෙන් වෙනස්වන මූල්‍ය පරිසරය බැංකුව විවිධ වූ අවදානම්වලට නිරාවරණය කරවයි. පොදුවේ, බැංකු ආයතනයක මූල්‍ය අවදානම යනු යම්කිසි ක්‍රියාවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි අහිතකර බලපෑමකි. එවැනි ප්‍රතිඵල ඉපයීම්/ප්‍රාග්ධනය සෘජුවම අහිමිවීමෙන් හෝ බැංකුවට තම ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව කෙරෙහි බාධා වැල්ලවීම් මගින් ඇතිවීමට ඉඩකඩ ඇත.

බැංකුවේ අවදානම් සුදානම හා කළමනාකරණය මගින් ණය අවදානම, වෙළෙඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, නෛතික අවදානම සහ ක්‍රමෝපායික අවදානම යන සියළුම වර්ගවල ප්‍රධාන අවදානම් සඳහා අවධානය යොමු කරයි.

පැහැදිලි කළ සීමාවන් මගින් සියලුම වැදගත් සහ අදාළ අවදානම් වර්ගීකරණ සහ අවදානම් ප්‍රාග්ධන තත්ත්වය සඳහා බැංකුවේ අවදානම් රුචිය පැහැදිලි කරයි.

බැංකුවේ වර්ධනයවන අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම අධීක්ෂණය හා පාලනය කිරීම ඇතුළත් වන අතර ඉහත සඳහන් ක්ෂේත්‍ර තුළදී මේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවා ඇති අවදානම් නිරාවරණ සීමාව තුළ සිදුවන බවට හා අවදානම් සහිත තීරණ බැංකුවේ ව්‍යාපාරික ක්‍රමෝපායන් සහ අරමුණු සමඟ සමගාමීව සිදුවන බවට තහවුරු කිරීම සිදු කරයි. කාර්ය මණ්ඩලයට අවදානම් භාර ගැනීමේ හා වීවා නිරවුල්ව පාලනය කිරීමේ හැකියාව සහිතව හා අවදානම් භාර ගැනීමේ පැහැදිලි හා සුවිශේෂිත වාතාවරණයක් ඇති කිරීමට බැංකුව කටයුතු කරයි. එසේ මුහුණ දීමට සිදුවන අවදානම් වලට උචිත වන පරිදි ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් පවත්වාගෙන යෑමට බැංකුව කටයුතු කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව

ආයතනය තුළ අවදානම් කළමනාකරණ රාමුවක් මගින් ආයතනයේ සැම මට්ටමක අවදානම් සහ සියලුම අවදානම් වර්ග සඳහා පාලනය සහ වගකීමට පහසුකම් ඇති කරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන මූලිකාංග පහත පරිදි වේ.

- අවදානම් පාලනය සහ කළමනාකරණ ව්‍යූහය
- අවදානම් රුචි ප්‍රකාශනය
- අවදානම් කළමනාකරණ ක්‍රමවේදය
- අවදානම දැනුවත් සංස්කෘතියක්

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අවදානම් කළමනාකරණය, අවදානම් පාලනය, අභ්‍යන්තර පාලනයන්, අවදානම් රුචිය, අවදානම් කළමනාකරණ මෙවලම් සහ අවදානම් පදනම් සංස්කෘතිය පිළිබඳ චිකිනෙකට සැබැඳි මූලිකාංගවලින් සමන්විත වේ.

බැංකුව සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පදනම් සංස්කෘතියක් ඇති බව අවධාරණය කරමින් එම මූලිකාංග එකිනෙකට සම්බන්ධ එකිනෙකට බැඳී පවතී.

අවදානම් කළමනාකරණය යම් ආයතනයක ක්‍රමෝපායික කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසකි. ආයතන වීවායේ කටයුතු හා අනුබද්ධ අවදානම් ක්‍රමානුකූලව ආමන්ත්‍රණය කරන ක්‍රියාවලිය වයයි. සාර්ථක අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් ආයතනය තුළ අවදානම් මට්ටමට සමානුපාතික මෙන්ම, අනෙකුත් ආයතනික කටයුතු, එහි විෂයපථය තුළ ඇතුළත්වීම හා සමපාත වෙමින් වෙනස්වන වාතාවරණයන්ට ප්‍රතිචාරාත්මක වීම මගින් චර්යාත්මත කටයුතුවලට ඇතුළත් කළ යුතුය. අවදානම් කළමනාකරණයේ අවධානය යනු වැදගත් අවදානම් තක්සේරු කිරීම සහ සුදුසු අවදානම් ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීමයි. මෙහි පරමාර්ථය වන්නේ ආයතනයේ සියලුම කටයුතුවලින් උපරිම තිරසාර වටිනාකම අත්කර ගැනීමයි. අවදානම් කළමනාකරණය මගින් යම් ආයතනයකට බලපෑ හැකි අනාගත උඩුකුරු සහ යටිකුරු සාධක හඳුනාගත



හැකිය. ඉන් සාර්ථකත්වයේ හැකියාව වැඩි කරන අතර,යම් ආයතනයක පරමාර්ථ අත්කර ගැනීම හා බැඳුණු අසමත්වීමේ හැකියාව සහ මට්ටම යන ද්විත්වය අඩු කරයි.

- **බැංකුවේ අවදානම් පාලනය හා කළමනාකරණ ව්‍යුහය**

බැංකුවේ අවදානම් කළමනාකරණ ව්‍යුහයට ව්‍යාපාර මෙහෙයුම, ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සහ විගණනය/ අනුකූලතාවයෙන් සමන්විත අංශ තුනක් ඇතුළත්ය. මෙම තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග පිළිගත නොහැකි අවදානම් නිරාවරණවලට අනුව බැංකුව ආරක්ෂා කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ යටතේ ක්‍රියාත්මක වේ. යාන්ත්‍රණයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, ජ්‍යේෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය අවදානම් කළමනාකරණය, අවදානම් මැනීම පිළිබඳ නිශ්චිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කර පාලනය සහ තෙවැනි ආරක්ෂක මාර්ගය විසින් සිදුකරන ස්වාධීන විගණනය නියාමනය කරයි.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් මුහුණ දෙන ණය, වෙළෙඳපොල සහ මෙහෙයුම් අවදානම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිශ්චිතව දක්වා ඇත. අනුකූලතාව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රම කලින් කල සමාලෝචනය කරයි. බැංකුවේ ආයතනික ව්‍යුහය තුළින් අවදානම් භාරගැනීම සහ කළමනාකරණ කටයුතු හා සම්බන්ධ පුද්ගලයින්ගේ කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිව දක්වා ඇත. හැකියා වර්ධනය සහ සමාලෝචන යාන්ත්‍රණ මගින් බැංකුව තුළ අවදානම් කළමනාකරණ සංකල්පය ඇතුළු කර ගැනීමට පියවර ගනිමින් සිටී.

විවිධ අවදානම්වල මැදිහත්වීම අවදානම



ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉතිරි කොටස...

තුළ අඩුකිරීමට හෝ වැඩි කිරීමට හේතු වන බැවින්, බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සුදුසු පරිදි බැංකුවේ සියලුම කටයුතුවල අවදානම්වල මැදිහත්වීම හඳුනාගෙන පිළිබිඹු කරයි. බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යයට, ආයතනය තුළ අවදානම් අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීමට ක්‍රියාත්මක කරන පහත සඳහන් ව්‍යුහය අයත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල කාර්යභාරය

බැංකුවේ අවදානම් කළමනාකරණය පාලනය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර, අවදානම් රුචිය තීරණය කර පාලනය ව්‍යුහය, ප්‍රතිපත්ති රාමුව, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ අවදානම පිළිබඳ ඵලදායී කළමනාකරණයට අදාළ වෙනත් කරුණු විධිමත් පදනමක් මත සමාලෝචනය කරයි,

ණය, වෙළෙඳපොල, මෙහෙයුම් හා ප්‍රාග්ධන සහ යම් වෙනත් අවදානම් කළමනාකරණය කිරීම සඳහා යොදා ගන්නා වැදගත් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ඇතුළුව බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව පාලනය කිරීමේදී සහයවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පත්කර ඇත.

මෙහෙයුම් පාලනය ක්‍රියාත්මක වන බවටත්, මෙහෙයුම් අදාළ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා මාර්ගෝපදේශවලට අනුව කරගෙන යනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තහවුරු කරයි.

විශේෂයෙන්ම මූල්‍ය විගණනය පවත්නා මෙහෙයුම් පාලනය අනුව සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හැරුණුවිට කළමනාකරණ කමිටු, ඵලදායී අවදානම් රාමුවක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ අවධානිත පාලනය සඳහා සහ විවිධ අවදානම් ක්ෂේත්‍ර තුල හඳුනාගත් සංස්කෘතිකයක් පවත්වාගෙන යෑම සඳහා වගකිව යුතුවේ.

බැංකුවේ වෙනස්වන අවදානම් කළමනාකරණ කාර්යය

- බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (IRMD) 2012 වසරේ දී පිහිටුවන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (EIRMC) සහ ව්‍යාපාර අඛණ්ඩතා මෙහෙයුම් කමිටුව (BCP) ස්ථාපිත කරන ලද අතර, ඒ සෑම කමිටුවකටම අදාළ විෂය ක්ෂේත්‍රය හඳුන්වා දීම ද අවසන් කර ඇත.
- ණය, වෙළෙඳපොල, මෙහෙයුම්, ද්‍රවශීලතා, පොළී අනුපාත අවදානම, නිෂ්පාදන අවදානම, ක්‍රමෝපායික අවදානම සහ අනුකූලතා අවදානම් ආවරණය කරමින් ණය ප්‍රතිපත්තිය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, පීඩන පරීක්ෂණ ප්‍රතිපත්තිය, අවදානම් පාලන ස්වයං තක්සේරු ප්‍රතිපත්තිය ණය සමාලෝචන යාන්ත්‍රණය ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇත.
- බැංකුවේ සියලුම අවදානම් පදනම් ව්‍යවහාර සහ අවදානම් රුචි ප්‍රකාශනය ඇතුළත් කරමින් ලියවිල්ලක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කර ඇත. (අවදානම් රුචිය හා අභ්‍යන්තර ඉවසුම් සීමා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සමඟ 2019 දී සංශෝධනය කරන ලදී).

ණය අවදානම් කළමනාකරණය

- ණය අවදානම් නිරාවරණයේ ඉහත විශේෂ සීමාවන් අනුමැතියට පෙර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ස්වාධීනව සමාලෝචනය කරයි.
- ගනුදෙනුකරුවාගේ අවදානම් පැතිකඩ මත පදනම් වී පහසුකම වර්ගීකරණය කිරීමට සහ ඔවුන්ගේ අවදානම් බැරැරුම්කම වර්ගීකරණය කිරීමට අවදානම් ශ්‍රේණිගතකරණ ආදර්ශ අභ්‍යන්තරව සංවර්ධනය කරන ලදී. (නිශ්චිත, අඩු අවදානම, මධ්‍යස්ථ අවදානම, පිළිගතහැකි/නියාමනය, ආන්තික, ඉහළ අවදානම,පිළිගත නොහැකි - ප්‍රතික්ෂේප)(උකස් ණය, සඳහා අවදානම් ශ්‍රේණිගතකරණ පිටපත 4.1",
- පුද්ගල ණය සඳහා අවදානම් ශ්‍රේණිගතකරණ පිටපත 3, සේඅඅ ණය සඳහා අවදානම් ශ්‍රේණිගතකරණ පිටපත 1, සහ සුළු හා මධ්‍ය පරිපාලන පුද්ගල ණය සඳහා අවදානම් ශ්‍රේණිගතකරණ පිටපත 1 දැනට භාවිතා කරයි)
- ණය සමාලෝචන යාන්ත්‍රණය ණය ගැටළු නැවත ඇගයීමට සහ පූර්ව අවවාද සංඥා හඳුනාගැනීමට කරගෙන යනු ලැබේ.
- ආදායම් මූලාශ්‍ර සහතික කිරීම (ISVM) බැංකුවේ ණය අවදානම අවම නිරීමට සංවර්ධනය කරන ලදී.
- ඉවසුම් සීමා සහිත ප්‍රධාන අවදානම් දර්ශක සහ අධ්‍යක්ෂ මණ්ඩලය දැක්වූ සීමා සහ සිහිපත් අයිතම හා අනෙකුත් අවදානම් අනුපාත කලින් කළ (මාසිකම හෝ කාර්තුමය) පරීක්ෂා කර, ගණනයකර තක්සේරු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.
- 2011 අංක 7 දරන බැංකු පනත් නියෝගය පරිදි, බලපත්‍රලාභී බැංකු සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව, උප වගන්තිය 2.5 - කළඹ කළමනාකරණය යටතේ, බැංකුවේ කළඹේ තත්ත්වය විශ්ලේෂණය කර ඇගයීම අවශ්‍යය. ඒ අනුව, අවදානම් කළමනාකරණ අංශය කාර්තුමය ලෙස පහත සඳහන් ප්‍රධාන අංග තක්සේරු කරයි.
- **විශේෂිත ශ්‍රේණිගතකරණ වර්ගීකරණ තුළ එකතුවූ නිරාවරණ මත නියමිත ප්‍රමාණාත්මක උඩත් සීමා මිල**

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 16/12/47 -"ණය අවදානම් කළමනාකරණය යටතේ කළඹ කළමනාකරණය" සඳහා නිකුත්කළ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා 16.12.147.12 අනුව පුද්ගල සහ උකස් ණය වර්ගීකරණ සඳහා ප්‍රමාණාත්මක උඩත් සීමා මිල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත.

ඒ අනුව, කාර්තුමය සමාලෝචනය අවදානම් කළමනාකරණ අංශය විසින් සිදුකරන අතර, කමිටුවේ සාමාජිකයින්ගේ සමාලෝචනය, නිර්දේශ සහ අනුමැතිය සඳහා අවදානම්

කළමනාකරණ අංශයේ වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රධාන නිරීක්ෂණ සහ යෝජනා සමඟ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි.

- **ණය කළඹ තුළ සංයුතිය විශ්ලේෂණය**

ඒ අනුව, අවදානම් කළමනාකරණ අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අභ්‍යන්තර ඉවසුම් සීමා සමඟ අනුකූලතාව හෝ අනුකූල නොවීම සඳහන් කරමින් එක් එක් ශාඛාවේ නිෂ්පාදනය අනුව (සේ.අ.අ. ණය, උකස් ණය සහ පුද්ගල ණය) කළඹ තුළ සංයුතිය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සමාලෝචනය. යෝජනා සහ නිර්දේශ සඳහා එම කමිටුව වෙත කාර්තුමය ලෙස ඉදිරිපත් කරයි.

- **ණය කළඹ හා අක්‍රිය ණය වර්ධන විශ්ලේෂණය**

බැංකුවේ සමස්ත කළඹ, කළඹ වර්ධනයට නිෂ්පාදන අනුව දායකත්වය, මුළු කළඹ වර්ධනයට සෘණාත්මක දායකයින්, පුද්ගල ණය වර්ධනයට ඉහළම දායකයින් සහ අක්‍රීය ණය වර්ධනය අවදානම් කළමනාකරණ අංශය විසින් කාර්තුමය ලෙස සමාලෝචනය කරන අතර, නිර්දේශ සමඟ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සමාලෝචනය. යෝජනා සඳහා එම කමිටුව වෙත ඉදිරිපත් කරයි.

- **පැහැරහැරීම් අනුපාතය ගණනය කිරීම**

පැහැර හැරීම් අනුපාතය යනු සියලුම හිඟ ණයවල ප්‍රතිශතයක් වන අතර, නිශ්චිත කාලසීමාවක් සඳහා වාරික ආපසු ගෙවීමේ ප්‍රමාදයෙන් පසු අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කරයි. පැහැර හැරීම් අනුපාත අවදානම වෙත තම නිරාවරණය තිරණය කිරීමට ණයකරුවන් විසින් භාවිතා කරන වැදගත් සංඥාලේඛන මිනුමකි. පැහැර හැරීම් අනුපාතයේ උපරිම ඉවසුම් සීමාව සඳහා ක්ෂේත්‍රයේ සම්මතය 2% කි.

- **ප්‍රධාන ක්‍රමෝපායික කාර්යසාධනය**

අවදානම් කළමනාකරණ අංශය කාර්තුමය වශයෙන් එම කාලසීමාව සඳහා අයවැයගත ඉලක්ක අනුව ණය නිෂ්පාදන අනුව කාර්යසාධනය සමාලෝචනය කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සමාලෝචනය. යෝජනා සඳහා එම කමිටුව වෙත ඉදිරිපත් කරයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

- විවිධ ක්‍රමවේද යටතේ බැංකුවේ ණය, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා තත්ත්වය තක්සේරුකර නියාමනය කිරීමට පිඩන පරීක්ෂණය සංවර්ධනය කර ඇත.

- ඉවසුම් සීමා සහිත ප්‍රධාන අවදානම් දර්ශක සහ අධ්‍යක්ෂ මණ්ඩලය දැක්වූ සීමා සිහිපත් අයිතම හා අනෙකුත් අවදානම් අනුපාත කලින් කළ (මාසිකම හෝ කාර්තුමය) පරීක්ෂා කර, ගණනයකර තක්සේරු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය

- ගනුදෙනුකරුවන් තක්සේරු කිරීමට සහ ඔවුන් මූලික ගනුදෙනුවට ඇතුළත් වන අවස්ථාවේදි පහළ, මධ්‍යම සහ ඉහළ අවදානම් වර්ගීකරණයට වර්ගීකරණය කිරීම සඳහා අවදානම් අනුකෘති හඳුන්වා දී ඇත. (අවදානම් අනුකෘති පිටපත 2 CDD සමඟ හඳුන්වා දේ)

- අවදානම් පාලන ස්වයං තක්සේරු ප්‍රතිපත්තිය අංශවලට හඳුන්වා දී ඇත. 2011 අංක 7 දරන බැංකු පනත් නියෝගයේ ඇෑ 2.2 නියෝගය -බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව බැංකුව විසින් මුහුණදෙන මෙහෙයුම් අවදානම් තක්සේරු කිරීමට ඵලදායී අවදානම මැනීමේ ශිල්පයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතාව ඉස්මතු කර ඇත. බැංකුව තුළ මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම පිණිස සම්පූර්ණ අවදානම් පාලන ස්වයං තක්සේරුව පැවැත්වීම එකි නියෝගය යටතේ අනිවාර්ය වේ.

- මෙහෙයුම් අවදානම් අලාභ සිදුවීම් සහ අවස්ථා හඳුනාගැනීමේ යාන්ත්‍රණය - මෙහෙයුම් අවදානම් සිදුවීම් / අවස්ථා වාර්තා කිරීම, අලාභ අවස්ථා වාර්තා කිරීම මාර්ගෝපදේශ වාර්තා කිරීම සඳහා ආකෘතිපතක් අවදානම් කළමනාකරණ අංශය විසින් සංවර්ධනය කර ඇත. කාර්තුමය වශයෙන් මෙය සියලුම අංශ ප්‍රධානීන්ට යවන අතර තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඔවුන් විසින් නියමකළ ආකෘතිපත්‍රය තුළ වාර්තා කෙරේ.

- ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP)

■ අවදානම් කළමනාකරණ අංශය විසින් සකස් කළ සම්පූර්ණ ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් වාර්තාව

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් වාර්තාව අදාළ සියලුම මාර්ගෝපදේශ, උපදෙස් සහ අවම අලාභයක් සහිත ආපදාවකදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි ඇතුළත් කරමින් පිළියෙල කර ඇත. එහි නියමයන් හා වගකීම්, අවකිරීමේ කාල පරමාර්ථ, ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවල පසුවිපරම් අඩවි, ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය සහ අයකිරීමේ කටයුතු සහ ප්‍රධාන වශයෙන් අනුගමනය කළ යුතු කාර්යයන් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් නියමයන් හි ඇතුළත් කර ඇත.

- **ආපදා පිළියම් පෙරහුරුව (DRD)**

ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ සම්බන්ධීකාරක (සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා නීති) සමඟ අවදානම් කළමනාකරණ අංශය වාර්ෂිකව ආපදා පිළියම් පෙරහුරුව සංවිධානය කරයි. අනෙකුත් සහය දෙපාර්තමේන්තුවල (තොරතුරු තාක්ෂණ, මනා සංවිධාන, මානව සම්පත් හා ශාඛා මෙහෙයුම්) සහයෝගිත්වයෙන් අදාළ උපදෙස් සහිත ආපදා පිළියම් පෙරහුරුවට මාර්ගය, පරීක්ෂණ ප්‍රතිඵල වාර්තා කිරීමේ ආකෘතිය ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් නියාමන කමිටුවේ ලේකම් ලෙස අවදානම් කළමනාකරණ අංශයේ ප්‍රධානි විසින් ලබා දේ.

- **ගිනි පෙරහුරුව**

අවම හානියක් සහිත ආපදා පිළියම් පරමාර්ථය සඳහා මෙය ඉතා ඵලදායී පෙර සැකසුම් මෙවලමකි. අවදානම් කළමනාකරණ අංශය විසින් ගිනි බලකායේ නිලධාරියා සමඟ උපදේශකත්වයෙන් ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ සම්බන්ධීකාරක සමඟ සහයෝගිත්වයෙන් මෙම සැසිය සංවිධානය කිරීමට අවශ්‍ය පියවර ගනී

- **ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් නියාමන කමිටුව පැවැත්වීම**

අවදානම් කළමනාකරණ අංශයේ කමිටුවේ ලේකම් ලෙස ප්‍රධානීගේ, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි.ගේ උපදේශකත්වයෙන් ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් නියාමන කමිටුව සංවිධානය කරන අතර, උපදෙස්. නිර්දේශය සහ නියෝග සඳහා කමිටුව වෙත අදාළ සියලුම කරුණු වාර්තා කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉතිරි කොටස...

වෙළෙඳපොල අවදානම් කළමනාකරණය

• වත්කම් හා වගකීම් මුසුව

2011 අංක 7 දරන බැංකු පනත් නියෝගයේ ඈ 2.2 නියෝගය -බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව පරිදි වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) වෙළෙඳපොල අවදානම් කළමනාකරණය සඳහා අනිවාර්ය ආයතනික ව්‍යුහයකි.

ඒ අනුව, අවදානම් කළමනාකරණ අංශය කාර්තුමය වශයෙන් වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව සඳහා වත්කම් හා වගකීම් කළමනාකරණ මෙවලමක් ලෙස "වත්කම් හා වගකීම් මුසුවක්" නමින් හඳුන්වන ආදර්ශයක් සංවර්ධනය කර ඇත. මෙම ආදර්ශය ප්‍රධාන වශයෙන් වෙළෙඳපොල තුළ මතුවිය හැකි පොළී අනුපාත අවදානම සහ අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම් අතර සම නොවීම හේතු කොට ගෙන සිදුවිය හැකි ද්‍රවශීලතා පරතරය ආමන්ත්‍රණය කරයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

• පීඩන පරීක්ෂණ සහ ක්‍රමවේද විශ්ලේෂණය

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රමයේ වැදගත් කොටසක් බවට පීඩන පරීක්ෂණය පත්ව ඇති අතර, මූල්‍ය විචල්‍යතාවන්හි විය හැකි ව්‍යාජ සිදුවීම් හෝ වෙනස්වීම් සනාථ කරගැනීමට එහි අනාගත අනතුරට භාජනයවීමේ හැකියාව තක්සේරු කිරීමට මෙය හවිතා කරයි. අනතුරට භාජනයවීමේ හැකියාව බැංකුවේ ලාභදායීතාව, ද්‍රවශීලතාව සහ/ හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව අනුව පොදුවේ සලකනු ලබයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ක්‍රියාවලිය (ICAAP)

2016 අංක 01 දරන බැංකු පනත් නියෝගයේ 4.2 සහ 4.3 වගන්තිය - බලපත්‍රලාභී වාණිජ බැංකු (LCB) සහ බලපත්‍රලාභී විශේෂ බැංකු (LSB) සඳහා බාසල් 111 (11 ස්ථරය) අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුව, අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ක්‍රියාවලියේ වාර්තාව සකස් කරයි.

එමනිසා, ICAAP පහත සඳහන් අවදානම් ආමන්ත්‍රණය කරයි.

අ) 1 ස්ථරය යටතේ ග්‍රහනයකළ අවදානම්: ණය, වෙළෙඳපොල සහ මෙහෙයුම් අවදානම්;

ආ) 1 ස්ථරය යටතේ සම්පූර්ණයෙන් ග්‍රහනය නොකළ අවදානම්, සංකේන්ද්‍රණ අවදානම (ණය අවදානම්), පොළී ආදායම/ බැංකුකරණ පොත තුළ ප්‍රතිඵල අවදානම් අනුපාතය (වෙළෙඳපොල අවදානම්) සහ

ඇ) 1 ස්ථරය මගින් ආවරණය නොකළ 1 ස්ථරය යටතේ විශේෂයෙන් ආමන්ත්‍රණය නොකළ අවදානම්, ච්‍යට ද්‍රවශීලතා අවදානම, සංකේන්ද්‍රණ අවදානම, කීර්තිනාම අවදානම, අනුකූලතා අවදානම, ක්‍රමෝපායික අවදානම සහ ව්‍යාපාර අවදානම සහ සුන්බුන් අවදානම ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණය සහ ආරක්ෂණ අවදානම ඇතුළත්ය

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ක්‍රියාවලියේ සංවර්ධන ක්‍රියාවලිය විවිධ අවදානම් වර්ගයන් සඳහා පිඩන පරීක්ෂණය සහ ක්‍රමවේද විශ්ලේෂණය වැනි ප්‍රමාණාත්මක යාන්ත්‍රණ කිහිපයකින් සමන්විතය. බැංකුව නිරාවරණය වන 2 ස්ථරයේ අවදානම් තක්සේරු කිරීමට අවදානම් කළමනාකරණ අංශය විසින් අවදානම් තක්සේරු කිරීමේ ආදර්ශ සහ ක්‍රමවේද විශ්ලේෂණය අභ්‍යන්තරව සංවර්ධනය කරන ලදී.

ප්‍රාග්ධනය හා අවදානම බරතබනලද වත්කම්වලට බලපෑම ගණනය කරන ලද අතර එබැවින් සැම ක්‍රියාදාමයක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය තුළ විචල්‍යතාව තක්සේරු කෙරේ.

නියාමන ප්‍රාග්ධනය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මාර්ගෝපදේශවලට අනුකූලව අවශ්‍ය අවම ප්‍රාග්ධනයෙන් සමන්විත වේ. දැනට. 1 ස්ථරය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ යටතේ ප්‍රාග්ධන නිර්වචනයට සමාන කෙරේ.

1 ස්ථරයේ ප්‍රාග්ධනය ඇතුළත් අභ්‍යන්තර ප්‍රාග්ධනය යන්නෙන් අවදානම්වල වර්තමාන මට්ටම් සමඟ නුබුන්වත්ව සිටීමට අවශ්‍ය කරන ප්‍රාග්ධනය අර්ථවත් කරයි.

• අවදානම් රුචිය

බැංකුවේ අවදානම් රුචිය තුළින් ක්‍රමෝපායික අරමුණු අත්කර ගැනීමේදී ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍රවල අවදානමේ සමුච්චිත ප්‍රමාණය පිළිගැනීම සඳහා බැංකුවේ කැමැත්ත අර්ථවත් කරයි. නියාමන අවශ්‍යතා, ක්‍රමෝපායික අරමුණු, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අනෙකුත් විචක්ෂණ සාධක අවදානම් රුචි ප්‍රකාශනය සැකසීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලා ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණයේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් රුචිය සහ ඉවසුම් සීමා ප්‍රකාශ කිරීම පිණිස ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රියාමාර්ග සකස් කර ඇත. ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකරන ක්‍රමෝපායික නියෝගය පරිනාමනය කිරීම සහ එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ ක්‍රියාත්මක කිරීමේ ඵලදායී ධූරාවලියක් ඇතුළත් කිරීම ජ්‍යේෂ්ඨ කළමනාකරණයේ රාජකාරියකි.

මෙම ප්‍රතිපත්ති මාර්ගයේ පහළට විධිමත්ව සන්නිවේදනය කරන බව සහ ආයතනයේ සංස්කෘතිය තුළ ඇතුළත් කරන බව බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකරණය විසින් සහතික කළ යුතුය. ප්‍රමාණනය කළහැකි අවදානම්වලට අදාළ අවදානම් ඉවසුම් බැංකුව වෙනුවෙන් අවදානම් භාරගන්නා අය වෙත සීමා හෝ උප සීමා ලෙස පොදුවේ සන්නිවේදනය කෙරේ. ගුණාත්මක අවදානම් ක්‍රියාමාර්ග මඟපෙන්වීම් ලෙස සන්නිවේදනය කරන අතර කළමනාකරණයේ ව්‍යාපාර තීරණවලින් අනුමාන කරයි.

බැංකුවේ අවදානම් රුචිය අවදානම් කළමනාකරණ කාර්යය විසින් නියාමනය කර පාලනය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික කළමනාකරණය සහ අදාළ කමිටු වෙත වරින්වර වාර්තා කරනු ලබයි.

අභ්‍යන්තර සහ බාහිර වාතාවරණය තුළ සැලකියයුතු වෙනස්වීම්වලට සමගාමීව මෙම ප්‍රතිපත්ති තබාගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කල මෙම ප්‍රතිපත්ති සමාලෝචනය කර අවශ්‍යයයි කල්පනා කරන පරිදි සුදුසු වෙනස්වීම් සිදු කරයි. මෙවැනි අවදානම් රුචි සීමා මාසිකව සහ කාර්තුමය වශයෙන් නියාමනය කරන අතර, අවදානම් රුචි සීමා බැංකුවේ අවදානම් කළමනාකරණ හැකියාවන්, ව්‍යාපාරික අවස්ථා, ව්‍යාපාර ක්‍රමෝපාය සහ නියාමන පිරිවිතරවලට සමගාමීව අවසාන වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

අවදානම් රුචි ප්‍රකාශනයන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුළ ඇතුළත් කර ඇත.

- **අවදානම් කළමනාකරණ ක්‍රමවේදය**

අවදානම් කළමනාකරණ ක්‍රමවේදය තුළින් අවදානම හඳුනාගැනීම, මැනීම, ඇගයීම, නියාමනය සහ කළමනාකරණය ඇති කරයි. අවදානම් කළමනාකරණ මෙවලම් ප්‍රතිපත්ති, සීමා, සහ පීඩන පරීක්ෂණය. ආදියෙන් සමන්විත අවදානම් මැනීම, නියාමනය සහ වාර්තාකරණය අවදානම් කළමනාකරණ කාර්යයේ වගකීමකි. විධිමත් හා තත්කාර්ය වාර්තා සමාලෝචනය සඳහා කළමනාකරණ කමිටු වෙත සහ ක්‍රමෝපායික තීරණ ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දේ.



නිෂ්පාදන හා කළඹ තුළ අවදානම පිළිබඳ සමුච්චිත ක්‍රියාමාර්ග සම්බන්ධ තොරතුරු සමන්විත ලබාදී ඇති වාර්තා හඳුනාගනී. අවදානම්වල ප්‍රමාණ, වර්ග සහ සංවේදීතා පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබාදෙමින් විකඟ වූ ප්‍රතිපත්ති සීමා සමඟ සන්සන්දනය කෙරේ.

බාසල් 11 හා 111 සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති අනෙකුත් නියාමන රාමු මත පදනම් වී සකස් කරන බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව මගින් පැහැදිලිව අවදානම කළමනාකරණය කිරීමේ පරමාර්ථ, ක්‍රියාවලි සහ කාර්යභාරයන් දක්වා ඇත.

විවිධ වෙළෙඳපොල තත්ත්වයන් තුළ හා ණය අවදානම් රුචිය, වෙළෙඳපොල අවදානම් සීමා, ප්‍රාග්ධනය සහ අරමුදල් අවශ්‍යතා සම්බන්ධයෙන් තීරණය ගැනීම පිණිස අනෙකුත් අවදානම් සාධකවල වෙනස්වීම් හේතු කොට ගෙන ඉපයීම්, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාවය මත සිදුවියහැකි අනාගත බලපෑම තක්සේරු කිරීමට තනි පුද්ගල මට්ටමින් හා ආයතන මට්ටමින් පීඩන පරීක්ෂණය සිදු කරනු ලැබේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව කළමනාකරණය

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලියේ - ICAAP පරමාර්ථ වන්නේල

1. බැංකුවේ අවදානම් පැතිකඩ ස්ථාපිත කිරීම
2. බැංකුවේ අවදානම් අබණ්ඩව තක්සේරු කිරීම
3. බැංකුවේ අවදානම් භාරගැනීමේ කටයුතුවල ආර්ථික බලපෑම ආවරණය කිරීමට ප්‍රාග්ධනය ආරෝපනය කිරීම
4. බැංකුවේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි අභ්‍යන්තර හා බාහිර සාධක කලින් හඳුනා ගැනීම
5. බැංකුව තුළ විවිධ මට්ටම්වලදී තීරණ ගැනීමට සහයවීම

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලි වාර්තාව පිළිබඳ සිදුකළ සමාලෝචනයට අනුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සුදුසු ක්‍රියාමාර්ග තුළින් හඳුනාගත් ගැටළු ආමන්ත්‍රණය කරමින් බැංකුවේ අවදානම් පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කළමනාකරණ හා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මුලිකාංගයන් ගනිමින් සිටී.

2019.12.31 දිනට බැංකුවේ පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය 22.49%ක් වන අතර මුළු ප්‍රාග්ධන අනුපාතය 23.22%කි. මෙවැනි අනුපාත ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා ඉහළින් වන අතර අවදානම් උකහාගැනීම සඳහා වඩා ශක්තිමත් හැකියාවක් සඳහන් කරයි.

ප්‍රාග්ධන කළමනාකරණ පරාමිති පහත රූපසටහනේ පෙන්වා ඇත.



පීඩන ඉපයීම්

ණය අවදානම

විකඟ වූ නියමයන්ට අනුකූලව බැඳීම් සපුරාලීමට බැංකුවේ ණයකරුවන් හා හෝ ඇපකරුවන් අසමත්වීමේ හැකියාව ලෙස ණය අවදානම වඩාත් සරලව අර්ථ දක්වයි. විවිධ නිෂ්පාදන යටතේ ඇපකරුවන්ට ලබාදී ඇති ණය හා අත්තිකාරම් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන මූලාශ්‍ර නිර්මාණය කරයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය ණයකරුවන් හා හෝ ඇපකරුවන් සඳහා පිළිගතහැකි ණය ප්‍රමිති සැකසීම, යහපත් කළඹ කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරන අතර, බැංකු ඇපකරුවන්ගේ ණය ස්ථාවරය තුළ පිරිහීමකට හේතු විය හැකි ආර්ථික හෝ වෙනත් වාතාවරණයන් තුළ වෙනස්වීම් කෙරෙහි අබණ්ඩව අවධානය යොමු කරයි.

බැංකුව ණය ප්‍රතිපත්තියක් හා ණය අත්පොතක් සංවර්ධනය කර ඇති අතර ඉන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමත අවදානම් රුචි මට්ටම්වලට අනුව සේවාදායකයා තේරීම, නිසි පිළිවෙල, අවදානම් ඉවසීම, සමාලෝචන හා අයකිරීමේ ක්‍රියාපටිපාටි, කළඹ නියාමනය, සහ කළමනාකරණය ඇතුළත් මූලධර්ම අර්ථ දක්වන අතර සුදුසු ණය වාතාවරණය, යහපත් ණය ලබාදීමේ ක්‍රියාවලියක් යටතේ මෙහෙයවීම, සුදුසු ණය පරිපාලනයක් පවත්වා ගැනීම, මැනීමේ සහ නියාමන ක්‍රියාවලිය, සහ ණය අවදානම සම්බන්ධයෙන් සුදුසු පාලනය සුරක්ෂිත කිරීම තුළින් ණය අවදානම පාලනය කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉතිරි කොටස...

ණය ප්‍රතිපත්තිය සහ අත්පොත වාර්ෂිකව සමාලෝචනය කරන අතර, බැංකුවේ අවදානම් රුචිය සහ ව්‍යාපාර ක්‍රමෝපාය තුළ අබණ්ඩතාව සුරක්ෂිත කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි.

ණය අවදානම් කාර්යසාධනයේ වගවීම තනිපුද්ගල ව්‍යාපාර ඒකකවලට පවරන අතර, අයහපත් ප්‍රවනතා බැංකුවේ සෑම මට්ටමකදීම ආමන්ත්‍රණය කෙරේ.

ණය අවදානම් කළමනාකරණය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ණය අවදානම කළමනාකරණය කිරීමේදී පහත සඳහන් මොඩියුල කෙරෙහි අවධානය යොමු කරයි.

ණයකරුවා පිළිබඳ මූලික නිවාරණය සහ ණය ඇගයීම ණය අත්පොත මගින් මෙහෙයවන අබණ්ඩ ප්‍රමිතිවලට අනුකූලව අවදානම් හිමිකරුවන් විසින් සිදු කරනු ලබයි. කාලීන ආකාරයක් මත සිය බැඳීම සපුරාලීමට ණය කරුවාගේ හැකියාව ණය ඇගයීම සහතික කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ ණය රුචියට අනුකූල වෙමින් ණය ඇගයීමේ ක්‍රියාවලිය කෙරෙහි අබණ්ඩතාව පවත්වා ගැනීමට ණය නිලධාරීන් දැනුවත් කෙරේ. ණය අවදානම ඇප ලෙස ඇපකරුවන් සහ ඇපවිම් මගින් අවම කරන අතර පිළිගත් නිර්ණායක ප්‍රතිපත්තිය මගින් සකස් කෙරේ. කලින් කල ඇපවල උපලබ්ධි කළහැකි වටිනාකම ඇගයීම සහ තක්සේරු කිරීම, නියාමන අවශ්‍යතාවය පරිදි සහ විශේෂයෙන් අයකිරීම් කාර්යයේදී කොටසක් ලෙස අවශ්‍ය අවස්ථාවේදී කරනු ලැබේ.

ආදායම් මූලාශ්‍ර සහතික කිරීමේ ආදර්ශය (ISVM) රාජ්‍ය නොවන අයදුම්කරුවන්ගේ ආදායම් මූලාශ්‍රය පිළිබඳ විශ්වාසවන්තභාවය ඇගයීම සඳහා මූලික මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කෙරේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර අවදානම් ශ්‍රේණිගතකරණ මොඩියුලය සංවර්ධනය කර ඇත. මෙම ශ්‍රේණිගතකරණ ආදර්ශය විවිධ ඇගයීම් නිර්ණායක මත පදනම් වී සේවාදායකයින් ශ්‍රේණිගත කිරීමට යොදා ගනු ලැබේ. අවදානම් තක්සේරු කිරීම, ණය තීරණ ක්‍රියාවලිය මෙන්ම අවදානම් පදනම් මිලකරණය සඳහා භාවිතා කළ යුතු මෙවලමකට සහය වීම සඳහා ශ්‍රේණිගතකරණ ආදර්ශය භාවිතා කරනු ලැබේ.

ගනුදෙනුකරුවන්ගේ අවදානම් පැතිකඩ ස්වාධීනව ඇගයීම අවදානම් නිලධාරීන් විසින් සිදුකරගෙන යනු ලබන අතර, අවදානම් හිමිකරුවන් විසින් සේවාදායකයාට දෙනලද අවදානම් ශ්‍රේණිගතකරණ තක්සේරු කරයි.

ණය අනුමත කිරීමේ ව්‍යූහය සඳහා බැංකුව තුළ පැහැදිලි මාර්ගෝපදේශ ස්ථාපිත කර ඇති අතර, බලය අනුමත ක්‍රියාවලිය විවිධ මට්ටම්වලට බෙදා හැර ඇත. ඕනෑම පුද්ගලයෙක්ට ණය ලබාදීම ආරම්භ කර අනුමත කළ හැකිය. නියමිත සීමාව ඉක්මවන ණය පහසුකම් අවදානම් කළමනාකරණ අංශයට අනුයුක්ත අවදානම් නිලධාරීන් විසින් ස්වාධීනව ඇගයීමට ලක්කරන අතර, එවැනි පහසුකම් අනුමත කිරීමේදී එම අදහස් අනුග මනය කරනු ලැබේ.

පෙර-මුදාහැරීමේ ඒකකය බැංකුවේ ණය ලබාදීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසක් ඉටුකරයි. පෙර-මුදාහැරීමේ කාර්යයන් අත්තිකාරම ලබාදෙන පදනම මත නියමයන් හා කොන්දේසි පැහැදිලිව දක්වා ඇත. මෙම නියමයන් හා කොන්දේසි බැංකුව සහ ණයගන්නා විසින් අනෝන්‍ය වශයෙන් පිළිගනී. ඒ තුළින් ණය ප්‍රමාණය හෝ අත්තිකාරම්වල උපරිම සීමාව, අත්තිකාරමේ ස්වභාවය, එය වලංගුවන කාලසීමාව, අයකිරීමට නියමිත පොළී අනුපාතය ආවරණය කරයි. එමෙන්ම එහි ආපසු ගෙවීමේ කාලසීමාව ඇතුළත් වන අතර, එය ණය/ අත්තිකාරමේ අරමුණ සහ ණය මුදලේ ප්‍රමාණය මත රඳා පවතී. ඇප තක්සේරු කිරීම සඳහා, විශේෂයෙන් උකස් ඇප (ඉඩම්, ගොඩනැගිලි යනාදිය), සඳහා අභ්‍යන්තර හා බාහිර වෘත්තීකයින්ගෙන් බැංකුව උපදෙස් ලබාගනී. ඇපවල නීතිමය පැත්ත හේතු කොට ගෙන, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ගනුදෙනුකරුවන්ට අදාළ සියලුම ලියවිලි සම්බන්ධ නිසි පරීක්ෂාව පවත්වා ගනී. පෙර-බෙදාහැරීමේ ඒකකය විසින් අවශ්‍ය සියලුම නියමයන් මනාව ඉටුකර තිබේද යන්න සහ ණයකරුවන් ඔවුන්ගේ සැබෑ අත්සන් මගින් වගකීමට බැඳී සිටින්නේද යන්න පරීක්ෂා කරයි. පෙර-බෙදාහැරීමේ ඒකකය බැංකුවේ හිමිකම් අහිමිවීමේ අවදානම වලක්වා ගත හැකි වන්නේ ඒවායේ අඩංගු සියලුම වගන්ති සහ සියලුම නීති උපදෙස් පරීක්ෂාකාරීව පරීක්ෂා කිරීමට නොසැලකිලිමත් නොවීමෙනි. ණය ගිවිසුම්, කොන්දේසි වෙනස් කිරීම හෝ ස්ථාපිත කිරීම හා සම්පූර්ණ කිරීමෙන් පසු, පෙර-මුහැරීමේ ඒකකය අවසර දියහැකි බැංකුවේ ණය මුදල මුදාහැරීම සම්මත කරයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන මූල්‍යකරණ ණය සමාලෝචන යාන්ත්‍රණය මගින් වියහැකි අලාභවලට අනුව බැංකුව සුරක්ෂිත කිරීමට ගැටළුකාරී ණය කලින් හඳුනාගැනීම සහතික කරයි. බැංකුව මට්ටම්න් නියමකරන ණය අවදානම් දර්ශකය, පූර්ව අවවාද සංඥා හඳුනා ගැනීමට සහ ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට, විධිමත් කාලපරාසයන් තුළ නියාමනය කෙරේ.

ගැටළුකාරී ණය සහ අක්‍රිය ණය අත්තිකාරම්වල අයකරගැනීමේ වගකීම ණය දෙපාර්තමේන්තුව සහ අයකිරීමේ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කෙරේ. ණය නිලධාරීන් මූලික අදියරවල අත්තිකාරම් අයකරගැනීම පසු විපරම් සිදුකරන අතර, ණය අක්‍රිය ණය බවට පත්වන අවස්ථාවේදී අයකිරීමේ දෙපාර්තමේන්තුවට මාරු කරනු ලැබේ. මෙම ඒකකය විසින් ඇපවල වටිනාකම නියාමනය කරමින් අයකිරීමේ කරුණු අවසන් කරන තෙක් අයකිරීමේ ක්‍රියාවලිය කරගෙන යනු ලැබේ. පසුගිය අත්දැකීම් තුළින් ඵලදායී පසුවිපරම සහතික කිරීමට සහ ක්‍රියාවලිය ඉහළ නැංවීමට අයකිරීමේ දෙපාර්තමේන්තුව ණය අවදානම් කළමනාකරණය සමඟ සම්බන්ධ වේ. අයකර නොගත් අත්තිකාරම් අවසාන විකල්පය ලෙස නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති අංශය වෙත මාරු කරනු ලැබේ.

ණය සංකේන්ද්‍රණ අවදානම

මෙය ඇපයක් හෝ ඇපයක කොටසක් මත අධික නිරාවරණය හේතු කොට ගෙන ඇතිවන අවදානමයි. HHI දර්ශකය මගින් මනිනලද බැංකුවේ ණය සංකේන්ද්‍රණය 3452 කි. හර්ෆින්ඩායි - හිර්ස්මන් දර්ශකය (HHI) යනු කළඹ සංකේන්ද්‍රණය පිළිබඳ පොදුවේ පිළිගත් මිනුමකි. 1,500ට HHI අඩු දර්ශකයක් සහිත කළඹ ඉහළින් විශේෂීකරණය වියයුතු බවට, 1,500 - 2,500 දක්වා HHI දර්ශකයක් මධ්‍යස්ථව සංකේන්ද්‍රිත කළඹක් වියයුතු බවට සහ 2,500 හෝ ඊට වඩා ඉහළ HHI දර්ශකයක් ඉහළ සංකේන්ද්‍රිත කළඹක් වියයුතු බවට සලකනු ලබයි. එබැවින්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සංකේන්ද්‍රණ

අවදානම අවම කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ අංශයට පුළුල්වීම වැනි එහි කළඹ විවිධාංගීකරණය කිරීමේ ක්‍රමෝපායන් මත දැනට අවධානය යොමු කෙරේ. බැංකුව අංශ අනුව නිරාවරණය, නිෂ්පාදන නිරාවරණය, සහ භූගෝලීය නිරාවරණ යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සීමා පරිදි සංකේන්ද්‍රණ අවදානම බැංකුව අඟය කරමින් සිටී.

2019.12.31 දිනට අංශ අනුව නිරාවරණය

අංශය	ප්‍රමාණය රු.මි.
කෘෂිකර්මය හා ධීවර	6,198
ඉදිකිරීම	29,690
සංචාරක කර්මාන්තය සහ වෙනත්	6



2019.12.31 දිනට භූගෝලීය සංකේන්ද්‍රණය

පළාත	ප්‍රමාණය රු.මි
මධ්‍යම	3,022
නැගෙනහිර	803
උතුරු මැද	3,694
උතුරු	1,290
සබරගමුව	1,193
දකුණු	3,858
ඌව	1,273
වයඹ	3,600
බස්නාහිර	14,482



2019.12.31 දිනට නිෂ්පාදන සංකේන්ද්‍රණය

නිෂ්පාදනය	ප්‍රමාණය රු.මි.
උකස්	9,500
සේඅඅ	7,558
පුද්ගලික	16,439
ස්ථාවර තැන්පතු ණය	621
ක්ෂුද්‍ර මූල්‍ය	142
ප්‍රතිමූල්‍ය	184
සේවක ණය	1,116
මෝටර් රථ	6



ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉතිරි කොටස...

2019 වසර තුළ දළ හා ශුද්ධ අක්‍රීය ණය අනුපාතවල වෙනස්වීම (සේඅඅ සහ වතු ණය ඇතුළුව)



2019 වසර තුළ දළ හා ශුද්ධ අක්‍රීය ණය අනුපාතවල වෙනස්වීම (සේඅඅ සහ වතු ණය රහිතව)



ඉහළ අක්‍රීය ණය (NPA) අනුපාතයට හේතුව 2019.12.31 දිනට 66.97%ක් වූ සේඅඅ හි අක්‍රිය ණය තත්ත්වය වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනලද ගනුදෙනුකරුවන්ගේ සේඅඅ ශේෂවලින් වාර්ෂිකව ඒය අයකකර ගනී.

වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අනුපාත හෝ මිල ගණන්වල උච්චාවචනය ශේෂ පත්‍ර දිනට හෝ ඉන් පසුව එහි වටිනාකම්වලට අහිතකර ලෙස ඇති කරවන බලපෑම වෙළෙඳපොල අවදානම වේ.

බැංකුවට අදාළව වෙළෙඳපොල අවදානම ලෙස සලකනු ලබන්නේ පොළී අනුපාත සහ ද්‍රවශීලතා යන අවදානම් වේ. සාමාන්‍යයෙන් මූල්‍ය වෙළෙඳපොලේ අස්ථාවර බව හා විශේෂයෙන්ම නිවාස මූල්‍ය බැංකුවේ වෙළෙඳපොල හා ද්‍රවශීලතා අවධානම් අධීක්ෂණය හා කලමනාකරණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව වෙතය.

බැංකුවේ වත්කම් හා වගකීම් ව්‍යුහය/සංයුතිය නිරීක්ෂණය කිරීම පිළිබඳ සහ තැන්පත් සහ අත්තිකාරම් සඳහා නිෂ්පාදන මිල තීරණය කිරීම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ වගකීම වේ. මෙහිදී අවශ්‍ය කරන කල්පිරීම් ආකෘතිය හා වර්ධිත වත්කම් හා වගකීම් සම්බන්ධතාවය තීරණය කිරීම කමිටුව විසින් සිදු කරනු ලබයි.

බැංකුවේ ප්‍රකාශිත පොළී අනුපාත ප්‍රකාශයට පත්කිරීම සහ අනාගත ව්‍යාපාරික ක්‍රමෝපයන් තීරණය කිරීම අරමුදල් ප්‍රතිපත්තිය විමර්ශනය හා ප්‍රකාශ කිරීම දැනට කමිටුව විසින් සිදු කරගෙන යනු ලබන කාර්යයන්ගෙන් කිහිපයකි. ද්‍රවශීලතා ගැටළු නිරාකරණය කිරීම සඳහා වූ අසම්භාව්‍යතා අරමුදල් සැලැස්මක් හා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ වත්කම් හා වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තියක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සතුවේ.

පොළී අනුපාත අවදානම

නියමිත කාල පරිච්ඡේදයක් තුළ පොළී අනුපාත ගැලපීම් නිසා ඇතිවන තත්ත්වයන් අතර අසමාන බවක් ඇතිවූ විට පොළී අනුපාත අවදානම පැනනගී. බැංකුවේ ණය දීම, අරමුදල් රැස්කිරීම හා ආයෝජන කටයුතු වලින් පොළී අනුපාත අවදානමේ වැඩිවීමක් ඇතිවේ.

බැංකුවේ මූලික අරමුදල් ප්‍රභවය තැන්පතු බැවින් මෙය වෙළෙඳපොල අවදානමේ ප්‍රධාන අංගයකි. මේවා ස්වරූපයෙන් කෙටිකාලීන සිට මධ්‍යකාලීන වන අතර, බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත වන නිවාස මූල්‍ය දිගුකාලීන ණයදීම් අංශයට අයත් වේ.

බැංකුව කාලයක් පුරා ස්ථාපිත ස්ථිර අනුපාතයකට ණය ලබාදෙන පරිසරයක කටයුතු කරන අතර. එහි වගකිම්වලින් වැඩි ප්‍රමාණයක් නිතර නිතර ප්‍රතිමිලකරනයට ලක්වේ. වර්ෂය තුලදී වැඩිවූ පොළී වියදම සැලකිය යුතු ලෙස ආන්තිකයට බලපා ඇති අතර, බැංකුව මෙම අසමතුලිතතාව ආමන්ත්‍රණය කිරීමට ක්‍රමෝපායන් සලකා බලමින් සිටියි. වෙළෙඳපොල තත්ත්වයන් හා පාරිභෝගික අවශ්‍යතා සමග ගැලපීමට මෙන්ම අසමාන්‍යතා සමනය කිරීම සඳහා වර්ෂය තුලදී නව වත්කම් හා වගකීම් නිපයුම් කීපයක් හඳුන්වා දී ඇත.

බැංකුව ස්කන්ධවල ආර්ථික වටිනාකම්වල වෙනස්වීම් විශ්ලේෂණය සඳහා නවිකරණය කළ කාලසීමා පරතර ප්‍රවේශයක් යොදා ගෙන ඇත

වෙළෙඳපොලේ ඇතිවිය හැකි බලපෑම් වෙනුවෙන් බැංකුව විශේෂ අමතර අවධානයක් යොමු කරයි.

අතර, වත්කම් හා වගකීම්වල සුන්බුන් වටිනාකම මත පදනම් වී විවිධ කාලවකවානුවලට ඒවා අනුරූපනය කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රවේශයෙන් විවිධ පොළී අනුපාත ක්‍රමවේදවලට ප්‍රතිචාරාත්මකව ස්කන්ධවල ආර්ථික වටිනාකමේ ගතික හැසිරීම විශ්ලේෂණය කරයි. පුළුල්ව, ස්කන්ධවල ආර්ථික වටිනාකම යන්න පොළී අනුපාතය තුළ වෙනසකට ප්‍රතිචාරාත්මකව වත්කම්වල ආර්ථික වටිනාකම සහ වගකීම්වල ආර්ථික වටිනාකම අතර වෙනස ලෙස නිර්වචනය කෙරේ. මේ දෙක අතර සම්බන්ධය අනුපාත සංවේදී වත්කම් සහ වගකීම්වල වෙනස්කළ කාලසීමාව හරහා ස්ථාපිත කෙරේ. බැංකුකරණ පොත තුළ පොළී අනුපාත අවදානමේ ප්‍රතිඵලය -IRRIBB මෙහි දක්වා ඇති පොළී අනුපාත අවදානම - නිමැවුම වගුවේ දැක්වේ.

ශුද්ධ පොලී ආදායමට එල්ලවිය හැකි ඕනෑම සෘණ බලපෑමක් අවම කරනු වස් එලදායිතා වක්‍රයේ වෙනස්වීම් සහ වෙළෙඳපොල අනුපාත උච්චාවචනයෙන් වියහැකි බලපෑම් බොහෝ සෙයින් වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව විසින් කළමනාකරණය කරනු ලබයි.

පොළී අනුපාත අවදානම - වසරවල වෙනස්කළ කාලසීමාව							
වකවානුවේ සාමාන්‍ය පැවතුම් කාලය - දින	15	60	135	270	730	1460	1825
බැංකු ශේෂ සහ ස්ථාපන	0.03706	0.14711		0.65094			
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	0.03865	0.15592	0.34887	0.67083		3.16934	3.73386
ණය හා අත්තිකාරම්	0.03968	0.16025	0.35292	0.68886	1.71942	3.01391	3.50510
පොළිය දරන වත්කම්	0.03731	0.15135	0.35109	0.66537	1.71942	3.01811	3.50531
තැන්පතු	0.03968	0.16025	0.35492	0.69465	1.76452	3.15814	3.70196
ණය ගැනීම්	0.03865	0.15592	0.34887	0.66692	1.72773	3.08961	3.61938
පොළිය දරන වගකීම්	0.03956	0.15990	0.35457	0.69308	1.74773	3.14447	3.69498

මුළු යෝග්‍යතා ප්‍රාග්ධනය	5,425
තෝලය (RSA / මුළු යෝග්‍යතා ප්‍රාග්ධනය)	6.94
වෙනස්කළ පැවතුම් කාලය (වත්කම්)(DA)	1.98
වෙනස්කළ පැවතුම් කාලය (වගකීම්) (DL)	0.92
බර (RSL / RSA)	1.09
වෙනස්කළ පැවතුම් කාල පරතරය (ශේෂ පත්‍රය) අවුරුදු (DGAP)	0.97
ස්කන්ධවල වෙනස්කළ පැවතුම් කාලය	6.74
අනුපාත කම්පනය	0.02
200 bp ක් සඳහා	(0.13)
ස්කන්ධ වටිනාකම තුළ පහත වැටීමේ අනුපාත කම්පනය	(730.75)
ස්කන්ධවල ආර්ථික වටිනාකම තුළ වෙනස	10%
ස්කන්ධවල ආර්ථික වටිනාකම තුළ වෙනසේ සීමාව	188.27
IRRBB ප්‍රාග්ධන අයකිරීම	

ද්‍රවශීලතා අනුපාතය

ආයතනයකට සිය ගිවිසගත් වගකීම් ඉටු කිරීමට ඇති නොහැකියාව මත හෝ බලාපොරොත්තු නොවූ පිරිවැය හෝ පාඩු සිදු නොකර නියමිත වත්කම් අරමුදල් වැඩිවීම නිසා සිදුවිය හැකි අලාභ ද්‍රවශීල අවදානම ලෙස හැඳින්විය හැක. ද්‍රවශීලතා අවදානම එක් හුදකලා සිද්ධියක් නොවේ. ණය සහ වෙළෙඳපොල අවදානම් වැනි අනෙකුත් අවදානම්වල ප්‍රතිඵලයක් ලෙසද එය සිදුවිය හැකිය.

ද්‍රවශීලතා කළමනාකරණය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ඉතා වැදගත් වනුයේ එහි වත්කම් හා වගකීම් සංවිතයේ ස්වභාවය හේතුවෙන්ය. වත්කම් හා වගකීම් සංයුතිය, වගකීම් ස්ථාවරත්වය හා විවිධාංගීකරණය බැංකුව අධීක්ෂණය කරමින් ණය සංවිතයේ ගුණාත්මක බව වර්ධනය කිරීම කෙරෙහි අවධානයෙන් පසුවේ.

සාධාරණ හා තරඟකාරී තැන්පත් අනුපාත ලබාදීම මගින් තැන්පත්කරුවන්ගේ විශ්වාසය දිනාගැනීමටත් පුළුල් ශාඛා ජාලය මගින් සුළු තැන්පත් ලබාගැනීමට ද බැංකුව සමත් වී ඇත. එහෙයින් මහ පරිමාණ තැන්පතු සඳහා වන විශ්වාසය අඩුවී ඇත. දැරිය හැකි මිලකට දිගුකාලීන ණය උපකරණ නොමැති බැවින් වත්කම් පොතෙහි කල්පිරීම් අව ගැලපුම් ඇතිවීමට හේතු වී ඇති අතර, කල්පිරීම් අවගැලපුම් අඩුකිරීම සඳහා බැංකුව නැවුම් නිෂ්පාදන හඳුන්වාදීම සඳහා පර්යේෂණ කරමින් සිටියි.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට බඳුන්වී ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් නිර්දේශයට අනුව බැංකුව ද්‍රවශීලතා අනුපාත කීපයක් අධීක්ෂණය කරමින් සිටියි.

ද්‍රවශීලතා ආශ්‍රිත අනුපාත

කල්පිරීම් පරතර විශ්ලේෂණය ද්‍රවශීලතා හා විධිමත් මුදල් ප්‍රවාහ අනාවැකි මගින් බැංකුව එහි ද්‍රවශීලතා සංචලනය අධීක්ෂණය කරයි. අසම්භාව්‍යතා අරමුදල් සැලසුම හා වෙළෙඳපොල ප්‍රවේශය ද බැංකුව විශ්ලේෂණය කරයි.

ද්‍රවශීලතා අනුපාත	දිනට පවත්නා තත්ත්වය 31.12.2019
ආයෝජන/ තැන්පතු	18%
ණයරැතැන්පතු	92%
ණය / වත්කම්	76%
ණය / ප්‍රාග්ධනය	634%
ශුද්ධ ණයට ගත් අරමුදල්/ ප්‍රාග්ධනය	28%
ආයතන තැන්පතු මත විශ්වාසය	28%
ද්‍රවශීල වත්කම්/ මුළු වත්කම්	15%
ලබාගත හැකි ණය මාර්ගය රු. බී.	2.8

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉතිරි කොටස...

වත්කම් මුසුව



වගකීම් මුසුව



2019.12.31 දිනට කල්පිරීම නොගැලපීම් විශ්ලේෂණය (රු.මි.) (ස්ථිර පදනම)

රු.මි.	දින 7 ට අඩු	දින 7-30	මාස 1-3	මාස 3-6	මාස 6-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු 5ට වැඩි	එකතුව
මුළු වත්කම්	1,242	3,586	2,101	1,656	5,505	7,295	6,038	18,367	45,790
මුළු වගකීම්	1,955	3,284	5,907	6,722	14,231	3,697	2,688	7,307	45,790
පරතරය	(713)	303	(3,806)	(5,066)	(8,726)	3,598	3,350	11,060	

2019.12.31 දිනට කල්පිරීම නොගැලපීම් විශ්ලේෂණය (රු.මි.) (හැසිරීම් උපකල්පන යටතේ)

රු.මි.	දින 7 ට අඩු	දින 7-30	මාස 1-3	මාස 3-6	මාස 6-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු 5ට වැඩි	එකතුව
මුළු වත්කම්	1,122	3,438	1,856	1,216	5,583	5,650	4,732	35,586	59,183
මුළු වගකීම්	223	1,203	2,073	2,364	9,547	12,803	6,751	14,619	
පරතරය	899	2,235	(218)	(1,149)	(3,964)	(7,152)	(2,019)	20,967	59,183

බැංකුවේ ණය දීම් හා තැන්පතු පොලි අනුපාත සම්බන්ධයෙන් මූලික තීරක ලෙස වෙනස්වන සුළු වෙළෙඳපොල තත්ත්වයන්ට මුහුණදීම පිණිස වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව එහි සුපුරුදු රැස්වීම් වාර ගණන වැඩිකර ඇත.

ද්‍රවශීලතාවය හා සම්බන්ධ නියාමන අවශ්‍යතාවයන් බැංකුව පහසු ලෙස සපුරා ඇත.

ද්‍රවශීලතාවයේ ඇතිවන වෙනස්වීම් සහ විය හැකි අහිතකර බලපෑම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳ අවධානය යොමු කිරීමට පීඩන පරීක්ෂණ සිදුකරමින් සිටියි.

මෙහෙයුම් අවදානම

බාහිර සිදුවීම්, පුද්ගල හා පද්ධති ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අලාභවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස හඳුන්වා දිය හැකිය. පුද්ගල වැරදි පද්ධති අඩපනවීම් හා ප්‍රමාණවත් නොවන ක්‍රියාමාර්ග හා පාලනය සමග ආශ්‍රිතව මෙහෙයුම් අවදානම ඇතිවේ.

ක්‍රියාමාර්ග හා පාලනය කාර්යක්ෂමව හා මනාව සංවිධිත කිරීම සහ තාක්ෂණ යටිතල පහසුකම්, ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම මගින් බැංකුව මෙහෙයුම් අවදානම අඩුකරනු ලබයි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට පරිපූර්ණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් පවතින අතර, එයට අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, පාලනය හා ක්‍රියාවේ යෙදවීම අධීක්ෂණ සහ වාර්තාකරන යාන්ත්‍රණය ඇතුලත් වෙයි. ප්‍රධාන මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති ණය සහ මෙහෙයුම් වැනි අත්පොත මගින් වෙන් වෙන් වශයෙන් හසුරවනු ලබයි.

පද්ධති සංවර්ධනය හා වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදය සැකසීම බැංකුව අඛණ්ඩව සිදුකරගෙන යයි. තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා පාලනය වැඩි දියුණු කිරීම, නිවාරක නඩත්තුව, සේවක කුසලතා වර්ධනය, ප්‍රතිපත්ති නිසිකලට හඳුන්වා දීම හා භාවිතාවේ යෙදවීම සහ අවදානම් මාරුකිරීමේ පියවර විගණන භාවිතාවේ යෙදවීම මෙයට අන්තර්ගත වේ. මෙහෙයුම් හා ක්‍රියාකාරකම් විමර්ෂණය කිරීම විදිනෙදා රැස්වීම් වලදී සිදු කරනු ලැබේ.

තම රාජකාරිවලට අදාළ නිවැරදි මෙහෙයුම් ක්‍රියාමාර්ග හඳුනාගැනීම සඳහාත් මෙම ක්‍රියාමාර්ගවලට සෑමවිටම අනුගතව ක්‍රියාකිරීමේ වගකීම අවධාරණය කිරීම සඳහාත් සේවකයින් පුහුණු කරයි.

මෙහෙයුම් අවදානම්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම සෑම කාර්ය බද්ධ ඒකකයකටම පත්කර ඇති නිලධාරීන් මගින් සිදුවෙයි. අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලියට තොරතුරු ලබා දෙමින් විගණන චලිදරව් චකඟතා ක්‍රියාවලිය ශාඛා පරීක්ෂාව සහ නියැදි මූලික සමාලෝචනය බැංකුවේ මෙහෙයුම් අවදානම් ක්‍රියාවලිය මගින් සිදුකරනු ලබයි.

ව්‍යාපාර කටයුතුවලට පදනම් වන අලාභ සිදුවීම් අවස්ථා චක්‌රැස්කර විශ්ලේෂණය කිරීම සඳහා අලාභ හඳුනාගැනීමේ දත්ත සංචිතයක් ස්ථාපනය කර ඇත. හඳුනාගත් අඩුපාඩු වැලැක්වීම සහ ක්‍රියාමාර්ග ඇති කිරීමට මෙම තොරතුරු විශ්ලේෂණය කරයි.

ක්‍රියාවලියේ යම් අඩුපාඩුවක් හඳුනාගත්විට ඒවා නැවත සිදුවීම වලක්වා ගැනීම සඳහා ක්ෂණික ක්‍රියාපටිපාටිමය පියවර ගනී. සුමට සහ යහපත් මෙහෙයුම් කටයුතු සිදු කිරීම තහවුරු කරමින් ව්‍යාපාර කටයුතුවල විනිවිදභාවය පාලනය හා ප්‍රතිපත්ති වර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත. බැංකුවේ නියමිත ප්‍රතිපත්ති හා සමග මෙහෙයුම් කටයුතුවල ඇති අනුකූලතාවය බාහිර සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ නිරීක්ෂණයට ලක්වෙයි.

අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට, කාර්යක්ෂම සේවාවක් ලබාදීමට සහ නිවැරදි තීරණ ගැනීම පහසුකරවීමට තොරතුරු පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් ආයෝජන සිදුකිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

තරඟකාරී ලාභයක් සහතික කරගැනීම සඳහා විකල්ප බෙදාහැරීමේ මාර්ග වෙළෙඳපොල කොටස තුළ ආක්‍රමණශීලී ග්‍රහනය ලබා ගැනීමට සහ සේවකයින්. ව්‍යුහය හා පද්ධතිය තුළ අවශ්‍ය ආයෝජන සිදු කිරීමට බැංකුව දැඩි ලෙස මැදිහත්වී ඇත.

එමෙන්ම, බැංකුවේ මෙහෙයුම් අවදානම් අවම කිරීමේ අංගයක් ලෙස, අවම අලාභය සහිතව හැකි ඉක්මණින් අනපේක්ෂිත ආපදාවකින් ප්‍රතිසාධනය වීමට එහි ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම අඛණ්ඩව හා ඵලදායීව ක්‍රියාත්මක කරයි. ඒ අනුව, පහත සඳහන් ප්‍රධාන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම - පිටපත 03 සමාලෝචනය හා බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් නියාමන කමිටුවේ විෂය ක්ෂේත්‍රය ස්ථාපිත කිරීම
- බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් කමිටුව පත් කිරීම
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ එක එක මට්ටම්වලදී ගිනි ආරක්ෂක පත් කිරීම
- ලේඛන කළමනාකරණ පද්ධතිය මිලදිගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ වෙනත් තොරතුරු තාක්ෂණය අදාළ තක්සේරු කිරීම් ලබාදීම
- ප්‍රධාන කාර්යාලය සඳහා සුදුසු ස්ථිර ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පිළියම් අඩවියක් සූදානම් කිරීම
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ගිනි සංඥාවක් ස්ථාපිත කිරීම
- ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන ශාඛා එකොළහ තුළ ආපදා පිළියම් පෙරහුරුවක් පැවැත්වීම සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් නියාමන කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම
- ගිනි උපදේශකයින්ගේ සහයෝගිත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ ගිනි පෙරහුරුවක් පැවැත්වීම සහ ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවල කාර්ය මණ්ඩලයට ගින්නේදී ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් පිළිබඳ දැනුවත් කිරීම

ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් ආපදා පිළියම් පෙරහුරුව පිළිබඳ විගණන සමාලෝචනයේ නිරීක්ෂණය පහත පරිදි වේ.

පාලන අරමුණ	සහතිකය			
	සම්පූර්ණ	සැලකියයුතු	සීමිත	නැත
01. සම්පූර්ණ හා අදාළ ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් ආපදා පිළියම් පෙරහුරු සැලැස්මක්/සැලසුම් ක්‍රියාත්මකද			√	
02. ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් ආපදා පිළියම් පෙරහුරු සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය හා සැලැස්ම/සැලසුම් කිරීමෙන් පසු තාක්ෂණික පිළියම් අයිතම සම්බන්ධීකරණය කරන ආකාරය			√	
03. අවසන් පිළියම් ක්‍රියාවලි ඇතුළුකිරීම සහ යැපෙන්නා සහ පෝෂක ක්‍රමය අතර අතුරු මුහුණත් හඳුනාගැනීම ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් ආපදා පිළියම් පෙරහුරු සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය හා සැලැස්ම/සැලසුම් තුළ අවබෝධ කරගන්නේද යන්න		√		
04. ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් ආපදා පිළියම් පෙරහුරු සැලැස්මක්/සැලසුම් වලංගු කිරීමට කිරීමට පරීක්ෂණය සිදු කරන්නේද යන්න හා ප්‍රතිඵල වාර්තා කිරීම හා නිවැරදි කිරීමේ ක්‍රියා සිදුකර ආකාරය		√		
05. දත්ත ආරක්ෂාව සඳහා ප්‍රවේශය		√		

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉතිරි කොටස...

එම විගණනයට අනුව, අවදානම් ඇතිවීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීමේ ප්‍රතිවිපාක මත පදනම් වී ඉහළ, මධ්‍යම සහ පහළ ලෙස විවිධ ප්‍රමුඛතා යටතේ සොයාගැනීම් වර්ගීකරණය කර ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් දෙනලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ආරම්භ කර ඇත.

බැංකුව තුළ වඩාත් ඵලදායීව ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම ශාඛා/ ප්‍රධාන කාර්යාලයේ අංශ සලකාබලමින් සම්පූර්ණ ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් කාර්යය සැලැස්මක් සංවර්ධනය කරමින් සිටී. සමස්තයක් ලෙස, ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම් කාර්යය සැලැස්ම බැංකුව තුළ සම්පූර්ණ ක්‍රියාවලියකි.

නෛතික අවදානම

බලාපොරොත්තු රහිත අධිකරණ ක්‍රියාමාර්ග හෝ බැංකුවට එරෙහිව ගත් නීතිමය පියවරකට සාර්ථක ලෙස මුහුණදීමට අපොහසත්වීම නිසා නෛතික අවදානම ඇතිවේ. එවැනි අවස්ථාවලදී බැංකුවේ සේවය කරන නෛතික කටයුතු සඳහා මැදිහත්වන කණ්ඩායම අවශ්‍ය පියවර ගෙන එවැනි අවදානම් අවම කිරීම සඳහා ක්ෂණික පියවර ගනී. බැංකුව මුහුණදෙන නෛතික අවදානම මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය වුවහොත් බැංකුව බාහිර නීති උපදෙස් ලබා ගනී.

ක්‍රමෝපායික අවදානම් කළමනාකරණය

ක්‍රමෝපායික අවදානම යනු ඉපයීම් සඳහා පවතින හෝ වියහැකි බලපෑම්, අහිතකර ව්‍යාපාරික තීරණ නිසා ප්‍රාග්ධනය කෙරෙහි ඇතිවිය හැකි බලපෑම්, අනිසි ලෙස තීරණ ක්‍රියාත්මක කිරීම සහ ක්ෂේත්‍රයේ ඇතිවන වෙනස්වීම් සඳහා ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් ඇතිවිය හැකි තත්ත්වයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය හා සාමාන්‍යාධිකාරීවරයා, ආයතනික කළමනාකරණය හා එක්ව ක්‍රමෝපායික සැලැස්මක් මෙහෙයවන අතර එය මනා ලෙස ක්‍රියාත්මක වීම සඳහා පහළ මට්ටම් දක්වා සන්නිවේදනය කිරීම සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික කලමනාකාරිත්වය විසින් ගනු ලබන සියලුම ක්‍රමෝපායික තීරණවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හා අවදානම අඩු කිරීම සඳහා නියාමන අවශ්‍යතා අදාළ නීති හා රෙගුලාසි, සංස්ථාපිත පාලන අවශ්‍යතා, ආචාර ධර්ම සහ කර්මාන්තයේ යහපත් පරිචය සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කරයි.

අනුකූලතා අවදානම

අදාළ නීති හා රෙගුලාසි, චර්යා සංග්‍රහය, සහ යහපත් පරිචය පිලිබඳ කරුණු සඳහා, අනුකූලතාවය නොදැක්වීම මගින් බැංකුවට සිදුවිය හැකි අලාභවීමකි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අභ්‍යන්තර අනුකූලතා කාර්යාවලියක් ආරම්භකර ඇති අතර, අනුකූලතා සංග්‍රහයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අනුකූලතා අවදානම නිසිලෙස කළමනාකරණය කිරීම සහතික කරනු පිණිස අනුකූලතා කාර්යය ව්‍යාපාර සහ මෙහෙයුම් ඒකක සමග සමීපව කටයුතු කරයි.

• අවදානම් දැනුවත් සංස්කෘතියක්

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ඇතුළත් කර ඇති ප්‍රතිපත්ති විධිමත්ව පහළ මට්ටම් දක්වා සන්නිවේදනය කරන බව සහ ආයතනයේ සංස්කෘතියට ඇතුළත් කරන බව බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකරණය විසින් සහතික කළ යුතුව ඇත.

ප්‍රමාණනය කළහැකි අවදානම්වලට අදාළ අවදානම් ඉවසුම බැංකුව වෙනුවෙන් අවදානම් භාරගන්නා පුද්ගලයින් වෙත සීමා හෝ උප සීමා ලෙස පොදුවේ සන්නිවේදනය කෙරේ. ගුණාත්මක අවදානම් ක්‍රියාමාර්ග මාර්ගෝපදේශ ලෙස සන්නිවේදනය කරන අතර, කළමනාකරණ ව්‍යාපාර තීරණ වලින් අනුමාන කරයි.

ජ්‍යේෂ්ඨ කළමනාකරණය /අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමා තුළ අවදානම භාරගැනීම පවත්නා බව ව්‍යාපාර මාර්ග කළමනාකරුවන් විසින් සහතික කළ යුතුව ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ඉවසුම්වල යම් වැදගත් අත්හැරීම ජ්‍යේෂ්ඨ කළමනාකරණය/ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතු අතර, ඔවුන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. මෙවැනි අත්හැරීම් අවදානම් කළමනාකරණයට අදාළ ක්‍රම සහ ක්‍රියාපටිපාටිවල සුදුසුකම විනිශ්චය කිරීමට නිමැවුවක් ලෙස සේවය කරයි.

අවදානම් භාරගන්නා හෝ පාලනය කරන සහ දෙනලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුළ අවදානම් කළමනාකරණය කිරීමේදී තීරණ ගැනීම හා සම්බන්ධවන සේවකයින් පැහැදිලිව එය අවබෝධකරගන්නා බවට අවදානම දැනුවත් සංස්කෘතියක් නිර්මාණය කිරීම බැංකුවේ අරමුණ වේ.

මානව සම්පත් කළමනාකරණය

සේවකයින් ආයතනයේ ලාභය සඳහා ප්‍රධාන දායකයින් වන අතර ඔවුන් ආයතනයට වටිනාකමකි. සේවකයින් යම් ආයතනයක ශේෂ පත්‍රය තුළ හෝ ගිණුම් පොත්වල "වත්කම්" යටතේ දැකිය හැකිය. කෙසේවෙතත්, ඔවුන් වඩාත් වටිනා වත්කම් වන අතර ඒ නිසාම යම් මූල්‍ය වටිනාකමක් ලබාදීමට නොහැක.

අපගේ සියලුම ගනුදෙනුකරුවන් වෙත වටිනාකම එකතු කරන අපගේ දැක්ම ස්පෘශ්‍ය ප්‍රතිඵල බවට පරිවර්තනය කරනු ලබන්නේ සේවකයින් විසිනි. එමනිසා, පුහුණු සහ සංවර්ධන කටයුතු සහ සේවක සහභාගිත්ව කටයුතු තුළින්, සේවකයින්ට සංවර්ධනය සහ දීප්තිමත්වීමට හැකි සේවා ස්ථානයක් නිර්මාණය කරමින්, අපගේ සේවකයින්ගේ දැනුම, දක්ෂතා සහ හැකියාවන් වැඩි කිරීම කෙරෙහි අපගේ ආයෝජනවලින් අවධානය යොමු කරමින්, ඔවුන්ට විශිෂ්ඨත්වය දැක්වීම සඳහා සියල්ල ඇතුළත් පෙළඹවීම් ඇති කරන සේවා පරිසරයක් ලබාදෙන බව අපි සහතික කරමු. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අපි, ආර්ථිකය වර්ධනය ඉදිරියට ගෙන යාමට විශිෂ්ඨ දක්ෂයින් ආකර්ෂණය, පෝෂණය කිරීම සහ රඳවාගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරමු.

සේවක ශක්තිය

මෙම වසර තුළ මුළු සේවක සංඛ්‍යාව 378ක් වූ අතර, ඔවුන් තුළනාත්මකව කුඩා ප්‍රමාණයක් වුවත්, ඔවුන් වඩා ඉහළ ප්‍රමාණයකින් බැංකුවේ කාර්යසාධනයට දායක වී ඇත. වසර තුළ, කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් බැංකුවෙන් ඉවත් වූ අතර නිලධාරීන් 12ක් බැංකුවෙන් විශ්‍රාම ගන්නා ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයෙක් වෙනත් පසුබිම මත බැංකුවෙන් ඉවත් විය. වසර තුළ බැංකුව සඳහා නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 04ක් අපි බඳවා ගත්තෙමු. අභ්‍යන්තරව සහ බාහිරව අපගේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව ඇබෑර්තු පිරීම් සිදුකරන ලදී.

සේවක විචල්‍යතාව

කළමනාකරණ මට්ටම	විචල්‍යතාව		
	විශ්‍රාම ගිය	ඉල්ලා අස්වූ/ වෙනත්	බාහිරින් බඳවාගත්
ආයතනික කළමනාකරණය	1		
ජෙෂ්ඨ කළමනාකරණය			2
විධායක	2		1
විධායක නොවන	9	3	1
එකතුව	12	3	4

ස්ථර අනුව සේවක ශක්තිය

කළමනාකරණ මට්ටම	2019.12.31 දිනට සේවකයින් ගණන
ආයතනික කළමනාකරණය	9
ජෙෂ්ඨ කළමනාකරණය	9
විධායක	103
විධායක නොවන	257
එකතුව	378

මානව සම්පත් කළමනාකරණය ඉතිරි කොටස...

ස්ත්‍රී පුරුෂභාවය

සමානව රැකියා අවස්ථා සපයන්නෙකු ලෙස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව කාන්තා හා පුරුෂ පාර්ශවයන් සඳහා සමාන රැකියා අවස්ථා ලබා දී ඇත. 2019 වසර සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ කාන්තා හා පිරිමි සේවක ප්‍රතිශතය පිරිමි 49% සහ කාන්තාවන් 51% ක් විය.

සේවක වයස් විස්තරය

ඉතා පළපුරුදු හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයක් තබා ගැනීමට බැංකුවට හැකියාව ලැබී තිබිනි. කාර්ය මණ්ඩලයෙන් 47% ක ප්‍රමාණයක් අවුරුදු 40 ඉක්මවූ අය වෙති.

වයස් වර්ගය	2019.12.31 දිනට සේවකයින් ගණන	ප්‍රතිශතය
50 හෝ ඊට ඉහළ	88	23
40 - 49	90	24
30 - 39	108	29
29 හෝ ඊට පහළ	92	24
එකතුව	378	100

හැකියා කළමනාකරණය

හැකියා සංචිතය අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට විශිෂ්ඨත්වය ලබාදීමට අපට හැකිවන බැවින් අපගේ හැකියා සංචිතය කළමනාකරණය උපරිම ප්‍රමුඛතාවයකි. සම්පූර්ණ හැකියාවන් මුදාහැරීමට සමාගමට හැකියාව ඇති කරමින් අනාගත නායකයින් බවට පත්වීම සඳහා සේවකයින්ගේ හැකියාව සංවර්ධනය කිරීමට අපගේ වෙනස්වන කණ්ඩායම තුළ අපි ආයෝජනය කරමින් විශිෂ්ඨ සම්පත් අත්කරගෙන බැංකුව තුළ රඳවාගන්නා බව අපි සහතික කරමු.

හැකියා ආකර්ෂණය හා අත්කරගැනීම

අපගේ ව්‍යාපාර අවශ්‍යතා සඳහා මනාව ගැලපෙන අපේක්ෂකයා තෝරා ගැනීමට සැලසුම් කරන බැංකුවේ බඳවාගැනීම් තුළින් නව දක්ෂයින් අත්කර ගැනීම ආමන්ත්‍රණය කරයි. අවශ්‍ය දක්ෂතාව, දැනුම, හැකියාවන් සහ අපගේ සංස්කෘතියට ගැලපෙන හා එය පෝෂණය කරන වඩාත් වැදගත් චර්යාවන් සහිත දක්ෂයින්ට ප්‍රමුඛතාව ලබා දේ. ඇබෑර්තු ඇතිවන සෑම අවස්ථාවකදීම, අභ්‍යන්තර දක්ෂයින්ට සමීප සලකාබැලීම ලබාදෙන අතර, අභ්‍යන්තර දක්ෂයින් ලබාගත නොහැකිනම් අවශ්‍ය මට්ටම්වලදී විශේෂිත දක්ෂයින් ලබා ගනී.

පුහුණුව හා සංවර්ධනය

සේවකයෙකුගේ දැනුම, හැකියාවන්, දක්ෂතා, ආකල්ප සහ කාර්යසාධනය වැඩි කරන ආකාරයෙන් පුහුණුව හා සංවර්ධනය ප්‍රධාන මෙවලමක් වන අතර, එය අප බැංකුවේ වර්ධනය අත්කර ගනු ලබයි. අපගේ සේවකයින්ට ඔවුන්ගේ දක්ෂතා සහ දැනුම වැඩි කර ගැනීමට ඔවුන්ගේ පුද්ගල සන්නාමය ශක්තිමත් කරමින් පුහුණුව හා සංවර්ධන අවස්ථා පිරිනමනු ලැබේ. තම රාජකාරී ඉටු කිරීමට ඔවුන්ට හැකියාව ඇති කරමින් විවිධ කාර්යයන් හී සෑම මට්ටමකදීම සේවකයින් පුහුණු කර සංවර්ධනය කිරීමට බැංකුව උත්සාහ ගන්නා අතර අනාගත වගකීම් සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දේ.

2019 වසර තුළ, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පුහුණුව හා සංවර්ධන වැඩසටහන් සඳහා රු. 1,872,684.25 ආයෝජනය කරන ලද අතර, සේවකයින් සඳහා පුහුණු පැය 1988ක් පිරිනමන ලදී. සමාලෝචිත වසර තුළ, අභ්‍යන්තර හා බාහිර පුහුණුව තුළ අපගේ සේවකයින් අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 05කට සහ බාහිර පුහුණු වැඩසටහන් 45කට සහභාගි විය. දේශීය හා විදේශීය ක්ෂේත්‍රයේ නවීකරණ හා සංවර්ධනයන්ට ඔවුන් නිරාවරණට කරනු පිණිස බාහිර පුහුණු අවස්ථා බැංකුව ලබා දේ.

2019 වසර තුළ, ලබාදෙන ලද විවිධ පුහුණු අවස්ථාවන් හී සේවක සහභාගිත්වය පහත වගුවෙන් සාරාංශ කෙරේ.

ප්‍රධාන ක්ෂේත්‍ර	සහභාගිවූවන් ගණන
දැනුම හා දක්ෂතා සංවර්ධන පුහුණුව	148
ආකල්ප සංවර්ධන පුහුණුව රැ අභිප්‍රේරණ පුහුණුව	95
තාක්ෂණික හැකියාව සහ තොරතුරු තාක්ෂණ පුහුණුව	58
විදේශීය පුහුණුව	3
සම්මන්ත්‍රණ, වැඩමුළු, සාමාජිකත්ව ගාස්තු, ප්‍රශ්ක තරගාවලි	33

සේවකයින්ගේ සේවය

සේවා වර්ගය (අවුරුදු)	2019.12.31 දිනට සේවකයින් ගණන	ප්‍රතිශතය
0-4	56	15
5-9	158	42
10-14	51	13
15-19	25	7
20 ඉහළ	88	23
එකතුව	378	100

සේවකයින්ගෙන් 43%ක් බැංකුව තුළ වසර 10කට වැඩි කාලයක් සේවය කර ඇති අතර, බැංකුවේ සංවර්ධනයට ඔවුන්ගේ සේවය දායක කරයි. කාර්ය මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රතිලාභ ලබාදීම පමණක් නොව, මූල්‍ය නොවන ප්‍රතිලාභ ඔවුන්ගේ රැකියා තෘප්තිය සඳහා වැඩිකර ඇත.

අප අද සිටින ස්ථානය කරා ගමන්මඟ විතරම් පහසු නොවීය. නමුත්, බැංකුව එය අත්කරගෙන සිටින සෑම දෙයක්ම එහි සේවකයින්ගේ වෙහෙස නොබලා කැපවීමේ උත්සාහයන් තුළින් අත්කරගෙන ඇත.

අනාගත කරුණු

ඉදිරි වසරවලදී අපගේ මානව සම්පත්වල විශිෂ්ඨ පරිචයන් ඉහළ නංවමින් අපගේ සේවක සංඛ්‍යාව අපි අබණ්ඩව ශක්තිමත් කරමු. පුහුණු හා සංවර්ධනය පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණය ප්‍රධාන මාර්ගය වන අතර, මෙම නව විෂ්ලේෂණය තුළින්, සේවකයින්ගේ තාක්ෂණය සහ මෘදු කුසලතා අංගයන් වඩාත් විස්තීර්ණ හා සියල්ල ඇතුළත් පුහුණු සැලැස්මක් නිර්මාණය කිරීමට අපි අපේක්ෂා කරමු.

ඉදිරි වසර තුළ අපේක්ෂිත මට්ටම කරා ලඟාවීමට සේවකයින්ගේ කුසලතා සහ දැනුම සංවර්ධනය කිරීමේදී ප්‍රධාන පුද්ගලයින්ට ලබාදෙන ලද අවධානය තුළින් අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය වැඩි කිරීම හා ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. කෙටියෙන් සඳහන් කරන්නේනම්, වඩා යහපත් සේවා ස්ථානයක් සහ වඩා තෘප්තිමත් සේවකයින් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරනු ඇත.

ආයතනික සමාජ වගකීම



ආයතනික සමාජ වගකීම යනු සමාජය කෙරෙහි සමස්ත ධනාත්මක බලපෑමක් ලබාදීමට තම ව්‍යාපාර ක්‍රියාවලිය සමාගම විසින් කළමනාකරණය ආකාරයයි. බැංකුව එහි කොටස්හිමියන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ප්‍රවර්ධනය කර ශක්තිමත් කිරීමේදී ආයතනික යහපාලනයේ සහ ආයතනික සමාජ වගකීම වැදගත්කම හඳුනා ගනී.

ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්තිය බැංකුවේ ආයතනික දැක්ම සහ ගනුදෙනුකරුවන්, කොටස්හිමියන්, සේවකයින් සහ ප්‍රජාව සඳහා තෝරාගත් බැංකුව බවට පත්වීමේ අභිලාෂය මගින් මෙහෙයවනු ලැබේ.

වර්තමානයේ, ජනතාව ඔවුන්ගේ ජීවන තත්ත්වයන් පිළිබඳව ඉහළ උනන්දුවක් දක්වයි. එබැවින්, ආයතනික අරමුණු අත්කර ගැනීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි කිරීම බැංකුව අපේක්ෂා කරයි. එමෙන්ම, එය ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත්ව ඇත.

ශ්‍රී ලංකාව දැනට වඩා ඉහළ ආර්ථික රටක් බවට පරිවර්තනය වීමට උත්සාහ දරන බැවින්, දිගු කාලීන ක්‍රමෝපායික සහ ව්‍යූහමය සංවර්ධන අභියෝග කෙරෙහි අවධානය යොමු කරමින් සිටී.

බැංකුව පහත ක්ෂේත්‍ර තුළ වැඩසටහන් සහ කාර්යයන්ට සහය වේ.

1. ජනතාවගේ නිවාස සිහිනය පිළිබඳ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම මගින් ජීවන තත්ත්වය වැඩි කිරීම.

2. අනෙකුත් අය අතර, විවිධ ආබාධ සහිත පුද්ගලයින්, විදි ළමුන් සහ උවදුරට භාජනය වියහැකි ළමුන්. ආර්ථිකමය වශයෙන් දුර්වල අංශ සහ යුද්ධ සහ ත්‍රස්තවාදී ක්‍රියා ඇතුළුව ස්වභාවික සහ අනෙකුත් ආපදාවලට ගොදුරුවූවන් ඇතුළත් සමාජයේ උවදුරට භාජනය වියහැකි සහ අඩු වරප්‍රසාද සහිත අංශයන්හී ජීවිත කෙරෙහි අර්ථවත් සමාජ ආර්ථික බලපෑමක් සිදු කිරීම.

3. ස්වභාවික සම්පත් කළමනාකරණය, කෘෂිකර්ම සංවර්ධනය, ග්‍රාමීය සංවර්ධනය, සම්ප්‍රදායික කලාව හා අත්කම්, ක්ෂුද්‍ර ව්‍යවසාය යන ක්ෂේත්‍ර තුළ මැදිහත්වීම් තුළින් තිරසාර ජීවනෝපාය වැඩි කිරීම.

4. විශේෂ අධ්‍යාපනය ඇතුළත් අධ්‍යාපනය සහ විශේෂයෙන් ළමුන්, කාන්තාවන්, වැඩිහිටියන් සහ විවිධ ආබාධ සහිත පුද්ගලයින් අතර රැකියා වර්ධන වෘත්තීමය දක්ෂතා සහ ජීවනෝපාය වර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සාක්ෂරතාව, ගනුදෙනුකාර අධ්‍යාපනය සහ දැනුවත්කම සහ රජයේ විවිධ වැඩසටහන් හා සමගාමී වන ආර්ථිකයේ විවිධ අංශයන් හී හැකියා සහ දක්ෂතා ගොඩනැගීව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් මෙයට ඇතුළත් කළ හැකිය.

5. පාරිසරිකමය තිරසාරභාවය, පරිසර පද්ධති තුලනය හා ස්වභාවිත සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා වැඩමුළු පවත්වමින් සිසුන් වෙත ඔවුන්ගේ සම්පූර්ණ සහය සෑමවිටම ලබාදෙමින් සිටී. එමෙන්ම බැංකුව ශ්‍රී ලංකාවේ ජනතාව අතර මූල්‍ය සාක්ෂරතාව වැඩි කිරීම පිණිස මූල්‍ය සාක්ෂරතා සංවිධාන කරමින් සිටී.

වසර ගණනාවක් පුරා, යුද්ධ සහ වෙනත් අවස්ථාවලදී පරිසරය, සෞඛ්‍යාරක්ෂාව, අධ්‍යාපනය සහ සංස්කෘතිය වැනි ක්ෂේත්‍රයන් නගා සිටුවීම සඳහා අපි සාර්ථකව දායක වී ඇත්තෙමු. මිලියන ගණනක් වන ආයෝජන මේ දක්වා සිදුකර ඇති අතර, ශ්‍රී ලංකාවේ සමස්ථ සංවර්ධනය සඳහා අපි අඛණ්ඩව දායක වෙමු.

අපගේ නිපැයුම් සහ සේවාවන්



රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශ්‍රී ලංකාව තුළ පළමු රාජ්‍ය බැංකුව වේ. එමනිසා, ජනතාවගේ කීර්තිනාමය. ගෞරවය සහ අඛණ්ඩ විශ්වාසය පවත්වා ගැනීම අත්‍යවශ්‍යය. මූල්‍ය ක්ෂේත්‍රයේ නායකයෙක් ලෙස, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමාන විශිෂ්ඨත්වය මගින් බැංකු ක්ෂේත්‍රය පෝෂණය කර ආරක්ෂා කළ යුතුය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත්කරුවා, ණයහිමියන් සහ අනෙකුත් සියලු රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වයන් / සියලුම පාර්ශ්වකරුවන් සැමදා දිනාගත යුතුය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත පරිදි, බැංකුව ගනුදෙනුකරුවන් සඳහා විවිධ මූල්‍ය පහසුකම් පිරිනමා ඇත. නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය පහසුකම් මෙන්ම පුද්ගල ණය බැංකුවේ ප්‍රධාන ණය නිෂ්පාදන දෙකකි. තවද. කෘෂිකාර්මික ණය පනත පරිදි සම්මත කර ඇත. ඊට අමතරව, කර්මාන්ත අංශය, සංචාරක ක්ෂේත්‍රය සහ අනෙකුත් එවැනි ආදායම් උපයන ක්ෂේත්‍ර සඳහා මූල්‍ය සැලසුම් කිරීමේ පහසුකම් ලබාදීම සඳහා හැකියාව එයට ඇත.

සෘජු සහ වක්‍ර ගනුදෙනුකරුවන් වෙත බැංකුව විසින් පිරිනමන සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට විධිමත් ප්‍රචාරණ වැඩසටහනක් පවත්වා ගැනිමේ හේතු මත වසර 89කට වැඩි කාලයක් තුළ ජනතාවගේ හදවත් බැංකුව දිනාගෙන ඇත. විවිධ අලෙවිකරණ ශිල්ප රාජ්‍ය යාන්ත්‍රණය සමඟ සම්බන්ධතාව හා පුද්ගලික සම්බන්ධතා ගනුදෙනුකාරුවන් දිනා ගැනීමට යොදා ගෙන ඇත. වසර තුළ බැංකුවේ අඛණ්ඩ මූල්‍ය ශක්‍යතාව සර්වව්‍යාපී අලෙවිකරණ ක්‍රමවේදයන් භාවිතා කර ඇත යන සාධකය සනාථ කරයි.

2019 වසර තුළ, නිකුත් කරන ණයවල ඉහළම ප්‍රමාණය වාර්තා කර ඇත. එම ප්‍රමාණය අමාත්‍යංශයේ යෝජනාක්‍රම ණය වලින් රුපියල් බිලියන දහයකට ආසන්න වේ. අනෙක් අතට, ණය පොළිය මත ලාභය විශාල වශයෙන් ඉහළ ගොස් ඇත. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ දශක 8ක ඉතිහාසය තුළ මෙය වැදගත් සන්ධිස්ථානවලින් එකකි. එමෙන්ම, බැංකුවට කෙටිකාලීන සහ දිගුකාලීන ස්ථාවර තැන්පතු ලෙස වඩා කැපිපෙනෙන ස්ථාවර තැන්පතු කළඹක් ලබාගැනිමට අවස්ථාව උදා වී ඇත.

සමස්ත දිවයිනම ආවරණය කිරීමට ස්ථාපිත කර ඇති ශාඛා ජාලය රටතුළ ගනුදෙනුකරුවන් දහස් ගණනකට සේවය ලබාදීම සඳහා බැංකුවට පහසුව ඇති කර ඇත. 2019 වසර තුළ, නිවාස ණය යෝජනා ක්‍රම 10ක් පමණ හඳුන්වා දෙන ලදී. රාජ්‍ය අංශයට හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හඳුන්වා දෙන ලද ණය සමඟ, ණනය නිෂ්පාදන කිහිපයක් ගනුදෙනුකරුවන්ට හඳුන්වා දෙන ලදී. ඉතුරුම් නිෂ්පාදන කිහිපයක් මෙම කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලාංකීය මූල්‍ය ක්ෂේත්‍රයේ වඩා ජනප්‍රිය 1922 ගාස්තු රහිත අංකය අත්කර ගැනිම ජයග්‍රහනයකි.ගනුදෙනුකරුවන් වෙත අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා මෙම සේවාවට නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඊට අමතරව, නවින ලෝකය වෙත මූල්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවිය ද මනාව භාවිතා කරනු ලැබේ. ඉහත සියල්ල සමඟ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට ජනමාධ්‍ය සහ අනෙකුත් සේවා තුළින් තොරතුරු ලබාදිමේ ශක්තිමත් මාර්ගයක් පවත්වා ගැනීමට හැකි වී ඇත.

මූල්‍ය ප්‍රකාශන

තිරසාර ව්‍යාපාර කාර්යසාධනය සහ
මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

පොදු කරුණු

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය මගින් ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සංස්ථාපනය කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත් නීතියට අනුව බලපත්‍රලාභී විශේෂ බැංකුවේ තත්ත්වය පිරිනමන ලදී.

බැංකුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමගින් බැංකුවේ කටයුතු පිළිබඳ ඔවුන්ගේ වාර්තාව සහ1988 අංක 30 දරන බැංකු පනත් නීතියට අනුව සංශෝධිත 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ අවශ්‍යතාවන් තහවුරු කරමින් එම මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිගේ වාර්තා ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරු ඉමහත් සතුටට පත්වේ.

බැංකුවේ ප්‍රධාන කටයුතු

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ප්‍රධාන කටයුතු වූයේ නිවාස, කෘෂිකර්ම සහ කර්මාන්ත සංවර්ධන මූල්‍ය සහ තැන්පතු සේවයේ යෙදවීම ප්‍රවර්ධනය කිරීමයි. වසර තුළ ප්‍රධාන කටයුතුවල ස්වභාවය තුළ කිසිදු සැලකියයුතු වෙනසක් සිදු වී නොමැත. රටේ නීති හා රෙගුලාසිවලට පටහැනිවන කිසිදු කටයුත්තක් තුළ බැංකුව යෙදී නොමැත.

අධ්‍යක්ෂවරු

සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධාන යටතේ, සභාපතිවරයා ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරු නවදෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, සංශෝධිත පරිදි 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 7 වගන්තියට අනුකූලව අමාත්‍යවරයා විසින් ඔවුන් ඔවුන් පත්කරනු ලබයි. විධායක අධ්‍යක්ෂවරු කිසිවෙකු බැංකුවේ නොමැත.

එසේ පත්කරන ලද අධ්‍යක්ෂවරු තිදෙනෙකු පහත සඳහන් අමාත්‍යංශවල නියෝජිතයින් වේ.

අ. කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශය

ආ. නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශය

ඇ. පශු සම්පත් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශය

එක් අධ්‍යක්ෂවරයෙකු භාණ්ඩාගාර නියෝජිතයා ලෙස පත්කර ඇත

අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය යන්නෙන් අධ්‍යක්ෂවරු තිදෙනෙකු අදහස් වේ. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට එක් වරක්වත් පැවැත්විය යුතු වෙයි. 2019 වසර තුළ රැස්වීම් දහ හතරක් පවත්වා ඇති බව වාර්තා කර ඇත

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමට

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගිවියයුතු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන	සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන
නිරෝෂන පෙරේරා (සභාපති)	14	14
කේ.ඩී.ආර්. ඔල්ගා මිය	13	13
සෙනාත් ද සොයිසා මහතා	14	14
දිල්හාන් ජයසිංහ මහතා	14	12
විදුර මංචනායක මහතා	13	13
බර්ණාඩ් වසන්ත මහතා	13	08

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන්

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියේ ප්‍රතිපත්තිය වන්නේ බැංකුව හා එහි සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු විනිවිදභාවය සහ අතේ දුරින් මිලකරණය මත පදනම් වන බව සහතික කිරීමයි.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල ප්‍රමාණාත්මකබව බැංකුව විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමඟ කටයුතු කරන ආකාරය අනුව තීරණය කරනු ලබන පදනම මෙම ප්‍රතිපත්තිය තුලින් පෙන්වා දේ. බැංකුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අනුගමනය කරන අතර, එය බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ නියෝගවලට සමගාමී වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකල හෝ සිදුකිරීමට යෝජනාකර ඇති යම්කිසි ව්‍යාපාර ගනුදෙනුවක් පිළිබඳව සෘජුව හෝ වක්‍රව බැංකුවේ අධ්‍යක්ෂවරයකු හෝ ඔහුගේ කලත්‍රයා හෝ යැපෙන දරුවකු හෝ දරුවන් උනන්දුවක් දක්වා තිබේනම් එම ගනුදෙනුව සඳහා දක්වා තිබූ උනන්දුවේ ස්වභාවය වැනි ගනුදෙනු සාකච්ඡා කරන රැස්වීමක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැලි දරව් කලයුතු වේ.

අධ්‍යක්ෂවරුන්ට බැඳියාවක් ඇති කරුණු සම්බන්ධයෙන් ඔවුන් ඡන්දය දීමෙන් වැලකී සිටින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂවරු ඔවුන්ගේ අධ්‍යක්ෂධූර සහ සම්බන්ධතා අනාවරණය කළ යුතුය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන්, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුව සමඟ යම් ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙක් සෘජුව හෝ වක්‍රව බැඳියාවක් නොමැති බව වාර්තා කරමි.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව ඉතිරි කොටස...

මෙහෙයුම් සමාලෝචනය හා අනාගත සංවර්ධනයන්

2019 මූල්‍ය වසර තුළ බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය සහ අනාගත සංවර්ධනය පිළිබඳ සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාව තුළ පිළිවෙලින් අංක 6 සිට 15 දක්වා පිටුවල දක්වා ඇති සභාපතිගේ වාර්තාව, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි.ගේ වාර්තාව සහ මූල්‍ය සමාලෝචනය තුළ අඩංගු වේ. එම වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසකි.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි)

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.) බැංකුව තුළ ඉහළ ශ්‍රේණියේ පුද්ගලයා වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහු පත්කරනු ලබයි. ඔහුගේ ප්‍රධාන වගකීම්වලට බැංකුවේ කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු ඇතුළත් වේ. බැංකුවේ තිරසාර සංවර්ධනය අත්කර ගැනීමට, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ක්‍රමෝපායික පරමාර්ථ, ආයතනික සාරධර්ම සහ සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටිවලට අනුකූලව බැංකුවේ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකරණය ඔහු සිදු කරයි.

දැක්ම, මෙහෙවර හා ආචාර ධර්ම

දැක්ම, මෙහෙවර හා ආචාර ධර්ම ප්‍රකාශනය මගින් බැංකුව ගමන් කරන දිසාව සහ අත්කර ගැනීමට උත්සාහ කරන දෑ පිළිබඳ සියලුම දෙනා අවධානයෙන් තබා ඇත. ඒ අනුව, ඉන් බැංකුවේ ප්‍රධාන සාරධර්ම සහ සේවකයින්ගේ හැසිරීම අපේක්ෂා කරන ආකාරය පැහැදිලි කරයි. බැංකුවේ ව්‍යාපාර කටයුතු එහි දැක්ම අත්කර ගැනීම සඳහා සදාචාර ප්‍රමිතිවල ඉහළ මට්ටමකින් පවත්වනු ලැබේ.

බැංකුවේ දැක්ම මෙහෙවර හා ආචාර ධර්ම මෙම වාර්ෂික වාර්තාවේ 03 පිටුවෙහි දක්වා ඇත.

ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන රාමුවක් හා ක්‍රියාවලියක් පවත්වාගෙන යෑම උදෙසා අධ්‍යක්ෂවරු කැපවී සිටිති.

ඵලදායී පාලනය තිරසාර වගකීම්සහගත වර්ධනය සඳහා උපදේශයක් බව අධ්‍යක්ෂ මණ්ඩලය සලකනු ලබයි. ආයතනික පාලන ප්‍රතිපත්ති අනුව බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් හා අනුකූලතා කාර්යයන් ඵලදායී ලෙස මෙහෙයවීම හා පාලනය කිරීම සිදුකරයි. ආයතනික පාලනය මෙම වාර්ෂික වාර්තාවේ 21 සිට 75 දක්වා පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

බැංකුවේ කටයුතු පාලනය සහතික කිරීම පිණිස බැංකු පනත් නියෝගවලට අනුකූලව අනු කමිටු හතරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.

• අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, එහි වාර්ෂික වාර්තාව, අනාවරණය සඳහා පිළියෙල කරන ගිණුම් සහ කාර්තුමය වාර්තා, නෛතික හා නියාමන අවශ්‍යතාවලට බැංකුවේ අනුකූලතාව පිළිබඳ අවංකකම නියාමනය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරන අතර, බැංකුවේ බාහිර විගණන කාර්යයේ වාර්ෂික වැඩසටහන සහ බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය සහ මූල්‍ය වාර්තාකරණය. තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ කමිටුවේ බලය යටතට වැටෙන මෙහෙයුම් කරුණු පිළිබඳ සාකච්ඡා කරයි.

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමන්විත වන අතර, මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඇයට ගිණුම්කරණය හා විගණනය තුළ සුදුසුකම් සතු වේ. ඇය භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරියකි. මෙම කමිටුවේ සාමාජිකයින් එකී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් පත් කරනු ලබන අතර, ඔවුන්ට මෙම කමිටුවේ සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, දක්ෂතාව සහ පළපුරුද්ද ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලේකම්වරයා විගණන කමිටුවේ ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය), සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), සහකාර සාමාන්‍යාධිකාරී (ණය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා සැපයුම්) ආරාධිතයින් ලෙස රැස්වීම් සඳහා සහභාගී වන අතර, රජයේ විගණන අධිකාරී නිරීක්ෂකයෙකු ලෙස සහභාගීවෙයි.

2019 වසර තුළදී විගණන කමිටු රැස්වීම වාර හතරක් පවත්වා ඇත. එකී රැස්වීම්වලින් ප්‍රධාන විධායක නිලධාරීගේ සහභාගිත්වය නොමැතිව 2019 වසර තුළ එක් රැස්වීමක් පවත්වන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 77 සිට 78 දක්වා පිටුවල දක්වා ඇත.

• අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව බැංකුව වෙනුවෙන් මානව සම්පත් ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමේදී මඟ පෙන්වීම් හා උපදෙස් ලබාදී, සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි., සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පාරිශ්‍රමික ප්‍රතිපත්ති, වැඩසටහන්, වැටුප් ව්‍යුහයන් සහ නියමයන් හා කොන්දේසි සමාලෝචනය කර, සියලුම කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ඇතුළුව සියලුම මානව සම්පත් ගැටළු පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සමඟ උපයෝගී කාර්යභාරයක් පවත්වා ගන්නා අතර, මෙය මෙම කමිටුව වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම් වේ.

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සමන්විත වන අතර, මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. අදාළ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැර මෙම කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගි වෙති.

කමිටු රැස්වීම් කාර්තුමය ලෙස පවත්වන අතර කෙසේවෙතත්, අවශ්‍යතාව මත පදනම් වී රැස්වීම් පවත්වනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් දෙකක් (2) 2019 වසර තුළ පවත්වනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 80 සිට 81 දක්වා පිටුවල දක්වා ඇත.

- **අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)**

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සුදුසු ණය දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම් හා ක්‍රමෝපායික අවදානම් යන සියලුම අවදානම් තක්සේරු කරන අතර, බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විශේෂිත අවදානම් ආමන්ත්‍රණය කිරීමට සහ කමිටුව විසින් නියමකළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ එවැනි අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයක් සහ ව්‍යාපාර මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍ර පිළිබඳ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීමට සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතාවන් මත පදනම් වී කමිටුව විසින් තීරණය කරන විවක්ෂණ මට්ටම ඉක්මවන මට්ටම්වල ඇති විශේෂ අවදානම්වල බලපෑම් අවම කිරීමට කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ස්වාධීන අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත.

විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වන අතර, මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. සහ ප්‍රුඵල් අවදානම් වර්ගීකරණ භාරව සිටින අවදානම් කළමනාකරණ ප්‍රධානී ද කමිටුවේ සාමාජිකයින් වෙති. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් /සහකාර සාමාන්‍යාධිකාරී (නීති) මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් 2019 වසර තුළ පවත්වනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 82 සිට 84 දක්වා පිටුවල දක්වා ඇත.

- **අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව**

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරාගැනීම/ පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවිනි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලියයුතු යෝග්‍යතාවයට සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ආකල්ප වැනි නිර්ණායක සකස් කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව එහි කටයුතු හා තීරණ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. කමිටුව කාර්යසාධනය සහ දායකත්වය සලකා බලමින් පත්වන අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නැවත පත් කිරීම සඳහා නිර්දේශ කරයි (හෝ නොකරයි), අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම සහ යෝග්‍යතාව ඉන් සහතික කරයි.

විධායක නොවන අධ්‍යක්ෂවරු සිව් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සමන්විත වන අතර මින් එක් අයෙකු විකල්ප සාමාජිකයෙකි. සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි., සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා නීති), සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) කමිටුවේ සභාපතිගේ උපදෙස් මත ආරාධිතයින් ලෙස රැස්වීම්වලට සහභාගි වෙති. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් /සහකාර සාමාන්‍යාධිකාරී (නීති) මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ. කෙසේවෙතත්, අවශ්‍යතාව මත පදනම් වී රැස්වීම් පවත්වනු ලැබේ. එක් කමිටු රැස්වීමක් 2019 වසර තුළ පවත්වනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 79 පිටුවේ දක්වා ඇත.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත (CAR)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය යනු බැංකුවේ අවදානම බරතබනලද ණය නිරාවරණයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශිත බැංකුවේ ලබාගතහැකි ප්‍රාග්ධනය මැනීමකි. බැංකුව සෑමවිටම අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවශ්‍යතාවය පවත්වාගෙන ඇත.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව විසින් විධිමත්ව නියාමනය කෙරේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සියළුම වගකීම් භාර ගනිති. අවදානම් අවමකිරීම සඳහා බැංකුව විසින් ගන්නා ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ 86 වෙනි පිටුවෙහි සවිස්තරව දක්වා ඇත.

අභ්‍යන්තර පාලනය

ගිණුම්කරණය සහ විගණනය විසින් තීරණය කර ඇති පරිදි අභ්‍යන්තර පාලනය යනු මෙහෙයුම් ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව, විශ්වාසදායක මූල්‍ය වාර්තාකරණය සහ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලතාව තුළ බැංකුවේ පරිමාර්ථ සහතික කිරීමේ ක්‍රියාවලියකි.

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව තුළ ඵලදායී සහ සම්පූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කර ඇති අතර, එය ව්‍යාපාරයේ විදිනෙදා කළමනාකරණය තුළ ආයතනික කළමනාකරණය සඳහා මාර්ගෝපදේශයකි.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 110 වෙනි පිටුවේ දැක්වේ.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව ඉතිරි කොටස...

ලාභ සහ විසර්ජන

2019 වසර සඳහා බැංකුවේ මුළු ආදායම රු. බිලියන 5,993 ක් විය.

බැංකුවට අදාළ ලාභ විස්තර පහත සඳහන් වගුවේ දැක්වේ.

	2019 රු. 000	2018 රු. 000
දළ ආදායම	5,993,473	5,473,221
පොලී ආදායම	5,981,510	5,524,857
පොලී වියදම	(3,951,343)	(3,577,504)
ශුද්ධ පොලී ආදායම	2,030,167	1,947,352
වෙනත් ආදායම්	11,963	(51,635)
ශුද්ධ ආදායම	2,042,130	1,895,717
අඩුකලා: මෙහෙයුම් වියදම්	(1,226,224)	(1,163,999)
ව.අ. බදු/ජා.ගෝ. බදු/ණ.ආ.ගෙ. බදු	(316,252)	(251,985)
බද්දට පෙර මෙහෙයුම් ලාභය	499,654	479,733
අඩුකලා: බදු සඳහා වෙන්කිරීම	(80,580)	(235,261)
වර්ෂය සඳහා ලාභය	419,074	244,472
රඳවාගත් ලාභය	2,957,694	2,729,278
විසර්ජනය සඳහා ඇති ලාභය	3,376,767	2,973,750
විසර්ජනයන්	-	71,619
ගෙවිය යුතු ලාභාංශ බදු	40,364	(48,965)
වීකාබද්ධ අරමුදලට ගෙවීම්	-	-
සංචිත අරමුදලට මාරු කිරීම්	(9,253)	(15,033)
ආයෝජන අරමුදලට මාරු කිරීම්	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්	12,247	(23,677)
ඉදිරියට ගෙන ආ ශේෂය	3,420,126	2,957,694

සංචිත

2019 දෙසැම්බර් 31 දිනට මුළු සංචිත ප්‍රමාණය රු.මිලියන 4,769 කි. (2018 වසරේ එය රු.මිලියන 4,297 කි.) පිටු අංක 122 හි දක්වා ඇති ස්කන්ධය තුළ වෙනස්වීමේ ප්‍රකාශයෙහි මෙහි වෙනස්වීම් දක්වා ඇත.

ප්‍රාග්ධන වියදම්

පිටු අංක 147 සටහන් අංක 16 හි බැංකුවේ දේපළ පිරියත හා උපකරණ හා මෝටර් රථ පිළිබඳ විස්තර දක්වා ඇත.

නිශ්චල දේපළ වෙළෙඳපාල වටිනාකම

2019 දෙසැම්බර් 31 දිනට ස්පෘශ්‍ය නිශ්චල දේපළ හිමිකාරිත්වයක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට නොමැත.

දායක ප්‍රාග්ධනය

රු.890 ක් ලෙස ගණනය කරන ලද ප්‍රාග්ධනයක් ශ්‍රී ලංකා රජය සපයා ඇත.

සැලකියයුතු කොටස් දැරීම් හා කොටස් විස්තර

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විකම ප්‍රාග්ධන සැපයුම්කරු වන්නේ ශ්‍රී ලංකා රජයයි. මේ සම්බන්ධයෙන් අතිරේක විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇත.

රජයේ ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා දායකත්වය

තම දැනුම හා විශ්වාසය පරිදි රජයට හා සේවක මණ්ඩලයට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමකට පත්වෙති.

බදුකරණය

2019 වසර සඳහා ආදායම් බදු බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ලබා ගන්නා බදු ගෙවිය හැකි ආදායමින් 28% ලෙස සපයා ඇත.

ශේෂපත්‍ර දිනෙන් පසු සිදුවූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයන්හි වැලිදරව් කලයුතු හෝ ගැලපීම් සිදුකිරීමට අවශ්‍ය යම්කිසි අවස්ථාවක් ශේෂ පත්‍ර දිනෙන් පසුව පැන නැගී නොමැත.

ශේෂපත්‍ර දිනෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයන්හි වැලිදරව් කලයුතු හෝ ගැලපීම් සිදුකිරීමට අවශ්‍ය යම්කිසි ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවී නොමැත.

අඛණ්ඩතාව

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයෙන් අනතුරුව, අගනා පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම්, පුරෝකථන හා අයවැය, ණය ගැනුම් අවශ්‍යතා හා කල්පිරීම්, පවත්නා හා අසම්භාව්‍ය බැරකම්, වෙනස්කම් ඇතිකිරීම සඳහා වූ මූල්‍ය තත්ත්වය, නිෂ්පාදන හා වෙළෙඳපොල ප්‍රවනතා, පූර්ණ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන්, ශක්තිමත් බව හා දුර්වලතා, අවස්ථා හා අභියෝග පිළිබඳව සලකා බැලීමේදී බැංකුවේ දැකියහැකි අනාගතයක් සඳහා සිය මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව ඉදිරියටත් සිදුකරගෙනයාම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වෙති.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ

ප්‍රමිති (LKAS හා SLFRS) අනුව සහ පොදුවේ පිලිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව අබණ්ඩතා පදනමක් මත පදනම්ව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර ඇත. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදි අවශ්‍යතාවය පරිදි සාධාරණ සහ විවක්ෂණ විනිශ්චයන් සිදුකර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සහ අනුකූලව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමත කරන ලදී.

අදාළ නීති හා නියමයන් හා රෙගුලාසි සමඟ අනුකූලතාව

සංශෝධිත පරිදි 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා ශ්‍රී ලංකාවේ නීතියට අනුව සම්මත කරන ලද අනෙකුත් සියළුම අදාළ නීති, නියමයන් හා රෙගුලාසි සමඟ සැමවිටම අනුකූලව කටයුතු කරන බව බැංකුව තහවුරු කරයි.

සියලුම පාර්ශ්වකරුවන්හට සාධාරණව සැලකීම

සියළුම වර්ගයේ පාර්ශ්වකාර කණ්ඩායම්වලට බැංකුව ඉතා වැදගත් ලෙස ගෞරවයෙන් සලකයි. බැංකුව එහි සේවාවන් මෙන්ම අවංකකම සහ සමානතාව පිළිබඳ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට කැප වී සිටී.

ගනුදෙනුකරුවන් හා ණය ගැනුම්කරුවන්

දැරිය හැකි පිරිවැයකට ජාතියට නිවාස ණය සැපයීම බැංකුවේ ප්‍රධාන අරමුණු අතරින් එකකි. මේ සම්බන්ධයෙන් නිතිපතා සමීක්ෂණ සිදුකිරීමට බැංකුව විශේෂ උත්සාහයක් ගෙන ඇත.එමෙන්ම විරැකියාව තුරන් කිරීමට රජය පෝෂණය කිරීමට සහයවෙමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන් වෙත ණය යෝජනා කිහිපයක් බැංකුව හඳුන්වා දී ඇත.

තැන්පත්කරුවන් හා ණය සැපයුම්කරුවන්

බැංකුවේ අරමුදල් සපයන්නන් අතර තැන්පත්කරුවන් ප්‍රධාන ස්ථානයක් ගනී. තැන්පතු අනුපාත ප්‍රසිද්ධ කරන අතර, ඒවා තරඟකාරී ස්වභාවයක් උසුලයි. ප්‍රාග්ධනය හා පොලිය නියමිත දිනට ගෙවීම සිදුකරයි.

භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී බැංකුව මිලගණන් කැඳවීම සිදුකරන අතර නිසි කලට ගෙවීම් සිදුකරයි.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ විගණකවරයා වෙයි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ගිණුම් විගණනය කිරීම 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර විගණකාධිපතිවරයාගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී.

2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ අංක 116 දරණ පිටුවේ පළකර ඇත.

පිළිගැනීම:

බැංකුව කෙරෙහි තබන ලද සහයෝගය හා විශ්වාසය වෙනුවෙන් බැංකුවේ වටිනා ගනුදෙනුකරුවන් අධ්‍යක්ෂවරු විසින් අගය කිරීම මෙහි සටහන් කරන අතර, අනාගතය තුළ මෙම අනෝන්‍ය සහයෝගී සම්බන්ධතාවයේ අබණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කර සිටී. අධ්‍යක්ෂවරු ඔබගේ බැංකුවේ සාර්ථකත්වය සඳහා සේවකයින් විසින් සිදුකරන දායකත්වය කෘතඥතා පූර්වකව පිළිගනී. එමෙන්ම අධ්‍යක්ෂවරු ශ්‍රී ලංකාව තුළ නියාමන හා රජයේ බලධාරීන්ගෙන් ලද සහයෝගය සහ සහය වෙනුවෙන් ස්තූතිය පුදකර සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,



නිෂානි පී.කේ ලොකුගේ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයේ 03 වන පරිච්ඡේදයේ (8) 11 (බී) වගන්තියට අනුකූලව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ (සංග්‍රහය) ඈ 1.5 මූලධර්මය මත පදනම් වී සහ නිර්දේශයන්ට අනුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව ඉදිරිපත් කරති.

බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ එහි සඵලතාවය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ. බැකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් සහ විශ්වාසනීයත්වය පවත්වා ගනිමින් වත්කම් විධිමත් පරිදි සුරක්ෂිත කරන්නේද යන්න පිලිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිහිටුවා ඇති බව අධ්‍යක්ෂවරු (අධ්‍යක්ෂ මණ්ඩලය) නිශ්චය කරති. කෙසේ වෙතත් ආවේනික අවදානම් හේතුවෙන් ඇතිවිය හැකි වැරදි අඩුපාඩු සහ වංචා වැලැක්වීම පිළිබඳ නිසි තහවුරු කිරීමක් මෙම පද්ධතිය මගින් සිදු නොකරයි.

බැංකුව මගින් මුහුණපාන වැදගත් අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ පාලනය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අතර, මෙම ක්‍රියාවලියට අවශ්‍ය අවස්ථාවේදී සහ ව්‍යාපාර පරිසරයේ හෝ නියාමන අවශ්‍යතාවල වෙනසක් ඇති වූ විට අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය නිරතුරුව සමාලෝචනය කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති ආයතනික පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සඳහා මාර්ගෝපදේශවලට අනුකූලව තහවුරු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම මාර්ගෝපදේශයේ දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා වන මූලධර්ම සැලකිල්ලට ගනිමින් අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර ඇත.

ක්‍රියාවට නංවා ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීමට සහ සම්පූර්ණ හා ප්‍රමාණවත් බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

බැංකුව මගින් මුහුණපාන අවදානම් හඳුනාගැනීම සහ ඇගයීම මගින් අවදානම සහ පාලන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම තුළ සහ මෙවැනි අවදානම් අවම කර පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, මෙහෙයවීම සහ නියාමනය තුළ කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලැස්ම සහ ඵලදායිත්වය යොදා ගැනීම සහ සමාලෝචනයේදී භාවිතා කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

කලින් කල අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය සමාලෝචනය කර සැලසුම් කිරීම සඳහා පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවට නංවා ඇත. අනෙකුත් කරුණු අතර, එම පාලන පද්ධතියට පහත දැක්වෙන කරුණු අඩංගුවේ.

- බැංකුව මුහුණ දෙන අවදානම් කළමනාකරණය කිරීම හා තක්සේරු කිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ අනුකමිටු පිහිටුවා ඇති අතර එමගින් අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණාත්මක බව හා විශ්වාසනීයත්වය පිලිබඳ තහවුරුවක් ලබාදීමටත් ආයතනික කළමනාකරණය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හා කළමනාකරුවන් යන විවිධ ස්ථර අතර බලතල පවරාදීමක්ද සිදුකර ඇත

- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වෙයි. බැංකුවේ අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම පිලිබඳව කමිටුව වගකිව යුතු අතර, මෙම කමිටුව බැංකුව මුහුණදෙන ප්‍රධාන අවදානම් හඳුනාගෙන බැංකුවේ අවදානම්

- කළමනාකරණය පදනම් කරගනිමින් ප්‍රතිපත්ති සකස් කරයි.

- බැංකුවේ මූල්‍ය පරිපාලන හා මෙහෙයුම් කටයුතු ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි හා අනුකූලවේද යන්න තහවුරු කිරීම සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය නියැඳි මූලික පරීක්ෂාවන් සිදුකරයි. සියළුම ඒකක හා ශාඛාවන්හි විගණන කටයුතු නිතර නිතර සිදුකරන අතර, එය බැංකුවේ ක්‍රියාකාරී ඒකකවල සහ නිෂ්පාදනය අදාළ අවදානම් මට්ටම හා පදනම් වී තිරණය කරනු ලබයි. බැංකුවේ මූල්‍ය පරිපාලනය හා මෙහෙයුම්වල අක්‍රමිකතා, අඩුපාඩු සහ වංචා පිළිබඳව විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා වෙත ස්වාධීන අරමුණු වාර්තාවක් යොමුකිරීම පිලිබඳව වගකිව යුතුවේ.

- පොදුවේ, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පවතින අභ්‍යන්තර පාලනයේ සමස්ථ සඵලතාවය සමාලෝචනය කර, අභ්‍යන්තර පාලනයේ පවතින දුර්වලතාවයන් පිළිබඳ විශේෂ නිරීක්ෂණ පිළිබඳ නිරතුරුව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. මේ සම්බන්ධයෙන් කමිටුව යොදාගන්නා යාන්ත්‍රණයට විගණකාධිපති වාර්තාව, අභ්‍යන්තර විගණන වාර්තා, වාර්ෂික/මාසික මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ.

- 2012 දී LKAS හා SLFRS සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අධ්‍යක්ෂ මණ්ඩලය යොදා ගෙන ඇත. එකී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමේ සිට, හඳුනාගැනීම, ඇගයීම, වර්ගීකරණය සහ අනාවරණය පිළිබඳ නව අවශ්‍යතාවන්ට අනුකූලවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව නියාමනය සහ ඉදිරියට යන වර්ධනය සිදුකරමින් පවතී.

- 2018 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක “මූල්‍ය උපකරණ” පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9 හි අවශ්‍යතාව සහ 2019 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක “කල්බදු” පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 16 හි අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිල්ලට ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවලට එහි ඇති බලපෑම තක්සේරු කිරීමට අවශ්‍ය පියවර රැගෙන ඇත.

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති වාර්තාකරන අවශ්‍යතාවයන් පිළිබඳ මඟ පෙන්වීම්වලට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිලියෙලකර ඇති බවට බැංකුවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය යම් තහවුරු කිරීමක් ලබා දෙන්නේ ද? යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇත.

- විදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වල බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා සුදුසු සවිබලගැන්වීම් සමඟ කළමනාකරණ මට්ටමේ කමිටු ක්‍රියාත්මකව පවති.

- බැංකුවේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ සැකැස්ම හා සඵලතාවය පිළිබඳව වාර්ෂික සමාලෝචනයක් මෙතෙක් සිදුකර නොමැත. අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ සමාලෝචනය කිරීම පහසුකරවන බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ලේඛණගත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය දැනටමත් අනුමත කර ඇත.

- බැංකුවේ වඩාත් ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතිකිරීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය පිලිබඳ අමතර පාලන ක්‍රියාමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කරවීම පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධ කරගෙන ඇත.

සහතික කිරීම

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුවේ මූල්‍ය වාර්තාකරන ක්‍රමය මූල්‍ය වාර්තාකරනයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා පිළියෙල කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුව සිදුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිලිබඳ අධ්‍යක්ෂවරුන්ගේ උක්ත ප්‍රකාශය බාහිර විගණක සමාලෝචකනය කරයි.

කේ.ඩී.ආර්. ඕල්ගා
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
අධ්‍යක්ෂ (විනෝ)

විදුර මංචනායක
අධ්‍යක්ෂ (විනෝ)

දිල්හාන් ජයසිංහ
අධ්‍යක්ෂ (විනෝ)

බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல My No. BAF/G/SMIB/IC/2019/02

ඔබේ අංකය உமது இல Your No.

දිනය திகதி Date 29 September 2020

සභාපති
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයාගේ තහවුරු වාර්තාව

හැඳින්වීම

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට ඇතුලත් කළ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශන ("ප්‍රකාශණය") සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය පිළිබඳ තහවුරු කිරීමක් මෙම වාර්තාව මඟින් සපයනු ලබයි.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත්කර ඇති 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයේ 3(8)(11)(ආ) වගන්තිය අනුකූලව නිකුත්කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශණය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා මාර්ගෝපදේශය" ට අනුව මෙම ප්‍රකාශණය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමණාකරණය වගකීමට බැඳී සිටී.

මාගේ වගකීම සහ SLSAE 3050 (ප්‍රතිශෝධිත) සමග අනුකූලතාවය

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵළදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුව සඳහා සහතික කිරීමේ වාර්තාව වන, සහතික කිරීමේ කාර්යය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය -SLAE 3050 (ප්‍රතිශෝධිත) අනුකූලව මම මෙම කාර්යය පැවැත්වූයෙමි.

සියලුම වැදගත් අංශයන් හිදී කළමනාකරණය අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර ඇති බවට සීමිත සහතිකයක් ලබාගැනීමේ ක්‍රියාපටිපාටි මම විසින් සැලසුම් කර ඉටුකිරීම මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ.

මෙම කාර්යයේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත් කිරීම හෝ නැවත නිකුත් කිරීම සඳහා මම වගකීමට බැඳී නොමැති අතර, මෙම කාර්යය සම්බන්ධයෙන් මුල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදුකර නොමැත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ක්‍රියාවට නංවන ලද වැඩ පිළිබඳ සාරාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද මෙම ප්‍රකාශනය ලේඛනවලින් තහවුරු වන්නේද යන්න සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අභ්‍යන්තර පාලනයේ සැලැස්ම සහ ඵලදායිත්වය සමාලෝචනය කිරීමේදි අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන ඇති ක්‍රියාවලිය පිළිබිඹු කරන්නේද යන්න සම්බන්ධයෙන් තක්සේරු කිරීම සඳහා මාගේ කාර්යය මම ඉටු කළෙමි.

නියැදියකින් ප්‍රශ්න කිරීම් මගින් ලබාගත් තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලියට සහයවන නියැදි පදනමක් මත, ඉටුකරන කරන ලද ක්‍රියාපටිපාටි මූලික වශයෙන් බැංකුවෙහි කාර්යය මණ්ඩලය සහ ලේඛණවල පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා සීමා විය.

SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව මෙම ප්‍රකාශනය මගින් සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න හෝ බැංකුවෙහි අවදානම සහ පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායිතාව පිළිබඳ මතයක් සකස් කරන්නේද යන්න සලකා බැලීමක් අවශ්‍ය නොවනු ඇත.

SLSAE 3050 (ප්‍රතිශෝධිත) අනුව වාර්ෂික වාර්තාව තුළ හෙළිදරව් කරන ලද කිසියම් සැලකිය යුතු ගැටළු පිළිබඳ වැදගත් අභ්‍යන්තර පාලන අංගයන් සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කරන ලද ක්‍රියාවලි සැබැවින්ම ගැටළුවලට පිළියම් කරන්නේද යන්න සලකා බැලීමක් අවශ්‍ය නොවනු ඇත.

තෝරාගත් ක්‍රියාපටිපාටි බැංකුවේ ස්වභාවය, ප්‍රකාශනය පිළියෙල කර ඇති සිදුවීම් හෝ ගනුදෙනුව පිළිබඳ මාගේ අවබෝධය සැලකිල්ලට ගත් මගේ විනිශ්චය මත රඳා පවතී.

මගේ නිගමනය සඳහා පදනමක් ලබා ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් කරුණු මා ලබාගෙන ඇති බව මම විශ්වාස කරමි.

මගේ නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටි අනුව, බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සැකැස්ම සහ එහි ඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාවට නගනු ලබන අගය කිරීමේ ක්‍රියාවලිය, අපගේ අවබෝධයට අනුව සහ වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් ප්‍රකාශනයන්ගේ අනුකූලතාවයේ පැහැදිලි බවක් හෝ විශ්වාස කටයුතුභාවයෙහි සැකයක් ඇති බවට කිසිදු සාක්ෂියක් හමුවී නොමැත.

ඩබ්.පී.සි. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

කළමනාකරණය විසින් භාරගන්නා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා වගකියමින්, මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මූල්‍ය වාර්තාකරණයට අදාළ නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බව සහතික කිරීම සඳහා අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශනය තුළ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරන බව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත්කරන මූල්‍ය ප්‍රකාශනවල අවංකකම හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී.

මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1988 අංක 30 දරණ බැංකු පනත, 1971 අංක 38 දරන මූල්‍ය පනත සමග කියවියයුතු 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතිය හා එහි සංශෝධනයන්හි දක්වා ඇති විධිවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියෝග ප්‍රකාරව ආයතනය අවබෝධකර ගැනීම, නියාමනය සහ මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය දැනුම ඇතිව, බැංකුවේ කටයුතු සහ ව්‍යාපාරය පාලනය සහ පරිපාලනය කිරීම අවශ්‍යය.

මෙම වාර්ෂික වාර්තුව තුළ පිළියෙල කරමින් ඉදිරිපත් කරන 2019 මූල්‍ය වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පාදක වී ගිණුම්කරණ පොත්වලට අනුකූලවන අතර, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතාවන්ට අනුකූලවන අතරම අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව එක් එක් මූල්‍ය වසර අවසානයේදී බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

මෙම වාර්ෂික වාර්තුව තුළ ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනවල අවංකකම හා විෂයමූලිකත්වය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගනී. මෙම මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂවරු පහත දෑ තහවුරු කර සිටිත

1. පවත්නා මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුව අනුරූප ආකාරයකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන, යොදාගෙන, සහ භාවිතා කර ඇති අතර වැදගත් අපගමනයන් ඇත්නම් අනාවරණය සහ පැහැදිලි කර ඇත;

2. අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත;

3. විනිශ්චයන් හා ඇස්තමේන්තු සිදුකර ඇති බව සහ ඒවා විචක්ෂණ හා සාධාරණබව.

මූලික කාර්යසාධන දර්ශක ඇතුළුව කාර්තුමය විගණනය කළ මූල්‍ය ප්‍රකාශන වක් වක් කාලසීමාව අවසානයේදී මාස දෙකක් ඇතුළත භාෂා තුනෙන් පුවත්පත්වල බැංකුව ප්‍රකාශයට පත් කර ඇති අතර ඒවා බැංකුවේ වේබ් අඩවියේද ප්‍රකාශයට පත් කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකළ සමාලෝචනය හා නිර්දේශය අනුග මනය කරමින් අතුරු මූල්‍ය ප්‍රකාශන මුද්‍රාහැරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 77 පිටුවේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කළ නියමිත ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

අඛණ්ඩතා පැවැත්ම

දැකියහැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකිරීම සඳහා සහ ශ්‍රී ලංකා වර්ලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS හා SLFRS) අනුකූලව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණය කිරීමට ප්‍රමාණවත් සම්පත් බැංකුවට ඇති බව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය

බැංකුවේ වත්කම් සුරක්ෂිත කර ගැනීමට සාධාරණ ක්‍රියාමාර්ග සහ පරීක්ෂාව ගැනීම සහ වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, අභ්‍යන්තර මූල්‍ය පාලනය පිළිබඳ ඵලදායී සහ සම්පූර්ණ පද්ධතියක්, එහි ඵලදායීත්වය නියාමනය සඳහා ඵලදායී පද්ධතියක් ඇතුළත් කර ඇති අතර, එයට අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණය ඇතුළත්ය. එමෙන්ම බැංකුවේ වත්කම් ආරක්ෂාකර සුරක්ෂිත කිරීමට සහ වංචාව හෝ අවපාලනය වැලැක්වීම සඳහා ශක්තිමත් පාලන පරිසරයක් පවත්වා ගැනීම කෙරෙහි සැලකියයුතු වැදගත්කම තබා ඇත.

අභ්‍යන්තර පාලනයේ අරමුණ වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ ඉලක්ක අත්කරගත හැකි ඵලදායී ආයතනයක් අත්කර ලැනීම වන අතර, එබැවින්, මූල්‍ය වාර්තාකරනයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීම සඳහා බැංකුවේ ව්‍යාපාරය සුදුසු අයුරින් හා ඵලදායී ආකාරයෙන් පවත්වනු ලබන බව සහ නිති හා රෙගුලාසිවලට අනුකූලවන බව මින් සාධාරණ ප්‍රමාණයකින් අර්ථවත් කරයි.

විගණන කමිටුවේ මඟපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය නියාමනය කරන අතර, අවශ්‍ය අවස්ථාවලදී නිර්දේශ සිදු කරයි.ග

මූල්‍ය ප්‍රකාශන සිය විධිමත් රැස්වීම්වලදි තමන් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කරන බව අධ්‍යක්ෂවරු සහතික වේ.

බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවක් මෙම වාර්ෂික වාර්තාවේ 101 සිට 111 දක්වා පිටුවල දක්වා ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට බැංකුව විසින් ගෙවියයුතු බදු සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් හා ඒ වෙනුවෙන් ගෙවියයුතු සියලුම දායකත්වයන් හා බදු සහ බැංකුව විසින් රජයට සහ අනෙකුත් නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවීමට බැඳී සිටින හා ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරු තහවුරු කර සිටී.

විගණන වාර්තාව

විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිලිබඳව අවසන් මතයක් ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඇතුළුව සියලුම වාර්තා විගණකාධිපතිවරයාට ලබාගැනීමට සලස්වා ඇති අතර ඔවුන් සුදුසුයයි සලකනු ලබන පරීක්ෂාවන් කරගෙන යාමට සෑම අවස්ථාවක්ම ලබාදී ඇත. ඒ අනුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව විමර්ෂණය සිදු කරමින් විගණකාධිපතිවරයාගේ මතය ප්‍රකාශ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ 116 පිටුවේ දැක්වේ.

වැදගත් ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ හිටපු අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහ බැංකුව පාර්ශවකරුවෙක් වූ වැදගත් ගිවිසුම් සමඟ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්ට වසර අවසානයේදී හෝ වසරේ කිසියම් අවස්ථාවක සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳියාවක් නොතිබූ බව සහතික කළ යුතුය ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට බැංකුව විසින් සියළුම නියාමන හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවිය යුතුව තිබූ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකර ඇති බව හෝ අදාල පරිදි සපයා ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමකට පත්වෙති.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ වගකීම් ඉටුකර ඇති බව අධ්‍යක්ෂවරුන් දරණ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



නිෂානි පී.කේ ලොකුගේ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/සහකාර
සාමාන්‍යාධිකාරී (නීති)

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல My No. BAF/G/SMIB/FA/2019/3

ඔබේ අංකය உமது இல Your No.

දිනය திகதி Date 17 September 2020

සභාපති,
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව

1.මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව සඳහා මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කරනු ලැබේ.

මාගේ මතය අනුව. අමුණා ඇති බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව, බැංකුවේ මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ තුළින් සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මම මාගේ විගණනය පැවැත්වූයෙමි. මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටස තුළ විගණගේ වගකීම් හි වීම ප්‍රමිති යටතේ මාගේ වගකීම තවදුරටත් විස්තර කෙරේ. මම ලබාගත් විගණන සාක්ෂිය මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට මම විශ්වස කරමි.

1.3. මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ පාලනය සඳහා වගකියන පුද්ගලයින්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටින අතර, එවැනි අභ්‍යන්තර පාලනය සඳහා කළමනාකරණයේ තීරණය කිරීම වංචාව හෝ දෝෂ සිදුවිය හැකි වැදගත් වැරදි ප්‍රකාශනවලින් නිදහස්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම සඳහා අවශ්‍යය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩතාවයට අදාළ කරුණු අදාළ පරිදි අනාවරණය කරමින් අඛණ්ඩතාවයක් ලෙස ඉදිරියට ගමන් කිරීම සඳහා බැංකුවේ හැකියාව තක්සේරු කිරීම සඳහා සහ කළමනාකරණය බැංකුව ඈවර කිරීමට, හෝ මෙහෙයුම් නතර කිරීමට අපේක්ෂා කරන්නේනම් හෝ එසේ කිරීම හැර වෙනත් විකල්පයක් නොමැතිනම් මිස ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම භාවිතා කිරීමට කළමනාකරණය වගකීමට බැඳී සිටී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පාලනය සඳහා වගකියන පුද්ගලයින් බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම සඳහා වගකිවයුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, බැංකුවට වාර්ෂික සහ කලින් කල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම සඳහා බැංකුව විසින් එහි සියලූම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ සුදුසු පොත් සහ වාර්තා පවත්වා ගැනීම අවශ්‍ය වේ.

1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

මගේ පරමාර්ථය වන්නේ සමස්ථයක් ලෙස වංචා හෝ දෝෂ හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශන වැදගත් වැරදි ප්‍රකාශයන්ගෙන් නිදහස්ද යන්න පිළිබඳ සාධාරණ සහතිකය ලබාගැනීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ සහතිකය ඉහළ මට්ටමේ සහතිකයක් වුවද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනයකින් වැදගත් වැරදි ප්‍රකාශයක් එහි පැවතියද සෑම අවස්ථාවකදීම එය සොයා ගන්නා බවට වගවීමක් නොමැත. වැරදි ප්‍රකාශ වංචාව හෝ දෝෂය තුළින් ඇතිවිය හැකි අතර තනි තනිව හෝ එකතුව මෙම මූල්‍ය ප්‍රකාශනවල පදනම මත ගනු ලබන ආර්ථික තීරණවලට බලපැමි කිරීමට ඉන් සාධාරණව අපේක්ෂා කරන්නේනම් වැදගත් ලෙස සලකනු ලබයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරා වෘත්තීය සංශයවාදය පවත්වා ගනිමි. එමෙන්ම මම :

- වංචාව හෝ දෝෂ හෝ සැලැස්ම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනවල වැදගත් වැරදි ප්‍රකාශන පිළිබඳ අවදානම් හඳුනාගෙන තක්සේරු කරන අතර, එවැනි අවදානම්වලට ප්‍රතිචාරාත්මක විගණන ක්‍රියාපටිපාටි ඉටුකරමින් මගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසුවන විගණන සාක්ෂිය ලබා ගනිමු. වංචාවෙන් ඇතිවන වැදගත් වැරදි ප්‍රකාශනයක් සොයා නොගැනීමේ අවදානම වංචාව කුමන්ත්‍රණය, ව්‍යාජ ලේඛන සෑදීම, සිතාමතා ඉවත්කිරීම්, ව්‍යාජ නියෝජන, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම හා සම්බන්ධවන බැවින් දෝෂයකින් ඇතිවන දෙයකට වඩා විශාලය.

- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා හැර අවස්ථාවන්ට සුදුසුවන විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමු.

- කළමනාකරණය විසින් භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සහ ඔවුන් විසින් සිදුකරක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ අනාවරණවල සාධාරණත්වය අගය කරමි.

- ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පදනම සම්බන්ධ කළමනාකරණයේ භාවිතයේ යෝග්‍යතාව සහ ලබාගත් විගණන සාක්ෂිය මත පදනම් වී, අඛණ්ඩතාවක් ලෙස ඉදිරියට යාම පිළිබඳ බැංකුවේ හැකියාව සම්බන්ධව වැදගත් සැකයක් ඇතිකළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතතාවක් පවතීද යන්න නිශ්චය කරමි. වැදගත් අවිනිශ්චිතතාවක් පවතින බවට මම නිශ්චය කරන්නේනම් මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ අනාවරණයන්ට මගේ විගණක වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, එවැනි අනාවරණ ප්‍රමාණවත් නොවන්නේනම් මගේ මතය වෙනස් කිරීමට අවශ්‍ය වේ. මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂිය මත මාගේ නිගමන පදනම් වේ. කෙසේවෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් අඛණ්ඩ පදනමක් මත බැංකුව ඉදිරියට යාම නතර කිරීමට හේතු විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම, අනාවරණ ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයකින් පාදක වූ ගනුදෙනු හා සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීමට ලක් කළෙමි.

අනෙකුත් කරුණු අතර මගේ විගණනය කුළ මම හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ යම් වැදගත් අඩුපාඩු ඇතුළුව වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් වගකියන පුද්ගලයින් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

විගණකාධිපති වාර්තාව - ඉතිරි කොටස...

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 19 දරන ජාතික විගණන පනත තුළ පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය:

- විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම මම ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂණයෙන් පෙන්නුම්වන තාක් දුරට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතා පරිදි සුදුසු ගිණුම්කරණ වාර්තා බැංකුව විසින් තබා ගෙන ඇත.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ පූර්වාසන්න වසර සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ අවශ්‍යතා පරිදි ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශවල පෙර වසරේ මා විසින් සිදුකළ සියලුම නිර්දේශ ඇතුළත් වේ.

ඉටුකළ ක්‍රියාපටිපාටිය සහ ලබාගත් සාක්ෂිය මත පදනම් වී පහත දෑ සඳහන් කිරීමට තරමි කිසිවක් මගේ අවධානයට යොමු නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතා පරිදි සාමාන්‍ය ව්‍යාපාර රටාවෙන් බැහැරව බැංකුව විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් බැංකුවේ පාලන මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙක්ට සෘජු හෝ වක්‍ර බැඳීමක් ඇති බව ප්‍රකාශ කිරීමත

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතා පරිදි බැංකුවේ පාලන මණ්ඩලය විසින් නිකුත්කළ අදාළ ලිඛිත නීතියකට, පොදු සහ විශේෂ උපදෙස්වලට බැංකුව අනුකූල වී නොමැතිබව ප්‍රකාශ කිරීම.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතා පරිදි බැංකුව එහි බලතල, කාර්යයන් සහ රාජකාරී ඉටු කර නොමැති බව ප්‍රකාශ

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතා පරිදි අදාළ නීතිය සමඟ අනුකූලව කාල රාමුවක් තුළ ආර්ථිකමය, කාර්යක්ෂමව සහ ඵලදායීව බැංකුව ප්‍රසම්පාදනය සහ භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ආදායම් ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2019	2018
		රු.	රු.
පොළී ආදායම		5,981,510,158	5,524,856,523
පොළී වියදම		(3,951,342,868)	(3,577,504,063)
ශුද්ධ පොළී ආදායම	01	2,030,167,290	1,947,352,460
ගාස්තු සහ කොමිස් ආදායම		113,332,608	107,468,209
ගාස්තු සහ කොමිස් වියදම		-	-
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	02	113,332,608	107,468,209
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී ශුද්ධ සාධාරණ ලාභය/ (අලාභය)	03	1,840,000	(260,000)
ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම	04	28,318,619	26,114,437
මුළු මෙහෙයුම් ආදායම		2,173,658,517	2,080,675,106
හානිකරණ අයකිරීම්	05	(131,528,308)	(184,958,053)
ශුද්ධ මෙහෙයුම් ආදායම		2,042,130,209	1,895,717,053
සේවක වියදම්	06	(882,138,042)	(824,017,672)
ක්ෂයකිරීමේ ක්‍රමක්ෂය වියදම්	07.2, 29.1	(57,301,152)	(25,817,153)
අනෙකුත් වියදම්	07	(286,785,299)	(314,164,575)
එබඳු,ජාගොබදු හා ණයආගෙබදු පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		815,905,716	731,717,653
මූල්‍ය සේවා මත විකතුකළ අගය මත බදු (VAT)	30	(171,063,330)	(198,439,397)
මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු (NBT)		(26,555,943)	(26,458,586)
මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු (DRL)		(118,632,641)	(27,086,978)
බදු පෙර ලාභය / (අලාභය)		499,653,802	479,732,692
ආදායම් බදු වියදම්	08	(80,580,258)	(235,260,663)
වසර සඳහා ලාභය / (අලාභය)		419,073,544	244,472,029

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	419,073,544	244,472,029
ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු ලබන අයිතම		
මූල්‍ය වත්කම් නැවත තක්සේරු කිරීම මත ලාභය හෝ අලාභය	-	-
ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතම		
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම් නැවත තක්සේරු කිරීම	17,009,388	(23,677,276)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය හෝ අලාභය මත විලම්බිත බදු බලපෑම	(4,762,629)	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	431,320,303	220,794,753

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනට	සටහන	2019	2018
		රු.	රු.
වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	10	121,239,625	96,180,182
බැංකු සමඟ ස්ථාපන	11	7,090,741,107	5,206,048,813
මූල්‍ය වත්කම් - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට	12	19,475,000	17,635,000
මූල්‍ය වත්කම් - AC			
- ණය සහ අත්තිකාරම්	13	35,892,870,362	34,225,486,332
- ණය සහ අනෙක් උපකරණ	14	2,613,184,244	1,943,157,959
මූල්‍ය වත්කම් - අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	15	5,379,078	5,379,078
දේපළ පිරියත සහ උපකරණ	16	56,067,712	64,244,824
භාවිතයට අයිතිය ඇති වත්කම්	29	112,674,031	-
විලම්බිත බදු වත්කම්	17	221,648,675	107,451,184
වෙනත් වත්කම්	18	1,178,156,939	931,684,987
මුළු වත්කම්		47,311,436,771	42,597,268,360
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	19	12,412,879	12,196,466
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්	20		
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු		38,872,216,979	34,272,228,231
- ණය සුරැකුම්පත් හිමිකරුවන්ට ගෙවිය යුතු		110,180,822	110,173,288
- අනෙකුත් ණයකරුවන්ට ගෙවිය යුතු		1,501,680,632	1,872,732,341
සේවක ප්‍රතිලාභ වගකීම	21	390,291,731	382,499,632
වෙනත් වගකීම්	22	765,985,183	760,454,437
මුළු වගකීම්		41,652,768,226	37,410,284,396
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	23	889,812,899	889,812,899
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	24	270,921,034	261,668,385
රඳවාගත් ඉපැයීම්	25	3,420,125,609	2,957,693,676
අනෙකුත් සංචිත	26	1,077,809,004	1,077,809,004
මුළු ස්කන්ධය		5,658,668,546	5,186,983,964
මුළු ස්කන්ධය හා වගකීම්		47,311,436,771	42,597,268,360

සහතික කිරීම:

(අ) ඉහත සඳහන් ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලබන ආකෘතිය හා නිර්වචනවලට අනුකූලව පිළියෙළ කරන ලැබ ඇති බවත්,

කේ.එල්.එන්.ඒ. පෙරේරා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී/ (මූල්‍ය)

බැංකුවේ අධ්‍යක්ෂවරු මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකිව යුතු බවත්, මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇති බවත්ය.

ආචාර්ය උදයශ්‍රී කාරියවසම් මහතා
සභාපති

එස්.කේ.ඒ. ගලප්පත්ති මහතා
අධ්‍යක්ෂ

ඩබ්.එම්. දයාසිංහ මහතා
සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	නාමය							
	පවරන ලද සංචිතය	ව්‍යවස්ථාපිත සංචිතය	ප්‍රාග්ධන සංචිතය	පොදු සංචිතය	නිමිකම් හානිපූර්ණ අරමුදල	රඳවාගත් ඉපැයීම්	අලෙවියට තබා ඇති සංචිතය	එකතුව
2017.12.31 දිනට ශේෂය	889,812,899	246,635,734	393,498,004	683,280,000	1,031,000	2,729,277,654	12,895,000	4,956,430,290
පෙර කාලසීමාවේ ගැලපීම්						(11,967,208)		(11,967,208)
ඇඩකෂ සංචිත මාරු කිරීම්						12,895,000	(12,895,000)	-
හානිකරණ ගැලපීම						70,691,003		70,691,003
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						244,472,029		244,472,029
කල්පිත ලාභාංශ බදු						(48,964,874)		(48,964,874)
අනෙකුත් විස්තීර්ණ ආදායම						(23,677,276)		(23,677,276)
වර්ෂය තුළ මාරු කිරීම්		15,032,651				(15,032,651)		-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-		-
2018.12.31 දිනට ශේෂය	889,812,899	261,668,385	393,498,004	683,280,000	1,031,000	2,957,693,676	-	5,186,983,964
පෙර කාලසීමාවේ ගැලපීම්						-		-
ඇඩකෂ සංචිත මාරු කිරීම්						-	-	-
හානිකරණ ගැලපීම						-		-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය						419,073,544		419,073,544
කල්පිත ලාභාංශ බදු වැඩිපුර ගෙවීම/ වෙන්කිරීම						40,364,278		40,364,278
අනෙකුත් විස්තීර්ණ ආදායම						12,246,759		12,246,759
වර්ෂය තුළ මාරු කිරීම්		9,252,649				(9,252,649)		-
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්						-		-
2019.12.31 දිනට ශේෂය	889,812,899	270,921,034	393,498,004	683,280,000	1,031,000	3,420,125,609	-	5,658,668,546

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා 2019/01/01	2019/01/01 සිට 31/12/2019	2018/01/01 සිට 31/12/2018
	රු.	රු.
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		
ලද පොළිය	4,820,061,665.73	4,635,448,510.24
පොළි ගෙවීම්	(4,143,156,182.19)	(4,393,015,334.53)
ශුද්ධ කොමිස් ලැබීම්	113,332,607.83	107,468,208.73
සේවකයින්ට ගෙවීම්	(824,099,814.81)	(787,069,528.34)
මූල්‍ය සේවා මත එඅ බදු, ණආගෙ බදු හා ජාගො බදු	(343,765,347.00)	(259,789,839.97)
අනෙකුත් මෙහෙයුම් කටයුතුවලින් ලැබීම්	3,530,149.29	2,540,436.78
අනෙකුත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම්	(347,767,571.77)	(315,804,667.13)
මෙහෙයුම් වත්කම් හා වගකීම් වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	(721,864,492.92)	(1,010,222,214.21)
මෙහෙයුම් වත්කම් (වැඩිවීම)/අඩුවීම		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	(1,704,102,405.97)	(1,321,306,074.65)
අනෙකුත් වත්කම්	(44,116,479.03)	-
	(1,748,218,885.00)	(1,321,306,074.65)
මෙහෙයුම් වගකීම් තුළ (වැඩිවීම)/අඩුවීම		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	4,674,406,102.68	1,467,261,443.29
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් – ණය හිමියන්ට ගෙවිය යුතු	(371,051,709.68)	(514,275,338.15)
අනෙකුත් වගකීම්	-	-
	4,303,354,393.00	952,986,105.14
ආදායම් බද්දට පෙර මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	1,833,271,015.08	(1,378,542,183.72)
ගෙවූ ආදායම් බදු	(163,771,708.00)	(194,966,230.38)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	1,669,499,307.08	(1,573,508,414.11)
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
ලද ලාභාංශ	21,771,330.00	23,574,000.00
දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්	207,650.00	214,300.00
මූල්‍ය ආයෝජන මිලට ගැනීම	(2,556,558,578.51)	756,118,847.12
දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම	(18,104,855.15)	(18,680,445.03)
මූල්‍ය ආයෝජන විකිණීමෙන් සහ කල්පිරීමෙන් ලද මුදල්	908,028,176.40	824,122,050.29
ආයෝජන කටයුතුවලින් ලැබූ ශුද්ධ ආදායම (භාවිතා කළ)	(1,644,656,277.26)	1,585,348,752.38
මූල්‍ය කටයුතුවලින් ලැබූ මුදල් ප්‍රවාහය		
ද්විතියික ණය නැවත ගෙවීම්	-	-
ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	-	-
මූල්‍ය කටයුතුවලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහ	-	-
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	24,843,029.82	11,840,338.27
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	83,983,716.16	72,143,377.89
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	108,826,745.98	83,983,716.16
මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳීම		
මුදල් සහ කෙටිකාලීන අරමුදල්	121,239,625.06	96,180,182.47
ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්	-	-
බැංකුවලින් ණයට ගැනීම් (OD)	(12,412,879.08)	(12,196,466.31)
කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	108,826,745.98	83,983,716.16

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1931 අංක 16 දරන ආඥාපනත මඟින් 1931 දෙසැම්බර් 06 වැනි දින ලංකා රාජ්‍ය උකස් බැංකුව ලෙස ආරම්භ කරන ලදී. ලංකා රාජ්‍ය උකස් බැංකුව හා වර්ෂ 1943 දී පිහිට වූ කෘෂිකාර්මික හා කර්මාන්ත ණය සංස්ථාව ඒකාබද්ධ කරමින් වර්ෂ 1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මඟින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ස්ථාපිත කරන ලදී. බැංකුව 1979 ජනවාරි 1 දින එහි මෙහෙයුම් ආරම්භ කළේය. මෙම බැංකුව බලපත්‍රලාභී විශේෂ බැංකුවක් ලෙස හඳුනා ගත් අතර බලපත්‍රය 1988 බැංකු පනතේ නියමයන් හී 1998 අප්‍රේල් 27 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.

1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස ණය ලබාදීමේ කටයුතුවල නියැලී සිටී අතර, වර්ධනය වන තරඟකාරිත්වයට මුහුණදීම පිණිස මෑතක සිට සිය කටයුතු විවිධාංගීකරණය කරමින් රථවාහන ණය හා පුද්ගල ණය වැනි අනෙකුත් ණය පහසුකම් ලබාදීමේ කටයුතුවල ද නිරත වෙමින් සිටී.

1.3. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත, 1988 බැංකු පනත සහ එහි සංශෝධනවල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.4. බලය ලබාදීමේ දිනය

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මෙම විගණනය කළ මූල්‍ය ප්‍රකාශන 2020.09.14 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයට අනුව නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

2019 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 378ක් විය. (2018 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 386 ක් විය.)

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1. පිළියෙළ කිරීමේ පදනම

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS). අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර, මූල්‍ය තොරතුරු වෛතිහාසික පිරිවැය මත පදනම්ව ආසන්න රුපියලට සාධාරණ වටිනාකමට අගය කර, පහත කරුණු සඳහා හැර උද්ධමනිය සාධක සඳහා කිසිදු ගැලපීමක් නොකර අනුරූපව යොදා ගෙන ඇත:

- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මනින ලද මූල්‍ය උපකරණ
- අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයේදී මනින ලද මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන
- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම සඳහා වගකීම

2.2. අනුකූලතා ප්‍රකාශනය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS). සහ බැංකු පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරනු ලබයි.

2.3. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද්‍රවශීලතාවයේ අනුපිළිවෙළට පුළුල්ව ඉදිරිපත් කරයි. හඳුනාගත් වටිනාකම් නිරවුල් කිරීම වෙනුවෙන් නෛතිකව බැඳී ඇති විටක සහ ශුද්ධ අගය පදනමින් නිරවුල් කිරීමට අරමුණක් ඇති විටක දී හෝ වත්කම් උපලබ්ධි කිරීමත් සමඟ වගකීම් නිරවුල් කිරීමත් එක්වර සිදු කරන අවස්ථාවේ දී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කර ඇත. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මඟින් විශේෂිතව හෙළිදරව් කිරීම යටතේ සහ කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථකථනය කිරීමට අනුව අවශ්‍ය හෝ ඉඩ දී ඇති විටක දී හැර මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කිරීමක් සිදු කර නොමැත

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරයි. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් වෙන වෙනම ඉදිරිපත් කරන්නේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 විසින් අවසර දී ඇත්නම් පමණි.

2.4. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී, කළමනාකාරිත්වය මඟින් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා ප්‍රමාණ තීරණය කිරීමේදී විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතා කර ඇත. අවිනිශ්චිතතාවය මත පදනම් වූ ප්‍රධාන සැලකියයුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන පහත සාකච්ඡාකර ඇති අතර, එවැනි වත්කම් හා වගකීම්වල ධාරණ අගයන් අදාළ සටහන්වල දක්වා ඇත.

2.4.1. අබණ්ඩතා පැවැත්ම

අබණ්ඩතා පැවැත්මත් ලෙස ඉදිරියට යාමට එහි හැකියාව පිළිබඳ බැංකුවේ කළමනාකරණය තක්සේරුවත් කර ඇති අතර, දැකියහැකි අනාගතය තුළ සිය මෙහෙයුම් අබණ්ඩව සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් බැංකුවට ඇති බවට සෑහීමට පත්වේ. තවද, අබණ්ඩතා පැවැත්මත් ලෙස ඉදිරියට යාමට බැංකුවේ හැකියාව මත සැලකියයුතු සැකයක් ඇතිකරන යම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳ කළමනාකරණයට අවබෝධයක් නොමැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශන අබණ්ඩතා පැවැත්මක් මත තවදුරටත් පිළියෙල කරනු ලබයි.

2.4.2. බදුකරණය

මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු ඇතුළුව බැංකුව ආදායම් බදු හා වෙනත් බදු ගෙවීම සඳහා යටත්වේ. මූල්‍ය ප්‍රකාශනවලට (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. SLFRS) යොදා ගැනීම් ගැලපීම් පිළිබඳ නිකුත් කර ඇති බදු මාර්ගෝපදේශයට අනුව වර්තන, විලම්භිත සහ අනෙකුත් බදු සඳහා මුළු වෙන් කිරීම් සහ බදු පැනවීමේ

අරමුණ සඳහා බදුකළහැකි ලාභය තීරණය කිරීමට සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන අවස්ථාවේ දී බදු නීතිය යොදා ගැනීම පිළිබඳ අර්ථ නිරූපණය කිරීමට අදාළව අවිනිශ්චිතතාවක් පවතී.

අමතර බදු ගෙවිය යුතු ද යන්න ඇස්තමේන්තු මත පදනම්ව වර්තන, විලම්භිත සහ අනෙකුත් බදු සඳහා වත්කම් හා වගකීම් බැංකුව හඳුනා ගනී. විලම්භිත සහ අනෙකුත් බදු අය කිරීම, හඳුනා ගෙන ඇත. මෙහි දී මෙම කරුණුවල අවසන් බදු ප්‍රතිඵලය මූලික අවස්ථාවේ හඳුනාගත් බදු වටිනාකමට වඩා වෙනස් වන අවස්ථාවකදී, එවැනි වෙනස්වීම් තීරණ ගනු ලැබූ කාලයට අදාළව ආදායම් හා විලම්භිත බදු වටිනාකමට බලපෑමක් ඇති කරනු ඇත.

2.4.3. විලම්භිත බදු වත්කම්

අනාගතයේ දී බදු අය කළ හැකි ලාභයන්ට හිලව් කිරීම් වශයෙන් යොදා ගත හැකි අලාභයන්ගේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි බදු අලාභයේ ප්‍රමාණයට විලම්භිත බදු වත්කම් හඳුනාගනී. මෙම විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීමේ දී අනාගත බදු සැලසුම්කරන ක්‍රමෝපායන් සමඟ අනාගත බදු අය කළ හැකි ලාභයේ කාලය සහ මට්ටම මත පදනම්ව විනිශ්චයන්ට එළැඹීම සිදු කිරීම අවශ්‍ය වේ.

2.4.4. සේවක ප්‍රතිලාභ වගකීම - පාරිතෝෂිත

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික ආයුගණක තක්සේරුව ප්‍රයෝජනයට ගෙන නිශ්චය කර ඇත. ආයුගණක තක්සේරු සඳහා වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, සේවකයින්ගේ පවත්නා සේවා කාලය සහ සේවක මරණ අනුපාතය යනාදිය පිළිබඳ උපකල්පනයන් පදනම් වේ. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසා එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ. මේ සඳහා යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2019	2018
පොළී අනුපාතය	10.50%	11.50%
වාර්ෂික වැටුප් වැඩිවීම් අනුපාතය	6.50%	7.50%
විශ්‍රාම ගන්නා වයස	අවුරුදු 55-60	අවුරුදු 55-60

සේවක ප්‍රතිලාභ බැඳීම්වලට අදාළ පාරිතෝෂිත වෙන් කිරීම් පිළිබඳව සටහන් අංක 21 හි දැක්වේ.

2.4.5. සේවක ප්‍රතිලාභ වගකීම් - වෛද්‍ය ප්‍රතිලාභ

වෛද්‍ය ප්‍රතිලාභ ආවරණය කිරීම සඳහා ඇති නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සඳහා වන පිරිවැය අරමුදල් ආයුගණක තක්සේරු මත පදනම්ව තීරණය කර ඇත. ආයුගනක තක්සේරු කිරීම වට්ටම් අනුපාතය වෛද්‍ය උද්ධමනයන් සහ මරණ අනුපාතය පිළිබඳව උපකල්පනයන් පදනම් වී ඇත. මෙම බැඳීම්වල දීර්ඝකාලීන ස්වභාවය නිසාම එම උපකල්පනයන් සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

යොදා ගනු ලැබූ උපකල්පනයන් පහත පරිදි වේ.

	2019	2018
වට්ටම් අනුපාතය	10.50%	11.50%
වෛද්‍ය වියදම් ඉහළයාම	7%	7%
සහභාගිකයාගේ දත්ත (කටයුතු) සම්ක්ෂණ තොරතුරු	31.12.2019	31.12.2018

සේවක ප්‍රතිලාභ පිළිබඳ විස්තර සටහන් අංක 21 හි දැක්වේ.

2.4.6. දේපල, පිරියත උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීව කාලය

බැංකුව එක් එක් වාර්තාකරන දිනයට දේපල, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය සහ ක්ෂය කිරීම සමාලෝචනය කරනු ලබයි. කළමනාකරණයේ විනිශ්චය මෙවැනි වට්ටම්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී ක්‍රියාවට නංවන අතර එමනිසාම ඒවා අවිනිශ්චිතතාවන්ට යටත් වේ. එක් එක් වත්කම් වර්ගය සඳහා ක්ෂය කිරීමේ ක්‍රම සහ භාවිතා කළ අනුපාත පිළිබඳ විස්තර සටහන් 2.5.7.5 හි දැක්වේ.

2.5. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.5.1. SLFRS 15 – "ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම"

ආදායම හඳුනා ගන්නේ කුමණ ප්‍රමාණයටද සහ කවදාද යන්න තීරණය කිරීම සඳහා SLFRS 15 මඟින් විස්තරාත්මක රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක අනාවරණ අවශ්‍යතාවන්ගෙන් අරමුණු කරන්නේ ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ඇතිවන ආදායම සහ මුදල් ප්‍රවාහයන්ගේ ස්වභාවය, ප්‍රමාණය, කාලය හා අවිනිශ්චිතතාව අවබෝධ කර ගැනීමට මූල්‍ය ප්‍රකාශක පරිශීලකයින්ට හැකියාව ඇති කිරීමයි. ආදායම හඳුනාගන්නා කාලය සහ ප්‍රමාණය තීරණය කිරීමට පියවර පහත ආදර්ශයක් ආයතන විසින් යොදා ගනී. යම් ආයතනයක් අයත්කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයට ගනුදෙනුකරුවන් වෙත භාණ්ඩයක් හෝ සේවාවක් යම් ආයතනයක් විසින් මාරුකරන විට සහ අවස්ථාවේදී ආදායම හඳුනා ගන්නා බව මෙම ආදර්ශය දක්වා ඇත. නිශ්චිත නිර්ණායක සපුරාලන අවස්ථාව මත පදනම් වී, ආදායම හඳුනා ගනී.

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටස...

කලින් යොදාගැනීම සඳහා අවසර සහිතව 2018 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හෝ ඉන් පසු කාලසීමා සඳහා SLFRS 15 බලාත්මක වේ. බැංකුව එහි මූල්‍ය ප්‍රකාශන මත ගාස්තු හා කොමිස් ආදායම කෙරෙහි වියහැකි බලපෑම පිළිබඳව මූලික සමාලෝචනය සම්පූර්ණ කර ඇත. හඳුනාගන්නා හෝ අගය කිරීම කරන අවස්ථාවේදී මූල්‍ය ප්‍රකාශන කෙරෙහි SLFRS 15 න් සැලකියයුතු බලපෑමක් ඇති නොවන බව මූලික සමාලෝචනය සඳහන් කරයි.

2.5.1. ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට බැංකුවේ හිමිකාරිත්වය තහවුරු කරන අවස්ථාවේදී ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

2.5.2. ශුද්ධ වෙළඳ ආදායම

වෙළඳ ක්‍රියාකාරකම්වලින් හටගන්නා ලද ප්‍රතිඵලවලට ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ හා ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය තුළින් උපලබ්ධි ලාභ හෝ අලාභ ඇතුළත්ය.

2.5.3. වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි.

2.5.4. අනෙකුත් වියදම්

සියළුම අනෙකුත් වියදම් ඒවා දරනු ලැබූ කාලයට අදාළව සහ ඒවායේ සම්බන්ධතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබයි. ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමේ දී හා කාර්යක්ෂම තත්ත්වයකින් ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යෑම සඳහා දරනු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා වන බැංකුවේ ලාභය සේවීමේ දී, ආදායමට අයකර ඇත.

2.5.5. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ කෙටිකාලීන අරමුදල්වලට අතැති මුදල් බැංකුවල ඇති ශේෂයන්, බැංකු සමඟ ස්ථාපනයන්, ඉල්ලුම් කළ හැකි මුදල් සහ කෙටිකාලීන දැනුම්දීමක් මත ලබා ගත හැකි මුදල් ද ඇතුළත් වෙයි. මුදල් සහ කෙටිකාලීන අරමුදල් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 10 හි දක්වා ඇත.

2.5.6. දේපල පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ පිරිවැය හෝ වටිනාකමින් සමුච්චිත ක්ෂයකිරීම සහ සමුච්චිත හානිකරණය අඩු කළ විදිනෙදා නඩත්තු වියදම ඉවත්කළ පසු වටිනාකමට දක්වා ඇත. අපේක්ෂිත ඵලදායී ජීව කාලයෙහි වෙනස්වීම් සුදුසු පරිදි ක්ෂය කිරීම් කාලය හෝ ක්ෂය ක්‍රමය වෙනස් කිරීම මඟින් ගණනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ද හඳුනා ගනු ලබයි.

2.5.6.1. හඳුනාගැනීමේ පදනම

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ලැබෙන සහ වත්කමක් පිරිවැය පහසුවෙන් අගය කළ හැකි අවස්ථාවේදී දේපළ පිරියත හා උපකරණ හඳුනා ගනී.

එදිනෙදා සේවා කිරීමේ පිරිවැය රහිතව දේපළ පිරියත හා උපකරණ පිරිවැයට සඳහන් කරයි.

2.5.6.2. අගය කිරීමේ පදනම

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, පහත සඳහන් විශේෂිත පදනම සඳහා එය ලබා දේ.

2.5.6.3. ක්ෂයකිරීම

දේපළ පිරියත හා උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ඒවායේ සුන්බුන් වටිනාකමට ලියා හැරීමට සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්ෂයකිරීම ගණනය කරන අතර, වත්කමක් ක්ෂය කිරීම එය භාවිතයට ගන්නා අවස්ථාවේදී ආරම්භ කරයි.

ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත පරිදි වේ:

වත්කම් වර්ගය	ක්ෂයකිරීමේ අනුපාතය (වාර්ෂිකව)
මෝටර් රථ	25.00% p.a.
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	12.50% p.a.
කාර්යාල උපකරණ	12.50% p.a.
පරිගණක	25.00% p.a.
වෙනත්	12.50% p.a.

කාර්යාල ගොඩනැගිලි පුළුල් කිරීම සඳහා වෙනස් කිරීම හෝ නවීකරණය වෙනුවෙන් දරන පිරිවැය වසර 4 ක් හෝ මූල් කල්බදු කාලය යන දෙකෙන් අඩුකාලයට ක්‍රමක්ෂය කර ඇත.

2.5.6.4. පසුව දරනු ලබන පිරිවැය

දේපළ පිරියත හා උපකරණ යන අයිතමයක කොටසක් අළුත් කිරීම සඳහා දරනු ලබන පිරිවැය, එම කොටස චකතු කිරීමත් සමඟ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බැංකුවට ප්‍රතිලාභයන් බැංකුවට ගලා එන්නේනම් සහ එහි පිරිවැය පහසුවෙන් අගය කිරීමට ද හැකිනම්. එම අයිතමයේ ධාරණ වටිනාකමකට හඳුනා ගනු ලබයි.

2.5.6.5. යළි ස්ථාපනය කිරීමේ පිරිවැය

දේපළ පිරියත සහ උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් පවත්වාගෙන යෑම සඳහා වන අළුත්වැඩියාවන් සහ නඩත්තුව සහ දරන වියදම එම අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලබයි.

2.5.6.6. කාරක ප්‍රාග්ධනය

ගොඩනැගිලි ඉදි කිරීම්, විශාල යන්ත්‍ර හා පිරියත සහ පද්ධති සංවර්ධනය, ප්‍රාග්ධනීකරණය අපේක්ෂාව සඳහා සෘජුව දරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ඇත. මෙවැනි වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.5.6.7. හඳුනා නොගැනීම

දේපළ පිරියත හා උපකරණ විකිණීම හෝ එම වත්කම් භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් බලාපොරොත්තු නොවන විට දී හඳුනා නොගනී. එවැනි වත්කම් හඳුනා නොගැනීමක් මත හට ගන්නා ලාභය හෝ අලාභය (වත්කමෙහි ධාරණ වටිනාකම සහ ශුද්ධ විකුණුම් ආදායම අතර වෙනස ගණනය කළ) වත්කම හඳුනා නෙගන්නා වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් මෙහෙයුම් ආදායම් ලෙසට හඳුනාගනු ලැබේ.

2.5.7. අස්පෘෂ්‍ය වත්කම්

බැංකුවේ අනිකුත් අස්පෘෂ්‍ය වත්කම්වල පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුලත් වෙයි. පිරිවැය විශ්වාසදායි ලෙස තක්සේරු කලහැකි විටදී සහ එයට සම්බන්ධිත ඇතිවිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා එන අවස්ථාවේදී අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගනී.

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම මත පිරිවැයට අගය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, අස්පෘෂ්‍ය වත්කම්වල සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණය අලාභයන් අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලබයි.

අස්පෘෂ්‍ය වත්කම්වල ඵලදායි ජීව කාලය නිශ්චිත හෝ අවිනිශ්චිතව අගය කිරීමක් සිදු කරනු ලබයි. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ඵලදායී ජීව කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි. නිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය අඩු වශයෙන් සෑම වර්ෂයක් අවසානයේ දීම සමාලෝචනයට ලක් කරනු ලබයි. අපේක්ෂිත ඵලදායී ජීව කාලය තුළ හෝ වත්කම් සමඟ ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන් භාවිතයේ අපේක්ෂිත රාටාවන් හී වෙනස්වීම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කරමින් ගණනය කරනු ලැබේ. නිශ්චිත ජීව කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම එම අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය සමඟ යන වියදම වර්ගීකරණය යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

පහත පරිදි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය පුරා සුන්බුන් වටිනාකමට අස්පෘෂ්‍ය වත්කම්වල පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල පන්තිය	ඵලදායී ජීව කාලය	ක්‍රමක්ෂය ක්‍රමය
පරිගණක මෘදුකාංගය	අවුරුදු 4	සරල මාර්ග ක්‍රමය

2.5.8. මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

බැංකුව සෑම වාර්තාකරන දිනයකදීම වත්කමෙහි හානිකරණය පිළිබඳව කිසියම් සලකුණක් තිබේද යන්න පිළිබඳව ඇගයීමට ලක් කරනු ලබයි. කිසියම් සලකුණක් පවතී නම් හෝ වත්කමක වාර්ෂික හානිකරණය පිළිබඳ පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේනම්, බැංකුව වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලබයි. කිසියම් වත්කමක ලැබිය හැකි වටිනාකම වනුයේ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකය හි සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පාවිච්චි වන වටිනාකම අඩු කළ පසු අගය වේ. එහි දී වත්කමෙහි ධාරණ අගය හෝ එහි ලැබිය හැකි වටිනාකම ඉක්මවන්නේ නම්, එම වත්කම හානිකරණය වී ඇති බවට සලකනු ලබන අතර එය අය කර ගත හැකි වටිනාකමට ලියා හරනු ලබයි.

භාවිතය තුළ වටිනාකම් තක්සේරු කිරීමේ දී, මුදලෙහි කාලීන වටිනාකම පිළිබඳ පවත්නා වෙළෙඳපොළ තක්සේරුව සහ වත්කමට නිශ්චිත අවදානම් පිළිබිඹු කරන පෙර බදු වට්ටමක් භාවිතා කරමින්, අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකම වට්ටම් කෙරේ. විකිණීම සඳහා දරනු ලබන වියදම් අඩු කළ සාධාරණ අගය තීරණය කිරීමේ දී, සුදුසු තක්සේරු ක්‍රමයක් යොදා ගනු ලබයි. එම ගණනය කිරීම, තක්සේරු කිරීම් පරිපාලිත සමාගම්වල ලැයිස්තුගත කොටස් මිල හෝ වෙනත් පවත්නා සාධාරණ අගය දර්ශකයන් මඟින් මනාව පැහැදිලි වේ.

2.5.9. මූල්‍ය සුරුකුම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී, බැංකුව මූල්‍ය ඇපවීම් ලබා දේ. මූල්‍ය ඇපවීම් අදාළ වාරිකයන් ලැබෙන විට, සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල (වෙනත් වගකීම් යටතේ) මූලිකවම හඳුනා ගනී. එම මූලික අවස්ථාවේ හඳුනා ගැනීමෙන් අනතුරුව, එක් එක් ඇපය යටතේ බැංකුවේ වගකීම, ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ මුලින් හඳුනාගත් ප්‍රමාණය සහ ඇපයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් මූල්‍ය බැඳීම නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වඩා නිවැරදි ඇස්තමේන්තු වටිනාකම යන දෙකන් ඉහළ අගයට මනිනු ලබයි.

මූල්‍ය ඇපවීම් සම්බන්ධයෙන් ඇති වගකීම්වල කිසියම් වැඩිවීමක් 'ණය අලාභ වියදම' යටතේ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබයි. වාරික ලැබීම් 'ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම' ලෙසට සරල මාර්ග ක්‍රමයට එම ඇපවීම අදාළ වන කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබයි.

2.5.10. විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ වගකීම

2.5.10.1. පාරිතෝෂිත

1983 අංක 12 දරන පාරිතෝෂිත මුදල් ගෙවීම පිළිබඳ පනත යටතේ බැංකුවේ සියළුම සේවකයින් එම අරමුදලට හිමිකම දරයි. විශ්‍රාම ගැනීමක දී හැර ඉල්ලා අස්වී ඇති හෝ සේවය අවසන් කර ඇති සේවකයින් රැකියාව අවසන් කරන හෝ ඉන් ඉල්ලා අස්වන මූල්‍ය වසරේ අවසාන මාසයට අදාළ දළ වැටුපෙන් භාගයක් අනුපාතයකට වසර පහකට වැඩි කාලයක් සේවය කර ඇති විට සේවය සම්පූර්ණ කරන ලද එක් එක් වර්ෂය සඳහා 1982 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පිළිබඳ පනත අනුව සේවය අවසන් කිරීමේ පාරිතෝෂිත මුදල් ලැබීමට හිමිකම ලබයි. බැංකුව

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටස...

පොරොන්දු වූ පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම තක්සේරු කරන අතර, එය ආයුගණක ඇගයීම් ක්‍රමය භාවිතා කරන විශ්වීත ප්‍රතිලාභ සැලැස්මකි.

සාමාන්‍ය සහ කලින් විශ්‍රාම ගැනීම

සහභාගිවන්නෙක්ට වසර තුනක සේවා කාලයක් ඇත්නම් ඔහු/ඇය වයස අවුරුදු 55 දී සාමාන්‍ය විශ්‍රාම ගැනීම සඳහා සුදුසුකම් ලබයි. සහභාගිවන්නන් සියලුම දෙනා අවුරුදු 60 පැමිණීම දක්වා දීර්ඝ කිරීමට සඳහා ද සුදුසුකම ලබයි.

ආයුගණක පාඩු/ලාභ හඳුනාගැනීම

ආයුගණක අලාභ /ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී.

වත්කම මත අපේක්ෂිත ප්‍රතිලාභ

වත්කම මත අපේක්ෂිත ප්‍රතිලාභයන් කලින් අරමුදල් නොයෙදීම මත ශූන්‍ය වනු ඇත.

පොළී වියදම

සැලසුම් කළ ගෙවිය යුතු වගකීම් ප්‍රතිලාභයන් වර්ෂයකින් ඉදිරියට ලඟාවීම නිසා පොලී අනුපාතය වෙනස්වීම අනුව එහි වර්තමාන වටිනාකම නිසා ඉහළ යා හැකි පොළිය මෙම පොළී වියදමට ඇතුළත් වේ.

අරමුදල් සපයා ගැනීමේ ක්‍රම

පාරිතෝෂික වගකීම නිරවුල් කිරීමට බාහිර අරමුදල් යොදා ගෙන නොමැත.

2.5.11. නිශ්චිත දායකත්ව සැලසුම

තවද බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක් ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායකත්ව සැලසුමකට ගෙවිය යුතු දායකත්වය සේවකයින් විසින් බැංකුව වෙත සේවය ලබා දෙන ලද කොටස වන අතර, එය 'සේවක මණ්ඩල වියදම' යටතේ වාර්තා කරනු ලබයි. නොගෙවන ලද දායකත්වයන් වගකීමක් ලෙසටම වාර්තා කරනු ලබයි.

බැංකුව පහත දැක්වෙන යෝජනා ක්‍රමයන්ට දායක වී ඇත.

2.5.11.1. සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයින් පිළිවෙළින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල ගෙවීම් හැර) 15% සහ 10% බැගින් අර්ථසාධක අරමුදලට දායක වෙයි. බැංකුවේ අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලකි.

2.5.11.2. සේවක භාර අරමුදල

බැංකුව සේවකයින්ගේ දළ මාසික (අතිකාල හැර) වැටුපෙන් 3%ක් සේවක භාරකාර මණ්ඩලය මඟින් පවත්වාගෙන යන සේවක භාර අරමුදලට දායක වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයින් පාරිතෝෂික අරමුදල් ලැබීමට හිමිකම් කියයි.

2.5.12. වෛද්‍ය ප්‍රතිලාභ

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථිර සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ විශ්‍රාමිකයින් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය සඳහා සුදුසුකම් ලබන අතර ඔවුන් සියළු දෙනාම අදාළ යෝජනා ක්‍රමය පිළිගෙන ඇති අතර එයට ගෙවිය යුතු සාමාජික මුදල් ද නියමිත ලෙසට ගෙවනු ලබයි. විශ්‍රාමික සාමාජිකයින්ගේ පවුල්වල සාමාජිකයින් විශේෂිත ප්‍රතිකාර යටතේ ප්‍රතිලාභ සඳහා පමණක් හිමිකම් කියයි. (යම් විශ්‍රාමික සාමාජිකයෙක් හෝ ඔහු/ඇයගේ පවුලේ සාමාජිකයෙකු සුදුසුකම් ලබයි.)

බැංකුව ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතයෙන් වෛද්‍ය ප්‍රතිලාභයේ වර්තමාන වටිනාකම තක්සේරු කරයි.

බැංකුව ආයුගණක තක්සේරුව සඳහා ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරයි. මෙම ක්‍රමය යටතේ. ඇතිවන ආයුගණක ලාභ/අලාභ පොදුවේ අරමුදල් නොකළ ආයුගණ උපචිත වගකීම අඩුකිරීම/ වැඩිකිරීම සිදුකරයි.

ආයුගණක පාඩු/ලාභ හඳුනා ගැනීම

ආයුගණක අලාභ/ලාභයන් ලාභ අලාභ ගිණුමෙහි හඳුනාගැනීම සිදු කරයි.

ආයුගණක අලාභ/ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී.

වත්කම් මත අපේක්ෂිත ඉපයීම

සැලැස්මට කලින් අරමුදල් නොකරන බැවින් වත්කම් මත අපේක්ෂිත ඉපයීම ශූන්‍ය වේ.

පොළී වියදම

නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම සහ වර්තමාන සේවා පිරිවැයේ කාල වටිනාකම පොලී වියදම වේ.

අරමුදල් සපයාගැනීම

වෛද්‍ය ප්‍රතිලාභ යොජනා ක්‍රමයට පිටතින් අරමුදල් ලබා ගැනීමක් සිදු නොවේ.

2.5.13. වෙන්කිරීම්

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ ගිවිසුම්ගත) ඇති විටක සහ බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභයක් ඇතුළත් සම්පත් පිටවයාමක් අවශ්‍ය වන විට සහ වගකීමෙහි ප්‍රමාණය විශ්වාසදායී ලෙසට ඇස්තමේන්තු කිරීමක් ද කළ හැකි විට වෙන්කිරීම් හඳුනා ගනියි. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදම ආදායම් ප්‍රකාශනයෙහි කිසියම් ප්‍රතිපූරණයකින් ශුද්ධව ඉදිරිපත් කර ඇත.

2.5.14. බදු

2.5.14.1. වර්තන බදු

වර්තන බදු වත්කම සහ වගකීම්වල, පවත්නා සහ පෙර වර්ෂ සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට ඇති හෝ ලබා ගැනීමට අපේක්ෂිත වටිනාකම්වලින් සමන්විත වේ. මෙම ප්‍රමාණය ගණනය කිරීමට භාවිතා කරන බදු අනුපාත හා බදු නීති යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට හෝ ශේෂ පත්‍ර දින වන විට බලාත්මක පවත්නා හෝ ඊට පසු බලාත්මක වූ ඒවාය. ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධනවල විධිවිධානවලට අනුකූලව, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 08 හි දක්වා ඇති බදු අනුපාතවලට, බදු අරමුණ සඳහා ගලපා ඇති පරිදි වසර සඳහා ලාභයේ පදනම මත බදු වෙන් කිරීම සිදු කෙරේ.

2.5.14.2. විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරන අරමුණ සඳහා වත්කම් සහ වගකීම්වල ධාරණ අගයන් සහ බදු අරමුණ සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන් විලම්බිත බදු හඳුනා ගනී.

පහතින් දක්වා ඇති අවස්ථාවන් හැර අනෙකුත් සියළුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හඳුනා ගනී:

- කීර්තිනාමය මූලික හඳුනා ගැනීමෙන් හෝ ව්‍යාපාරික සබඳතාවකින් තොරව වත්කමක් හෝ වගකීමක් තුළින් හෝ ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස හට ගන්නා ගිණුම්කරණ හෝ බදුකරණ ලාභ හෝ අලාභයන් පවතින විට විලම්භිත බදු වත්කම පැන නඟින අවස්ථාව, සහ

- පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වල ආයෝජන හා බැඳී පවත්නා බදුකළහැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්වීමේ ආපසු හැරවීමේ කාලය පාලනය කළ හැකි සහ එම තාවකාලික වෙනස දැකියහැකි අනාගතයේ දී ආපසු හැරවීමක් සිදු නොවන අවස්ථාව

සියළුම අඩුකළහැකි වෙනස්වීම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනා ගනී. බදුකළහැකි ලාභ ඉඩදිය හැකි තාවකාලික කාල වෙනස්කම් සහ ඉදිරියට ගෙනෙන ලද හිලව් නොකල බදු බැර සහ හිලව් නොකළ බදු අලාභයන්ට අදාළව පාවිච්චි කළ හැකි වන තරමට ඉදිරියට ගෙනෙන ලද හිලව් නොකල බදු හැර සහ හිලව් නොකළ බදු අලාභයන් පැවතීම හැර

- අඩුකළහැකි තාවකාලික වෙනස්වීම්වලට අදාළ විලම්භිත බදු වත්කම් ව්‍යාපාරික සබඳතාවකින් තොරව වත්කමක හෝ වගකීමක මූලික හඳුනාගැනීම තුළින් ඇතිවන අවස්ථාව සහ ගනුදෙනුව වන අවස්ථාවේදී එය ගිණුම්කරණ ලාභය හෝ බදුකළහැකි ලාභය හෝ අලාභයට බල නොපාන අවස්ථාව සහ

- පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වල කර ඇති ආයෝජන හා බැඳී පවත්නා තාවකාලික බදු වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික බදු වෙනස්කම් දැකියහැකි අනාගතය තුළ ආපසු හැරවිය හැකි ප්‍රමාණයට සහ

- බදු කළ ලාභය තාවකාලික වෙනස්වීම් භාවිතා කිරීමට හැකි ප්‍රමාණයට යොදා ගත හැකි විට විලම්භිත බදු වත්කම් හඳුනා ගනු ලබන අවස්ථාව.

විලම්භිත බදු වත්කමක ධාරණ අගය එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට සමාලෝචනය කර අතර, ප්‍රමාණවත් බදු කළ හැකි ලාභය භාවිතා කිරීමට නියමිත විලම්භිත බදු වත්කමේ සියලුම හෝ කොටසකට ලබාගැනීමට තවදුරටත් නොහැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට නැවත ඇගයීමට ලක්කරන අතර, එම වටිනාකම අනාගත බදු කළහැකි ලාභය අයකරගත යුතු බදු විලම්භිත වත්කමට ඉඩ දෙන ප්‍රමාණයට හඳුනා ගනී.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට පනවා ඇති හෝ ඉන්පසුව පැනවිය හැකි බදු අනුපාත සහ බදු නීතීන් මත පදනම් වී වත්කම් උපලබ්ධි කරන හෝ වගකීම් නිරවුල් කරන වර්ෂය තුළ යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයකට විලම්භිත බදු වත්කම් සහ වගකීම් අගය කරනු ලබයි.

2.5.14.3. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT)

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත සහ එහි සංශෝධනවල අංක 25 ඒ වගන්තිය අනුව බැංකුවේ එකතු කළ අගය මත බදු ප්‍රමාණය 15% කි.

2.5.15. පොළී ආදායම

2.5.15.1. ඵලදායී පොළී අනුපාත ක්‍රමය

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය උපකරණ සියල්ල සඳහා ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් පොළී ආදායම වාර්තා කරනු ලබයි. SLFRS 9 යටතේ ලාභය හෝ අලාභය තුළින් අනෙකුත් විස්තීර්ණ ආදායමේදී සාධාරණ අගයට මනින ලද පොළීය දරන මූල්‍ය වත්කම් මත පොළී ආදායම, මෙන්ම LKAS 39 යටතේ අලෙවිය සඳහා තබාගෙන ඇති සහ කල්පිරෙන තෙක් රඳවාගෙන ඇති ලෙස වර්ගීකරණය කළ පොළීය දරන මූල්‍ය වත්කම්

ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් පොළී ආදායම වාර්තා කරනු ලබයි. ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීවකාලය හෝ සුදුසු අවස්ථාවක, මූල්‍ය වත්කමේ ශුද්ධ ධාරණ අගයට වඩා කෙටි කාලසීමාවක් තුළින් තක්සේරු කළ අනාගත මුදල් ලැබීම් හරියටම වට්ටම් කළ හැකි අනුපාතයයි.

ඵලදායී පොළී අනුපාතය (සහ එමනිසාම වත්කමේ ක්‍රමක්ෂය පිරිවැය) ඵලදායී පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටස් වන ඇත්කරගැනීම, ගාස්තු සහ පිරීවැය කෙරෙහි යම් වට්ටම් සලකා බලමින් ගණනය කෙරේ. ණය මුදලක අපේක්ෂිත ජීව කාලයපුරා අඛණ්ඩ ලාභ අනුපාතයක් පිළිබඳ වඩාත් හොඳ තක්සේරුව නියෝජනය කරන ප්‍රතිඵල අනුපාතයක් භාවිතා කරමින් බැංකුව පොළී ආදායම හඳුනා ගනී.

එබැවින්, විවිධ අදියරවල අයකරනු ලැබියහැකි විවිධ පොළී අනුපාත සහ නිෂ්පාදන ජීවන රටාවේ (පෙර ගෙවීම්, දඩ පොළීය සහ අයකිරීම් ඇතුළුව) අනෙකුත් ගති ලක්ෂණවල බලපෑම ඉන් හඳුනා ගනී.

මූල්‍ය වත්කම පිළිබඳ මුදල් ප්‍රවාහ සම්බන්ධ අපේක්ෂාවන් ණය අවදානම නොවන හේතු සඳහා සමාලෝචනය කෙරේ. පොළී ආදායම තුළ වැඩිවීමක් හෝ අඩුවීමක් සහිත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමේ ධාරණ අගයට ධනාත්මක හෝ සෘණාත්මක ගැලපීමක් ලෙස ගැලපීම ගිණුම්ගත කෙරේ. මෙම ගැලපීම ආදායම් ප්‍රකාශනය තුළ පොළිය සහ සමාන ආදායම තුළින් පසු කාලීනව ක්‍රමක්ෂය කෙරේ.

2.5.15.2. පොළිය සහ සමාන ආදායම

බැංකුව ණය හානිකරණ වත්කම් හැර මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයට ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය භාවිතා කරමින් පොළී ආදායම ගණනය කරනු ලබයි.

මූල්‍ය වත්කමක් ණය හානිකරණ බවට පත්වන සහ එමනිසාම අදියරට 3 ලෙස සලකන අවස්ථාවක, මූල්‍ය වත්කමේ ශුද්ධ ක්‍රමක්ෂය පිරිවැයට ඵලදායී පොළී අනුපාත (EIR) ක්‍රමය යොදා ගනිමින් බැංකුව පොළී ආදායම ගණනය කරනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී අනිවාර්යයෙන් මැනීමට අවශ්‍ය සියලුම වෙළෙඳ වත්කම් සහ මූල්‍ය වත්කම් මත පොළී ආදායම පිළිවෙලින් ශුද්ධ වෙළෙඳ ආදායම සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ / (අලාභ) තුළ ගිවිසුම්ගත පොළීය භාවිතයෙන් හඳුනා ගනී.

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටස...

2.5.16. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම

2.5.16.1. හඳුනා ගැනීමේ දිනය

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ අත්හරිමින් මූල්‍ය වත්කම් සහ වගකීම් වෙළෙඳ දිනයට හඳුනා ගන්නා අතර, මෙම දිනය වන්නේ බැංකුව උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල කොටස්කරුවෙක් බවට පත්වන දිනයයි.

මෙයට ඇතුළත් වන්නේ වෙළෙඳාමේ විධිමත් මාර්ගවන, වෙළෙඳ ස්ථානය තුළ රෙගුලාසියක් හෝ ගිවිසුමක් මගින් පොදුවේ ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම බෙදා හැරීම අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම සහ විකිණීමයි. අරමුදල් ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් හඳුනා ගනී. අරමුදල් බැංකුව වෙත මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ බැංකුව හඳුනා ගනී.

2.5.16.2. මූල්‍ය උපකරණයන්ගේ මූලික තක්සේරු කිරීම

මූලික හඳුනා ගැනීමේ දී මූල්‍ය උපකරණයන් වර්ගීකරණය එහි ගිවිසුම්ගත කාලය සහ එම උපකරණය කළමනාකරණය සඳහා ව්‍යාපාර රටාව මත පදනම් වේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වාර්තා කරන, එයට ගනුදෙනු පිරිවැය එකතු කරන හෝ අඩුකරන අවස්ථාව හැර ඒවායේ සාධාරණ අගයට මූලික වශයෙන් අගය කරනු ලබයි. වෙළෙඳ ලැබීම් ගනුදෙනු මිලට අගය කරනු ලබයි. මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය උපකරණ මත සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස්වන අවස්ථාවක. පහත විස්තර කරන පරිදි බැංකුව දින 1 ලාභය හෝ අලාභය ගණනය කරයි.

දින 1 ලාභය හෝ අලාභය

උපකරණයේ ගනුදෙනු මිල ආරම්භයේදී සාධාරණය අගයට වෙනස්වන්නේනම්. සහ සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනුවල නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරන තක්සේරු කරණ ශිල්පයක් මත පදනම් වන අවස්ථාවක, බැංකුව ශුද්ධ වෙළෙඳ ආදායම තුළ ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස හඳුනා ගනී. සාධාරණ අගය සමහර යෙදවුම් නිරීක්ෂනය කළ නොහැකි ආදර්ශ මත පදනම් වන අවස්ථාවන්හිදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය තුළ වෙනස සොයා ගන්නා අතර යෙදවුම් නිරීක්ෂනය කළ හැකි බවට පත්වන හෝ උපකරණය හඳුනා නොගන්නා අවස්ථාවේදී ලාභය හෝ අලාභය තුළ පමණක් හඳුනා ගනී.

2.5.16.3. මූල්‍ය වත්කම් හා වගකීම් අගය කිරීමේ වර්ග

2018 ජනවාරි 1 දින සිට, පහත පරිදි අගය කරන ලද මූල්‍ය වත්කම් හා වගකීම්වල ගිවිසුම්ගත නියමයන් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආදර්ශය මත පදනම් වී බැංකුව එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කරයි:

- ක්‍රමක්ෂය පිරිවැයට
- අනෙකුත් විස්තිර්ණ ආදායම තුළින් සාධාරණ අගයට
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට

2018 ජනවාරි 1 දිනට පෙර, බැංකුව එහි මූල්‍ය වත්කම් ණය හා අත්තිකාරම්, (ක්‍රමක්ෂය පිරිවැයට), ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට. අලෙවිය සඳහා තබා ඇති හෝ කල්පිරෙන තෙක් රඳවා ගන්නා (ක්‍රමක්ෂය පිරිවැයට) වර්ගීකරණය කර ඇත. බැඳීම් නොවන මූල්‍ය වගකීම් සහ මූල්‍ය ඇප ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ.

2.5.17. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

2.5.17.1. බැංකුවලින් ගෙවියයුතු, ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්, ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන (2018 ජනවාරි 1 දිට අදාළ ප්‍රතිපත්තිය)

2018 ජනවාරි 1 සිට, බැංකුවලින් ගෙවිය යුතු, ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේනම් පමණක් අගය කරයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට මූල්‍ය වත්කම් දරා ගැනීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගනී.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි හිඟව පවත්නා ප්‍රධාන මුදල මත මුල් මුදල සහ පොළියේ පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂ දිනවල ඇති වේ.

මෙම කොන්දේසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

2.5.17.2. ව්‍යාපාර ආදර්ශ තක්සේරුව

බැංකුව එහි ව්‍යාපාර අරමුණු අත්කර ගැනීමට මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය වඩා හොඳින් පිළිබිඹු කරන මට්ටමකදී එහි ව්‍යාපාර ආදර්ශය තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආදර්ශය උපකරණයකින් උපකරණය යන පදනම මත තක්සේරු එකතුකළ කළඹ තුළ ඉහළ මට්ටමකදී කරනු නොලැබුවත්,පහත නිරීක්ෂණය කළ හැකි සාධක මත එය පදනම වේ:

- ව්‍යාපාර ආදර්ශයේ සහ එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්වල කාර්යසාධනය අගය කරන සහ ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට වාර්තා කරන ආකාරය
- ව්‍යාපාර ආදර්ශයේ සහ කාර්යසාධනයට බලපාන අවදානම් (එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන මූල්‍ය වත්කම්) විශේෂයෙන් එවැනි අවදානම් කළමනාකරණය කරන ආකාරය
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට ගෙවනු ලබන ආකාරය (නිදසුනක් ලෙස, ගෙවීම කළමනාකරණය කළ වත්කම්වල සාධාරණ අගය හෝ
- එකතුකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත පදනම් වේ)
- විකුණුම්වල අපේක්ෂිත වාර ගණන, වටිනාකම සහ කාලය බැංකුවේ තක්සේරුවේ වැදගත් අංගයකි.

ව්‍යාපාර ආදර්ශ තක්සේරුව 'නරක සිදුවීම් හෝ 'පීඩන සිදුවීම් සැලකිල්ලට ගන්නේ නැතිව සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාම මත පදනම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මුල් අපේක්ෂාවන්ගෙන් වෙනස් වන ආකාරයකින් මුදා හරින්නේනම්, එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ඉතිරි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය බැංකුව වෙනස් නොකරයි. නමුත්. ඉදිරියට ගෙනියන අලුතින් උත්පාදිත හෝ අලුතින් මිලදිගත් මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී එවැනි තොරතුරු අතුළත් කරයි.

2.5.17.3. SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පියවරක් ලෙස, SPPI පරීක්ෂණය සපුරා ඇතිද යන්න හඳුනා ගැනීම සඳහා මුල්‍ය උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ බැංකුව තක්සේරු කරයි.

මෙම පරීක්ෂණයේ අරමුණ සඳහා ප්‍රධාන මුදලී යන්න මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම්වල සාධාරණ අගය ලෙස නිර්වචනය කරන අතර මුල් මුදල මූල්‍ය වත්කමේ (නිදසුනක් ලෙස, ආපසු ගෙවීම හෝ වාරිකය/ වට්ටම ක්‍රමක්ෂය කිරීම ඇත්නම්) පුරා වෙනස් විය හැකිය.

ණයදීමේ වැඩපිළිවෙලක් තුළ පොළියේ වඩාත් වැදගත් අංග වන්නේ මුදල සහ ණය අවදානමේ කාල වටිනාකම සඳහා නියමානුකූල ප්‍රතිඵලවයි. SPPI තක්සේරු කිරීම සිදු කිරීම සඳහා, බැංකුව විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම් කරනු ලබන ව්‍යවහාර මුදල සහ පොළී අනුපාතය නියම කරන කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

මෙයට වෙනස්ව, මුල් ණය දීමේ වැඩපිළිවෙලකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තුළ අවදානම් හෝ

වෙනස්වීම් සඳහා නිරාවරණය අඩුකර ගැනීමකට වඩා හඳුන්වාදෙන

ගිවිසුම්ගත නියමයන් හිඟව පවත්නා ප්‍රමාණය මත මුල් මුදල හා පොළිය ගෙවීම සඳහා පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති නොකරයි. එවැනි අවස්ථාවලදී, මූල්‍ය වත්කම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වේ.

2.5.17.4. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ණය උපකරණ (2018 ජනවාරි 1 සිට අදාළ ප්‍රතිපත්තිය)

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන අවස්ථාවේදී අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ SLFRS 9 යටතේ නව වර්ගීකරණය බැංකුව යොදා ගනී:

- උපකරණය ව්‍යාපාර ආදර්ශයක් තුළ දරා ගැනීම, හා එහි පමාර්ථය සාමූහික ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ සහ අලෙවිකරන මූල්‍ය වත්කම් යන දෙවර්ගය විසින් අත්කර ගැනීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් හි SPPI පරීක්ෂණය සපුරාලීම

මෙම උපකරණ විශාල වශයෙන් LKAS 39 යටතේ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස පෙර වර්ගීකරණය කර ඇති වත්කම්වලින් සමන්විත වේ.

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ක්‍රමක්ෂයට ණය උපකරණ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සාධාරණ අගය තුළ වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ අලාභ සහිත සාධාරණ අගයට පසුව මනිනු ලැබේ. සමාන සුරැකුම්වල බැංකුව විසි ආයෝජනයකට වැඩිපුර දරන අවස්ථාවේදී, වීවා පෙර පිවිසි පෙර පිටවුම් මත LKAS බැහැර කළ යුතුයයි සලකනු ලැබේ. හඳුනා ගැනීම මත, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායමෙන් ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

2.5.17.5. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ (2018 ජනවාරි 1 සිට අදාළ ප්‍රතිපත්තිය)

මූලික හඳුනා ගැනීම මත, බැංකුව අවස්ථානුකූලව LKAS 32 යටතේ ස්කන්ධය පිළිබඳ නිර්වචනය සපුරාලන අවස්ථාවේදී එහි ස්කන්ධ ආයෝජන කිහිපයක් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ

අගයේදී ස්කන්ධ උපකරණ ලෙස වෙනස්කළ නොහැකි ලෙස වර්ගීකරණය කිරීම තෝරා ගෙන ඇත. මූල්‍ය උපකරණ: අලෙවිය සඳහා තබා නොමැති අවස්ථාවකදී, එවැනි වර්ගීකරණය උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

මෙම ස්කන්ධ උපකරණ මත ලාභ හෝ අලාභ ලාභයට නැවත ප්‍රතිවක්‍රිය නොකරයි. උපකරණයේ පිරිවැයේ කොටසක් අයකර ගැනීමක් ලෙස එවැනි ලද මුදල්වලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවේදී, එවැනි ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරන අවස්ථාව හැර ගෙවීමේ අයිතිය සථාපිත කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභය හෝ අලාභය තුළ ලාභාංශ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ හානිකරණ තක්සේරුවකට යටත් නොවේ.

2.5.17.6. නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල්

මූලික අගය කිරීමෙන් පසු, නිකුත්කළ ණය හා අනෙකුත් ණයටගත් අරමුදල් පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ. ක්‍රමක්ෂය පිරිවැය නිකුත්කළ අරමුදල් පිළිබඳ යම් මට්ටම් හෝ වාරික සහ ඵලදායී පොළී අනුපාතයයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගනිමින් ගණනය කෙරේ. වගකීමක් සහ ස්කන්ධ සංරචකයක් අඩංගු සංකීර්ණ මූල්‍ය උපකරණයක් නිකුත් කරන දිනයට වෙන් කෙරේ.

2.5.17.7. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් හා වගකීම්

මෙම වර්ගය තුළ මූල්‍ය වත්කම සහ මූල්‍ය වගකීම යනු අලෙවිය සඳහා තබා ඇති සහ මූලික හඳුනා ගැනීම මත කළමනාකරණය විසින් නම්කරන ඇති හෝ SLFRS යටතේ සාධාරණ අගයේදී මැනීමට අනිවාර්යයෙන්ම අවශ්‍ය වන වීවා වේ. කළමනාකරණය පහත සඳහන් නිර්ණායකයක් සපුරාලන අවස්ථාවේ මූලික හඳුනා ගැනීම මත ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට උපකරණයක් නම් කරයි. එම නම් කිරීම උපකරණයක් උපකරණයක් මගින් යන පදනම මත තීරණය කෙරේ.

- මෙම නම් කිරීම වත්කම් හෝ වගකීම් අගය කිරීමෙන් වෙනත් ආකාරයකින් ඇතිවියහැකි හෝ
- විවිධ පදනමක් මත වී මත ලාභ හෝ අලාභ හඳුනා ගැනීමේ අනුරූප නොවන ප්‍රතිකාරය තුරන් කරයි නැතිනම් සැලකියයුතු ලෙස අඩු කරයි.

  හෝ

- වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි1 දක්වා වත්කම්) මූල්‍ය වගකීම් සමූහයක (හෝ LKAS 39 යටතේ මූල්‍ය වත්කම් හෝ දෙකම) කොටසක් වන අතර, ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන ක්‍රමෝපායට අනුකූලව කළමනාකරණය කරන අතර වීවායේ කාර්යසාධනය අගයනු ලබයි.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටස...

කෙරේ. සාධාරණ අගයේ වෙනස්වීම් බැංකුවට අයත් ණය අවදානම් තුළ වෙනස්වීම් නිසා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ වගකීම්වල සාධාරණ අගය තුළ වෙනස්වීම් හැරදැමීම සමඟ ලාභය සහ අලාභය තුළ වාර්තා කෙරේ. සාධාරණ අගය තුළ වීවැනි වෙනස්වීම් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ණය සංචිතය තුළ වාර්තා කරන අතර, ලාභය සහ අලාභයට ප්‍රතිචක්‍රීය නොකරයි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම්කළ උපකරණ මත උපයන හෝ දරන පොළිය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් යම් මට්ටම/ වාරිකය සහ උපකරණයේ අත්‍යවශ්‍ය කොටසක් වන සුදුසුකම් ලබන ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් පිළිවෙලින් පොළී ආදායම හෝ පොළී වියදම තුළ උපචිත කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මැනිම නීතියෙන් අනිවාර්ය වත්කම් මත උපයන පොළිය ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් වාර්තා කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මනිනලද ස්කන්ධ උපකරණවලින් ලාභාංශ ආදායම ගෙවීමේ අයිතිය ස්ථාවර කර ඇති අවස්ථාවේදී අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස ලාභ සහ අලාභ තුළ වාර්තා කෙරේ.

2.5.17.8.මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ව්‍යාපාර මාර්ගයක් අත්කරගන්නා, බැහැර කරන හෝ අවසන් කරන විශේෂ වාතාවරණයකදී හැර බැංකුව ඒවායේ මූලික හඳුනා ගැනීමෙන් පසු එහි

මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකරයි. බැංකුව 2018 සහ 2019 දී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කර නොමැත.

2.5.17.9. මූල්‍ය වත්කම් හා වගකීම් නැවත හඳුනා නොගැනීම

2.5.17.9.1. නියමයන් හා කොන්දේසිවල සැලකියයුතු වෙනස්වීම් අනුව හඳුනා නොගැනීම

බැංකුව ගනුදෙනුකරුවන්ට ණය වැනි මූල්‍ය වත්කමක් හඳුනා නොගන්නේ, හානිකරණ අලාභය දැනට වාර්තා කර නොමැති ප්‍රමාණය දක්වා නැවත හඳුනා නොගැනීමක් ලෙස හඳුනාගන්නා වෙනස සමඟ එය අලුත් ණයක් බවට පත්වන පරිදි සැලකියයුතු ප්‍රමාණයට එහි නියමයන් හා කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවේදීය. අලුතින් හඳුනාගත් ණයමුදල් අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා 1 අදියර ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එම ණය POCI වන බවට සලකන්නේනම් පමණි.

අනෙකුත් කරුණු අතර, ගනුදෙනුකරුවන්ට ණයක් හඳුනා ගන්නේද යන්න තක්සේරු කිරීමේදී, බැංකුව පහත සඳහන් සාධක සලකා බලයි:

- ණය මුදලේ ව්‍යවහාර මුදලේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඇපයක වෙනස්වීම
- වෙනස්වීම මගින් SPPI නිර්ණායක තවදුරටත් සපුරනු නොලබන උපකරණයක් විය

වෙනස්වීම පසුකාලීනව වෙනස් වන මුදල් ප්‍රවාහවලට හේතු නොවේනම්. වෙනස්වීම නැවත හඳුනා ගැනීමට හේතු නොවේ. මුල් ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ තුළ වෙනස මත පදනම් වී, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට වෙනස් වීමේ ලාභයක් හෝ අලාභයක් වාර්තා කරයි.

2.5.17.9.2. සැලකියයුතු වෙනස්වීම නොවන නැවත හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල්පිරී ඇති අවස්ථාවේදී මූල්‍ය වත්කමක් (හෝ අවශ්‍ය අවස්ථාවලදී. මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගනී. මූල්‍ය වත්කම් මාරු කර ඇතිනම් සහ මාරු කිරීම හඳුනා නොගැනීමට සුදුසුකම් ලබයිනම් බැංකුව මූල්‍ය වත්කම හඳුනා නොගනී.

බැංකුව පහත කරුණු මත මූල්‍ය වත්කම මාරුකර ඇත :

- බැංකුව මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ ගිවිසුම්ගත අයිතිය මාරු කර තිබීම, හෝ
- මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ රඳවාගෙන තිබුනද, පසුකර යැවීමේ ගිවිසුමක් යටතේ යම් තෙවැනි පාර්ශ්වයකට සැලකියයුතු ප්‍රමාණයකින් තොරව සම්පූර්ණයෙන් ලද මුදල ගෙවීමට බැඳීමක් පිළිගෙන තිබීම

පසුකර යැවීමේ ගිවිසුම් යනු ගනුදෙනු වන අතර ඒ තුළින් බැංකුව මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය රඳවා ගන්නා ('මුල් වත්කම'), නමුත් පහත සඳහන් කොන්දේසි තුන සපුරාලන අවස්ථාවේදී ආයතන එකක් හෝ කිහිපයකට ('පසු ප්‍රතිලාභීන්') වෙත වීවැනි මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීමක් ඇති බව පිළිගැනීමට

- වෙළෙඳපොල අනුපාතවලට ණය සමඟ උපචිත පොළි ප්‍රමාණය සම්පූර්ණයෙන් අයකර ගැනීමට අයිතිය සහිත කෙටි කාලීන අත්තිකාරම් හැර මුල් වත්කමෙන් සමාන මුදලක් එකතු කර ඇතිනම් මිස පසු ප්‍රතිලාභීන් වෙත මුදල් ගෙවීමට බැංකුවට බැඳීමක් නොමැතිවීම.
- පසු ප්‍රතිලාභීන් වෙත සුරැකුමක් ලෙස නොවන මුල් වත්කම් බැංකුවට විකිණීමට හෝ ඔඩපනය කිරීමට නොහැකි වීම.
- සැලකියයුතු ප්‍රමාදයකින් තොරව පසු ප්‍රතිලාභීන් වෙනුවෙන් බැංකුව අයකරන යම් මුදල් ප්‍රවාහ ප්‍රේෂණය කිරීමට බැංකුවට සිදුවීම.

ඊට අමතරව, එකතු කිරීමේ දිනය සහ වීවැනි මුදල් ප්‍රවාහ පසු ප්‍රතිලාභීන් වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය දිනය අතර කාලසීමාව තුළ උපයන ලද පොළිය ඇතුළුව මුදල් හෝ මුදලට සමාන දෑ හී ආයෝජනය සඳහා හැර බැංකුවට වීවැනි මුදල් ප්‍රවාහ නැවත ආයෝජනය කිරීමට හිමිකම නොමැත.

පහත කරුණු යටතේ නැවත හඳුනා නොගැනීමක් සඳහා පමණක් මාරු කිරීම සුදුසුකම් ලබයි.

- බැංකුව වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස මාරු කර තිබීම, හෝ
- බැංකුව වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන නොතිබීම, නමුත් වත්කමේ පාලනය මාරුකර තිබීම.

යම් අසම්බන්ධිත තෙවැනි පාර්ශ්වයකට සම්පූර්ණයෙන්ම වත්කම විකිණීම සඳහා

පැවරුම්ලාභියාට ප්‍රායෝගික හැකියාව ඇත්නම් සහ මාරු කිරීම සම්බන්ධයෙන් අමතර සීමා පැනවීමත් නොමැතිව ඒක පාර්ශ්විකව එම හැකියාව ක්‍රියාවට නැංවීමට හැකිනම්, පාලනය මාරු කර ඇති බවට බැංකුව සලකනු ලබයි.

බැංකුව වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන සැලකියයුතු ලෙස රඳවාගෙන නොමැති හෝ වත්කමේ පාලනය රඳවා ගෙන නොමැති අවස්ථාවේදී, බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පමණක් වත්කම තවදුරටත් හඳුනා ගනී. මේ කුමන අවස්ථාවේද වුවත්, බැංකුව ආශ්‍රිත වගකීමක් හඳුනා ගනී. මාරුකළ වත්කම සහ ආශ්‍රිත වගකීම බැංකුව රඳවාගෙන ඇති අයිතිය හා බැඳීම පිළිබිඹු කරන පදනමක් මත මනිනු ලබයි.

මාරුකළ වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කමේ මුල් ධාරණ අගය සහ බැංකුවට ගෙවීමට අවශ්‍ය

වියහැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම ප්‍රමාණය යන දෙකෙන් පහළ අගයට මනිනු ලබයි.

අඛණ්ඩ මැදිහත්වීම මාරුකළ වත්කම මත ලිඛිත හෝ මිලදීගැනීමේ විකල්පයක (හෝ දෙකම) ස්වරූපයක් ගන්නේනම්, අඛණ්ඩ මැදිහත්වීම මිලදී ගැනීම මත බැංකුවට ගෙවීමට අවශ්‍ය වියහැකි වටිනාකමට මනිනු ලබයි. සාධාරණ අගයට මනින ලද වත්කමක් මත ලිඛිතව තබනලද විකල්පයක් වන අවස්ථාවකදී, ආයතනයේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය මාරුකළ වත්කමේ සාධාරණ අගය සහ විකල්ප ක්‍රියාත්මක මිල යන දෙකෙන් අඩු අගයට සීමා වේ.

මූල්‍ය වගකීම්

වගකීම යටතේ බැඳීම මුදහරින, අවලංගු වන හෝ කල්පිරෙන අවස්ථාවක මූල්‍ය වගකීමක් හඳුනා නොගනී. පවත්නා මූල්‍ය වගකීමක් සැලකියයුතු වෙනස් නියමයන් මත හෝ පවත්නා වගකීමක නියමයන් සැලකියයුතු ලෙස වෙනස්වන පරිදි එම ණයකරුගේ වෙනත් ණයකින් ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවක, එවැනි නුවමාරුවක් හෝ වෙනස්කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

2.5.18. මූල්‍ය වත්කම් හානිකරණය (2018 ජනවාරි 1 ට අදාළ ප්‍රතිපත්තිය)

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව, ගනුදෙනුකරුවන්ට සියලුම ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වියහැකි හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කෙරේ. පහත සඳහන් තක්සේරු ශිල්ප ණයවල සාධාරණ අගය ගණනය කිරීමට භාවිතා කළ අතර ඒවා පහත පරිදි වේග

1. තනි තිනි හානිකරණ ක්‍රමය

තනි තනි හානිකරණ ක්‍රමය ණය සඳහා සිදු කරන අතර, එහිදී මුදල් ආපසු ණය ඉවත් කරන අතර රු.මි.5ට වැඩි සියලුම ණය ඇතුළත් කරයි. නැතිනම් ප්‍රාග්ධන පදනමෙන් 0.1%ක් තනි තනිව සැලකියයුතු ලෙස සලකනු ලබයි. තනි තනි හානිකරණ පරීක්ෂණය සඳහා පහසුකම් හානිකරණයේ විෂයමූලික සාක්ෂි ලබාගැනීම මත පදනම් වී තෝරා ගනු ලැබේ.

2. සාමූහික හානිකරණ ක්‍රමය

වියහැකි ණය අලාභ සඳහා සාමූහික හානිකරණ වෙන් කිරීම් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගයකිරීම පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 09 ට අනුකූලව සිදු කෙරේ. බැංකුව අපේක්ෂිත ණය අලාභ මූලධර්මයට අනුව සාමූහික හානිකරණ වෙන්කිරීම බැංකුව සිදුකර ඇත. එහිදී තනි පුද්ගල හානිකරණය වැදගත් නොවේ.

2.5.18.1. අපේක්ෂිත ණය අලාභ මූලධර්මය පිළිබඳ දළ විශ්ලේෂණය

ඉදිරිය දකින අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් සහිතව LKAS 39 හි දරන ලද අලාභ ප්‍රවේශය වෙනුවට SLFRS 9 යොදා ගැනීම මූලිකවම බැංකුවේ ණය අලාභ හානිකරණ ක්‍රමය මූලිකවම වෙනස් කර ඇත. 2018 ජනවාරි 1 සිට, "මූල්‍ය උපකරණ" ලෙස මෙම සෑම කොටසකම සඳහන් කරන ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමඟ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අත්තිකාරම බැංකුව වාර්තා කරමින් සිටී. ස්කන්ධ උපකරණ SLFRS 9 යටතේ හානිකරණයට යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වන අතර එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත වියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි.

ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන දෙකම මූල්‍ය

උපකරණවල පාදක කළඹේ ස්වභාවය මත රැඳෙමින් තනි තනි පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. මූල්‍ය වත්කම් කාණ්ඩකරණය සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය සමානුත පදනමක් මත අගය කර ඇත.

මූල්‍ය උපකරණයක ඉතිරි ජීව කාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැලකිල්ලට ගනිමින් මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරන කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදු කිරීමට බැංකුව ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුව එහි ණය පහත විස්තර කරන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ POCI තුළට කාණ්ඩ කරයි:

ණය පළමුව හඳුනාගන්නා අවස්ථාවේදී, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම් වී අත්තිකාරමක් හඳුනා ගනී. අදියර 1 ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

- **අදියර 1:**

  ණය පළමුව හඳුනාගන්නා අවස්ථාවේදී, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම් වී අත්තිකාරමක් හඳුනා ගනී. අදියර 1 ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

- **අදියර 2:**

  ණයමුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි. අදියර 2

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටස...

ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 3 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

- **අදියර 3:**

ණය හානිකරණය වී ඇති බවට සලකන ණය (අංක 13 හි සඳහන් පරිදි). බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි.

- **POCI:**

මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POCI) වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. POCI වත්කම් මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතයක් මත පදනම් වී පොළි ආදායම පසුකාලීනව හඳුනා ගනී. අපේක්ෂිත ණය අලාභවල පසුකාලීන වෙනසක් සිදුවන ප්‍රමාණයට පමණක් හඳුනාගනී නැතිනම් මුදා හරී.

හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් බැංකුවට නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය අඩු කරනු ලබයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනා නොගැනීමක් ලෙස සලකනු ලබයි.

2.5.18.2. අපේක්ෂිත ණය අලාභ (ECLs) ගණනය කිරීම

ඵලදායී පොළි අනුපාතයට ආසන්නවීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බරතබනලද ක්‍රියාදාම හතරක් මත පදනම් වී බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවියයුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප පහත කෙටියෙන් දක්වන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

- **PD:**

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පැහැර හැරීම සිදුවියහැකි බව පිළිබඳ ඇස්තමේන්තුවකි. පහසුකම මෙයට පෙර හඳුනා ගෙන නොමැතිනම් සහ තවමත් කළඹ තුළනම්, පැහැර හැරීමක් තක්සේරු කළ කාලසීමාව තුළ විකතරා අවස්ථාවකදී පමණක් සිදුවියහැක.

- **EAD:**

පැහැර හැරීමේදී නිරාවරණය යනු බැඳුණු පහසුකම සහ මඟහැරුණු ගෙවීම්වල උපචිත පොළිය මත පහළවැටීම් අපේක්ෂිත ගිවිසුම මගින් හෝ වෙනත් ආකාරයකින් උපලේඛනගත මුල් මුදල සහ පොළිය නැවත ගෙවීම ඇතුළුව වාර්තාකරන දිනයෙන් පසු නිරාවරණ තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අනාගත පැහැරහැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවකි.

- **LGD:**

අලාභ ලබන පැහැර හැරීම යනු දෙනලද යම් කාලයකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවක ඇතිවන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හිඟ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, බැංකුව විසින් මූලික සිදුවීම, හොඳම සිදුවීම සහ නරකම සිදුවීම ලෙස ක්‍රියාදාම තුනක් සලකා බලයි. මේවා එකින් එක එකිනෙකට වෙනස් PDs, EADs සහ LGDs හා බැඳේ. අදාළ වන අවස්ථාවේදී, ණය අයකර ගැනීමේ හැකියාව සහ ඇපවල වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලබාගතහැකි ප්‍රමාණය ඇතුළුව පැහැර හැරී ණය අයකර ගැනීමට අපේක්ෂා කරන ආකාරය සම්බන්ධයෙන් විවිධ ක්‍රියාදාම පිළිබඳ තක්සේරුවක් ද ඇතුළත් කරයි.

හානිකරණ අලාභ සහ මුදාහැරීම් මූල්‍ය වත්කමේ දළ ධරණ අගයේ ගැලපීමක් ලෙස ගණනය කරන වෙනස්කිරීමේ අලාභ හෝ ලාභ සඳහා ගණනය කර වෙන වෙනම අනාවරණය කෙරේ.

2.5.18.3. අපේක්ෂිත ණය අලාභ ක්‍රමයේ ශිල්ප පහත සාරාංශ කෙරේ:

- **අදියර 1:**

මාස 12 අපේක්ෂිත ණය අලාභ වාර්තා කරන දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම්වලින් ඇතිවන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන ජීවකාල අපේක්ෂිත ණය අලාභවල කොටසක් ලෙස ගණනය කෙරේ. මාස 12 තුළ සිදුවියහැකි පැහැර හැරීමක් පිළිබඳ අපේක්ෂාව මත පදනම් වී මාස 12 අපේක්ෂිත ණය අලාභ දීමනාව බැංකුව විසින් ගණනය කරයි.

මෙම අපේක්ෂිත මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාවන් පුරෝකථන EAD සඳහා යොදා ගන්නා අතර අපේක්ෂිත LGD වලින් ගුණකර මුල් ඵලදායී පොළි අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි. ඉහත විස්තර කළ පරිදි මෙම එක් එක් ක්‍රියාදාමය සඳහා මෙම ගණනය කිරීම සිදු කරයි.

- **අදියර 2:**

ණයමුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවක් වාර්තා කරයි. ශිල්ප ක්‍රම විවිධ ක්‍රියාදාම භාවිතය ඇතුළුව ඉහත විස්තරකල දෙයට සමාන වන නමුත් PDs සහ LGDs උපකරණයේ ජීවකාලය තුළ තක්සේරු කෙරේ. අපේක්ෂිත මුදල් හිඟය ඵලදායී පොළි අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි.

- **අදියර 3:**

ණය හානිකරණය වී ඇති බවට සලකන ණය සඳහා. එවැනි ණය සඳහා ජීවකාල අපේක්ෂිත ණය අලාභ බැංකුව හඳුනා ගනී. මෙම ක්‍රමය 100%ට PD සැකසුම සහිත අදියර 2 වත්කම්වලට සමානය.

- **POCI:**

POCI වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතය

මගින් වට්ටම්කළ ක්‍රියාදාම හතර සම්භාවිතා බරතැබීමක් මත පදනම් වී මූලික හඳුනා ගැනීමේ සිට පීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී. වාර්තාකරණ දිනයට බැංකුවට POCI වත්කම් නොමැත.

2.5.18.4. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ සාධාරණ අගයේ පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මෙම මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේනම් ඇතිවිය හැකි දිමනාවට සමාන මුදලක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමඟ සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සමුච්චිත අලාභ වත්කම හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට ප්‍රතිවක්‍රිය කෙරේ.

2.5.18.5. මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් (POCI)

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් සඳහා, අලාභ දීමනාව තුළ මූලික හඳුනා ගැනීමේ සිට පීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

2.5.18.6. ඉදිරිය දකින තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත කරුණු වැනි ආර්ථික යෙදවුම් ලෙස ඉදිරිය දකින තොරතුරු පිළිබඳ පුළුල් පරාසයක් මත බැංකුව විශ්වාසය තබයි:

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොළී අනුපාත
- ඇ.ඒ.ඩො.: රුපියල් නුවමාරු අනුපාතය
- විරැකියා අනුපාත

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සහ ආදර්ශ මූල්‍ය ප්‍රකාශනවල දිනයට වෙළෙඳපොලේ සියලුම ගතිලක්ෂණ සෑමවිටම ග්‍රහනය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැලකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේ ගුණාත්මක ගැලපීම් හෝ ආවරණ තාවකාලික ගැලපීම් ලෙස අවස්ථානුකූලව සිදු කෙරේ. එමනිසා, බැංකුව පහත සඳහන් ගුණාත්මක සාධක සැලකිලල්ට ගනී. Average LTV

- සාමාන්‍ය LTV
- රජයේ ප්‍රතිපත්ති
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය නියාමන බලපෑම

2.5.18.7. ඇප තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිතා කිරීමට උත්සාහ දරයි. ඇප මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපල, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් වැනි විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ බැංකුව එහි ණයදීමේ වැඩපිළිවෙල තුළින් පවරාගන්නා ඇප සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියයි.

2.5.18.8. නැවත අත්කරගත් ඇප

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිතා කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය කිරීමයි. එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත්යයි තීරණය කළ වත්කම් ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමේ ධාරණ අගය යන දෙකින් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණයට මාරු කෙරේ. විකිණීම වඩාත් හොඳ විකල්පයක් වන බවට තීරණය කරනු ලබන වත්කම් ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම්නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කර ගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම්වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාවට අනුව, බැංකුව එහි පාරිභෝගික කළඹ තුළ දේපල හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීමට අරමුදල් අයකර ගැනීමට බාහිර නියෝජිතයින් සේවයේ යොදවනු ලබයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/ වගකිවයුත්තන්ට ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කරගැනීමේ ක්‍රියාවලීන් යටතේ නේවාසික දේපල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා නොකෙරේ.

2.5.18.9. කපාහැරීම්

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුළ පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුව අයකරගැනීමේ කාර්යය නවතා ඇති අවස්ථාවේදී පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් කපා හරිනු ලබයි. කපාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට චිකතු කිරීමක් ලෙස වෙනස පළමුව සලකනු ලැබේ. යම් පසුකාලීන අයකර ගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

2.5.18.10. කල්බදු.

2018 මූල්‍ය වර්ෂය යටතේ, දේපල, පිරියත හා උපකරණවල කල්බදු මූල්‍ය අලාභ හෝ මෙහෙයුම් අලාභ ලෙස වර්ගීකරණය කරන ලදී.

2019 ජනවාරි 1 සිට, SLFRS 16 කල්බදුවලට අනුව කල්බදු වත්කම් බැංකුව විසින් භාවිතා කිරීමට ඇති දිනයට බැංකුව විසින් කල්බදු භාවිතයට ඇති වත්කම් සහ අනුරූප වගකීමක් ලෙස හඳුනා ගනී.

කල්බද්දකින් ඇති වන වත්කම් සහ වගකීම් වර්තන වටිනාකම් පදනමක් මත මූලිකවම අගය කෙරේ. වගකීම්වල පහත සඳහන් කල්බදු ගෙවීම්වල ශුද්ධ වර්තන අගය ඇතුළත් ය.

- කල්බදු දිරිදීමනා ලැබීම් අඩුකළ ස්ථිර ගෙවීම් (අවශ්‍යම ස්ථිර ගෙවීම් ඇතුළුව)

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ඉතිරි කොටස...

- දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විවිධ කල්බදු ගෙවීම මූලිකව ආරම්භක දිනයට දර්ශකය හෝ අනුපාතය භාවිතා කරමින් මනිනු ලබයි
- සුන්බුන් වටිනාකමේ ඇප යටතේ සමූහය විසින් ගෙවීමට ඇති අපේක්ෂිත ප්‍රමාණ
- සමූහය වීම මතය ක්‍රියාත්මක කිරීමට සාධාරණව නිශ්චිතනම්, මිලදී ගැනීමේ මතයක් පිළිබඳ ප්‍රායෝගික මිල, සහ
- කල්බදු නියමයන්ගෙන් සමූහය වීම විකල්පය ක්‍රියාවට නංවන බව පිළිබිඹු කරයිනම් කල්බදු අවසන් කිරීම සඳහා දඩමුදල් ගෙවීම

කල්බදු ගෙවීම් කල්බද්ද තුළ පොළී අනුපාත භාවිතා කරමින් වට්ටම් කෙරේ. වීම අනුපාතය සමූහය තුළ කල්බදු සඳහා පොදුවේ අවස්ථාව වන පහසුවෙන් තීරණය කළ නොහැකිනම්. කල්බදුකරුගේ වර්ධිත ණය ගැනීමේ අනුපාතය භාවිතා කෙරේ.

කල්බදු ගෙවීම් මුල් මුදල සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කෙරේ. එක් එක් කාලසීමාව සඳහා වගකීමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ ආවර්ථික අනුපාතයක් නිෂ්පාදන කරමින් පොළී මූල්‍ය පිරිවැය කල්බදු කාලය තුළ ලාභය හෝ අලාභයට අයකෙරේ.

භාවිතයට අයිතිය ඇති වත්කම් පහත සඳහන් දෑ ඇතුළත්ව පිරිවැයට මනිනු ලැබේ:

- කල්බදු වගකීමේ මූලික මැනීමේ ප්‍රමාණය
- ලද යම් කල්බදු දිරිදීමනා අඩුකළ ආරම්භක දිනයට හෝ පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම්
- යම් මූලික සෘජු පිරිවැය, සහ
- ප්‍රතිසංස්කරණ පිරිවැය.

භාවිතයට අයිතිය ඇති වත්කම් වත්කමේ ඵලදායී ජීවකාලයේ කෙටි කාලය සහ සරල මාර්ගික ක්‍රමයක් මත කල්බදු කාලය පුරා පොදුවේ ක්ෂය කෙරේ.

කෙටි කාලීන කල්බදු ආශ්‍රිත ගෙවීම් සහ අඩු වටිනාකම් වත්කම්වල සියලුම කල්බදු ලාභය හෝ අලාභය තුළ වියදමක් ලෙස සරල මාර්ගික පදනමක් මත හඳුනා ගනී. කෙටි කාලීන කල්බදු යනු මාස 12 හෝ ඊට අඩු කාලයක් සහිත කල්බදුය.

2.5.18.11. වාර්තාකරන කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරන කාලසීමාවෙන් පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර, සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සිදු කෙරේ.

2.5.18.12. රජය හා රජයට අදාළ ආයතන සමඟ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

LKAS 24 හි 24 පරිච්ඡේදය යටතේ අනාවරණයෙන් නිදහස්වීම බැංකුව තෝරාගෙන නැත.

3. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණවල වෙනස්වීම් (SLFRS 16)

3.1. නව සහ සංශෝධිත ප්‍රමිති හා අර්ථකථන

මෙම මූල්‍ය ප්‍රකාශනවල, පළමු වරට 2019 ජනවාරි 1 හෝ ඊට පසු ආරම්භ වන කාලසීමාවන් සඳහා ක්‍රියාත්මක වන පරිදි SLFRS 16 කල්බදු බැංකුව යොදා ගෙන ඇත. නිකුත් කරනු ලැබූවද මේ දක්වා බලාත්මක නොවූ යම් වෙනත් ප්‍රමිති, අර්ථකථන හෝ සංශෝධන බැංකුව යොදා ගෙන නොමැත.

බැංකුව 2019 ජනවාරි 1 සිට SLFRS 16 කල්බදු අතිතානුයෝගීව යොදාගෙන ඇත. නමුත් මෙම ප්‍රමිතිය තුළ විශේෂිත සංක්‍රාන්ති විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි 2018 වාර්තාකරන කාලසීමාව සඳහා තුලනයන් නැවත සඳහන් කර නොමැත.

නව වාර්තාකරන ප්‍රතිපත්තිය 2.5.19 සටහන්වල අනාවරණය කෙරේ.

SLFRS 16 යොදාගැනීම මත, LKAS 17 කල්බදු මූලධර්ම යටතේ මෙහෙයුම් කල්බදු ලෙස මෙයට පෙර වර්ගීකරණය කර ඇති කල්බදු සම්බන්ධයෙන් සමූහය කල්බදු වගකීම් හඳුනා ගෙන ඇත. මෙම වගකීම් කල්බදුකරුගේ වර්ධනීය ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් වට්ටම් කළ ඉතිරි කල්බදු ගෙවීම්වල වර්තන වටිනාකමට ක්‍රමක්ෂය කෙරේ.

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගත් වීම කල්බදුවලට අදාළ පෙර ගෙවූ හෝ උපචිත කල්බදු ගෙවීම් ප්‍රමාණයෙන් ගලපන ලද කල්බදු වගකීමට සමාන ප්‍රමාණයකට භාවිතයට අයිතිය ඇති වත්කම් ක්‍රමක්ෂය කරන ලදි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. ශුද්ධ පොළී ආදායම

	2019	2018
	රු.	රු.
පොළී ආදායම		
බැංකු සමඟ ස්ථාපන	730,365,096	665,225,374
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්		
- ණය සහ අත්තිකාරම්	5,042,348,392	4,687,478,097
- ණය සහ අනෙකුත් උපකරණ	208,796,671	172,413,052
මුළු පොළී ආදායම	5,981,510,158	5,524,856,523
පොළී වියදම		
බැංකුවලට ගෙවිය යුතු	27,417	65,731
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්		
- ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	3,722,392,841	3,308,441,414
- ණය සුරැකුම්පත් හිමිකරුවන්ට ගෙවිය යුතු	2,757,534	2,742,466
- අනෙකුත් ණයකරුවන්ට ගෙවිය යුතු	226,165,075	266,254,451
මුළු පොළී වියදම	3,951,342,868	3,577,504,063
ශුද්ධ පොළී ආදායම	2,030,167,290	1,947,352,460

අ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ශුද්ධ ආදායම

	2019	2018
	රු.	රු.
පොළී ආදායම	110,239,073	101,969,571
(අඩු කළා) පොළී වියදම	-	-
ශුද්ධ පොළී ආදායම	110,239,073	101,969,571

2. ගාස්තු සහ කොමිස් ශුද්ධ ආදායම

	2019	2018
	රු.	රු.
ගාස්තු සහ කොමිස් ආදායම	113,332,608	107,468,209
ගාස්තු සහ කොමිස් වියදම	-	-
ගාස්තු සහ කොමිස් ශුද්ධ ආදායම	113,332,608	107,468,209
සමන්විත දෑ		
බැංකු සේවා ගාස්තු- ණය සහ අත්තිකාරම්	104,823,332	97,755,399
නීති සහ තාක්ෂණික ගාස්තු- ණය සහ අත්තිකාරම්	401,260	558,791
අනෙකුත් ගාස්තු	8,108,017	9,154,018
ශුද්ධ ගාස්තු සහ කොමිස් ශුද්ධ ආදායම	113,332,608	107,468,209

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

3. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය උපකරණයෙන් ශුද්ධ සාධාරණ අගයේ ලාභ / (අලාභ)

	2019	2018
	රු.	රු.
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත ලාභ	1,840,000	-
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් මත අලාභ	-	(260,000)
එකතුව	1,840,000	(260,000)

4. අනෙකුත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)

	2019	2018
	රු.	රු.
ලාභාංශ ආදායම	21,771,330	23,574,000
විවිධ ආදායම්	6,547,289	2,540,437
අනෙකුත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)	28,318,619	26,114,437

05. ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් /(ආපසු හැරවීම)

	2019	2018
	රු.	රු.
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්		
අදියර 1	13,770,764	15,475,456
අදියර 2	7,740,486	24,367,738
අදියර 3	109,437,584	147,542,908
ක්‍රමක්ෂය පිරිවැයට අනෙකුත් මූල්‍ය වත්කම්		
අදියර 1	135,598	67,391
අදියර 2	443,876	(2,495,439)
අදියර 3	-	-
එකතුව	131,528,308	184,958,053

06. පුද්ගල වියදම්

	2019	2018
	රු.	රු.
වැටුප් හා ප්‍රසාද දීමනා	588,537,495	574,169,121
නිශ්චිත ප්‍රතිලාභ දායකත්ව/ ප්‍රතිලාභ සැලසුම්වලට දායකත්වය	85,179,105	79,343,055
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන් කිරීම	51,915,646	46,338,201
වෙනත්	156,505,796	124,167,295
එකතුව	882,138,042	824,017,672

07. අනෙකුත් වියදම්

	2019	2018
	රු.	රු.
07.1		
අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන	2,601,651	2,350,426
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	5,273,734	1,500,000
වෘත්තීය හා නීති වියදම්	1,359,613	795,917
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	148,221,814	196,942,381
ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වියදම්	7,785,485	20,788,846
මෝටර් වාහන නඩත්තුව සහ ගමන් වියදම්	7,779,123	7,374,667
සාමාන්‍ය වියදම්	15,918,508	18,557,667
ඩිස්ට්‍රික් නියෝජිත කොමිස්	8,750	14,250
අනෙකුත් අලාභ බොල් ණය සහ ලියා හැරීම්	3,686,529	947,787
මහ බැංකු තැන්පතු රක්ෂණය	32,544,376	29,687,389
වෙනත් වියදම්	61,605,715	35,205,244
07.2		
දේපල, පිරියත හා උපකරණවල ක්ෂය කිරීම/ක්‍රමක්ෂය	25,988,195	25,817,153
එකතුව	312,773,494	339,981,728

වියදම් විස්තර

	2019	2018
ප්‍රචාරණ වියදම්	3,219,339	7,596,382
ප්‍රවර්ධන වියදම්	4,566,147	13,192,465
	7,785,485	20,788,846

සේවක වියදම්

	2019	2018
	රු.	රු.
වැටුප් හා ප්‍රසාද දීමනා	588,537,495	574,169,121
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - සේ.අ.අ. හා සේ.හා.අ	85,179,105	79,343,055
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතොෂික වෙන් කිරීම	35,084,300	31,480,006
අසනීප නිවාඩු මුදල් කිරීම	18,986,857	19,470,333
අතිකාල සහ දීමනා	23,122,850	26,913,710
සේවක අධ්‍යයන හා පුහුණුව	4,231,845	4,474,804
වෛද්‍ය යෝජනා ක්‍රමය - ගෙවීම්	47,499,204	33,102,227
වෛද්‍ය යෝජනා ක්‍රමය - වෙන්කිරීම (IFRS)	16,831,345	24,693,846
සුභ සාධනය	2,198,852	3,105,795
රක්ෂණය	1,589,577	1,679,452
සේවක ණය දින 1 වෙනස (IFRS)	35,956,285	5,425,562
සේවක ආදායම් මත උපයනවිට බදු	20,770,371	20,159,760
PF සහයෝගය	2,149,953.42	-
වන්දි ගෙවීම	-	-
එකතුව	882,138,042	824,017,672

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

අනෙකුත් වියදම් වෙනත් වර්ගය

	2019	2018
	රු	රු
පරිගණක නඩත්තුව	7,303,332	4,227,310
බැංකු කොමිස්	1,581,565	1,346,174
පුවත්පත් හා සඟරා	556,070	575,017
ණය ආශ්‍රිත වියදම්	3,751,716	1,997,039
ණය තොරතුරු කාර්යාංශයේ අයකිරීම්	3,931,086	3,614,075
රක්ෂණය -මාර්ගස්ථ මුදල්	-	37,381
ඉන්ධන	2,072,910	2,700,555
රක්ෂණය - මෝටර් රථ	524,076	620,509
ආයතන වෙත දායක මුදල්	7,763,363	6,950,273
උපදේශන ගාස්තු	3,409,672	3,275,716
ACL අයකිරීම්	1,970,500	2,272,100
වගා රක්ෂණ බදු	2,330,441	2,497,852
ණය ආපසු ගෙවීමේ බදු (DRL)	-	-
තක්සේරුකරුවන්ට ගෙවූ ගමන් වියදම්	4,474,625	4,304,806
ආයතනික සමාජ වගකීම	91,750	663,250
නැවත උපලේඛණගතකළ ණය මත ප්‍රාග්ධනය කළ පොළිය	-	63,187
පරිත්‍යාග	100,000	60,000
වත්කම් බැහැර කිරීම මත අලාභ	86,122	
ප්‍රාග්ධනය ලියා හැරීම (උකස් ණය)	11,901,834	
ප්‍රාග්ධනය ලියා හැරීම (සේඅඅ ණය)	1,343,037	
ක්‍රමක්ෂය පිරිවැය NSB බැඳීම් ගාස්තු වියදම	1,955,782	
එකතුව	55,147,881	35,205,244

08. බදු වියදම්

	2019	2018
	රු	රු
වර්තන බදු වියදම		
වර්තන බදු	199,540,377	246,910,840
විලම්බිත බදු වියදම/ (බැර)	(118,960,119)	(11,650,177)
එකතුව	80,580,258	235,260,663
අ. බදු වියදම් සැසඳීම		
බදු පෙර ලාභය /(අලාභය)	815,905,716	731,717,653
පෙර කාලසීමා සඳහා වර්තන ආදායම් බදු ගැලපීම්		
එකතු කළා: බදු කාර්යය සඳහා අඩු කළ නොහැකි වියදම්වල බදු බලපෑම	282,061,551	274,697,263
(අඩු කළා): බදු කාර්යය සඳහා අඩු කළ හැකි වියදම් මත බදු බලපෑම	(393,232,495)	(90,101,622)
වත්කම් බැහැර කිරීම	-	-
ලාභාංශ	(23,611,330)	(23,574,000)
වර්ෂය සඳහා ගලපන ලද ලාභය	681,123,442	892,739,294
වසරේ ලාභය මත පදනම්ව බදුකරණය	190,714,564	249,967,002
විලම්බිත බදුකරණයට/බදුකරණයෙන් මාරු කිරීම	(118,960,119)	(11,650,177)
ඉකුත් වසරේ (අධි) /ඌන වෙන් කිරීම්	8,825,814	(3,056,162)
කාලසීමාව සඳහා බදු වියදම	80,580,258	235,260,663
ආ. ආදායම් ප්‍රකාශනය සහ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ විලම්භිත බදු (බැර) /අයකිරීම		
විලම්බිත බදු වත්කම්		
දේපල පිරියත සහ උපකරණ	(6,529,482)	261,847
සේවක ප්‍රතිලාභ බැඳීම්	109,281,685	107,189,337
හානිකරණ වෙන් කිරීම	120,158,724	
භාවිතයට අයිතිය ඇති වත්කම්	(1,262,252)	
විලම්භිත බදු වත්කම්	221,648,675	107,451,184

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

09. අගය කිරීමේ පදනම මගින් මූල්‍ය උපකරණ පිළිබඳ විශ්ලේෂණය - බැංකුව - පවත්නා වසර (2019)

රු.වලින්.	AC	FVPL	FVOCI	එකතුව
වත්කම්				
මුදල් හා මුදලට සමාන දෑ	121,239,625	-	-	121,239,625
බැංකු සමඟ ස්ථාපන	7,090,741,107	-	-	7,090,741,107
ණය සහ අත්තිකාරම්	35,892,870,362	-	-	35,892,870,362
ණය උපකරණ	65,983,517	-	-	65,983,517
නැවත විකිණීමේ ගිවිසුම ආපසු හැරවීම	1,385,517,561	-	-	1,385,517,561
භාණ්ඩාගාර බිල්පත්	994,878,307	-	-	994,878,307
භාණ්ඩාගාර බැඳුම්කර	168,803,531	-	-	168,803,531
වීකක භාර	-	19,475,000		19,475,000
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	45,720,034,009	19,475,000	5,379,078	45,744,888,087
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	12,412,879	-	-	12,412,879
මූල්‍ය වගකීම්				
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	38,872,216,979	-	-	38,872,216,979
- ණය සුරැකුම්පත් දරන්නන්ට ගෙවිය යුතු	110,180,822	-	-	110,180,822
- වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු	1,501,680,632	-	-	1,501,680,632
මුළු මූල්‍ය වගකීම්	40,496,491,311	-	-	40,496,491,311

AC - ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්
FVPL - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේ දී මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්
FVOCI – අනෙකුත් විස්තරාත්මක ආදායමේදී සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්/ වගකීම්

බැංකුව -පෙර වසර (2018)

රු.වලින්.	AC	FVPL	FVOCI	එකතුව
වත්කම්				
මුදල් හා මුදලට සමාන දෑ	96,180,182	-	-	96,180,182
බැංකු සමඟ ස්ථාපන	5,206,048,813	-	-	5,206,048,813
ණය සහ අත්තිකාරම්	34,225,486,332	-	-	34,225,486,332
ණය උපකරණ	65,983,517	-	-	65,983,517
නැවත විකිණීමේ ගිවිසුම ආපසු හැරවීම	729,583,724	-	-	729,583,724
භාණ්ඩාගාර බිල්පත්	874,312,408	-	-	874,312,408
භාණ්ඩාගාර බැඳුම්කර	274,697,508	-	-	274,697,508
වීකක භාර	-	17,635,000		17,635,000
ලැයිස්තුගත නොකළ කොටස්	-	-	5,379,078	5,379,078
මුළු මූල්‍ය වත්කම්	41,472,292,485	17,635,000	5,379,078	41,495,306,563
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	12,196,466	-	-	12,196,466
මූල්‍ය වගකීම්				
- තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	34,272,228,231	-	-	34,272,228,231
- ණය සුරැකුම්පත් දරන්නන්ට ගෙවිය යුතු	110,173,288	-	-	110,173,288
- වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු	1,872,732,341	-	-	1,872,732,341
මුළු මූල්‍ය වගකීම්	36,267,330,327	-	-	36,267,330,327

10. මුදල් හා මුදලට සමාන දෑ

	2019	2018
	රු	රු
අතැති මුදල්	51,038,006	40,970,999
බැංකු සමඟ ශේෂ	70,201,619	55,209,184
එකතුව	121,239,625	96,180,182

11. බැංකු සමඟ ස්ථාපන

	2019	2018
	රු	රු
සම්පත් බැංකුව	-	1,515,747,273
NDB බැංකුව	5,472,505,060	1,750,768,307
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	481,358,048	201,482,740
මහජන බැංකුව	-	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	1,206,029,945
සණස සංවර්ධන බැංකුව	541,651,017	532,020,548
ලංකා බැංකුව	595,226,980	-
එකතුව	7,090,741,107	5,206,048,813

12. ලාභය හෝ අලාභය තුළින් හඳුනාගත් මූල්‍ය වත්කම්

	2019	2018
	රු	රු
වීකක භාර (NDB බැංකුව)	19,475,000	17,635,000
එකතුව	19,475,000	17,635,000

අ.විශ්ලේෂණය

	2019	2018
	රු	රු
ඇප අනුව		
ඇප ලෙස ඔඩපනය කළ	-	-
ණය නැති	19,475,000	17,635,000
දළ එකතුව	19,475,000	17,635,000

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

සටහන 13 ක්‍රමක්ෂට පිරිවැයට මූල්‍ය වත්කම්- ණය හා අත්තිකාරම්

	2019	2018
	රු	රු
දළ ණය හා අත්තිකාරම්	**36,728,853,508**	34,930,520,644
අදියර 1	**26,125,257,565**	24,567,228,079
අදියර 2	**1,915,952,809**	1,765,471,953
අදියර 3	**8,687,643,134**	8,597,820,613
(අඩුකළා): පහත අදියර යටතේ සමුච්චිත හානිකරණය:	**835,983,146**	705,034,312
අදියර 1	**153,428,543**	139,657,779
අදියර 2	**64,705,873**	56,965,387
අදියර 3	**617,848,730**	508,411,145
ශුද්ධ ණය හා අත්තිකාරම්	**35,892,870,362**	34,225,486,332

අ. විශ්ලේෂණය

	2019	2018
	රු	රු
නිෂ්පාදනය අනුව		
උකස්	**9,577,227,772**	9,323,875,172
සේවක අර්ථසාධක අරමුදල	**8,282,816,696**	8,707,071,343
රථ වාහන	**5,799,377**	15,443,468
කාර්ය මණ්ඩල ණය	**1,117,959,770**	985,803,833
පුද්ගල ණය	**16,648,653,558**	14,821,377,959
වෙනත්	**1,096,396,335**	1,076,948,869
දළ එකතුව	**36,728,853,508**	34,930,520,644
ඇප අනුව		
සුරැකුම් ලෙස තබාගෙන ඇති ඇප	**18,798,261,460**	18,859,528,741
අනෙකුත් ණය වර්ධනයන්	**17,930,592,047**	16,070,991,903
දළ එකතුව	**36,728,853,508**	34,930,520,644

ආ. වසර තුළ හානිකරණය තුළ වෙනස්වීම්

	2019	2018
අදියර 1		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	139,657,779	124,182,324
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	13,770,764	15,475,456
වසර තුළ කපාහැරීම	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	153,428,543	139,657,779
අදියර 2		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	56,965,387	32,597,649
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	7,740,486	24,367,738
වසර තුළ කපාහැරීම	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	64,705,873	56,965,387
අදියර 3		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	508,411,145	360,868,238
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	109,437,584	147,542,908
වසර තුළ කපාහැරීම	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	617,848,730	508,411,145
එකතුව	835,983,146	705,034,312

14. ක්‍රමක්ෂට පිරිවැයට මූල්‍ය වත්කම්- ණය හා අනෙකුත් උපකරණ

	2019	2018
	රු	රු
භාණ්ඩාගාර බිල්පත්	994,878,307	874,312,408
භාණ්ඩාගාර බැඳුම්කර	168,803,531	274,697,508
ණයකර	65,983,517	65,983,517
නැවත විකිණීමේ ගිවිසුම ආපසු හැරවීම	1,385,517,561	729,583,724
වාණිජ පත්‍රිකා	-	-
දළ එකතුව	2,615,182,916	1,944,577,157
අ.විශ්ලේෂණය		
ඇප අනුව		
සුරැකුම් ලෙස තබාගෙන ඇති ඇප	-	-
අනෙකුත් ණය වර්ධනයන්	2,615,182,916	1,944,577,157
දළ එකතුව	2,615,182,916	1,944,577,157

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

ආ. වසර තුළ හානිකරණය තුළ වෙනස්වීම්

	2019	2018
අදියර 1		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	333,215	265,824
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	135,598	67,391
වසර තුළ කපාහැරීම	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	468,813	333,215
අදියර 2		
2018.12.31 දිනට ආරම්භක ශේෂය	1,085,983	3,581,423
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	443,876	(2,495,439)
වසර තුළ කපාහැරීම	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	1,529,859	1,085,983
අදියර 3		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	-	-
වසර තුළ කපාහැරීම	-	-
අනෙකුත් වෙනස්වීම්	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	-	-

15. අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්

	2019	2018
	රු	රු
ලැයිස්තුගත නොකළ කොටස්		
ණය තොරතුරු කාර්යාංශය	4,754,078	4,754,078
ෆිට්ච් ශ්‍රේණිගතකරණය	625,000	625,000
දළ එකතුව	5,379,078	5,379,078
අ.විශ්ලේෂණය		
ඇප අනුව		
සුරැකුම් ලෙස තබාගෙන ඇති ඇප	-	-
අනෙකුත් ණය වර්ධනයන්	5,379,078	5,379,078
දළ එකතුව	5,379,078	5,379,078

ආ. වසර තුළ හානිකරණය තුළ වෙනස්වීම්

	2019	2018
	රු	රු
අදියර 1		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	-	-
වසර තුළ කපාහැරීම	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	-	-
අදියර 2		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	-	-
වසර තුළ කපාහැරීම	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	-	-
අදියර 3		
2019.12.31 දිනට ආරම්භක ශේෂය	-	-
ආදායම් ප්‍රකාශනයට අයකිරීම/ආපසු ලිවීම	-	-
වසර තුළ කපාහැරීම	-	-
2019.12.31 දිනට අවසන් ශේෂය	-	-

16. දේපල, පිරියත හා උපකරණ

අ.දේපල, පිරියත හා උපකරණ

රු.වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ	පරිගණක උපකරණ හා මෘදුකාංග	එකතුව
2019 (පවත්නා වසර)				
පිරිවැය/සාධාරණ අගය				
2019.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	129,546,278	137,910,796	338,255,328
එකතුකිරීම්	-	9,224,149.40	8,880,706	18,104,855
බැහැර කිරීම්	-	(4,947,691.42)	(6,325,394)	(11,273,085)
ගැලපීම්	-			-
2019.12.31 දිනට අවසන් ශේෂය	70,798,254	133,822,736.20	140,466,108	345,087,098
(අඩුකළා): සමුච්චිත ක්ෂයකිරීම				
2019.12.31 දිනට ආරම්භක ශේෂය	70,798,254	79,055,708	124,156,543	274,010,505
වසර සඳහා අයකිරීම	-	13,002,578	12,985,617	25,988,195
බැහැර කිරීම්	-	(4,653,919)	(6,325,394)	(10,979,313)
ගැලපීම්	-			-
2019.12.31 දිනට අවසන් ශේෂය	70,798,254	87,404,366	130,816,766	289,019,386
(අඩුකළා): හානිකරණ අයකිරීම්				
2019.12.31 දිනට ශුද්ධ පොත් අගය	-	46,418,370	9,649,342	56,067,711.98

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

රු.වලින්	මෝටර් රථ	ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ	පරිගණක උපකරණ හා මෘදුකාංග	එකතුව
2018 (පෙර වසර)				
පිරිවැය/සාධාරණ අගය				
2018.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	114,536,483	134,240,146	319,574,883
එකතුකිරීම්	-	15,009,795	3,670,650	18,680,445
බැහැර කිරීම්	-			-
ගැලපීම්	-			-
2018.12.31 දිනට අවසන් ශේෂය	70,798,254	129,546,278	137,910,796	338,255,328
(අඩුකළා): සමුච්චිත ක්ෂයකිරීම				
2018.01.01 දිනට ආරම්භක ශේෂය	70,798,254	65,668,370	111,726,728	248,193,352
වසර සඳහා අයකිරීම	-	13,387,338	12,429,815	25,817,153
එකතුකිරීම්	-			-
බැහැර කිරීම්	-			-
ගැලපීම්	-			-
2018.12.31 දිනට අවසන් ශේෂය	70,798,254	79,055,708	124,156,543	274,010,505
(අඩුකළා): හානිකරණ අයකිරීම්				
2018.12.31 දිනට ශුද්ධ පොත් අගය	-	50,490,570	13,754,253	64,244,824

17.විලම්බිත බදු වත්කම /(වගකීම්)

	2019	2018
	රු	රු
2019.01.01 දිනට ආරම්භක ශේෂය	107,451,184	95,801,007
පහත දෑ තුළින් හඳුනාගත් වසර සඳහා අයකිරීම		
- ලාභය / (අලාභය)	118,960,119	11,650,177
- අනෙකුත් විස්තරාත්මක ආදායම	(4,762,629)	-
2019.12.31 දිනට අවසන් ශේෂය	221,648,675	107,451,184

18. අනෙකුත් වත්කම්

	2019	2018
	රු	රු
පිරිවැය		
ව්‍යවස්ථාපිත තොගය	18,197,038	10,743,575
තැන්පතු සහ කලින් ගෙවීම්	6,193,643	28,824,683
කලින් ගෙවූ සේවක ණය	331,878,204	295,921,918
ලැබියයුතු VAT	33,183,621	-
ලැබියයුතු පොළිය - ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු	617,374,536	488,895,679
වෙනත්	171,329,897	107,299,133
එකතුව	1,178,156,939	931,684,987

19. බැංකුවලට ගෙවිය යුතු

	2019	2018
	රු	රු
ණයගැනීම් (ODs)	12,412,879	12,196,466
ආපසු හැරවීමේ ගිවිසුම්	-	-
වෙනත්	-	-
එකතුව	12,412,879	12,196,466

20. ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්

	2019	2018
	රු	රු
තැන්පතුකරුවන්ට ගෙවිය යුතු	38,872,216,979	34,272,228,231
බැංකුව විසින් නිකුත්කළ ණය සුරැකුම්පත්	110,180,822	110,173,288
ආපසු හැරවීමේ ගිවිසුම්	-	-
වෙනත් ණයගැනීම්	1,501,680,632	1,872,732,341
එකතුව	40,484,078,432	36,255,133,860

අ. තැන්පත්කරුවන්ට ගෙවියයුතු ප්‍රමාණය පිළිබඳ විශ්ලේෂණය

	2019	2018
	රු	රු
නිෂ්පාදන අනුව		
ඉතුරුම් තැන්පතු	1,669,895,646	1,560,434,916
ස්ථාවර තැන්පතු	36,104,411,121	31,628,705,583
වෙනත් තැන්පතු (යෝජනා ක්‍රම)	1,097,910,212	1,083,087,733
එකතුව	38,872,216,979	34,272,228,231

ආ. අනෙකුත් ණය ගැනීම් පිළිබඳ විශ්ලේෂණය

	2019	2018
	රු	රු
බැංකු ණය	1,202,349,370	1,604,093,151
AHF	3,540,664	11,912,260
මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය	212,235,156	256,726,931
බල්බදු වගකීම	83,555,442	-
එකතුව	1,501,680,632	1,872,732,341

21. සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වන නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි (PVDBO) වර්තමාන අගය ආයුගණක උපදේශණ මගින් පුරෝකථනය කළ ඒකක ණය ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් බැංකුව තක්සේරු කරයි.

මෙම අරමුදලේ ආයුගණක තක්සේරු කිරීම් වට්ටම් කිරීමේ අනුපාතය, බලාපොරොත්තු වන වත්කම් මත ඉපැයීම් අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම් සහ සේවක උනන්දුව වැඩිවීමේ ප්‍රතිශතය ආදිය පිළිබඳ උපකල්පනයන් පදනම්ව ඇත. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වරූපය නිසා එම ඇස්තමේන්තු කිරීම් සැලකියයුතු අවිනිශ්චිතතාවයන්ට ලක් වේ. සියළුම උපකල්පනයන් වාර්තාකරන දිනට යළි ඇගයීමට ලක් කර ඇත. 2019 දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ වගකීම 2019 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරු වාර්තාව මත පදනම්ව ඇත. එහි අගය කිරීම ඇචුවරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මඟින් ක්‍රියාවට නංවා ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ඉතිරි කොටස...

ආයුගණකයින් විසින් භාවිතා කළ ප්‍රධාන උපකල්පනයන්ට පහතින් සඳහන් දෑ ඇතුළත්ය:

	2019	2018
පොළී අනුපාතය	10.50%	11.50%
වැටුප් වැඩිවීමේ අනුපාතය	6.50%	7.50%
විශ්‍රාම ගැනීමේ වයස	55-60 years	55-60 years

පාරිතෝෂිකය

	2019	2018
	රු	රු
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම		
වර්ෂයේ ආරම්භක ශේෂය	192,331,682	161,651,109
වර්තමාන සේවා වියදම	12,966,157	18,589,878
පොළී වියදම	22,118,143	12,890,128
ප්‍රතිලාභ ගෙවීම්	(27,114,159)	(24,060,835)
ආයුගණක(ලාභ/අලාභ)	(4,770,465)	23,261,402
එකතුව	195,531,358	192,331,682

වෛද්‍ය

	2019	2018
	රු	රු
වෛද්‍ය ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම		
වර්ෂයේ ආරම්භක ශේෂය	190,167,950	174,893,882
වර්තමාන සේවා වියදම	4,656,332	20,112,796
පොළී වියදම	21,869,314	4,581,049
ආයුගණක(ලාභ/අලාභ)	(12,238,922)	415,873
ප්‍රතිලාභ ගෙවීම්	(9,694,301)	(9,835,651)
එකතුව	194,760,373	190,167,950
මුළු සේවක ප්‍රතිලාභ වගකීම	390,291,731	382,499,632

22. අනෙකුත් ප්‍රතිලාභ

	2019	2018
